# වාර්ෂික වාර්තාව

# 2016

## ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය

# ශ්‍රී ලංකා මහවැලි අධිකාරියේ
# වාර්ෂික වාර්තාව-2016


| **පටුන** | | **පිටුව** |
|---|---|---|
| දැක්ම සහ මෙහෙවර | | i |
| ඓතිහාසික පසුබිම | | ii -vi |
| 2016 වර්ෂයේ අධ්‍යක්ෂ මණ්ඩලයේ සංයුතිය | | vii |
| ජ්‍යෙෂ්ඨ කළමණාකාරිත්වය | | viii |
| 2016 වසර සඳහා අධ්‍යක්ෂ ජනරාල්වරයාගේ සමාලෝචනය | | ix |
| අධ්‍යක්ෂ මණ්ඩල සංෂිප්ත සටහන | | x |
| 2016 විගණන කමිටු වාර්තාව | | xi |
| ඉකුත් වසර 7 තුළ වත්කම් සහ වගකීම් | | xii |
| ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය යටතේ ස්ථාපිත සමාගම් වල අධ්‍යක්ෂ මණ්ඩලය- 2016 | | xiii |
| ***1-කොටස*** | ***පාලන වාර්තාව*** | |
| ***පළමුවැනි පරිච්ජේදය*** | ***ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය පිහිටුවීම*** | **(1-07)** |
| | එහි සංයුතිය සහ කර්තව්‍යයන් | **02-03** |
| | ශ්‍රී.ල.ම.අ. සාමාන්‍ය පරිපාලන ව්‍යුහය | **04** |
| | මහවැලි කලාප වල ව්‍යුහය හා පරිපාලනය | **05** |
| | මූලස්ථාන මෙහෙයුම් අංශය | **06** |
| | සැලසුම් හා මෙහෙයුම් අංශය | **07** |
| | අභ්‍යන්තර විගණන අංශය | **07** |

| | | |
|---|---|---|
| *දෙවැනි පරිච්ඡේදය -* | ***තාක්ෂණ සේවා අංශය*** | **(08-19)** |
| | කාර්යභාරයන් | 08 |
| | ඉංජිනේරු සැලසුම් නිර්මාණ හා පහල නිම්න සංවර්ධන | 08-10 |
| | මූලික වැඩ පාලන ක්‍රියාකරවුම් හා නඩත්තු අංශය | 11 |
| | ජල පාලන ලේකම් කාර්යාලය | 12-13 |
| | ඉඩම් පරිහරණ සැලසුම් අංශය | 13-18 |
| | වන හා පරිසර සංරක්ෂණ අංශය | 18-19 |
| *තුන්වැනි පරිච්ඡේදය-* | ***සංවර්ධන අංශය*** | **(20-36)** |
| | ඉඩම් අංශය | 20-23 |
| | කෘෂිකර්ම සංවර්ධන අංශය | 24-30 |
| | ආයතන සංවර්ධන අංශය | 30-32 |
| | ව්‍යාපාර සංවර්ධන අංශය | 33-36 |
| *සිව්වැනි පරිච්ඡේදය-* | ***මානව සම්පත් හා මූල්‍ය කළමනාකරණ අංශය*** | **(37-42)** |
| | මානව සම්පත් කළමනාකරණ අංශය | 37-38 |
| | නීති අංශය | 39 |
| | මුදල් අංශය | 39-40 |
| | මහවැලි ආරක්ෂක බලකාය | 40 |
| | මහවැලි කේන්ද්‍රය | 40-42 |
| | ප්‍රවාහන අංශය | 42 |

*පස්වැනි පරිච්ඡේදය- ශ්‍රී ලං.ම.අ. යටතේ පිහිටුවනු ලැබූ සමාගම්* **(43-45)**

ii කොටස වාර්ෂික ගිණුම් (46-55)

iii කොටස විගණකාධිපතිවරයාගේ වාර්තාව (56-93)

iv කොටස විගණකාධිපති වාර්තාව පිළිබඳ අධ්‍යක්ෂ ජනරාල්වරයාගේ කරුණු දැක්වීම (94-115)

vi කොටස ශ්‍රී.ම.අ සමස්ථ කාර්යය සාධනය (116-132)

# දැක්ම

ගංගා නිම්න පදනම්කර ගත් ඒකාබද්ධ තිරසාර සංවර්ධනය කරා යන දකුණු ආසියාවේ විශිෂ්ටතම ජාතික ආයතනය බවට පත්වීම.

# මෙහෙවර

ශ්‍රී ලංකාවේ සමාජ ආර්ථක සමෘද්ධිය උදෙසා මහවැලි සහ අනෙකුත් විශේෂිත ප්‍රදේශවල භූමිය, ජලය, සියළුම ස්වාභාවික සම්පත් සහ මානව සම්පත ප්‍රශස්ත ලෙස පරිහරණය සඳහා නව්‍ය වැඩසටහන් සහ ව්‍යාපෘති සම්පාදනය, ප්‍රවර්ධනය සහ වැඩිදියුණු කිරීමට අනුබල දීම.

## ඓතිහාසික පසුබිම

මහවැලි සංවර්ධන ව්‍යාපාරය ශ්‍රී ලංකාවේ ක්‍රියාත්මක කරනු ලැබ ඇති දැවැන්ත භෞතික හා මානව සම්පත් සංවර්ධන වැඩසටහනකි. මූලික වශයෙන් වියළි කලාපයේ ග්‍රාමීය සංවර්ධනය අරමුණු කරගත් මෙම ව්‍යාපෘතිය 1968 වර්ෂයේදී එවකට පැවති රජය විසින් UNDP/FAO සංවිධානය මගින් ලද තාක්ෂණික සහායන් මත සැලසුම් කරන ලදී. මධ්‍යම කඳුකරයේ පවතින ස්වාභාවික ජල සම්පත වියළි කලාපයේ කෘෂි කර්මාන්තයට හා ජනාවාස සංවර්ධනය සඳහා යොදා ගැනීමේ කාර්යයේදී මහවැලි සංවර්ධන ව්‍යාපාරය මගින් විශාල කාර්යභාරයක් සිදු කරන ලදී.

ශ්‍රී ලංකාවේ ජනගහන වර්ධනය තීව්‍ර වීමත් සමග පැන නැඟුනු අතුරු ප්‍රශ්නවලට විසඳුම් සෙවීමේදී නිෂ්පාදන වේගය වැඩි කිරීම කෙරෙහි අවධානය යොමු කළ යුතු විය. 1969 දී ශ්‍රී ලංකාවේ ජනගහනය මිලියන 11.8 ක් විය. මෙය 1940 ජනගහනයේ මෙන් දෙගුණයක් වූ අතර වාර්ෂික ජනගහන වර්ධන වේගය 3.1% ක් විය. මෙලෙස ජනගහනය වැඩිවීම නිසා ආහාර සඳහා 1980 වන විට සහල් මෙ. ටො. මිලියන 1.8 ක් අවශ්‍ය යැයි උපකල්පනය කරන්නට විය. නමුත් 1969 දී සහල් නිෂ්පාදනය වූයේ මෙ. ටො. මිලියන 0.7 ක් පමණි. එමෙන්ම කර්මාන්ත වර්ධනයට හා ගෘහස්ත පරිභෝජනයට විදුලිය ගිගා වොට් පැය 2000 ක් පමණ විය. නමුත් 1969 වන විට විදුලිය නිෂ්පාදනය වූයේ වසරකට ගිගා වොට් 470 ක් පමණි. ඉන් ගිගා වොට් පැය 388 ක් ජල විදුලිය වූ අතර ඉතිරිය ඛනිජ තෙල් දහනයෙන් ලද තාප විදුලිය වේ. තවද 1960-1967 කාල සීමාව තුල සහල් මෙ. ටො. 466,000 ක් වාර්ෂිකව ආනයනය වූ අතර ඒ සඳහා වසරකට රු. මි. 200 බැගින් විදේශයන්ට ගලා යන්නට විය. මේ හැර අතිරේක භෝග සඳහා ද රු. මි. 139 ක් වාර්ෂිකව වැය වී ඇත. එම වියදම ඉතා ඉහළ අගයක් විය.

ශ්‍රී ලංකාවේ තෙත් කලාපය තුළ ජනගහනය ඒකරාශිවීමක් දක්නට ලැබුණි. තෙත් කලාපය තුළ ජනඝනත්වය වර්ග කිලෝමීටරයට 465 වූ අතර වියළි කලාපය තුල වර්ග කිලොමීටරයට 80 ක් පමණ විය. දිවයිනේ මුළු භූමි ප්‍රමාණයෙන් 66% ක්ම වියළි කලාපයට අයත් වන අතර ජනගහනයෙන් 70% ක් තෙත් කලාපයේ ජීවත් විය. මේ අනුව වියළි කලාපයේ විශාල බිම් ප්‍රදේශයක් පුරාම ඉතා අඩු ජනගහන ව්‍යාප්තියක් දක්නට ලැබිණි. ඒ අනුව ලංකාවේ අනෙකුත් ගංගා හා සසඳන කළ තෙත් කලාපයේ මධ්‍යම කඳුකරයෙන් ඇරඹී දිවයිනේ මුළු භූමි ප්‍රමාණයෙන් 6න් 1කට ලැබෙන වර්ෂා ජලය සිය ග්‍රහනයට ගෙන වියළි කලාපය මැදින් මුහුද වෙත ගලායන මහවැලි ගඟ වසරේ සෑම කාලයකදීම සුපෝෂිත ගංගාවකි. මේ අනුව මහවැලි ගඟ වියළි කලාපයට හරවා එයින් ලැබෙන ජලයෙන් වියළි කලාපයේ කෘෂිකාර්මික සංවර්ධනයක් ඇති කිරීමත්, ඉහළ මහවැලි බල ප්‍රදේශ ආශ්‍රිතව විදුලි බලාගාර ඉදිකිරීමත් මගින් ශ්‍රී ලංකාවේ අනාගත අවශ්‍යතා සපුරා ගත හැකි බව ප්‍රත්‍යක්ෂ විය. මේ පිළිබඳ ඉදිරිපත් වූ අදහස්වල ප්‍රතිඵලයක් ලෙස රජය කළ ඉල්ලීමකට අනුව එක්සත් ජනපද මෙහෙයුම් දූත මණ්ඩලය වියළි කලාපය ආශ්‍රිත ඉඩම් සංවර්ධනය පිළිබඳව ශක්‍යතා අධ්‍යයනයක් 1956 දී ආරම්භ කර ඇත. ඒ සමඟම ශ්‍රී ලංකාවේ වාරිමාර්ග හා මිනුම් දෙපාර්තමේන්තු යන ආයතනවල සහය ඇතිව කැනේඩියානු රජයේ තාක්ෂණික

ආධාර මත කැනේඩියන් හන්ටින් සර්වේ කෝපරේෂන් ආයතනයද ශ්‍රී ලංකා රජයේ ඉල්ලීම පරිදි මහවැලි ගඟ පිළිබඳ අධ්‍යයනයක් සිදු කරන ලදී. මෙම ආයතන එම අධ්‍යයනය පිළිබඳ ස්වාධීන වාර්තා දෙකක් 1961 දී ඉදිරිපත් කරන ලදී. මෙම වාර්තාව අනුමැතිය සඳහා 1962 දී පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන ලදී.

සමස්ත මහවැලි ද්‍රෝණියේම ජල සම්පත පිළිබඳව පූර්ණ අධ්‍යයනයක් සිදු නොකර මහවැලි ජලයෙන් කොටසක් හරවා යැවීම අයහපත් ප්‍රතිඵල ජනනය කරන බැවින් දේශීය විද්වතුන්ගේ අදහස් හේතුවෙන් පාර්ලිමේන්තුව මෙම යෝජනා අනුමත නොකරන ලදී. ඉන්පසු මහවැලි ගඟ ඇතුළු වෙනත් ගංගා ආශ්‍රිත ඉඩම් හා ජල සම්පත් පිළිබඳ සමස්ත අධ්‍යයනයක් කර සංවර්ධනය සඳහා ප්‍රමුඛත්වය ලබාදිය යුතු ව්‍යාපෘති තෝරා ස්වාධීන නිර්දේශ ඉදිරිපත් කරන ලෙස 1962 දී එක්සත් ජාතීන්ගේ සංවිධානය වෙත ඉල්ලීමක් ඉදිරිපත් කරන්නට විය. එහි ප්‍රතිඵලයක් ලෙස එක්සත් ජාතීන්ගේ සංවර්ධන වැඩසටහන විසින් එහි ආහාර හා කෘෂිකර්ම සංවිධානයේ විශේෂඥ පිරිසකගෙන් සමන්විත කණ්ඩායමක් ශ්‍රී ලංකාවට එවන ලදී. එයට අමතරව එම කණ්ඩායමට සහාය සඳහා ශ්‍රී ලංකාවේ විශේෂඥ පිරිසක් හා කාර්ය මණ්ඩලයක් ද පත් කරන ලදී.

සිව් වසරක දැඩි අධ්‍යයන පරිශ්‍රමයකින් පසුව 1968 දී වෙන් වෙන් වූ විශේෂ වාර්තා 14 කින් යුතු කාණ්ඩ තුනක අධ්‍යයන වාර්තාව ප්‍රකාශයට පත් කරන ලදී. මෙසේ ඉදිරිපත් කරන ලද මහවැලි සංවර්ධන සැලැස්ම 1968 වසරේදී පාර්ලිමේන්තුව විසින් අනුමත කරන ලදී.

උතුරු මැද පළාත් සහ නැගෙනහිර පළාත් ආශ්‍රිත ප්‍රතිලාභ ලබන ප්‍රදේශය කලාප 13 ක් ලෙස නම් කරන ලද අතර එය ඉංග්‍රීසි A සිට M දක්වා නම් කෙරුණි. ආර්ථික වශයෙන් වඩාත් ඵලදායී හා අඩු ආයෝජනයක් මගින් වැඩි ප්‍රතිලාභ ලැබිය හැකි ව්‍යාපෘති පළමු වන පියවර යටතට ගන්නා ලදී.

## මහවැලි මහ සැලැස්ම

මහවැලි මහ සැලැස්ම ප්‍රධාන අරමුණ වූයේ මහවැලි ගඟේ ජල සම්පතෙන් ඝන මීටර් මිලියන 6900 ක් පමණ වූ ජල ප්‍රමාණයක් විදුලි බල නිෂ්පාදනයට හා වාරි කටයුතු සඳහා සැපයීමයි. දෙවන අරමුණ වූයේ ජලාශ 15 ක් ඉදිකර 11 ක් ප්‍රධාන වශයෙන් විදුලි බලය නිෂ්පාදනය සඳහා යෙදවීමයි.

එක්සත් ජාතීන්ගේ සංවර්ධන වැඩසටහන මඟින් ආහාර හා කෘෂිකර්ම සංවිධානය විසින් ඉදිරිපත් කරන ලද මහවැලි මහ සැලැස්ම අනුව මහවැලි ගංගා ද්‍රෝණියේ සහ වියළි කලාපය තුළ වූ තවත් ගංගා ද්‍රෝණි වල පිහිටි ඉඩම්, හෙක්ටයාර් 364,372 ක් සඳහා යල මහ දෙකන්නයටම වගා කිරීමට වාරි ජල පහසුකම් සලසා දීමට යෝජනා කර තිබුණි. මෙයින් හෙක්ටයාර 264,777ක් අළුතින් අස්වැද්දීමට යෝජිත වූ අතර හෙක්ටයාර 110,404 ක් ඒ වන විට වසරක එක් කන්නයක් පමණක් වගා කළ ඉඩම් විය. සැලසුම් කළ ජලාශ හා ඇල මාර්ගවල විභවයන් ප්‍රයෝජනයට ගැනීමෙන් ගිගා වොට් පැය 2037 ක වාර්ෂික ස්ථාවර

විදුලිය ප්‍රමාණයක් ජනනය කළ හැකි බවද එයින් පෙන්වා දී තිබුණි. මහවැලි මහා සැලැස්ම අනුව එම සංවර්ධන කටයුතු වසර 30 ක් තුළ නිම කිරීමට යෝජනා විය. අරමුදල් යෙදවීමේ හා ක්‍රියාත්මක කිරීමේ පහසුව මෙන්ම විශේෂයෙන්ම සංවර්ධන ප්‍රතිලාභ වල අවශ්‍යතාවය යන කරුණු පිළිබඳ අවධානය යොමුකර සංවර්ධන කටයුතු පියවර තුනකට බෙදා තිබුණි.

I ප්‍රථම පියවර

1969-1980 අතර කාලය තුළ ක්‍රියාත්මක කිරීමට යෝජනා විය. මේ තුළින් අළුත් ඉඩම් හෙක්ටයාර් 74,494 කට පැරණි ඉඩම් හෙක්ටයාර් 58,300 කට වාරි ජලය සැපයීමටත් ගිගාවොට් පැය 820 ක් වාර්ෂික ස්ථාවර විදුලිය බල ප්‍රමාණයක් ජනනය කිරීමට සැලසුම් කර තිබුණි. මෙම පියවරේ වැඩ කටයුතු ව්‍යාපෘති තුනක ට බෙදන ලදී. එනම්,

- පොල්ගොල්ල හැරවුම (1969-1973)
- වික්ටෝරියා / මිනිපෙ හැරවුම (1973-1977)
- මොරගහකන්ද බහුකාර්යය ඒකකය

II දෙවන පියවර

මේ යටතේ මාදුරුඔය ජලාශය, තල්දෙන බහුකාර්ය සංකීර්ණය හා කන්දකාඩු අමුණ යන මූලස්ථ වැඩ කොටස් යටතේ මහවැලි හා මාදුරු ඔය නිම්නයන්හි ඉඩම් හෙක්ටයාර 93,117 ක් වගා කිරීමට වාරි පහසුකම් ලැබෙන අතර මෙයින් ඉඩම් හෙක්ටයාර 8,502 ක් ඒ වන විටත් වගා කරමින් තිබූ ඉඩම් යැයි ගණන් බලා තිබේ. මෙගා වොට් 15 ක ස්ථාපිත ජවයක් සහිත ජල විදුලි බලාගාරයක් තල්දෙනදී ඉදිකිරීමටද මාදුරුඔය ජලාශය පෝෂණය කිරීමට උල්හිටිය රත්කිඳ ජලාශයේ සිට උමඟක් ඉදිකිරීමටද මාදුරුඔය ජලාශය ආශ්‍රිතව මෙගා වොට් 4.9 ක ස්ථාපිත ජවයක් ඇති කුඩා ජල විදුලි බලාගාරයක් ඉදිකිරීම මෙහි ප්‍රධාන කාර්යයන් විය.

III තෙවන පියවර

මෙමගින් දිවයිනේ උතුරු මධ්‍යම පළාතේ අලුත් ඉඩම් හෙක්. 105,668 ක් සංවර්ධනය කෙරේ. ජල විදුලිය නිපදවීමේ අවසන් සැලසුම ක්‍රියාත්මක කොට මෙගා වොට් 293 ක ප්‍රමාණයක ස්ථාපිත ජවයක් ඇති විදුලි බලාගාර ඉදිකරන අතර එමගින් වාර්ෂිකව ගිගා වොට් පැය 1169 ක ස්ථාවර විදුලි ජනනයක් කරනු ඇත. පැරණි මිනිපෙ වම් ඉවුර ඇල වැඩි දියුණු කිරීම, කිලෝමීටර් 164 ක් උතුරු මධ්‍යම ඇල ඉදිකිරීම, රොටලාවල, උමාඔය, රන්ටැඹේ. කොත්මලේ, කළුගඟ ආදී ජලාශ ඉදිකිරීම මෙම පියවරට ඇතුලත් විය.

නමුත් කාලීන අවශ්‍යතාවයන්ට ප්‍රමුඛතාවය දෙමින් මහවැලි මහ සැලැස්ම සංවර්ධන අදියර 3 කින් ක්‍රියාවට නැංවෙමින් පවතී.

## මහවැලි මහ සැලැස්ම ක්‍රියාත්මක කිරීම (1 වන සංවර්ධන අදියර)

මහවැලි මහ සැලැස්ම යටතේ ප්‍රථම ව්‍යාපෘතිය ලෙස පොල්ගොල්ල හා බෝවතැන්න ව්‍යාපාර 1970 දී ආරම්භ කරනු ලැබූ අතර, 1976 වන විට ඉදිකිරීම් කටයුතු අවසාන කිරීමට හැකි විය. මෙමගින්, පෙර පැවති ඉඩම් හෙක්ටයාර් 16,000 කට හා නව ඉඩම් හෙක්ටයාර 23,000 කට වාරි ජලය සැපයීමටද , මෙගා වොට් 40 ක ස්ථාපිත ධාරිතාවයකින් යුත් ජල විදුලිය නිපදවීමට ද හැකි විය. මේ ව්‍යාපාරය යටතේ මහවැලි එච් කලාපයට අයත් කලා වැව නිම්නයේ ගොවි පවුල් 23,000 ක් 1977 වන විට පදිංචි කරනු ලැබිණි. මේ වන විට මහවැලි ව්‍යාපාරය යටතේ එච් කලාපයේ සියලු ජනාවාස කටයුතු අවසන් කර ඇති අතර, එහි පදිංචි කරනු ලැබ ඇති මුළු පවුල් සංඛ්‍යාව 39,500 කි.

1977 වන විට ශ්‍රී ලංකා ආර්ථිකය ගැටලු රැසකට මුහුණ දී තිබිණි. සහල් ඇතුලු කෘෂි නිෂ්පාදන ආනයන වියදම ඉහළ යෑම ප්‍රධාන ගැටළුවක් විය. රට තුල සහල් අවශ්‍යතාවයෙන් නිපදවූයේ 69%ක් වූ අතර 31% ක් ආනයනය මත රදා පැවතිනි. එයට අමතරව තවත් අත්‍යවශ්‍ය කෘෂි නිෂ්පාදන රැසක්ද ආනයන කරන ලදී.

විදුලි බල නිෂ්පාදනය 1977 වන විට විදුලිබල මණ්ඩලයේ විදුලි ධාරිතාවය මෙගා වොට් 408 ක ප්‍රමාණයක් රටේ විදුලිබල ඉල්ලුම සැපයීමට එය ප්‍රමාණවත් නොවුනි. විදුලි බිඳ වැටීම් සාමාන්‍ය දෙයක් වූ අතර එය වසරකට දින 70 ක විදුලිය විසන්ධිවීමක් දක්වා වර්ධනය වී තිබිණි.

ශ්‍රී ලංකාවේ විරැකියාව 17% දක්වා වර්ධනය විය. විරැකියාව පහළ දැමීම අත්‍යවශ්‍ය කරුණක් විය. මෙම ගැටලුවට කඩිනම් විසඳුම් ලබාදීම අත්‍යවශ්‍ය විය.

මෙම ගැටළු ඉක්මනින් විසඳීමේ පියවරක් ලෙස මහවැලි සංවර්ධන මහ සැලැස්ම කඩිනම් කල යුතු බවට 1977.10.12 දින එවකට පැවැති රජය තීරණය කරන ලදී.

## මහවැලි කඩිනම් වැඩසටහන (දෙවන සංවර්ධන අදියර)

මහවැලි මහ සැලැස්මට අයත් තෝරාගත් ව්‍යාපෘති කිහිපයක් එක විට අරඹා වසර 6 ක් වැනි කෙටි කාලයකදී නිම කිරීමට 1977 දී රජය තීරණය කළේය. එය ක්‍රියාත්මක කිරීම සඳහා වෙනම අමාත්‍යාංශයක් ද ආරම්භ කරනු ලැබීය. ඒ අනුව කොත්මලේ, වික්ටෝරියා, රන්දෙණිගල හා මාදුරු ඔය ජලාශ යෝජනා ක්‍රම අරඹා ක්‍රියාත්මක කිරීමට අවස්ථාව උදා විය. පසුව මෙයට රන්ටැඹේ ව්‍යාපාරය ද ඇතුළත් කෙරිණි. මෙයින් මාදුරුඔය හැර අනෙකුත් ජලාශ පාදක කොට ගෙන ජල විදුලිය උත්පාදනය කරනු ලබන අතර, එම ජලයම වාරි කර්මාන්තය සඳහා ද භාවිත කෙරේ. මේ අනුව මහවැලි සී හා බී කලාප සංවර්ධන කොට ගොවි ජනයා පදිංචි කිරීමද මහවැලි කඩිනම් වැඩසටහනට අයත් විය. ඒ අනුව බී කලාපයේ පවුල් 30,465 ක් ද සී කලාපයේ පවුල් 45,488 ක් ද පදිංචි කර ඇත.

මෙම ව්‍යාපෘති සඳහා පිලිවෙලින් ස්වීඩනය, මහා බ්‍රිතාන්‍ය, ජර්මනිය, හා කැනඩාවත් , පහළ නිම්න සංවර්ධනය සඳහා ලෝක බැංකුව, EEC, ජපන් හා කුවේට් යන රටවල් මූල්‍ය ආධාර සපයන ලදී. මෙම

ව්‍යාපෘති දියත් කිරීම සඳහා 1979 දී ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය ස්ථාපනය කරන ලද අතර, ඉංජිනේරු හා නිර්මාණ කාර්යයන් සඳහා මහවැලි ඉංජිනේරු හා නිර්මාණ ඒජන්සියත් නැවත පදිංචි කිරීම සඳහා මහවැලි ආර්ථික ඒජන්සියත්

ස්ථාපිත කරන ලදී. එමෙන්ම කඩිනම් මහවැලි සංවර්ධනය මගින් ඉදිවුණු විශාල ජලාශ පාලනය සඳහා මූලික වැඩ පාලන හා මෙහෙයුම් අංශය 1986 දී ස්ථාපිත කරන ලදී.
1990 වර්ෂය වන විට කඩිනම් මහවැලි සංවර්ධන ව්‍යාපෘති නිමවූ අතර එමගින් විදුලිබල ක්ෂේත්‍රය හා කෘෂිකර්මාන්තය නැංවීමට විශාල ආයෝජනයක් සිදුවිය. මේ නිසා තවදුරටත් කෘෂිකර්මාන්තය ආයෝජනය සිදු කිරීමට රජය මැලි වූ බැවින් මහවැලි මහ සැලසුමට අදාළ මොරගහකන්ද ජලාශ ව්‍යාපෘතිය යටපත් විය. කෙසේ නමුත් දීර්ඝ කාලයක් මුළුල්ලේ සැලසුම් වලට පමණක් සීමා වී තිබූ මෙම සංවර්ධන ව්‍යාපෘතිය වර්තමානය වන විට ක්‍රියාත්මක තත්වයට පැමිණ තිබීම මහවැලි සංවර්ධන ව්‍යාපාරයේ ප්‍රතිලාභ තවදුරටත් පුළුල් කිරීමට ඉවහල් වේ.

<u>මහවැලි ව්‍යාපාරයේ වර්තමාන කාර්යභාරය හා අනාගත සැලසුම් (තෙවන සංවර්ධන අදියර)</u>

මේ යටතේ මොරගහකන්ද හා කළුගඟ ජලාශ ව්‍යාපෘතිය, කාලිංගනුවර අංගමැඩිල්ල ජල පොම්පාගාර ව්‍යාපෘතිය, මහවැලි ගඟේ අතු ගංගාවන් වූ කුඩාඔය ආශ්‍රිතව බහුකාර්ය සංවර්ධන ව්‍යාපෘතිය, වැලිඔය ජනපදය ආශ්‍රිතව කිවුල්ඔය ජලාශ ව්‍යාපෘතිය, ඉහළ ඇලහැර ඇල ව්‍යාපෘතිය, උතුරුමැද මහ ඇල ව්‍යාපෘතිය, වයඹ පළාත් ඇල ව්‍යාපෘතිය, මිණිපේ ඇල ව්‍යාපෘතිය යනාදිය ක්‍රියාත්මකව වෙමින් පවතී.

2020 වනවිට නව ඉඩම් හෙක්ටයාර 30,400 ක් සංවර්ධනය කිරීමට බලාපොරොත්තු වන අතර මේ යටතේ මොරගහකන්ද ව්‍යාපෘතිය යටතේ හෙක්ටයාර 5000 ක්, මාදුරුඔය දකුණු ඉවුර සංවර්ධන ව්‍යාපෘතිය යටතේ හෙක්ටයාර 18,000, කිවුල්ඔය ජලාශ ව්‍යාපෘතිය ආශ්‍රිතව හෙක්ටයාර 2,400, උමාඔය බහුකාර්ය සංවර්ධන ව්‍යාපෘතිය යටතේ හෙක් 5000ක් අලුතින් සංවර්ධනය වේ.

ජල විදුලි නිෂ්පාදනය - උමාඔය ව්‍යාපෘතිය මෙගාවොට් 120 ක්ද මොරගහකන්ද ව්‍යාපෘතිය යටතේ මෙගවොට් 25 ක්ද කුඩා ජලවිදුලි බලාගාර වලින් මෙගාවොට් 60 ක්ද ජාතික විදුලිබල නිෂ්පාදනයට එකතුවේ. ඉහත වැඩසටහන් යටතේ ජාතික ආහාර නිෂ්පාදනයට එකතු වන නව වටිනාකම් ප්‍රශස්ත අයුරින් මහවැලි ජානපදිකයන්ගේ සුභසිද්ධිය උදෙසා යොදා ගැනීමට අපේක්ෂා කරමු.

## 2016 වර්ෂය තුල අධ්‍යක්ෂ මණ්ඩලයේ සංයුතිය

| අනු අංකය | නම/තනතුර | කාලය |
|---|---|---|
| 01 | අනුර දිසානායක මහතා<br>අධ්‍යක්ෂ ජනරාල්<br>ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය | 2016 ජනවාරි සිට දෙසැම්බර් දක්වා |
| 02 | ඉංජි. ආර්. එම්. ඩබ්. රත්නායක මහතා<br>ලේකම්<br>වාරිමාර්ග සහ ජලසම්පත් කළමනාකරණ අමාත්‍යාංශය | 2016 ජනවාරි සිට<br>දෙසැම්බර් දක්වා |
| 03 | ඉංජි. වයි. අබ්දුල් මජීඩ් මහතා<br>අධ්‍යක්ෂ ජනරාල්<br>වාරිමාර්ග දෙපාර්තමේන්තුව | 2016 ජනවාරි සිට<br>පෙබරවාරි දක්වා |
| 04 | ඉංජි.එස් .එස්. එල් .වීරසිංහ<br>අධ්‍යක්ෂ ජනරාල්<br>වාරි මාර්ග දෙපාර්තමේන්තුව | 2016 මාර්තු සිට<br>දෙසැම්බර් දක්වා |
| 05 | තිලක් බණ්ඩාර මහලේකම් මහතා | 2016 ජනවාරි සිට<br>දෙසැම්බර් දක්වා |
| 06 | එම්. ඩී. ජේ. සී. මුරගේ මහතා<br>සහකාර අධ්‍යක්ෂ<br>වෙළඳ සහ ආයෝජන ප්‍රතිපත්ති දෙපාර්තමේන්තුව | 2016 ජනවාරි සිට<br>දෙසැම්බර් දක්වා |

# ජ්‍යෙෂ්ඨ කළමනාකරිත්වය

| අනු අංකය | තනතුරු නාමය | නම |
|---|---|---|
| 01 | අධ්‍යක්ෂ ජනරාල් | අනුර දිසානායක මයා |
| 02 | අතිරේක අධ්‍යක්ෂ ජනරාල් | - |
| 03 | නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල් (පාලන හා මුදල්) | ආර්.එම්.සී.එම්. හේරත් මිය |
| 04 | නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල් (තාක්ෂණ සේවා) | ඉංජි. එච්.එච්.පී. ප්‍රේමකුමාර මයා |
| 05 | නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල් (සංවර්ධන) | - |
| 06 | අධ්‍යක්ෂ (පිරිස් හා පාලන) | - |
| 07 | ව්‍යාපෘති අධ්‍යක්ෂ (වේලි ආරක්ෂණ හා ජල සම්පත් සැලසුම් ව්‍යාපෘතිය) | ඉංජි. ඩී.සී.එස්. ඇලකන්ද මයා |
| 08 | ව්‍යාපෘති අධ්‍යක්ෂ (මොරගහකන්ද කළුගඟ සංවර්ධන ව්‍යාපෘතිය) | ඉංජි. ආර්.බී. තෙන්නකෝන් මයා |
| 09 | ව්‍යාපෘති අධ්‍යක්ෂ (මහවැලි ඒකාබද්ධ ව්‍යාපෘතිය) | ඉංජි. එම්.පී.එම්. පෙරේරා මයා |
| 10 | අධ්‍යක්ෂ (මුදල්) | ටී.ඩී.ප්‍රියන්ත මයා |
| 11 | අධ්‍යක්ෂ (අභ්‍යන්තර විගණන) | - |
| 12 | අධ්‍යක්ෂ (මහවැලි කේන්ද්‍රය) | අරුණ ප්‍රභාත් ලේකම්ගේ මයා |
| 13 | අධ්‍යක්ෂ (කෘෂිකර්ම) | ඩබ්ලිව්.ඊ. ද මෙල් මයා |
| 14 | අධ්‍යක්ෂ (ධීවර හා පශු සම්පත්) | - |
| 15 | අධ්‍යක්ෂ (ඉඩම්) | ඩී.ඒ.ඒ.යූ.ගුණසේකර මයා |
| 16 | අධ්‍යක්ෂ (ආයතන සංවර්ධන) | ආචාර්යය. ඩී.එම්.එස්. දිසානායක මයා |
| 17 | අධ්‍යක්ෂ (ව්‍යාපාර සංවර්ධන) | ඩබ්ලිව්.කේ.පී.සී. පෙරේරා මයා |
| 18 | අධ්‍යක්ෂ (ඉංජිනේරු නිරමාණ හා සැලසුම්) | ඉංජි. පී. තලගල මිය |
| 19 | අධ්‍යක්ෂ (පහළ නිම්න සංවර්ධන) | ඉංජි. කේ.ජී. පෙරේරා මයා |
| 20 | අධ්‍යක්ෂ (මූලික වැඩ පාලන ක්‍රියාකරවුම් හා නඩත්තු) | - |
| 21 | අධ්‍යක්ෂ (ගංගා ද්‍රෝණි කළමනාකරණ) | ඉංජි. චන්ද්‍රා සෙනරත් මෙය |
| 22 | අධ්‍යක්ෂ (ඉඩම් පරිහරණ සැලසුම්) | එච්.එච්. ලීලානන්ද මයා |
| 23 | අධ්‍යක්ෂ (වන හා පරිසර) | එජ්.එම්.කේ.බී. අත්තනායක මයා |
| 24 | අධ්‍යක්ෂ (ජල කළමනාකරණ ලේකම් කාරයාලය) | ඉංජි. ජී.කේ.ටී. සමරතුංග මෙය |
| 25 | අධ්‍යක්ෂ (සැලසුම් හා නියාමන) | මහින්ද ගුණරත්න මයා |
| 26 | අධ්‍යක්ෂ (මූලස්ථාන මෙහෙයුම්) | ඩී.කේ.වී. විජේවීර මිය |
| 27 | අධ්‍යක්ෂ (ආරක්ෂක) | මේජර්. එල්.පී.ඒ. ජයවර්ධන මයා |
| 28 | අධ්‍යක්ෂ (නීති) | ආර්.එල්. රාජපක්ෂ මිය |
| 29 | නේවාසික ව්‍යාපාර කළමණාකාර ( බී කලාපය) | එස්.ටී.දන්තනාරායන මයා |
| 30 | නේවාසික ව්‍යාපාර කළමණාකාර ( සී කලාපය) | කේ.ඒ.සී.විමල් කුමාර මයා |
| 31 | නේවාසික ව්‍යාපාර කළමණාකාර ( ඩී කලාපය) | එම්.එම්.අසංක ගුණතිලක මයා |
| 32 | නේවාසික ව්‍යාපාර කළමණාකාර ( එල් කලාපය) | එච්.කේ.පී.ජයනාද මහතා |
| 33 | නේවාසික ව්‍යාපාර කළමණාකාර ( ජී කලාපය) | ඒ.එම්.එච්.බණ්ඩා මයා |
| 34 | නේවාසික ව්‍යාපාර කළමණාකාර ( එච් කලාපය) | අයි.එම්.යූ.කේ.කුමාර මහතා |
| 35 | නේවාසික ව්‍යාපාර කළමණාකාර ( වික්ටෝරියා කලාපය) | අයි.එම්.යූ.කේ.කුමාර මහතා |
| 36 | නේවාසික ව්‍යාපාර කළමණාකාර ( හුරුළුවැව කලාපය) | කේ.ඒ.ජයසිංහ මයා |
| 37 | නේවාසික ව්‍යාපාර කළමණාකාර ( රඹකැන්ඔය කලාපය) | ඒ.එම්.ඒ.පී.ජී. ගුණවර්ධන මහතා |
| 38 | නේවාසික ව්‍යාපාර කළමණාකාර ( වලව කලාපය) | ආර්.බී. සිරිසේන මයා |

# 2016 වසර සඳහා අධ්‍යක්ෂ ජනරාල්වරයාගේ සමාලෝචන සටහන

මහවැලි සංවර්ධන බහුකාර්යය යෝජනා ක්‍රමය ක්‍රියාත්මක කිරීම සඳහා 1979 අංක 23 දරණ පනතින් ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය ස්ථාපිත කරන ලදී. ශ්‍රී ලංකා භූමි ප්‍රමාණයෙන් 1/3 ක භූමි ප්‍රදේශයක් පුරා ව්‍යාප්තව පවතින මහවැලි බල ප්‍රදේශ තුල වාසය කරන ජනගහනය 860,000 ක් ඉක්මවා සිටී. මහවැලි සංවර්ධන වැඩසටහනේ ආරම්භක අරමුණු අතර වියළි කලාපයේ වගාව සඳහා ජලය සැපයීමෙන් බත බුලතින් රට සශ්‍රීක කිරීම, විදුලි බල නිෂ්පාදනය වැඩිකිරීම, ජනාවාසකරණය ආදී අරමුණු ඇතුලත් විය. වර්තමානය වන විට එම අරමුණු වලින් ඔබ්බට ගොස් කෘෂිකාර්මික ඵලදායීතාවය ඉහළ නැංවීම, කාර්යක්‍ෂම ජල කළමණාකරනය, වාරි පද්ධති හා ඒ ආශ්‍රිත යටිතල පහසුකම් කාර්යක්ෂමව පවත්වාගෙන යාම, මෙහෙයුම් හා නඩත්තු කටයුතු අකණ්ඩව සිදු කිරීම හා සූර්ය බලශක්ති නිෂ්පාදනය ඇතුළුව මහවැලි සංවර්ධන සැලැස්මේ ඇතුලත් මොරගහකන්ද කළු ගඟ සංවර්ධන ව්‍යාපෘතිය ,වයඹ ඇල සංවර්ධන ව්‍යාපෘතිය, උතුරුමැද ඇල ව්‍යාපෘතිය, මාදුරු ඔය දකුණු ඉවුර සංවර්ධන ව්‍යාපෘතිය, මිනිපේ ඇල සංවර්ධන ව්‍යාපෘතිය, ඉහළ ඇලහැර ඇල යන ව්‍යාපෘති වලට අමතරව වැලි ඔය රිදී මාලියද්ද හා මහවැලි “බී” කලාපයේ ඒකාබද්ධ සංවර්ධන ව්‍යාපෘති ක්‍රියාත්මක කරමින් පානිය ජලය , ගෘහස්ත පරිහරණය සඳහා ජලය , කෘෂිකර්මාන්තය හා කර්මාන්ත සඳහා ජලය සැපයීමත්, රටේ ආහාර අවශ්‍යතාවය සැපයීමත්, ආයෝජන දිරිගැන්වීම, අපනයන බෝග දිරිගැන්වීම වැනි අරමුණු දක්වා විකාශනය වී ඇත.

2016 වර්ෂයේ ජාතික වාරි ප්‍රතිපත්තියට අනුකූලව ජල සම්පත් සංරක්ෂණය, වාරිමාර්ග හා යටිතල පහසුකම් වැඩිදියුණු කිරීම හා නවීකරණය, ජලපෝෂක ප්‍රදේශ සංරක්ෂණය, මහවැලි ආයතන ප්‍රති සංවිධානය, මහවැලි ගොවි සංවිධාන හා ගොවි ප්‍රජාවගේ ආර්ථික හා සමාජීය සංවර්ධනය අපේක්ෂා කරන ලදී. තවද යුද්ධය හේතුවෙන් දේපල අහිමිවීම් හා අවතැන් වීම් බහුලව පැවති මහවැලි “එල්” කලාපය විශේෂ ව්‍යාපෘතියක් හරහා සංවර්ධනය කිරීම තවදුරටත් ක්‍රියාත්මක කරන අතර දිළිඳුම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයක් වූ රිදීමාලියද්ද ප්‍රාදේශීය ලේකම් බල ප්‍රදේශය ආවරණය වන පරිදි ඒකාබද්ධ සංවර්ධන ව්‍යාපෘතියක් මගින් එම ප්‍රදේශයේ යටිතල පහසුකම්, කෘෂිකර්මාන්ත , පානීය ජල පහසුකම් හා සනීපාරක්ෂක වැසිකිලි පහසුකම් සංවර්ධනය කිරීමද අකණ්ඩව සිදු කරන ලදී. දැනට ක්‍රියාත්මක ලෝක බැංකු හා ආසියානු සංවර්ධන බැංකු ව්‍යාපෘති අතර දේශගුණික බලපෑම් අවම කිරීමේ ව්‍යාපෘතිය, මහවැලි ජල සුරක්ෂිතතා ව්‍යාපෘතිය වැනි ව්‍යාපෘති රැසක් තුලින් මහවැලි ප්‍රජාවගේ ජල අවශ්‍යතාවය සැපයීම, ඇල වේලි පද්ධතිය ශක්තිමත් කිරීම, කැඩිබිඳී ගිය වාරිපද්ධති පුනරුත්ථාපනය කිරීම, කෘෂිකාර්මික ඵලදායීතාවය වැඩිදියුණු කිරීම වැනි කාර්යයන් රැසක් ක්‍රියාත්මක විය.

ජල විදුලිය 2286 Gwh නිපදවීමේ ක්‍රියාන්විතයේදී ඉන් 17% ක මහවැලි ජලදායකත්වයක් ලබාදීමට මහවැලි අධිකාරියට හැකිවිය. තවද කුඩා පරිමාණ ජල විදුලි බලාගාර තුලින් 59.3 Gwh නිපදවීමට ද හැකිවිය.
රටේ ආහාර අවශ්‍යතාවය සැපයීම සඳහා වී නිෂ්පාදනයෙන් 22%, සෝයා 90%, බී ළූනු 34%, බඩඉරිඟු 06% ,උඳු 05% ,මුං 08% ,කව්පි 08%, රටකජු 04% මිරිස් (අමු) 10%, දියර කිරි නිෂ්පාදනය 07% හා මිරිදිය මත්ස්‍ය නිෂ්පාදනය 15% ක් ලෙස ජාතික නිෂ්පාදනයට එක් කිරීමට හැකිවීම ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය ලැබූ සුවිශාල ජයග්‍රහණයකි. තවද මහවැලි ගොවිසංවිධාන 1007 ක් පරිපාලනය කරමින් ක්‍රියාත්මක කරන ලද සහභාගිත්ව වාරිපද්ධති කළමණාකරන වැඩසටහන තුලින් බෙදුම් ඇල හා කෙත් ඇල පද්ධති පුනරුත්ථාපනය කිරීමට හැකිවීමෙන් ඒ වෙනුවෙන් දැරිය යුතු රාජ්‍ය වියදම් අවම කිරීමට ද හැකිවිය.

උක්ත සංවර්ධන ඉලක්කයන් සපුරා ගැනීම සඳහා මාර්ගෝපදේශකත්වය සැපයූ විෂයභාර ගරු අමාත්‍යතුමන් වන අතිගරු ජනාධිපතිතුමන් හා ගරු රාජ්‍ය අමාත්‍යතුමන් මෙන්ම අධ්‍යක්ෂ මණ්ඩලයට හා උනන්දුවෙන් හා කැපවීමෙන් කටයුතු කල ශ්‍රී ලංකා මහවැලි අධිකාරියේ කාර්යය මණ්ඩලයට ද මාගේ කෘතඥතාවය පල කිරීමට මෙය අවස්ථාවක් කර ගනිමි.



ආචාර්ය ඩී.එම්.එස්.දිසානායක,
අධ්‍යක්ෂ ජනරාල්,
ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය.

## අධ්‍යක්ෂ මණ්ඩල සංෂිප්ත සටහන

ශ්‍රී ලංකා මහවැලි අධිකාරියේ අධ්‍යක්ෂ මණ්ඩල වාර්තාව 2016-12-31 දිනට සංවිධානයේ විගණනය කරනු ලැබූ මූල්‍ය ප්‍රකාශන සමග කාරුණිකව ඉදිරිපත් කරමු.

<u>වර්ෂය පිළිබඳ සමාලෝචනය</u>

අධ්‍යක්ෂ ජනරාල් විසින් ඉදිරිපත් කර ඇති සමාලෝචනයේ 2016 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය තුල සිදුකරන ලද සංවිධානයේ මෙහෙයුම් පිලිබඳ සවිස්තර ප්‍රකාශයක් අන්තර් ගත කර ඇත.

එසේම සංවිධානයේ වත්කම් , සුරැකීම ,වංචා ,දූෂණ හා වෙනත් අක්‍රමිකතා සොයා බැලීම සහ අවදානම් අවම කිරීමේ අරමුණින් අභ්‍යන්තර පාලනය පිලිබඳ මනා කළමණාකාරිත්වයකින් කටයුතු කර ඇත.

තවද ශ්‍රී ලංකා මහවැලි අධිකාරියේ සියළුම කාර්ය මණ්ඩලය විසින් ඔවුන් වෙත පැවරි ඇති කාර්යයන් ඉටු කිරීමේදී දක්වා ඇති ඉමහත් කැපවීම පිලිබඳ අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයින් වශයෙන් අපගේ ප්‍රශංසාව මෙයින් පල කරමු.

ඉංජි. ආර්. එම්. ඩබ්. රත්නායක මහතා
ලේකම්
වාරිමාර්ග සහ ජලසම්පත් කළමනාකරණ අමාත්‍යාංශය

ඉංජි. වයි. අබ්දුල් මජීඩ් මහතා
අධ්‍යක්ෂ ජනරාල්
වාරිමාර්ග දෙපාර්තමේන්තුව

තිලක් බණ්ඩාර මහලේකම් මහතා

එම්. ඩී. ජේ. සී. මුරගේ මහතා
සහකාර අධ්‍යක්ෂ
වෙළඳ සහ ආයෝජන ප්‍රතිපත්ති දෙපාර්තමේන්තුව

ඉංජි.එස් .එස්. එල් .වීරසිංහ
අධ්‍යක්ෂ ජනරාල්
වාරී මාර්ග දෙපාර්තමේන්තුව

# 2016 විගණන කමිටු වාර්තාව

ශ්‍රී ලංකා මහවැලි අධිකාරියේ විගණන කමිටුව අධ්‍යක්ෂ මණ්ඩලයේ විධායක නොවන අධ්‍යක්ෂවරු තිදෙනෙකුගෙන් සමන්විත වන අතර, එහි සභාපතිත්වය මහා භාණ්ඩාගාරය නියෝජනය කරන අධ්‍යක්ෂවරයා විසින් දරනු ලබයි.

**වර්ෂය තුළ විගණන කමිටු සාමාජිකත්වය**

- එම්. ඩී. ජේ. සී. මුරගේ මහතා - කමිටු සභාපති - භාණ්ඩාගාර නියෝජිත
- ඉංජී. ආර්. එම්. ඩබ්. රත්නායක මයා - සාමාජික
- තිලක් බණ්ඩාර මහලේකම මයා - සාමාජික

**කමිටුව සඳහා සහභාගිත්වය**

- නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල් (පාලන හා මුදල්)
- අධ්‍යක්ෂ (මුදල්)
- ප්‍රධාන අභ්‍යන්තර විගණක
- විගණකාධිපතිවරයා නියෝජනය කරමින් රජයේ විගණන නිලධාරිවරයෙකු
- අවශ්‍යතාවය අනුව කැඳවුම් ලබන අනෙකුත් අදාල නිලධාරීන්

**කමිටුවේ කාර්යභාරය**

❖ අභ්‍යන්තර පාලන ක්‍රියාදාම සුපරීක්ෂාව, සමාලෝචනය හා අවශ්‍ය අවස්ථාවන්හිදී ප්‍රතිසංවිධානය කිරීම හා වාර්ෂික විගණන සැලසුම් අනුමත කිරීම.

❖ අභ්‍යන්තර විගණන වාර්තා සමාලෝචනය කිරීම, ගැටළු පරීක්ෂා කිරීම සංශෝධන ඇති කරමින් නිවැරදි කිරීම් සිදුකිරීම සඳහා පියවර ගැනීම.

❖ 1971 අංක 38 දරණ මුදල් පනතේ 142(ඇ) අනු වගන්තිය ප්‍රකාරව විගණකාධිපතිවරයා විසින් මතු කර ඇති කරුණු විමසා බැලීම.

❖ ආයතනික කාර්ය සාධන වාර්තා කාර්තුමය වශයෙන් සමාලෝචනය හා සැසඳීම.

**අභ්‍යන්තර විගණන අංශය**

ආයතනය තුළ ඵලදායි කාර්යසාධනයක් තහවුරු කිරීම සඳහා මූල්‍ය විගණනය, පද්ධති විශ්ලේෂණය හා කාර්යසාධන විශ්ලේෂණය හා විශේෂ විමර්ශන සිදු කිරීම අරමුණු කර ගනිමින් ශ්‍රී ලංකා මහවැලි අධිකාරියේ පිහිටුවා ඇති අභ්‍යන්තර විගණන අංශය 2016 වර්ෂය තුල විගණන කමිටු උපදෙස් පරිදි අභ්‍යන්තර විගණන සැලැස්මක් ඔස්සේ අධිකාරියේ අභ්‍යන්තර විගණන කටයුතු ක්‍රියාත්මක කළ අතර අකාර්යක්ෂම ක්‍රියාපිළිවෙත් පිටුදකිමින්, අභ්‍යන්තර පාලනය වැඩි දියුණු කරමින්, වංචා දූෂණ සිදුවිය හැකි අවස්ථා අවම කරමින් කටයුතු කිරීම සඳහා මෙම අංශය තුලින් පද්ධති විගණන ක්‍රමවේදයක් ක්‍රියාවට නැංවීමට කටයුතු කර ඇත.

**2016 වර්ෂය තුළ අත්කරගත් ප්‍රගතිය**

- අභ්‍යන්තර විගණන සැලැස්ම යටතේ වර්ෂය තුළ විගණන වාර්තා 21 ක් නිකුත් කිරීම.
- විමර්ශන 11 ක් පවත්වා විමර්ශන වාර්තා ලබා දීම.
- විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම් 04 ක් පැවැත්වීම.

**නිර්දේශය:**

ඉහත කරුණු වලදී හඳුනාගත් ගැටළු නිවැරදි කිරීමට උපදෙස් දෙමින් කමිටුව විසින් සැපයූ නිර්දේශ මත කළමනාකාරීත්වය විසින් ආයතනයේ නිවැරදි කිරීම් සිදුකිරීමට පියවර ගෙන ඇත.

# ඉකුත් වසර 07ක වත්කම් හා වගකීම්

| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| | | | | | | | |
| | **2016** | **2015** | **2014** | **2013** | **2012** | **2011** | **2010** |
| | (රු 000 | (රු 000 | (රු 000 | (රු 000 | (රු 000 | (රු 000 | (රු 000 |
| **<u>වත්කම්</u>** | | | | | | | |
| **<u>ජංගම නොවන වත්කම්</u>** | | | | | | | |
| දේපල යන්ත්‍රෝපකරණ හා උපකරණ | 4,195,724 | 4,294,893 | 4,259,208 | 4,549,301 | 3,733,498 | 4,011,792 | 5,325,181 |
| අනෙකුත් මූල්‍ය වත්කම් | | | | | | | 59,848,291 |
| නොනිමි වැඩ | 41,301 | 74,286 | 62,506 | 48,362 | 12,821 | | 2,940,429 |
| ආයෝජන | 178,556 | 152,577 | 175,359 | 166,731 | 135,392 | 135,392 | 124,801 |
| ජංගම නොවන වත්කම්වල එකතුව | 4,415,581 | 4,521,756 | 4,497,073 | 4,764,394 | 3,881,711 | 4,147,184 | 68,238,702 |
| | | | | | | | |
| ෛ◌ජව වත්කම් ප්‍රාග්ධන | 101,940 | | | | | | |
| ලියා හැරීම් | 859 | | | | | | |
| | | | | | | | |
| **<u>ජංගම වත්කම්</u>** | | | | | | | |
| තොග | 168,173 | 157,428 | 180,900 | 174,028 | 161,801 | 157,725 | 162,219 |
| ◌ෛ◌ජව වත්කම් වෙළ ඳ | 22,630 | | | | | | |
| ලැබිය යුතු (වෙළඳ හා අනෙකුත්) | 1,730,015 | 1,307,077 | 1,274,329 | 1,150,958 | 898,804 | 684,392 | 1,129,552 |
| කලින් ගෙවීම් | 8,754 | 5,172 | | 38 | 1,548 | 19,470 | 4,209 |
| බැංක සුරැකුම් | 4,153 | 1,372 | 837 | 905 | 2,210 | 2,160 | 359 |
| මුදල් සහ මුදල් සමායනයන් | 312,750 | 429,588 | 190,391 | 140,950 | 121,802 | 143,521 | 209,735 |
| ජංගම වත්කම් එකතුව | 2,246,475 | 1,900,637 | 1,646,457 | 1,466,879 | 1,186,165 | 1,007,268 | 1,506,074 |
| **මුළු වත්කම්වල එකතුව** | 6,764,855 | **6,422,393** | **6,143,530** | **6,231,273** | **5,067,876** | **5,154,452** | **69,744,776** |
| | | | | | | | |
| **<u>ජංගම බැරකම්</u>** | | | | | | | |
| ගෙවියයුතු | 376,737 | 341,286 | 491,622 | 528,482 | 478,223 | 364,983 | 238,803 |
| ඒලයන්ස් මූල්‍ය සමාගම කල් බදු | 3,080 | | | | | | |
| උපචිත වියදම් | 122,286 | 46,159 | 207,705 | 87,145 | 61,525 | 47,494 | 39,385 |
| **ජංගම බැරකම් එකතුව** | **502,103** | **387,445** | **699,327** | **615,627** | **539,748** | **412,477** | **278,188** |
| | | | | | | | |
| **<u>ජංගම නොවන වගකීම්</u>** | | | | | | | |
| පාරිතෝෂිත දීමනා සදහා වෙන්කිරීම් | 1,489,288 | 1,551,379 | 1,311,876 | 1,157,688 | 1,077,205 | 1,022,674 | 1,071,471 |
| බැංකු ණය | 2,455 | | | | | | |
| විලම්බිත බදු | 612 | 612 | 612 | 612 | 612 | 612 | 1,142 |
| කල්බදු | 2,653 | 11,247 | 14,329 | 6,243 | 9,269 | | |
| **ජංගම නොවන බැරකම් වල එකතුව** | 1,495,008 | 1,563,238 | 1,326,817 | 1,164,543 | 1,087,086 | 1,023,286 | 1,072,613 |
| **මුළු බැරකම්** | 1,997,111 | 1,950,683 | 2,026,144 | 1,780,170 | 1,626,834 | 1,435,763 | 1,350,801 |
| **ශුද්ධ වත්කම් එකතුව** | 4,767,744 | 4,471,710 | 4,117,386 | 4,451,103 | 3,441,042 | 3,718,689 | 68,393,975 |
| | | | | | | | |
| | | | | | | | |
| **<u>ශුද්ධ වත්කම්</u>** | | | | | | | |
| සමුච්චිත අරමුදල | 24,066,161 | 23,702,950 | 23,383,849 | 23,224,435 | 23,116,473 | 23,009,463 | 87,422,561 |
| ආදායම් සංචිත | 52,121 | 53,992 | 67,466 | 53,560 | 53,560 | 53,560 | 65,731 |
| ප්‍රත්‍යාගන ලාභය | 4,019,027 | 4,021,721 | 3,837,266 | 3,851,627 | 3,061,097 | 3,061,146 | 3,119,639 |
| ඉ/ගෙ අදායම් හා වියදම් ශේෂය | (23,369,566) | (23,276,474) | (23,171,205) | (22,678,520) | (22,787,889) | (22,405,480) | (22,213,956) |
| **ශුද්ධ වත්කම්/හිමිකම් එකතුව** | 4,767,743 | 4,502,189 | 4,117,376 | 4,451,102 | 3,443,241 | 3,718,689 | 68,393,975 |

# ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය යටතේ ස්ථාපිත සමාගම්වල අධ්‍යක්ෂ මණ්ඩලය - 2016

| අනු අංකය | සමාගම | සභාපති | අධ්‍යක්ෂ මණ්ඩලය | ප්‍රධාන කාර්යාලීය ලිපිනය |
|---|---|---|---|---|
| 01 | සී/ස මහවැලි පශු සම්පත් හා කෘෂි ව්‍යාපාර (පුද්ගලික)සමාගම | නිමල් එන් පීරිස් මයා | 1. පරාක්‍රම අබේවර්ධන මයා<br>2. ආශා රාජකීය මිය.<br>3. එඩ්වඩ් ද මැල් මයා (අධ්‍යක්ෂ)<br>4. ඔස්මන් ද සිල්වා (අධ්‍යක්ෂ) | අංක 260/20, බේස්ලයින් පාර, කොළඹ 09 |
| 02 | සී/ස මහවැලි උපදේශන සේවා කාර්යාංශය | Dr.හර්ෂ සමරවීර මයා | 1. කේ.එල්.එස්.සහබන්දු මයා<br>2. ඉංජි එල්.ආර්.එච්.පෙරේරා | අංක 11, ජාවත්ත පාර, කොළඹ 05 |
| 03 | ස්භාවික සම්පත් කළමනාකරණ සේවා (පුද්) සමාගම | Eng.ඒ.ඒ.වී.ඩයස් මයා | 1.ඉංජි.බී.ඩබ්.එන්.ඩබ්. සෙනෙවිරත්න බණ්ඩා<br>2.එන්.එම්.කේ.බී.අත්තනායක<br>3.එල්.එම්.ධර්මසිරි මයා<br>4.එම්.ජී.අබේරත්න බණ්ඩාර(සමාගම් ලේකම්) | වෙල්ල පෙදෙස, පොල්ගොල්ල, මහනුවර |

# පාලන වාර්තාව

## I කොටස

## පළමු පරිච්ඡේදය

## ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය පිහිටුවීම.

## එහි සංයුතිය

1979 අංක 23 දරණ පනතින් ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය පිහිටුවා ඇති අතර එකී පනතේ 12 වන වගන්තිය යටතේ යම් විශේෂිත ප්‍රදේශයක හෝ විශේෂ ප්‍රදේශයක් සම්බන්ධයෙන් අධිකාරියෙහි කර්තව්‍ය පහත සඳහන් පරිදි පැහැදිලි කර ඇත.

(අ) ජලාශ, වාරිමාර්ග බෙදාහැරීමේ ක්‍රම සහ විදුලි බලය නිපදවීම සහ සැපයීම සඳහා වූ යාන්ත්‍රස්ථාන ඉදිරිකිරීම සහ මෙහෙයවීම ඇතුළු මහවැලි ගඟ සංවර්ධන යෝජනා ක්‍රමය සැලසුම් කිරීම සහ ක්‍රියාවට නැගීම.

එසේ වුවද විදුලි බලය බෙදාහැරීමට අදාළ කර්තව්‍ය වෙනත් යම් ලිඛිත නීතියක් යටතේ එසේ කිරීමට බලය ඇති වෙනත් යම් අධිකාරියක් විසින් ද කරනු ලැබිය හැකිය.

(ආ) පූර්ණ හා ඒකාග්‍ර සංවර්ධනයට ප්‍රතිෂ්ඨාධාරවීම සහ ඒම සංවර්ධන සුරක්ෂිත කිරීම.

(ඇ) කෘෂිකාර්මික ඵලදායී වර්ධනය සහ සේවා නියුක්ති හැකියාවන් උපරිම තත්වයට පත් කිරීම සහ කෘෂි ආර්ථික සංවර්ධනය ඇති කිරීම හා සුරක්ෂිත කිරීම.

(ඈ) භෞතික පරිසරය සංරක්ෂණය කිරීම හා පවත්වාගෙන යාම.

(ඉ) ජනතා පොදු සුභසාධනය හා සංස්කෘතික ප්‍රගතිය දියුණුකිරීම සහ පරිපාලනය කිරීම.

(ඊ) අභ්‍යන්තර සහ බාහිර පෞද්ගලික ප්‍රාග්ධනය කෘෂිකාර්මිකසංවර්ධනයෙහි යෙදවීම, ප්‍රවර්ධනය හා සුරක්ෂිත කිරීම.

(උ) මහවැලි ගඟ සංවර්ධන යෝජනා ක්‍රමය සැලසුම් කිරීමේ දි සහ ක්‍රියාවට නැංවීමේ දි රාජ්‍ය දෙපාර්තමේන්තු , රාජ්‍ය ආයතන පළාත් පාලන ආයතන , රජයේ සංස්ථා , ව්‍යවස්ථාපිත ආයතන , පෞද්ගලික හෝ වෙනත් තැනැත්තන්ගේ සහයෝගය ලබා ගැනීම සහ සුරක්ෂිත කිරීම.

## 1.0 ශ්‍රී ලංකා මහවැලි අධිකාරියේ කර්තව්‍යයන්

අධ්‍යක්ෂ ජනරාලවරයා විසින් ශ්‍රී ලංකා මහවැලි අධිකාරියේ එක් එක් විෂය ක්ෂේත්‍රයන් යටතේ ස්ථාපිත කර ඇති ව්‍යාපෘති හා ක්ෂේත්‍ර කාර්යාලයන්හි කටයුතු සම්බන්ධීකරණය නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල්වරුන්,අධ්‍යක්ෂවරුන්, ව්‍යාපෘති අධ්‍යක්ෂවරුන් හා නේවාසික ව්‍යාපාර කළමනාකාරවරුවන් මගින් සිදුකරනු ලැබේ.

ඒ අනුව පහත සඳහන් කර්තව්‍යයන් ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය විසින් ඉටුකර ඇත.

- සංයුක්ත සැලැස්ම හා වාර්ෂික ක්‍රියාකාරි සැලැස්ම අනුව ආයතනයේ ප්‍රගතිය මාසිකව විමර්ශනය කොට අවශ්‍ය මැදිහත්වීම මගින් නියමිත ඉලක්ක සපුරා ගැනීම
- වත්කම් නඩත්තුව හා පරිපාලකය පිළිබඳ නිසි සැලැස්මක් අනුව කටයුතු කිරීම තුලින් වත්කම් අපහරණය කිරීම
- කාලරාමුවකට අනුව මොරගහකන්ද , කළුගඟ ජලාශය හා කිවුල් ඔය ජලාශය ඉදිකිරීම
- B කලාපය දකුණු ඉවුර හා L කලාපය වාරි බිම් ප්‍රමාණය වැඩිකර ගැනීම සඳහා ප්‍රදේශ හඳුනාගෙන මූලික පරිසර අධ්‍යනයන් සිදුකිරීම
- කෘෂිකාර්මික සහාය සේවා ප්‍රවර්ධනය, කෘෂිකාර්මීක ප්‍රවර්ධනය හා ආදායම් උත්පාදනය, වැඩසටහන් දියුණු කිරීම හා රටේ ආහාර සුරක්ෂිතතාවය ඇති කිරීම.
- වාරි පද්ධති නඩත්තුව හා කළමණාකරනය ගොවි සංවිධානවලට පැවරීමට හැකිවන පරිදි ගොවි සංවිධාන ශක්තිමත් කිරීම පිළිබඳ නිළධාරින් හා ගොවි නියෝජිතයන් බල ගැන්වීම
- "සමෘද්ධිමත් දැයකට මහවැලි සත්ත්ව නිපැයුම්" තේමාව යටතේ මහවැලි ජානපදික ප්‍රජාවගේ ජීවනෝපාය සංවර්ධනයට පශුසම්පත් ක්ෂේත්‍ර බලගැන්වීම.
- කෘෂිකාර්මික ඉඩම් සීමිත සම්පතක් වන මහවැලි ජානපදිකයින්ගේ දෙවන, තෙවන පරම්පරාවල ආර්ථීක සංවර්ධනය හා රැකියා ජනනය උදෙසා සාම්ප්‍රදායික කෘෂිකර්මාන්තයෙන් බැහැර වූ රැකියා ආයෝජන ව්‍යාපෘති සඳහා යොමු කිරීම හා මග පෙන්වීම.
- සියළුම මට්ටම් වල නිලධාරින් හා සේවකයින්ගේ ධාරිතා සංවර්ධනය සඳහා කටයුතු කිරීම හා කාර්යය මණ්ඩල තොරතුරු පරිඝනක ගත කර ඊ මානව සම්පත් කළමණාකරණ පද්ධතියක් හඳුන්වාදීමට කටයුතු කිරීම
- රේඛිය ආයතන සමග සාකච්ජා කරමින් කන්න මෙහෙයුම් සැලසුම් ක්‍රියාවලිය තුලින් ප්‍රධාන ජලාශ මගින් වාරිමාර්ග ජනාවාස ව්‍යාපෘති ප්‍රධාන ජලවිදුලිබල නිෂ්පාදනය, හා ගෘහස්ථ ජල විදුලිබලය හා ගෘහස්ථීත ජලසම්පාදනය සඳහා ජලය වෙන්කරදීම.
- බී, සී, එච්, එල්, ඩී, මොරගහකන්ද, හුරුළුවැව , වලවේ, වික්ටෝරියා සහ නව කලාපයක් ලෙස ප්‍රකාශයට පත් කරන ලද රඹුක්කන්ඔය යන ව්‍යාපෘති වල භෝග විවිධාංගිකරණය , සමාජආර්ථික සංවර්ධනය රැකියා උත්පාදනය සඳහා කටයුතු කිරීම.
- ජල කළමණාකරනය , මානව සම්පත් සංවර්ධනය , පශු සම්පත් සංවර්ධනය, කෘෂිකාර්මික සංවර්ධනය, පස සහ ජලය සංරක්ෂණය දියබෙත්මකළමණාකරනය, පාරිසරික දූෂණය හා ජලදූෂණය පිළිබඳ ප්‍රජාව දැනුවත් කිරීම.
- ප්‍රධාන ජලාශ වල හැරවුම් නිර්මිත සුරක්ෂිතාවය සිදුකිරීම සඳහා සඵලදායි මෙහෙයුම් නඩත්තු වැඩසටහන් සැකසීම ක්‍රියාත්මක කිරීම හා ඒ තුලින් ගොවි සංවිධාන දැනුවත් කිරීම.

## ශ්‍රී ලංකා මහවැලි අධිකාරියේ පරිපාලන ව්‍යුහය

**අධ්‍යක්ෂ ජනරාල්** → **අතිරේක අධ්‍යක්ෂ ජනරාල්**

**නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල් (තාක්ෂණ සේවා)**

- අධ්‍යක්ෂ - මූලික වැඩ පාලන ක්‍රි.ක. හා න.ඒ.
- අධ්‍යක්ෂ - ඉංජිනේරු නිර්මාණ
- අධ්‍යක්ෂ - පහළ නිම්න සංවර්ධන
- අධ්‍යක්ෂ - ගංගාද්‍රෝණි කළමණාකරණ
- අධ්‍යක්ෂ - වන හා පරිසර
- අධ්‍යක්ෂ - ඉඩම් පරිහරණ සැලසුම්
- අධ්‍යක්ෂ - ජල කළමණාකරණ ලේකම් කාර්යාලය

**නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල් (පාලන හා මුදල්)**

- අධ්‍යක්ෂ - පිරිස් හා පාලන
- අධ්‍යක්ෂ - මුදල්
- අධ්‍යක්ෂ - නීති
- අධ්‍යක්ෂ - මහවැලි කේන්ද්‍රය
- අධ්‍යක්ෂ - මහවැලි ආරක්ෂක බලකාය

**නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල් (සංවර්ධන)**

- අධ්‍යක්ෂ - ඉඩම්
- අධ්‍යක්ෂ - කෘෂිකර්ම
- අධ්‍යක්ෂ - ආයතන සංවර්ධන
- අධ්‍යක්ෂ - ව්‍යාපාර සංවර්ධන
- අධ්‍යක්ෂ - පශු සම්පත් සංවර්ධන

නේවාසික ව්‍යාපාර කළමණාකරුවන්
බී, සී, ඩී, එච්, එල්, මොරගහකන්ද,
වික්ටෝරියා, රඹකැන්ඔය, හුරුළුවැව, වලව
මහවැලි කලාප

- අධ්‍යක්ෂ - අභ්‍යන්තර විගණක
- අධ්‍යක්ෂ - සැලසුම් හා මෙහෙයුම්
- අධ්‍යක්ෂ - මූලස්ථාන මෙහෙයුම්

## 1.2 මහවැලි කලාප-ව්‍යුහය හා පරිපාලනය

මහවැලි ගංගා ද්‍රෝණි සංවර්ධන මහ සැලැස්මට අනුව ඇතිකරන ලද ජනාවාස පරිපාලනය, වාරි පද්ධති මෙහෙයවීම, නඩත්තුව හා පරිපාලනය සඳහා මහවැලි බල ප්‍රදේශ කලාප වශයෙන් පරිපාලන ඒකක 10 ක් පිහිටුවා ඇත. මහවැලි ගංගා නිම්නයට ආශ්‍රිතව B,C,D,H, මොරගහකන්ද, වික්ටෝරියා, හුරුළු වැව යන කලාපද, උඩවලව, වැලි ඔය (L කලාපය) සහ රඹකැන්ඔය කලාප වැනි විශේෂ කලාපද, මෙසේ ආරම්භ කර ඇත.

මහවැලි කලාප වල හා විශේෂිත ප්‍රදේශයන්හි සංවර්ධනය හා කළමණාකරණ කර්තව්‍යයන් නේවාසික ව්‍යාපාර කළමණාකරුවන්ගේ බලතල යටතට පවරා ඇත. නේවාසික ව්‍යාපාර කළමණාකරුවන් සෘජුවම අධ්‍යක්ෂ ජනරාල් හා අතිරේක අධ්‍යක්ෂ ජනරාල් වෙත වගකිව යුතු අතර, නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල්වරුන්ගේ අධීක්ෂණය යටතේ කලාප මට්ටමින් සිදුවිය යුතු කාර්‍ය්‍යයන් සඳහා ප්‍රධාන කාර්යාලයෙන් එක් එක් විෂය ක්ෂේත්‍රය සඳහා පත්කර ඇති අධ්‍යක්ෂවරුන්ගේ සහාය ලබා දෙනු ඇත.

එසේම සෑම කලාපයකටම ප්‍රධාන විධායක නිලධාරිවරයා නේවාසික ව්‍යාපාර කළමණාකරු වන අතර තාක්ෂණ , ඉඩම් , කෘෂිකර්ම හා සංවර්ධන ක්ෂේත්‍රයන් සඳහා අධීක්ෂණ නිලධාරින් ලෙස නියෝජ්‍ය නේවාසික ව්‍යාපාර කළමණාකාරවරුන් අනුයුක්ත කර ඇත. ඒකක කිහිපයකට එක් කොට්ඨාශ කළමණාකාර කාර්යාලයක් ද එම කාර්යාලයේ එක් එක් විෂය ක්ෂේත්‍රය සඳහා කොට්ඨාශ කළමණාකාරවරුන්ගේ සෘජු අධීක්ෂණය යටතේ වාරිමාර්ග ඉංජිනේරුවරයෙකු , ආයතන සංවර්ධන නිලධාරිවරයෙකු , කෘෂිකර්ම නිලධාරිවරයෙකු හා ඉඩම් නිලධාරිවරයෙකු ස්ථාන ගත කර ඇත. එම සියළුම නිලධාරින් ගේ අධීක්ෂණය යටතේ සියළුම විෂය ක්ෂේත්‍රයන්ගේ රාජකාරි ඉටුකිරිම හා එක් ඒකකයකට එක් ඒකක කළමණාකාරවරයෙකු බැගින් ස්ථාන ගත කොට ඇත. මෙම ඒකකයක් සාමාන්‍යයෙන් පවුල් **250-300** අතර ප්‍රමාණයක ඉඩම් ලාභීන් පිරිසක් පදිංචි කිරිම සිදුකර ඇත.

මහවැලි කලාපයන්හි ඉඩම් පරිපාලනය සිදු කරනු ලබන්නේ ඉඩම් සංවර්ධන ආඥා පනත හා රජයේ ඉඩම් ආඥා පනත ප්‍රමුඛ කරගත් රජයේ ඉඩම් ප්‍රතිපත්තියට අනුවය. රජයේ ඉඩම් සංවර්ධන කටයුතු සඳහා බැහැර කිරීමේ සිට ප්‍රධාන පත්‍ර නිකුත් කිරීම දක්වා මූලික කටයුතු එම ඉඩම් වලට අදාළ .පසු කටයුතුද සිදු කරනු ලැබේ. මීට අමතරව වානිජ හා ආයෝජන කටයුතු සඳහා ඉඩම් බදු පදනම මත, බැහැර කිරීමට අදාළ මූලික කටයුතු සිදුකරනු ලබන්නේද , මුල් ජානපදිකයන්ට අමතරව දෙවන, තුන්වන පරම්පරාවට ඉඩම ලබා දීමද කලාප කාර්යාල තුළින් සිදු කෙරේ.

එසේම වාරි ජල කළමණාකරනය, ආයතනික සංවර්ධනය මගින් වාරි පද්ධති නඩත්තුව , කළමනාකරණය, හා වැඩි දියුණු කිරීමද කෘෂිකාර්මික සංවර්ධනය යටතේ බීජ නිෂ්පාදනය, ගොවිපළ සංවර්ධනය , පුහුණු හා ආදර්ශ කටයුතුද, පශු සම්පත්, ධීවර හා පරිසර සංරක්ෂණ කටයුතු, ව්‍යාපෘති සංවර්ධනය, කුඩා හා මධ්‍ය පරිමාණ ණය වැඩසටහන් ක්‍රියාවට නැංවීම , වානිජ කෘෂි ව්‍යාපාර මෙහෙයවීම, කෘෂි කර්මාන්ත හා සම්බන්ධ ස්වයං රැකියා වැඩසටහන් ක්‍රියාවට නැංවීමද කලාපිය පරිපාලනය යටතේ සිදු කෙරේ.

## 1. 3 අධ්‍යක්ෂ ජනරාල්ගේ සෘජු අධීක්ෂණය යටතේ කළමණාකරනය වන අංශ

- මූලස්ථාන මෙහෙයුම් අංශය
- සැලසුම් හා මෙහෙයුම් අංශය
- අභ්‍යන්තර විගණන අංශය

### 1. 3. 1 මූලස්ථාන මෙහෙයුම් අංශය

**කාර්යභාරයන්**

- ශ්‍රී ලංකා මහවැලි අධිකාරියේ අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් පැවැත්වීම් හා එහි කාර්යයන් සම්බන්ධ සියලු අදාළ සියලු කටයුතු මෙහෙයවීම.

- ආයතනයට ලැබෙන තැපැල සම්බන්ධීකරණය, කළමණාකරණය හා පසු විපරම.

- අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් පවත්වනු ලබන සියලුම අභ්‍යන්තර හා බාහිර රැස්වීම්, සම්මන්ත්‍රණ ආදිය සැලසුම් කිරීම හා මෙහෙයවීම.

- කලාපිය , ජාතික හා ජාත්‍යන්තර සම්මන්ත්‍රණ වලට අදාළ කටයුතු හා විදේශ ආධාර දූත මණ්ඩල පැමිණීම් වලට අදාල සංවිධානය කිරීම හා මෙහෙයවීම.

- විදේශීය ශිෂ්‍යත්ව, සම්මන්ත්‍රණ හා වැඩමුළු සඳහා නාම යෝජනා ඉදිරිපත් කිරීම හා ඊට අදාළ සම්බන්ධීකරණ කටයුතු.

- ශ්‍රී ලංකා මහවැලි අධිකාරියේ කාර්යභාරයන්ට අදාළ පාර්ලිමේන්තුව, ජනාධිපති කාර්යාලය, මුදල් අමාත්‍යාංශය, ඇතුලු අනෙකුත් සියලු අමාත්‍යාංශ දෙපාර්තමේන්තුව, ජාත්‍යන්තර ආයතන ආදී සියලුම ආයතන සම්බන්ධීකරණය.

- අමාත්‍ය මණ්ඩල සංදේශ, කෙටුම්පත් ඉදිරිපත් කිරීම හා අමාත්‍ය මණ්ඩල අනුමැතීන් වලට අනුව ක්‍රියා කිරීම.

- දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කටයුතු ඉටු කිරීම, ප්‍රාදේශීය හා ව්‍යාපෘති ප්‍රසම්පාදන කටයුතු වල තීරණ තහවුරු කිරීම.

- විධායක කළමනාකරණ / විගණන කළමනාකරණ කමිටු රැස්වීම් සම්බන්ධීකරණය, ලේඛණ ගත කිරීම හා තීරණ දැනුම් දීම.

- විශේෂ ව්‍යාපෘති සම්බන්ධ ව්‍යාපාර මෙහෙයුම් කමිටු පැවැත්වීමට අදාල සම්බන්ධීකරණය

## 1 .3. 2 සැලසුම් හා මෙහෙයුම් අංශය

- ආයතයයේ දැක්ම හා මෙහෙවරට අනුව සංයුක්ත ක්‍රියාකාරි සැලැස්මක් සැකසීම හා වාර්ෂික සැලැස්ම අනුව කටයුතු කිරිම.
- විශේෂ ව්‍යාපාති වාර්තා සැකසීම හා ආර්ථික සමාජීය සමීක්‍ෂණ හා විශ්ලේෂණ සිදුකිරිම.
- ක්‍රියාකාරි සැලැස්මේ සහ ව්‍යාපෘති වාර්තාවල ඇති ප්‍රගතිය මාසිකව , ත්‍රෛයිමාසිකව හා වාර්ෂිකව සමාලෝචනය කිරිම , ව්‍යපෘති ඇගයීම් සම්බන්ධිකරණය හා මෙහෙයුම් ඇගයීම් පද්ධතියක් සහතික කිරිම.
- තාක්‍ෂණ වාර්තා , ශක්‍යතා වාර්තා මෙහෙයුම් සහ ඇගයීම් වාර්තා සංරක්‍ෂණය හා භාවිතයට ලබා දිම.
- මහවැලි පරිඝණක ජාලය මෙහෙවීම හා නඩත්තුව හා නිල වෙබ් අඩවිය ස්ථාපිත කිරිම, යාවත්කාලීන කිරිම හා තොරතුරු තාක්‍ෂණ සහාය සැපයීම.
- බලපෑමට ලක්වන ක්‍ෂේත්‍ර පිලිබඳ අධ්‍යනයන් සම්බන්ධිකරණය කිරිම

## 1. 3. 3 අභ්‍යන්තර විගණන අංශය

- ශ්‍රී ලංකා විගණන ප්‍රමිතීන් , යහ පාලනය සඳහා වූ පොදු ව්‍යාපාර ප්‍රතිපත්ති චක්‍රලේඛන, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදි ජනරජයේ මූල්‍යමය විධිවිධාන හා මුදල් සහ ප්‍රතිපත්ති සැලසුම් අමාත්‍යාංශයේ අභ්‍යන්තර විගණන ප්‍රතිපත්ති සහ නීතිරීති .ව්‍යවස්ථා හා කලමණාකරණ තිරණ වලට අනුකූලව අභ්‍යන්තර විගණන විෂය පථය සකස් කිරිම.
- ශිල්පීය හෝ ගිණුම්කරණ දෘෂ්ටි කෝණයකින් මෙන්ම කලමණාකරන දෘෂ්ටි කෝණයකින් ද යුතුව ආයතනයේ මෙහෙයුම් කාර්යයන් පිරික්සා බැලීම, විගණනය හා වාර්තා කිරිම.
- වැඩ යෝජනා ක්‍රම හා ව්‍යාපෘති වල ප්‍රගතිය සහ ඒ පිලිබඳ වැඩසටහන් නියමිත කාල රමුව තුල කොතෙක් සාක්ෂාත් කර ගැනීමට කටයුතු කර ඇත් දැයි නිරන්තරව ඇගයීම් කිරිම.
- අදාළ කාලවකවානුව තුල සිදුකල යුතු වැඩ ක්‍රියාත්මක වීම ප්‍රමාද වීමට තුඩු දෙන ගැටළු සහගත ක්‍ෂේත්‍රයන් පිලිබඳව යාවත්කාලීනව ස්ථානීය විමර්ශනයන් පැවැත්වීම.
- මෙහෙයුම් කාර්යයන් අධීක්‍ෂණය කිරිමෙහිලා භාවිතා කරනු ලබන කලමණාකරන ක්‍රමවේදය සහ පාලනයන් ඇගයීම හා සමාලෝචනය කිරිම.

# දෙවන පරිච්ඡේදය

# තාක්ෂණ සේවා අංශය

## 2.0 කාර්යභාර්යන්

1. සංයුක්ත සැලැස්ම/වාර්ෂික සැලැස්මට අනුව නව අංශයකින් අරමුණු සාක්ෂාත් කර ගැනීම සඳහා උපාය මාර්ගික සැලසුම් සකස් කිරීම.
2. තාක්ෂණික සැලසුම් හා ඇස්තමේන්තු සැකසීම සඳහා මගපෙන්වීම හා මෙහෙයවීම.
3. ප්‍රධාන වෙලි හා ජල හැරවුම් මාර්ග හා පහළ නිම්න ප්‍රදේශයේ වාරි පද්ධතිය ඇතුළු භෞතික සම්පත් නිසි පරිදි නඩත්තු කර ආරක්ෂාව තහවුරු කිරීම සඳහා සුදුසු ක්‍රියාවලියක් සැකසීම.
4. ජලාශ හා වාරිපද්ධති හරහා කෘෂිකාර්මික කටයුතු හා අනෙකුත් අවශ්‍යතා සඳහා ඇති ජල ප්‍රමාණය නිසි කලට සපයාදීම සඳහා විධිමත් සැලසුම් පිළියෙල කිරීම.
5. ව්‍යාපෘති සැලසුම් කිරීම ශක්‍යතා ඇගයීම, මෙහෙයවීම හා ප්‍රගතිය සමාලෝචනය.

මූලික වශයෙන්ම ඉහත දැක්වූ ප්‍රධාන ක්‍රියාවලීන් ඉලක්ක කර ගනිමින් ශ්‍රී ලංකා මහවැලි අධිකාරියේ තාක්ෂණ සේවා අංශය කටයුතු කරනු ලබයි. ඒ අනුව 2016 වසර තුල මෙම අංශය මඟින් පහත සඳහන් කාර්යයන් ඉටු කර ඇත.

### 2.1 ඉංජිනේරු සැලසුම් හා නිර්මාණ

### 2.1.1 මාර්ග හා වාරි මාර්ග වැඩ

1) මැදිරිගිරිය ජලාශ අංක 2 / යාය 3 සැලසුම් කිරීම හා ඇස්තමේන්තු සකස් කිරීම
2) ඉහත ජලාශයේ පිටවාන සහ අවහැරවුම් නිර්මිතය සැලසුම් කිරිම
3) කවුඩුල්ල වම් ඉවුර ඇල හා නිර්මිත සැලසුම් කිරීම, ඇස්තමේන්තු සකස් කිරීම.
4) කන්දෙපිටවල අතු ඇලේ බෙදුම් ඇල අංක 01 බෑවුම් නිර්මිතය (Drap Structure) සැලසුම් කිරීම.
5) මැදිරිගිරිය කන්තලේ මාර්ගයේ කි.මී. 3.290 හා කි.මී.3.650 ස්ථානවල බෝක්කු සැලසුම් කිරීම.
6) ‘එල්’ කලාපයේ සාමඋදාන වැව පුනරුත්තාපනය සඳහා සැලසුම් කිරීම හා ඇස්තමේන්තු සකස් කිරීම.
7) මැදිරිගිරිය අග්බෝපුර මාර්ගයේ කි.මී. 0.0 ස්ථානයේ පාලම සහ එම මාර්ගයේ බෝක්කු (Culverts) සැලසුම් කිරීම.
8) ‘එල්’ කලාපයේ ඇතාවැටුණුවැව යටි පැන්නුම (Causeway) නවීකරණය සඳහා සැලසුම් කිරීම හා ඇස්තමේන්තු සකස් කිරීම.
9) කළුගඟ දකුණු ඉවුර ප්‍රධාන ඇලේ කුඹුරු ඇල අංක 1 හා 2 හි අවහැරවුම් සැලසුම් කිරීම.
10) පොල්ගොල්ල වෙල්ල පහළ කොටස වෙල්ල ආරක්ෂා කිරීම සඳහා සැලසුම් සකස් කිරීම.
11) ‘එල්’ කලාපයේ හැළඹවැව මාර්ගය කි.මී. 0 සිට කි.මී. 7.150 දක්වා සැලසුම් කිරීම හා ඇස්තමේන්තු සකස් කිරීම.
12) කළුගඟ දකුණු ඉවුර පුධාන ඇලේ කි.මී. 4.60 අවහැරවුම් නිර්මිතය සැලසුම් කිරීම.
13) මැදිරිගිරිය අග්බෝපුර කි.මී. 8.0 ස්ථානයේ බෝක්කුව සැලසුම් කිරීම.
14) කවුඩුල්ල වම් ඉවුර කි.මී. 0.975 ස්ථානයේ අවහැරවුම් නිර්මිතය සැලසුම් කිරීම.
15) ‘එල්’ කලාපයේ කිරිඉබ්බන්වැව හා ඇතාවැටුණුවැව පුනරුත්තාපනය සඳහා සැලසුම් සටහන් සකස් කිරීම.

**2.2 වාස්තු විද්‍යාඥ ඒකකය - ගොඩනැගිලි සැලසුම් කිරීම.**

1) ලග්ගල නගරය ප්‍රාදේශීය රෝහල යෝජිත අතිරේක ගොඩනැගිලි
2) ලග්ගල නගරයේ යෝජිත ගෘහ විද්‍යාගාරය, ගරාජය (Work shop), පරිගණක ගොඩනැගිලි, පාසල් ගොඩනැගිලි
3) "එල්" කලාපයේ යෝජිත iv ශ්‍රේණියේ නිල නිවාසය
4) රුහුණු කෙත සංචාරක බංගලාව නිදන කාමර, කෑම කාමරය, පැන්ට්‍රිය (Pantry) නවීකරණය
5) මහවැලි අධිකාරියේ ප්‍රධාන කාර්යාලයේ යෝජිත ආපන ශාලාව
6) ලග්ගල නගරයේ පාසැලේ යෝජිත රැස්වීම් ශාලාව.
7) ශ්‍රී ලංකා මහවැලි අධිකාරියේ දෙහිඅත්තකණ්ඩිය යෝජිත බොජුන්හල
8) මැදිරිගිරිය කලාපයේ යෝජිත සංචාරක බංගලාව
9) මොරගහකන්ද කළුගඟ සංවර්ධන ව්‍යාපෘතියේ ප්‍රාථමික පාසල, යෝජිත පුස්තකාලය, පරිගණක කාමරය, ගුරුවරුන්ගේ විවේකාගාරය
10) බකමූණ නගරයේ යෝජිත මැණික් හා පර්යේෂණ ආයතනය
11) දැස්ගිරිය නගරය යෝජිත ශල්‍යාගාරය
12) එල් කලාපයේ නේවාසික ව්‍යාපාර කළමණාකාර කාර්යාලයේ යෝජිත කාර්යාලය වැඩි දියුනු කිරීම (Extension)
13) නුවරඑළිය යෝජිත සංචාරක බංගලාව
14) දෙහිඅත්තකණ්ඩිය යෝජිත සංචාරක බංගලාව

**පහළ නිම්න සංවර්ධන කටයුතු**

- මහවැලි බල ප්‍රදේශයන්හි ඇති වාරි පද්ධති මෙහෙයුම් හා නඩත්තු කිරීම, ගොඩනැගිලි පරිශ්‍ර නඩත්තු හා කළමනාකරණය කිරීම, මාර්ග පද්ධති අළුත්වැඩියාවන් හා ඊට අදාල ඉදිකිරීම් කිරීම, ඇස්තමේන්තු කිරීම, ඉදිකිරීම් තත්ව පාලනය සහ ප්‍රගති සමාලෝචනය මෙම අංශයේ ප්‍රධාන කාර්යයන් වේ.

- කුඩා පරිමාණ ජල විදුලි උත්පාදන ව්‍යාපෘති සංවර්ධනය

2016 වර්ෂය තුලද පහත සඳහන් කුඩා පරිමාණ ජල විදුලි උත්පාදන බලාගාර ඉදිකිරීම් කටයුතු සම්බන්ධීකරණය හා අධික්ෂණ කටයුතු කරන ලදී.

1) දඹුලු ඔය - එච්.පී.ඩී. පවර් පුද්ගලික සමාගම

2) අත්කන්ද (මෙ.වො. 6.5) - එස්කැස් පුද්ගලික සමාගම

**<u>ඒ අනුව 2016 වසර සඳහා මහා භාණ්ඩාගාරය විසින් ඒ ඒ කලාපය සඳහා වෙන් කළ ප්‍රතිපාදන වැය කිරීම පහත පරිදි වේ.</u>**

| | කලාපය / ව්‍යාපෘතිය | 2016 වර්ෂයේ තා/සේ අංශයට වෙන් කල මුදල රු. මිලියන | 2016 වසරේ මූල්‍ය ප්‍රගතිය රු. මිලියන | මූල්‍ය ප්‍රගතිය % |
|---|---|---|---|---|
| | ව්‍යාපෘති | | | |
| 1 | රිදීමාලියද්ද | 65.010 | 50.731 | 78% |
| 2 | ඒකාබද්ධ සංවර්ධන ව්‍යාපෘතිය එල් කලාපය | 485.595 | 452.935 | 93% |
| 3 | කිවුල්ඔය ව්‍යාපෘතිය | 19.400 | 19.000 | 98% |
| 4 | ඒකාබද්ධ සංවර්ධන ව්‍යාපෘතිය බී කලාපය | 474.000 | 471.695 | 100% |
| 5 | මල්වැන්න සංවර්ධන ව්‍යාපෘතිය - බී කලාපය | 217.000 | 177.668 | 82% |
| 6 | කුඩා හා මධ්‍ය ප්‍රමාණ වාරිමාර්ග පද්ධති පුනරුත්ථාපනය කිරීම | 200.000 | 177.915 | 89% |
| 7 | ගැටඹේ මහවැලි ගං ඉවුරු සංරක්ෂණය | 125.000 | 65.554 | 52% |
| | උප එකතුව | 1.586.005 | 1.415.498 | 89% |
| | කලාප | | | |
| 8 | බී කලාපය | 58.111 | 63.322 | 109% |
| 9 | සී කලාපය | 128.071 | 127.937 | 100% |
| 10 | ඩී කලාපය | 35.250 | 21.081 | 60% |
| 11 | ජී කලාපය | 38.750 | 38.164 | 98% |
| 12 | එච් කලාපය | 102.000 | 102.404 | 100% |
| 13 | එල් කලාපය | 165.000 | 165.199 | 100% |
| 14 | වලව කලාපය | 138.902 | 145.864 | 105% |
| 15 | හුරුළුවැව කලාපය | 39.500 | 36.202 | 92% |
| 16 | රඹකැන්ඔය | 32.232 | 29.598 | 92% |
| 17 | වික්ටෝරියා කලාපය | 42.650 | 42.278 | 99% |
| | උප එකතුව | 780.466 | 772.049 | 99% |
| | අංශ | | | |
| 18 | ප්‍රධාන කාර්යාලය (තාක්ෂණ සේවා) | 25.303 | 27.886 | 110.2% |
| 19 | යාන්ත්‍රික වැඩපල - තඹුත්තේගම | 5.000 | 4.040 | 81% |
| 20 | ගංභාද්‍රෝණි කළමනාකරණ - මඩාටුගම | 880 | 726 | 83% |
| 21 | ව්‍යාපෘති සම්බන්ධීකරණ කාර්යාලය - මඩාටුගම | 700 | 631 | 90% |
| 22 | මූලික වැඩ පාලන ක්‍රියාකරවුම් හා නඩත්තු අංශය | 220.360 | 226.761 | 103% |
| | උප එකතුව | 252.243 | 260.044 | 103% |
| | එකතුව | 2618.714 | 2447.591 | 93% |

- පහත සඳහන් විදුලි ව්‍යාපෘති වෙනුවෙන් ආයෝජකයින් විසින් පරිසර අධ්‍යන වාර්තා සකස් කිරීම සම්බන්ධීකරණය කිරීම.

1) උකුවෙල (මෙ.වො. 2.2) දිග්ගල හා මාදුරුඔය වම් ඉවුර

## 2.2 ගංගා ද්‍රෝණි සංවර්ධනය

වේලි ආරක්ෂණ හා ජලසම්පත් කළමනාකරණ ව්‍යාපාතියට අදාලව දඹුලු ඔය, කණ්ඩලම හා චන්ද්‍රිකා වැව යන ජලාශ වල වේලි පුනරුත්තාපන කටයුතු නිම කිරීම, ජලසම්පත් සංවර්ධනය පිළබඳ සකස් කල ජාතික සැලසුමෙහි තාක්ෂණ ඇගයීම් සිදු කිරීමද 2016 වසර තුළ කරන ලද විශේෂ කාර්යයන් වේ.

## 2. 3 මූලික වැඩ පාලන ක්‍රියාකරවුම් නඩත්තු අංශය

මහවැලි කඩිනම් ව්‍යාපාරය යටතේ ඉදිකරන ලද විශාල ජලාශ , අන්තර් ද්‍රෝණි , ඇළ පද්ධති , වේලි හා ආශ්‍රිත නිර්මිත නොකඩවා ක්‍රියාත්මක කිරීමට හැකිවන පරිදි ඒවා නිසි කළමණාකරනය සඳහා 1985 වසරේදී මූලික වැඩ පාලන ක්‍රියාකරවුම් නඩත්තු අංශය ස්ථාපිත කර ඇත.

### 2 .3 1 2016 වර්ෂයේ ක්‍රියාකාරකම්

- ජලාශ වේලි හා ආශ්‍රිත නිර්මිත වල සාමාන්‍ය නඩත්තු සම්පූර්ණ කිරිම.
- සියලු වේලි සඳහා සැලසුම් කරන ලද ආරක්ෂිත මෙහෙයුම ක්‍රියාකාරකම් හා නිත්‍ය නඩත්තුව කටයුතු සම්පූර්ණ කිරිම.
- උපකරණ වලින් රැස්කරන ලද දත්ත එකතු කිරිම විශ්ලේෂණය කිරිම ,සැලසුම් කළ පරිදි ඉටු කිරිම.
- සැලසුම් කරන ලද ජල තත්ව නඩත්තු ක්‍රියාකාරකම් සම්පූර්ණ කිරිම.
- ජලාශ සංරක්ෂණ කටයුතු හා අනවසර අල්ලා ගැනිම් සිදුකර ඇති ප්‍රදේශ නැවත අත්පත් කර ගැනීමේ මූලික කටයුතු අවසන් කිරිම.
- ආයතනික පරික්ෂණ , මූ.වැ.පා. ඒකකයට අනුයුක්ත කර ඇති ඉංජිනේරුවරුන් මගින් ඉටු කිරිම
- දිගන ගම්මානයේ නිත්‍ය නඩත්තු කටයුතු සිදුකිරිම
- **ඩෙංගු මර්ධන ශ්‍රමදාන වැඩසටහන්, පාරිසරික ආරක්ෂණ බලපත්‍රය ලබා ගැනීම, කසල කළමනාකරණ වැඩසටහන් දියත් කිරීම.**

## 2 .4 ජල පාලන ලේකම් කාර්යාලය

**2015/16 මහ කන්නය ( 2015 ඔක්. 01 සිට 2016 මාර්තු 31 දක්වා )**

මහවැලි හා වලව පද්ධතියේ ප්‍රධාන ජලාශවල ජල මට්ටම් සැළකිය යුතු ලෙස ඉහළ මට්ටමක පැවතුනද වාරි ජලාශවල ජල මට්ටම් අඩු අගයක පැවතුන බැවින් 2015/16 මහ කන්නය ආරම්භ කිරීම නොවැම්බර් මස තෙක් ප්‍රමාද කරන ලදී. මහවැලි පද්ධතියේ ඉහළ ජලධාරා ප්‍රදේශවලට අපේක්ෂිත සාමාන්‍ය ප්‍රමාණය ඉක්මවා ජලය ලැබුන බැවින් කොත්මලේ ජලාශය හැර ඉතිරි ජලාශ නොවැම්බර් දෙසැම්බර් මාසවලදී වාන් දමන ලදී.

මෙම කන්නය තුල මහවැලි පද්ධතියෙන් ගිගාවොට් පැය 1289 ක් ජාතික විදුලිබල පද්ධතියට එක්කරන ලදී. එය සමස්ත විදුලිබල උත්පාදනයෙන් 20% ක ප්‍රමාණයකි.

ජලපාලන කමිටුව යටතේ ඇති කලාපවල 2015/16 මහ කන්නයේ වගාව සැළසුම්කළ හා පැවති ආකාරය 01 වන රූප සටහනෙන් දැක්වේ.




රූප සටහන 01

**2016 යල කන්නය ( 2016 අප්‍රේල් 01 සිට 2016 සැප්තැම්බර් 30 දක්වා)**

2016 යල කන්නයේ මහවැලි පද්ධතියේ පොල්ගොල්ල ජලාශය හැර අනිකුත් ජලාශවලට ලැබුනු ජල ප්‍රමාණය අපේක්ෂිත සාමාන්‍ය අගයට වඩා අඩු අගයක පැවති අතර උඩවලව ජලාශයට අපේක්ෂිත සාමාන්‍ය තත්වයට වඩා වැඩි ජල ප්‍රමාණයක් ලැබුණි.

වාරි ජලාශවලටද මැයි මස තුල ලැබුනු ජල ප්‍රමාණය සමග අවම අගයක තිබූ ජලාශ මට්ටම් ඉහළ ගිය බැවින් 2016 යල කන්නයේ වගාව පිහිටුවීම 2016 අප්‍රේල් 15 - මැයි 25 අතර සිදුකරන ලදී. 2016 යල කන්නයේ වගාව සැළසුම්කළ හා පැවති ආකාරය 02 වන රූප සටහනෙන් දැක්වේ.




රූප සටහන 02

මෙම කන්නය තුල මහවැලි පද්ධතියේ විදුලිබල උත්පාදනය ගිගාවොට් පැය 746 කි.

**2016/17 මහ කන්නය ( 2016 ඔක්. 01 සිට 2017 මාර්තු 31 දක්වා )**

මහවැලි හා වලව පද්ධතියේ ප්‍රධාන ජලාශ මෙන්ම වාරි ජලාශවලද ජල මට්ටම් අඩු අගයක පැවතුන බැවින් මෙම කන්නයේ වගාව සීමා කරන ලදී. කන්නය ආරම්භ කිරීම නොවැ.15 සිට දෙසැ. 01 දක්වා ප්‍රමාද කරන ලදී.

## 2. 5 ඉඩම් පරිහරණ සැලසුම් අංශය

### 2.5.1 කාර්යභාරයන්

- මහවැලි ප්‍රදේශ වල ඉඩම් පරිහරණය හා භෞතික සැලසුම් සකස්කිරිම හා නව සංවර්ධිත ප්‍රදේශ වල ඉඩම් අත්පත් කර ගැනීම් , නැවත පදිංචි කිරීම් පිළිබඳ ජාතික ප්‍රතිපත්තිය අනුව උපාය මාර්ග සැලසුම් පිළියෙල කිරිම
- නව ව්‍යාපෘති හා විශේෂ ව්‍යාපෘති වල ඉඩම් හා භෞතික සැලසුම් සකස්කිරිම සඳහා ඇති දත්ත හා තොරතුරු රැස්කිරිම
- ද්විතියික හා ප්‍රාථමික තොරතුරු ආශ්‍රයෙන් භූගෝල විද්‍යාත්මක තොරතුරු සිතියම් සකස්කිරිම, යාවත්කාලීන කිරිම
- මහවැලි බල ප්‍රදේශ වල ජනාවාස හා නගර නිර්මාණ සැලසුම් කිරිම
- මහවැලි බල ප්‍රදේශ වල ජන ව්‍යාප්තිය , කෘෂිකර්මාන්තය, භෞතික යටිතල පහසුකම් ඇතුළු අනෙකුත් මානව ක්‍රියාකාරකම් පිළිබඳ තොරතුරු රැස්කිරිම හා සිතියම් වාර්තා පිළියෙල කිරිම යන කරුණු අරමුණු කර ගනිමින් ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය තුළ ඉඩම් පරිහරණ හා සැලසුම් අංශය ස්ථාපිත කර ඇත.

## 2.5.2 2016 වර්ෂයේ ක්‍රියාකාරකම්

- **ව්‍යුහාත්මක සැලසුම් සකස් කිරීම**

**<u>සී කලාපය</u>**

සී කලාපයේ වෙහෙරගල කොට්ඨාසයේ නගර මධ්‍යස්ථානයට අදාළ මූලික සැලසුම් වල වෙන් කර ඇති භාවිතයන් වර්තමාන ඉඩම් පරිහරණ රටාව හේතුවෙන් වෙනස්වීම් වලට ලක්වී ඇති ආකාරය අධ්‍යයනය කර අනාගතයේදී එම ප්‍රදේශයේ සැලසුම් සකස් විය යුතු ආකාරය අධ්‍යයනය කිරීමේ ක්ෂේත්‍ර සමීක්ෂණය 2016 වර්ෂයේ සිදු කර ඇත.







සී කලාපයට අදාළව මේ වන විට සකස් කර ඇති සියලුම අවසාන ජනපද සිතියම් සහ අවසාන භූ විද්‍යාත්මක සිතියම් වල දෘඩ පිටපත් මෘදු පිටපත් බවට පත්කර එම සිතියම් වල විද්‍යුත් දත්ත පද්ධතියක් සකස් කිරීමට අදාළ මූලික කටයුතු අවසන් කර ඇත.

එමෙන්ම සී කලාපයේ එක් එක් කොට්ඨාස වලට අදාල බල ප්‍රදේශය දැක්වෙන සිතියම් වල මුද්‍රිත පුවරු මුද්‍රණය කර ලබාදී ඇති අතර එමගින් කොට්ඨාස මට්ටමින් ආවරණය වන ප්‍රදේශය හඳුනා ගැනීමට පහසුවක් මෙන්ම වඩා ඵලදායි සේවාවක් සැපයීම කෙරෙහිද ඉවහල් වී ඇත.
















## එච් කලාපය

එච් කලාපයට අදාලව මේ වන විට සකස් කර ඇති සියළුම අවසාන ජනපද සිතියම් හා අවසාන ගම් සිතියම් වල දෘඪ පිටපත් මෘදු පිටපත් බවට පත් කර එම සිතියම් වල විද්‍යුත් දත්ත පද්ධතියක් සකස් කිරීමට අදාල මූලික කටයුතු අවසන් කර ඇත.

සමස්ථ එච් කලාපයේ හඳුනාගත් පැති දෙකක රක්ෂිත ප්‍රදේශ මැන සළකුණු කිරීමද 2016 වර්ෂයේ අවසන් කර ඇත. එමගින් වැවට අදාල පෝෂක ප්‍රදේශ ආරක්ෂා කිරීමත් අනවසර පදිංචිකරුවන්ගේ ආක්‍රමණය වැළැක්වීමත් වැවෙහි රක්ෂිත ප්‍රදේශ සංරක්ෂණය සඳහා ඉදිරි සැලසුම් සකස් කිරීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගැණීමත් අරමුණු කර ඇත.





**තම්මට්ටැව වැව** **එප්පාවල වැව**

## වලව කලාපය

වලව කලාපයට අදාළව මේ වන විට සකස්කර ඇති සියලුම අවසාන ජනපද සිතියම් සහ අවසාන ගම් සිතියම් වල දෘඩ පිටපත් මෘදු පිටපත් බවට පත් කර එම සිතියම් වල විද්‍යුත් දත්ත පද්ධතියක් සකස් කිරීමට අදාල මූලික කටයුතු අවසන් කර ඇත.

තවද වලව කලාපයේ ඇඹිලිපිටිය නගර මධ්‍යස්ථාන සංවර්ධන සැලැස්ම සැකසීම සඳහා අදාළ රේඛීය ආයතන කැඳවා ඇඹිලිපිටිය නගරය ආශ්‍රිත මූලික ගැටළු හඳුනාගෙන එම ගැටළු ප්‍රමුඛතාගත කරන ලදී. ඒ අනුව

නගරය සීඝ්‍ර සංවර්ධනයට සාපේක්ෂව නගරයට පිවිසෙන රථ වාහන නැවැත්වීමට ප්‍රමාණවත් රථගාල් නොමැති වීම හා නගරයේ කැලි කසල කළමනාකරණය විධිමත් කිරීමේ අවශ්‍යතාවය හඳුනා ගැනිණි.

ඒ අනුව එක් එක් ප්‍රමුඛතා ගැටළු වලට අදාළ කමිටු පත් කර එම ගැටළු වලට විසඳුම් ලෙස උපායමාර්ගික ව්‍යාපෘති හඳුනාගත් අතර ඇඹිලිපිටිය නගරයේ පාසල් කාලය තුළ අධික රථ වාහන තදබදයක් පවතින ජනාධිපති විද්‍යාලය අසල එක් ව්‍යාපෘතියක් ක්‍රියාත්මක කිරීමට පියවර ගැනිණි.

එමෙන්ම ඇඹිලිපිටිය නගරය ආශ්‍රිතව පවතින කැලි කසලකළමනාකරණය විධිමත් කිරීම සඳහා ව්‍යාපෘති කිහිපයක් හඳුනාගත් අතර අප ජලය පිරිපහදු මධ්‍යස්ථානයක් ස්ථාපිත කිරීම, කසල ප්‍රතිචක්‍රීකරණ මධ්‍යස්ථානය වැඩිදියුණු කිරීම හා ජීව වායු පද්ධති මහා පරිමාණ ව්‍යාපාරික ස්ථාන සඳහා හඳුන්වාදීම තුලින් කසළ මගින් පුනර්ජණනීය බලශක්ති උත්පාදනය කෙරෙහි ජනතාව හුරු කරවීමද අරමුණු කෙරිණි. තවද කසළ වර්ගීකරණය ප්‍රචලිත කිරීම තුළින් බැහැර කිරීමට යොමු කෙරෙන කසළ ප්‍රමාණය අවම කිරීමටද වැඩසටහන් සැලසුම් කර ඇත.

## ඩී කලාපය

මොරගහකන්ද කළුගඟ කෘෂිකාර්මික සංවර්ධන ව්‍යාපෘතිය යටතේ සංවර්ධනය කරනු ලබන ඩී කලාපයේ බිසෝපුර ප්‍රාදේශීය මධ්‍යස්ථානයට අදාලව ජනාවාස ප්‍රදේශ සැළසුම් කාර්මික කටයුතු වලට අදාල ප්‍රදේශ සංවර්ධන සැළසුම් සකස් කර ඇත.












## මොරගහකන්ද සංවර්ධන ප්‍රදේශය

මොරගහකන්ද කළුගඟ කෘෂිකාර්මික සංවර්ධන ව්‍යාපෘතිය යටතේ සංවර්ධනය කරනු ලබන ලග්ගල නගර මධ්‍යස්ථානයේ වාණිජ කටයුතු වලට අදාළ ප්‍රදේශ ආශ්‍රිත සැලසුම් සකස් කිරීම හා නගර මධ්‍යස්ථානය තුළ පොදු පහසුකම් සැපයීමට අදාල සැලසුම් යාවත්කාලින කිරීම සිදුකර ඇත.











## 2 .6 වන හා පරිසර අංශය

### 2 .6 .1 කාර්යභාරයන්

- ආයතනය විසින් මෙහෙයවනු ලබන සියළුම සංවර්ධන කටයුතු වලදී ඊට අදාළ වන පාරිසරික ප්‍රතිපත්ති සකස්කිරීම සඳහා සහයවීම හා ඊට අදාළ කළමණාකරන සංරක්ෂණ සැලසුම් සකස්කිරීම
- සංවර්ධන ව්‍යාපෘතින්හි සියළුම පරිසර බලපෑම් ඇගයීම් කටයුතු මෙහෙයවීම , පසු විපරම, වෙනත් ආයතන සමග සම්බන්ධීකරණය
- පරිසර හා වන සංරක්ෂණ කළමණාකරන කටයුතු සම්බන්ධීකරණය, සැලසුම් සකස්කිරීම,පසු විපරම හා ඊට අදාළ මාර්ගෝපදේශ පිළියෙල කිරීම
- අදාළ ක්ෂේත්‍රයෙහි විද්‍යාත්මක පර්යේෂණ සංවර්ධන කටයුතු සිදුකිරීම
- ශ්‍රී ලංකා මහවැලි බල ප්‍රදේශයන්හි ස්වභාවික සම්පත් පිළිබඳ දත්ත රැස්කිරීම හා කළමණාකරණය

### 2.6.2 2016 වර්ෂය තුල ක්‍රියාකාරකම්

1. ඉහළ මහවැලි ජලපෝෂක ප්‍රදේශය සංරක්ෂණය සඳහා වූ ක්‍රියාකාරකම්
2. මහවැලි පහළ නිම්න හා අනෙකුත් මහවැලි කලාපවල සිදුකරන ලද පරිසර ක්‍රියාත්මක වැඩසටහන හා ඒකාබද්ධ ව්‍යාපෘති වල පරිසර වැඩසටහන් ක්‍රියාත්මක කිරීම.
3. මහවැලි අධිකාරිය මගින් ක්‍රියාත්මක කරනු ලබන මහා පරිමාණ ව්‍යාපෘතිවල පරිසර සංරක්ෂණ කටයුතුවල පරිසර අනුමැතියේ කොන්දේසි ක්‍රියාත්මක කරවීමට අදාල කටයුතු හා පසුවිපරම් කිරීම සහ මහවැලි සංවර්ධව හා පරිසර අමාත්‍යාංශය හා මහවැලි අධිකාරිය මගින් ක්‍රියාත්මක කරවීමට යෝජිත ව්‍යාපෘතිවල තාක්ෂණික කමිටු ,මෙහෙයුම් කමිටු හා ස්ථාවර කමිටු නියෝජනය කිරීම.
4. ජාතික පාරිසරික පනත යටතේ ව්‍යාපෘති අනුමත කිරීමේ ආයතනයක් ලෙස පාරිසරික බලපෑම් ඇගයීම් කටයුතු පරිපාලනය හා පසුවිපරම් කටයුතු සිදුකිරීම.
5. රේඛීය රාජ්‍ය ආයතන වලින් ක්‍රියාත්මක කරනු ලබන සංවර්ධන ව්‍යාපෘතිවල තාක්ෂණික කමිටු නියෝජනය, ජාතික මට්ටමින් ක්‍රියාත්මක කරවීමට යෝජිත පරිසර ක්‍රියාකාරකම් සම්බන්ධ රැස්වීම් හා වැඩමුළු සඳහා අධිකාරිය නියෝජනය කිරීම හා අභ්‍යන්තර කමිටු නියෝජනය කිරීම.

- **2016 මූල්‍ය ප්‍රතිපාදන වෙන්කිරීම හා ප්‍රගතිය**

| අංකය | අංශය/කලාපය | මූල්‍ය ප්‍රතිපාදන වෙන්කිරීම (රු.මි.) | සංශෝධිත මූල්‍ය ප්‍රතිපාදන වෙන්කිරීම (රු.මි.) | මූල්‍ය ප්‍රගතිය (රු.මි.) | ප්‍රතිශතය |
|---|---|---|---|---|---|
| 01 | පරිසර හා වනසංරක්ෂණ අංශය-කොත්මලේ | 26.00 | 27.51 | 21.53 | 78.24 |
| 02 | බී,සී,ඩී,ජී,එච්,වලව, හුරුළුවැව,වික්ටෝරියා,රඹකැන්ඔය කලාප | 24.00 | 23.03 | 21.96 | 95.35 |
| | එකතුව | 50.00 | 50.55 | 43.49 | 86.03 |

<u>ප්‍රාග්ධන වියදම්</u>

| අයවැය සංකේත අංකය | අංශය | ඇස්තමේන්තු මුදල රු. | සංශෝධිත ඇස්තමේන්තු මුදල රු. | වියදම් මුදල රු. | ප්‍රතිශතය |
|---|---|---|---|---|---|
| 2965 | ස්වභාවික සම්පත් සංරක්ෂණ අංශය | 5,000,000.00 | 5,053,000.00 | 5,040,778.62 | %99.76 |
| 2965 | පරිසර අධ්‍යාපන හා පුහුණු අංශය | 4050,000.00, | 4328,091.00, | 4090,802.78, | 94%52. |
| 2965 | ඉඩම් පරිහරණ සැලසුම් හා භූගොලීය තොරතුරු පද්ධති තාක්ෂණ අංශය | 500,000.00 | 146,120.00 | 146,120.00 | %100 |
| 2965 | ජලවිද්‍යා අධ්‍යයන අංශය | 3,000,000.00 | 2,958,000.00 | 301,755.00 | %10.20 |
| 2965 | පටක රෝපණ අංශය | 6,650,000.00 | 6,424000.00, | 6,479,91412. | %100.87 |
| 2113 | ස්ථාවර වත්කම් අත්පත්කර ගැනීම් | 1,000,000.00 | 1,000,000.000 | 1,010,489.50 | %101.05 |
| 2383 | වාහන නඩත්තුව හා අළුත්වැඩියාව | 1,200,000.00 | 1,999,800.00 | 2107,504.63 | 105.3% |
| 2385 | ගොඩනැගිලි නඩත්තු අංශය | 4500,000.00, | 5,587,000.00 | 2,333,489.72 | 4%1.76 |
| 2386 | කාර්යාල උපකරණ අළුත්වැඩියා කිරීම | 100,000.00 | 18,000.00 | 18,341.64 | %101.89 |
| එකතුව | | **26,000,000.00** | **27,514,011.00** | **21,529,196.01** | **78.24%** |

# තුන්වැනි පරිච්ඡේදය
## සංවර්ධන අංශය

සංවර්ධන අංශය ප්‍රධාන අංශ 05 කින් සමන්විත වන අතර එම අංශ පහත පරිදි වේ.

01 ඉඩම් අංශය

02. කෘෂිකර්ම සංවර්ධන අංශය

03. පශු සම්පත් සංවර්ධන අංශය

04. ආයතන සංවර්ධන අංශය

05. ව්‍යාපාර සංවර්ධන අංශය

### 3.1 ඉඩම් අංශය

ඉඩම් සංවර්ධන ආඥා පනත, රජයේ ඉඩම් ආඥා පනත, සන්තකය ආපසු ලබා ගැනීමේ පනත, කැළෑ ආඥා පනත වැනි අණපනත් මගින් පැවරී ඇති බලතල ප්‍රකාරව ශ්‍රී ලංකා මහවැලි අධිකාරියේ සියළුම කලාප වල ඉඩම් රාජකාරි කටයුතු සංවිධානය කිරීම, ඉඩම් කච්චේරි හා අනවසර පරීක්ෂණ පැවැත්වීම, පිළිබඳව කලාප වලින් යොමු වන ඉල්ලීම් අනුව අධ්‍යක්ෂ ජනරාල්ගේ විධිමත් අනුමැතිය ලබා ගැනීමට කටයුතු කිරීම හා දන්වා යැවීම. එම කටයුතු අධීක්ෂණය කිරීමට අවශ්‍ය උපදෙස් ලබා දීම මෙම අංශයෙන් සිදුකරනු ලබන ප්‍රධානතම කාර්යභාරයන් ලෙස හඳුනාගත හැකිය.

**2016 වර්ෂය තුල ක්‍රියාත්මක කල කාර්යයන්**

- ඉඩම් බෙදීම කිරීම සඳහා සුදුස්සන් තෝරා ගැනීම.
- කට්ටිකරුවන් අතර ඉඩම් බෙදීම කිරීම.
- ඉඩම් බලපත්‍ර හා ප්‍රධාන පත්‍ර නිකුත් කිරීම.
- ඉඩම් අයිතිය බෙදීම කිරීම.
- ඉඩම් අත්පත් කර ගැනීම හා වන්දි ගෙවීම.
- රාජ්‍ය ආයතන සඳහා ඉඩම් පැවරීම.
- පූජා භූමි සඳහා පූජා ඔප්පු ලබාදීම.
- මධ්‍යම පරිමානයේ ව්‍යාපාරිකයින් සඳහා ඉඩම් ලබා දීම.
- ඉඩම් සඳහා බදු අය කිරීම.
- ඉඩම් මැනීම හා තක්සේරු කිරීම.
- කොට්ඨාශ දින පැවැත්වීම.

### 3.1.1 2016 වර්ෂයේ ප්‍රගතිය

**අවසර පත්‍ර ලබා දීම ඉඩම් සංවර්ධන ආඥා පනත - 2016**

| කලාපය | ඉලක්කය | ප්‍රගතිය |
|---|---|---|
| බී | 4,060 | 3,885 |
| සී | 1,910 | 1,765 |
| මොරගහකන්ද | 1,900 | 1,828 |
| එච් | 2,810 | 2,230 |
| එල් | 3,200 | 2,701 |
| උඩවලව | 7,200 | 7,108 |
| වික්ටෝරියා ,කොත්මලේ | 1,000 | 704 |
| මැදිරිගිරිය | 750 | 400 |
| හුරුළුවැව | 1,400 | 1,044 |
| රඹකැන්ඔය | 1,400 | 1,118 |
| එකතුව | **25,630** | **22,783** |

**ප්‍රදානපත්‍ර ලබා දීම ඉඩම් සංවර්ධන ආඥා පනත - 2016**

| කලාපය | ඉලක්කය | ප්‍රගතිය |
|---|---|---|
| බී | 7,060 | 6,955 |
| සී | 5,915 | 5,768 |
| මොරගහකන්ද | 1,205 | 983 |
| එච් | 3,200 | 2,864 |
| එල් | 1,900 | 1,753 |
| උඩවලව | 7,500 | 7,315 |
| වික්ටෝරියා ,කොත්මලේ | 805 | 688 |
| මැදිරිගිරිය | 300 | - |
| හුරුළුවැව | 2,000 | 1,032 |
| රඹකැන්ඔය | 150 | - |
| එකතුව | **30,035** | **27,358** |

## රජයේ ඉඩම් ආඥා පනත යටතේ දීමනා පත්‍ර ලබා දීම -2016

| කලාපය | ඉලක්කය | ප්‍රගතිය |
|---|---|---|
| බී | 15 | - |
| සී | 15 | 2 |
| මොරගහකන්ද | 5 | 1 |
| එච් | 30 | 14 |
| එල් | - | - |
| උඩවලව | 55 | 48 |
| වික්ටෝරියා ,කොත්මලේ | 640 | 550 |
| මැදිරිගිරිය | - | - |
| හුරුළුවැව | 40 | - |
| රඹකැන්ඔය | 5 | - |
| එකතුව | **805** | **615** |

## රාජ්‍ය ආයතන සදහා ඉඩම් ලබා දීම - 2016

| කලාපය | පැවරුම් නියෝග | | ඉඩම් භාරදීම | |
|---|---|---|---|---|
| | ඉලක්කය | ප්‍රගතිය | ඉලක්කය | ප්‍රගතිය |
| බී | 10 | - | 15 | 11 |
| සී | 350 | 341 | - | - |
| මොරගහකන්ද | 5 | - | - | - |
| එච් | 10 | - | - | - |
| එල් | 2 | - | - | - |
| උඩවලව | 10 | - | - | - |
| වික්ටෝරියා ,කොත්මලේ | 5 | - | - | - |
| මැදිරිගිරිය | - | - | - | - |
| හුරුළුවැව | 5 | 2 | - | - |
| රඹකැන්ඔය | 3 | - | - | - |
| එකතුව | **400** | **343** | **15** | **11** |

**රජයේ ඉඩම් ආඥා පනත යටතේ විහාරස්ථාන දීමනා පත්‍ර ලබා දීම - 2016**

| කලාපය | ඉලක්කය | ප්‍රගතිය |
|---|---|---|
| බී | 25 | 18 |
| සී | 10 | 6 |
| මොරගහකන්ද | 5 | 3 |
| එච් | 25 | 19 |
| එල් | - | - |
| උඩවලව | 5 | - |
| වික්ටෝරියා, කොත්මලේ | 15 | 12 |
| මැදිරිගිරිය | - | - |
| හුරුළුවැව | 10 | 3 |
| රඹකැන්ඔය | 5 | - |
| එකතුව | **100** | **61** |

**දීර්ඝ කාලීන බදුකර ලබා දීම - 2016**

| කලාපය | ඉලක්කය | ප්‍රගතිය |
|---|---|---|
| බී | 75 | 41 |
| සී | 35 | 8 |
| මොරගහකන්ද | 10 | 3 |
| එච් | 235 | 168 |
| එල් | 20 | - |
| උඩවලව | 50 | - |
| වික්ටෝරියා ,කොත්මලේ | 605 | 523 |
| මැදිරිගිරිය | 10 | - |
| හුරුළුවැව | 25 | 2 |
| රඹකැන්ඔය | 10 | - |
| එකතුව | **1,075** | **745** |

## 3.2 කෘෂිකර්ම සංවර්ධන අංශය

කෘෂිකාර්මික සහාය සේවා ප්‍රවර්ධනය කිරීම කෘෂි කාර්මික ප්‍රවර්ධන වැඩසටහන් දියුණු කිරීම රටේ ආහාර සුරක්ෂිතතාවය ඇති කිරීමට දායක වීම හා වාරිජල කාර්යක්ෂමතාවය වැඩි කිරීම මෙම අංශය වෙතට පැවරෙන ප්‍රධාන කාර්යයන් ලෙස හඳුනා ගත හැකිය .එමෙන්ම විශේෂයෙන්ම බෝග තීව්‍රතාවය වැඩි කිරීම බෝග විවිධාංගී කරණය කෘෂි නිෂ්පාදන ඵලදායීතාවය වැඩි කිරීම අරමුණු කර ගනිමින් වාණිජ කෘෂි කර්මාන්තය වැඩි දියුණු කිරීම.ගොවිනට නව තාක්ෂණය ලබාදිම.ගෙවතු සංවර්ධනය හා ගොවීන්ගේ ජීවන තත්වය ඉහළ නැංවීම ද මෙම අංශය මගින් ඉටු කරන සුවිශේෂී කාර්යයන් වේ.

### 3.2.2 2016 වර්ෂයේ ක්‍රියාකාරකම්

#### 2016 වර්ෂයේ අයවැය මගින් කෘෂි ඵලදායී වැඩසටහනට මුල්‍ය ප්‍රතිපාදන ලබා දීම

| කලාපය | අනුමත මුදල් රු.මිලි |
|---|---|
| බී | 33 |
| සී | 17 |
| ඩී | 4 |
| ජී | 9 |
| එච් | 80 |
| හුරුළුවැව | 12 |
| වලව | 38 |
| වික්ටෝරියා / කොත්මලේ | 2 |
| රඹකැන්ඔය | 6 |
| ප්‍රධාන කාර්යාලය | 2 |
| එකතුව | 203 |

**2016 වර්ෂය තුල කෘෂිකර්ම ඵලදායිතා වැඩසටහනේ මුල්‍ය ප්‍රගතිය**

| කලාපය | වෙන්කර ඇති මුදල රු.'000 | වියදම්කර ඇති මුදල රු.'000 | ප්‍රතිශතය |
|---|---|---|---|
| බී | 32,709 | 32,762 | 100% |
| සී | 17,437 | 17,663 | 101% |
| ඩී | 4,000 | 3,844 | 96% |
| ජී | 9,325 | 8,500 | 91% |
| එච් | 80,111 | 72,200 | 90% |
| හුරුළුවැව | 12,000 | 8,208 | 68% |
| රඹකැන්ඔය | 6,013 | 4,785 | 80% |
| වලව | 37,855 | 38,491 | 102% |
| වික්ටෝරියා / කොත්මලේ | 2,000 | 2,137 | 107% |
| ප්‍රධාන කාර්යාලය | 2,000 | 2,258 | 113% |
| **එකතුව** | **203,451** | **190,847** | **94%** |

2016 වර්ෂයේ කෘෂි ඵලදායිතා වැඩසටහනේ භෞතික ප්‍රගතිය

| ක්‍රියාකාරකම | ඒකකය | 2016 ඉලක්කය | 2016 ප්‍රගතිය |
|---|---|---|---|
| වී වගා ප්‍රවර්ධනය | | | |
| සන්නිවේදන වැඩමුළු පැවැත්වීම | වැඩමුළු | 422 | 512 |
| යාය වැඩසටහන් | සංඛ්‍යාව | 300 | 297 |
| අස්වනු සමීක්ෂණ | සමීක්ෂණ | 431 | 454 |
| නව තාක්‍ෂණ ආදර්ශන | වැඩසටහන් | 168 | 132 |
| කාර්යක්‍ෂම පොහොර භාවිතය සඳහා ගොවි පුහුණු | ගොවීන් | 11,965 | 9,530 |
| වෙනත් ක්ෂේත්‍ර භෝග | | | |
| ගොවි පුහුණු | වැඩසටහන් | 1501 | 1256 |
| වගා ආදර්ශන | වැඩසටහන් | 539 | 734 |
| බී ඇණු වසන්තීකරණය | කි. ග්‍රෑම් | 226,000 | 95,500 |
| පෙර ගිවිසුම් | ගොවීන් | 9280 | 7618 |
| මී මැසි පෙට්ටි ලබාදීම | සංඛ්‍යාව | 315 | 255 |
| ක්‍ෂුද්‍ර ජල සම්පාදන පද්ධති ලබාදීම | සංඛ්‍යාව | 171 | 126 |
| කෘෂි ළිං | සංඛ්‍යාව | 94 | 88 |
| පලතුරු බෝග සංවර්ධනය | | | |
| අඹ ගස් පුනරුත්තාපන වැඩසටහන් | සංඛ්‍යාව | 193 | 156 |
| පළතුරු මැස්සා පාලන වැඩසටහන් | සංඛ්‍යාව | 344 | 255 |
| ගොවි පුහුණු වැඩමුළු | වැඩසටහන් | 12 | 15 |
| ගෘහ ආර්ථික සංවර්ධන | | | |
| මී පැණි නිෂ්පාදන වැඩසටහන | මී මැසි ජනපද | 442 | 433 |
| බිම්මල් නිෂ්පාදන වැඩසටහන | සංඛ්‍යාව | 45 | 77 |
| ආදර්ශ ගෙවතු වැඩසටහන | ගෙවතු | 1248 | 1582 |
| ගොවි පුහුණු | වැඩසටහන් | 346 | 358 |
| කාබනික පොහොර භාවිතය වැඩි කිරීමේ වැඩසටහන | | | |
| ගොවි පුහුණු | වැඩසටහන් | 243 | 228 |
| කොම්පෝස්ට් නිෂ්පාදන වැඩසටහන් | වැඩසටහන් | 3513 | 2169 |
| දහයියා අඟුරු නිෂ්පාදන වැඩසටහන් | වැඩසටහන් | 1335 | 1800 |
| කෘෂි ව්‍යාප්ති කටයුතු | | | |
| තුන්අවුරුදු සැලසුම මෙහෙයවීම | වැඩසටහන් | 254 | 277 |
| වගා තරඟ හා ප්‍රදර්ශන | වැඩසටහන් | 24 | 29 |
| නිළධාරි පුහුණු | | | |
| පෙර කන්න පුහුණු | වැඩසටහන් | 103 | 84 |
| විශේෂ පුහුණු | වැඩසටහන් | 97 | 92 |

## බෝග නිෂ්පාදනය ප්‍රගතිය සහ දායකත්වය - 2015/16 මහ සහ 2016 යල කන්නය

### කන්න බෝග

| බෝගය | වපසරිය (හෙක්) | මහවැලි නිෂ්පාදනය (මෙ.ටො) | ජාතික නිෂ්පාදනය (මෙ.ටො) | මහවැලි දායකත්වය (%) |
|---|---|---|---|---|
| වී | 158,628 | 872,454 | 4,540,000 | 19 |
| බඩ ඉරිඟු | 4,373 | 15,368 | 247,340 | 6 |
| කුරක්කන් | 486 | 1,166 | 5,044 | 23 |
| මුං | 986 | 1,479 | 23,419 | 6 |
| උඳු | 813 | 1,221 | 10,511 | 12 |
| කව්පි | 1,238 | 1,362 | 21,438 | 6 |
| සෝයා | 2,421 | 4,850 | 9,931 | 49 |
| රටකජු | 536 | 1,072 | 26,316 | 4 |
| තල | 395 | 237 | 13,871 | 2 |
| අමු මිරිස් | 821 | 9,852 | 78,251 | 13 |
| රතුළූණු | 25 | 500 | 89,704 | 1 |
| ලොකුළූණු | 1,713 | 42,850 | 73,191 | 59 |

### පළතුරු බෝග

| බෝගය | වපසරිය (හෙක්) | නිෂ්පාදනය (මෙ.ටො) |
|---|---|---|
| කෙසෙල් | 8,274 | 124,115 |
| පැපොල් | 711 | 12,806 |
| අඹ | 2,136 | 8,544 |

### එළවළු සහ වෙනත් බෝග

| බෝගය | වපසරිය (හෙක්) | නිෂ්පාදනය |
|---|---|---|
| එළවළු | 4,352 | 78,340 (මෙ.ටො) |
| පොල් | 6,461 | 205,999,200 (ගෙඩි) |
| වෙනත් | 1,559 | |

- පැල සිටුවන යන්ත්‍ර භාවිතය මගින් ඉහළ අස්වනු ලබා ගැනීම සහ කාර්යක්ෂම වල් පාලනය - ක්ෂේත්‍ර ආදර්ශණ




- ගුණාත්මක බිත්තර වී ලබා දීම




- වී වගාව සඳහා පැරෂුට් තැටි භාවිතය




- පත්‍ර වර්ණ දර්ශක භාවිතයෙන් යූරියා පොහොර භාවිතය අවම කිරීම




- දෙපාවේලි යෙදීම මගින් ජල කාර්යක්ෂමතාවය ඉහල දැමීම



ඒකාබද්ධ පළිබෝධ පාලන පුහුණු වැඩසටහන



සෝයා බෝංචි වගාව ප්‍රවර්ධනය සදහා බීජ ලබා දීම



ජල අර්බුදයට පිළියමක් ලෙස විසිරුම් ජල සම්පාදන පද්ධති ලබා දීම



බී ඒැණු සත්‍ය බීජ නිෂ්පාදන ක්ෂේත්‍ර වර්ෂාවෙන් ආරක්ෂා කරගැනීම සදහා වැසි ආවරණ ගෘහ ලබා දීම



මිරිස් වගාව ප්‍රවර්ධනය කිරීම සඳහා මිරිස් බීජ ලබා දීම

මිරිස් ගම්මාන පිහිටුවීම





යල කන්නයේ ජල අර්බුදයට පිළියමක් ලෙස
වගා ළිං ඉදිකිරීම සඳහා මහවැලි දායකත්වය ලබා දීම

පළතුරු ගම්මාන පිහිටුවීම






ගෘහ ආර්ථිකය ශක්තිමත් කිරීම සඳහා බිම්මල් නිෂ්පාදනගෘහ ලබා දීම



කාබනික පොහොර නිෂ්පාදනය සහ භාවිතය ප්‍රවර්ධනය

ගොවි පුහුණු වැඩසටහන්





බෝග සායන වැඩසටහන් පැවැත්වීම



ගෙවතු සංවර්ධන වැඩසටහන්







## 3.4 ආයතන සංවර්ධන අංශය

වාරිමාර්ග ව්‍යාපෘති කළමනාකරණය සඳහා ගොවි සංවිධාන බිහිකිරීමේ මුඛ්‍ය කාර්යය අරමුණු කර ගනිමින් පිහිටුවා ඇති ආයතන සංවර්ධන අංශය මේ වන විට ගොවි සංවිධාන 1000 ක් පමණ බිහිකර ඇති අතර එම ගොවි සංවිධාන ගොවිජන සේවා පනත යටතේ නෛතික රාමුව තුළ බලගන්වා ඇත. වාරිමාර්ග පද්ධති කළමනාකරණය එනම් ආරක්ෂාව සංරක්ෂණය නඩත්තුව හා මෙහෙයවීම් යන කටයුතු ඒ ඒ වාරි පද්ධතියේ භුක්තිකරුවන් වන ගොවීන් ගෙන් සැදුම් ලත් ගොවි සංවිධාන විසින් ඉටු කළ යුතු වේ.

මෙම සංකල්පය හා මූල ධර්මය මත පදනම්ව බෙදුම් ඇල දක්වා පරිපාලන කටයුතු ගොවි සංවිධාන වලට භාර දී ඇතත් සමස්ත ක්‍රියාදාමය හැසිරවීමට හැකි වන පරිදි ගොවි සංවිධාන බල ගන්වා නොමැති තත්වයක් යටතේ විශේෂ වැඩ සටහනක් මගින් ගොවි සංවිධාන බල ගැන්වීම ආරම්භ කර ඇත.

### 3.4.1 ගොවි සංවිධාන ශක්තිමත් කිරීම

ආයතන සංවර්ධන අංශයේ ප්‍රධාන භූමිකාව ලෙස වාරි පද්ධති කළමනාකරණය හා ගොවි සංවිධාන ශක්තිමත් කිරීම දැක්විය හැකිය.

ගොවි සංවිධාන බෙදුම් ඇළ මූලික කරගෙන පිහිටුවා ඇත. මෙම ගොවි සංවිධාන ශක්තිමත් කිරීම තුලින් ගොවීන්ගේ හා ගොවි සංවිධාන වල ආර්ථික තත්වය උසස් කිරීම ගොවි සංවිධාන ශක්තිමත් කිරීමේ

වැඩසටහනේ අපේක්ෂාවයි. ගොවි සංවිධාන සාමාජිකයින් විසින් ඒ සඳහා කෙත් ඇළ මට්ටමෙන් නිලධාරීන් පත්කොට තිබේ. වාරි පද්ධති නිසි නඩත්තුව සහ සූක්ෂම වාරි ජල කළමනාකරණයක් වෙත ගොවි සංවිධාන මෙහෙය වීම ද මෙම අංශය මගින් සිදු කරනු ලබයි. එයට අමතරව කලාපීය වශයෙන් වාරි ජලය බෙදා හැරීම, වගා දින දර්ශන සකස් කිරීම සහ කෘෂි ඉලක්ක තීරණය කිරීම වැනි තීරණ ද ගොවි සංවිධාන විසින් ගනු ලබයි.

<u>මහවැලි ගොවි සංවිධාන පිළිබඳ සාරාංශය</u>

| කලාපය | ගොවි සංවිධාන ගණන |
|---|---|
| බි | 133 |
| සී | 196 |
| ඩී | 10 |
| ජී | 44 |
| එච් | 225 |
| එල් | 22 |
| වලව | 287 |
| හුරුළුවැව | 82 |
| රඹකැන්ඔය | 08 |
| **එකතුව** | **1007** |

### 3.4.2 ප්‍රජා සහභාගිත්ව වාරි පද්ධති කළමනාකරණ වැඩසටහන

මහවැලි කලාප වල තෝරා ගත් ගොවි සංවිධාන වල කෙත් ඇළවල් නඩත්තු සහ මෙහෙයුම් කටයුතු ගොවි ප්‍රජාව විසින්ම කර ගැනීමේ හැකියාව ඇති කරවීම ප්‍රජා සහභාගීත්ව වාරි පද්ධති කළමනාකරණ වැඩසටහනේ ප්‍රධාන අරමුණයි. එමෙන්ම කෙත් ඇළ හා මාර්ග නියමිත ප්‍රමිතීන්ට අනුව නඩත්තු කිරීමේ තත්වයට පත් කිරීම සහ ජලය බෙදා හැරීමේ කාර්යය ක්‍රමවත් කිරීම තුලින් කාර්යක්ෂම ජල පරිහරණය කිරීමේ සංස්කෘතියට ගොවි ප්‍රජාව පත් කිරීම ප්‍රජා සහභාගිත්ව වාරි පද්ධති කළමනාකරණය තුලින් අපේක්ෂා කෙරේ.





### 3.4.3 ප්‍රජා සංවර්ධන

මහවැලි කලාප තුල මතින් තොර, හිංසනයෙන් තොර, අපචාරයන්ගෙන් තොර, සාරධර්ම සපිරි නිරෝගිමත් ගොවි ජනතාවක් බිහි කිරීම සඳහා මග පෙන්වීම ප්‍රජා සංවර්ධන වැඩසටහනේ ප්‍රධාන අරමුණ වේ. ඒ අතර සුජාත දරුවෝ වැඩසටහන, වකුගඩු රෝග නිවාරණය පිළිබඳ සායන පැවැත්වීම හා පිරිසිදු පානීය ජල ව්‍යාපෘති සැකසීම, මත්ද්‍රව්‍ය හා දුම්වැටි භාවිතය වැළැක්වීම සඳහා දැනුවත් කිරීමේ වැඩසටහන් පැවැත්වීම, ළමා අපචාර,

කාන්තා හිංසනය, අඩු වයස් ගැබ් ගැනීම් වැළැක්වීම සඳහා දැනුවත් කිරීම් හා ගෘහස්ථ ප්‍රචණ්ඩත්වය පිටු දැකිම සඳහා වූ වැඩසටහන් මේ වර්ෂය තුල සිදු කරන ලද වැඩසටහන් අතර ප්‍රධාන වේ.






<u>2016 වර්ෂයේ ආයතන සංවර්ධන අංශයේ ප්‍රගතිය</u>

- සියළුම මහවැලි කලාපයන් ආවරණය වන පරිදි හොඳම මහවැලි මහ ගොවියා හා හොඳම මහවැලි ගොවි සංවිධානය - 2016 තේරීමේ තරඟය පවත්වන ලදි. **එම තරඟාවලියේ දි හුරුළුවැව කලාපය හොඳම මහවැලි මහ ගොවියා තරඟය සඳහා තේරී පත් වූ අතර හොඳම මහවැලි ගොවි සංවිධානය ඇති කලාපය ලෙස තේරී පත් වූයේ බකමූණ කලාපයයි.** රු. මිලියන 7.434ක් පමණ වටිනා ත්‍යාග ඔවුන් වෙත පිරිනමන ලදි. මෙම සියළු ත්‍යාග අතිගරු ජනාධිපතිතුමාගේ සුරතින් ලබාදෙන ලදි.

- හොඳම මහවැලි මහ ගොවියා හා හොඳම මහවැලි ගොවි සංවිධානය - 2016 තේරීමේ තරඟයේ උත්සව කටයුතු ඇතුළු ගොවි සංවිධාන ප්‍රවර්ධන කටයුතු සඳහා හා වාරි පද්ධති කළමනාකරණ වැඩසටහන සඳහා රු.මිලියන 3.2ක පමණ මුදලක් වැය කර ඇත.

- සහභාගිත්ව වාරි පද්ධති කළමනාකරණ වැඩසටහන යටතේ ඇළ වේලි පිළිසකර කිරිමේ කටයුතු සියළුම මහවැලි කලාපයන් ආවරණය වන පරිදි සිදු කරන ලද අතර ඒ සඳහා මහවැලි අධිකාරිය අමුද්‍රව්‍ය සැපයිම සඳහා පමණක් සිය දායකත්වය ලබාදෙන ලදි. ශ්‍රම දායකත්වය ගොවි සංවිධාන විසින් ලබාදුන් බැවින් එහි නිමැවුම වෙනුවෙන් රජයට අති විශාල මුදලක් ඉතිරි කර ගැනීමට හැකි විය.

- "සුජාත දරුවෝ" මත්ද්‍රව්‍ය නිවාරණ ස්වේච්ඡා නායකයින් පුහුණු කිරීමේ පුහුණු වැඩසටහන් 10ක් සියළුම කලාපයන් ආවරණය වන පරිදි පවත්වා ඇත. එහි දී 250ක පමණ තරුණ ස්වේච්ඡා නායක නායිකාවන් පිරිසක් පුහුණුව ලබා ඇත. මෙම වැඩසටහන් පැවැත්වීම සඳහා රු. මිලියන 1.1ක පමණ මුදලක් වෙන් කොට තිබූ අතර රු. මිලියන 0.924ක මුදලක් වැය කර ඇත.

- ජාතික ප්‍රජා ජල සැපයුම් දෙපාර්තමේන්තුව මගින් මහවැලි "එල්" කලාපයේ හා "බී" කලාපයේ ගම්මාන වල ප්‍රති ආශ්‍රැති ජල පිරිපහදු යන්ත්‍ර 20ක් සවි කිරිම සඳහා යන්ත්‍ර ලබා දී ඇති අතර එම කලාපයන් හි ඒ සඳහා Plant Room ඉදි කිරිම අවසන් කොට ඇත. ඒ අනුව ජල පිරිපහදු යන්ත්‍ර බොහෝ ප්‍රමාණයක් ජාතික ප්‍රජා ජල සැපයුම් දෙපාර්තමේන්තුව මගින් මේ වනවිට ස්ථාපනය කොට අවසන් කර ඇත.

## 3.5 ව්‍යාපාර සංවර්ධන අංශය

මහවැලි ජනපදික ප්‍රදේශ වල වාරි හා ඉඩම් සම්පත් ප්‍රයෝජනයට ගනිමින් ව්‍යාපාර සංවර්ධනය සඳහා ව්‍යාපෘති සැළසුම් කිරීම , පෞද්ගලික අංශයේ ව්‍යාපාර සංවර්ධනයට යොමුකර ගැනීම , ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම සඳහා ක්‍රමෝපායන් සකස්කිරීම හා ඇගයීම , ව්‍යාපාරික ඉල්ලුමේ ස්වභාවය අනුව වෙළඳපල සමීක්ෂණ පැවැත්වීම , කුඩා ව්‍යාපාර ප්‍රවර්ධනය කිරීම හා මහවැලි නිෂ්පාදන අලෙවි ප්‍රවර්ධන කටයුතු දෙවන හා තෙවන පරම්පරාවන් සඳහා රැකියා අවස්ථාවන් සපයා දීම හා ඔවුන්ගේ ව්‍යවසායකත්ව ගුණාංග වැඩි දියුණු කිරීම , පරිසර හිතකාමී සහ ගොවිපළ පදනම් කර ගත 'සංචාරක ව්‍යාපෘති ප්‍රවර්ධනය, සුළු හා මධ්‍යම පරිමාණ ණය යොජනා ක්‍රම දියත් කර ආයෝජකයින්ගේ ප්‍රාග්ධන අවශ්‍යතා සපුරාලීම විශේෂයෙන් මෙම අංශය වෙත පැවරුනු කාර්යයන් වේ



ව්‍යාපාර සංවර්ධන අංශයේ කාර්යභාරය

- සත්ව පාලන,විසිතුරු මත්ස්‍ය,පොල් වගාව,වෙනත් බෝග හා පලතුරු වගා ආදී ආයෝජන ව්‍යාපෘති සඳහා ඉඩම් ලබාදීම මත බදු ආදායම් ලබා ගැනීම
- පරිසර හිතකාමී සංචාරක අවස්ථා පුළුල් කිරීම උදෙසා ජලාශවල සංචාරක බෝට්ටු සේවා සඳහා අවසර ලබාදී වාර්ෂික බදු මුදලක් ලබා ගැනීම

| අනු අංකය | ජලාශය/ ගංගාව | ආයෝජකයා පිළිබඳ තොරතුරු ( ලිපිනය) | බදු කාලසීමාව | මූලික තැන්පතුව රු. | වාර්ෂික බදු මුදල රු. |
|---|---|---|---|---|---|
| 01 | වික්ටෝරියා | 339/6,මීගමු පාර,පැලියගොඩ | 2016.01.06 සිට 2021.01.05 දක්වා | 100,000.00 | පලමු වර්ෂ 2 සඳහා 75000 බැගින් වන අතර පසුව 5% බැගින් වාර්ෂිකව වැඩි වේ. |
| 02 | පොල්ගොල්ල | මහවැලි රිච් හෝටලය 35, පී.බී.ඒ. වීරකෝන් මාවත, මහනුවර | 2016.02.09 සිට 2019.02.08 දක්වා | 100,000.00 | 181,912.50 |
| | | අංක 117, සර් චිත්තම්පලම් ඒ. ගාර්ඩිනර් මාවත, කොළඹ 02 | 2016.02.09 සිට 2019.02.08 දක්වා | 100,000.00 | 181,912.50 |
| | | මහවැලි රිච් හෝටලය, අංක 35, පී.බී.ඒ වීරකොන් මාවත,මහනුවර | 2016.08.02 සිට 2018.08.02 | අවු 02 | 300,000.00 |
| 03 | කොත්මලේ | අංක27/15, රොස්මීඩ් පෙදෙස, කොළඹ07 | අවු.01 | 50,000.00 | 30,000.00 |
| 04 | දඹුලුඔය | ඩී.පී.තලගල ප්ලෙෂර් අයිලන්ඩ්, ජලාශ පාර,දඹුල්ල | අවු 01 | 100,000.00 | 330,000.00 |
| 05 | මහවැලි ගඟ | නිමල් එන් පීරිස්, කළමනාකාර අධ්‍යක්ෂ, රිවර්ස් එජ් කැන්ඩි(පුද්)සමාගම, අංක 409,ජෝර්ජ් ඊ ද සිල්වා මාවත, මහනුවර | අවු 02 | | 75,000.00 |
| 06 | කටුපිල වැව | කැටියප ගමගේ,සුදර්මා ප්‍රියදර්ශනි අංක 159,කොවුල්ආර උතුර,සෙවනගල | අවු 01 | 10,000.00 | 100,000.00 |

- මහවැලි බල ප්‍රදේශවල ඉතා ආකර්ෂණීය ස්ථානවල පිහිටි සංචාරක බංගලා නවීකරණය කරමින් දෙස් විදෙස් සංචාරකයින්ට විවෘත කිරීම තුලින් අදායම් උත්පාදනය
- සූර්ය බල ශක්ති,ජෛව ස්කන්ධ විදුලි බල ශක්ති ,ජල විදුලි බල ශක්ති ආදි විදුලිබල ව්‍යාපෘති සඳහා ලබාදුන් ඉඩම් වල බදු අදායම්/මහවැලි අධිකාරිය සමඟ හවුල් ව්‍යාපාර ලෙස ආරම්භ කිරීම තුලින් ලාභ ඉපයීම
- ප්‍රදේශීය ආර්ථික සංවර්ධනයට සෘජුවම දායකවන ව්‍යාපෘති සඳහා අවශ්‍ය ජලය සැපයීම තුලින් ආදායම් ලබා ගැනීම
- ජලාශ මතු පිට පාවෙන සූර්ය බල ශක්ති විදුලි ව්‍යාපෘති සඳහා මහවැලි ජලාශ මතුපිට ආයෝජන අවස්ථා සලසාදීම
- දේශීය සීනි අවශ්‍යතාවය මෙරට තුලදීම නිෂ්පාදනය කිරීම සඳහා සීනි කර්මාන්ත ශාලා වැනි ව්‍යාපෘතිවල ඉඩම් සහ ප්‍රදේශයේ ගොවීන් අතර ඉඩම් බෙදා දීම මඟින් බදු අදායම මෙන්ම රාජ්‍යභාගය ලබා ගැනීම
- කළුගල් /ඛනිජ ද්‍රව්‍ය(ඩොලමයිට්,තිරුවානා,ඇපටයිට්,මයිකා,හුනුගල් ) ආශ්‍රිත කර්මාන්ත සඳහා ලබාදෙන ඉඩම් වල බදු හා ඉවත් කරනු ලබන කියුබ් ප්‍රමාණය අනුව අයකිරීම.
- කර්මාන්ත උද්‍යාන පවත්වා ගෙන යාම මඟින් ප්‍රදේශීය මට්ටමේ ආර්ථිකය ශක්තිමත් කිරීම
- තිලාපියා වැනි මිරිදිය මත්ස්‍යයින් ජලාශ වල දැල් කුඩු තුල ඇති කිරීමේ ව්‍යාපෘති මඟින් විදේශීය විනිමය ඉපයීම සඳහා කුඩා සහ මධ්‍යම පරිමාණ ව්‍යවසායකයින් දිරි ගැන්වීම

### 3.5.1. 2016 වර්ෂයේ සිදුකල ක්‍රියාකාරකම්

- ව්‍යාපාර කෘෂිකාර්මික බෝග වගාව හා පලතුරු වගාව,විසිතුරු මත්ස්‍ය ව්‍යාපෘති,ඇගලුම්හල්, සහල් සැකසුම්,හා කුඩා විදුලි බලාගාර වැනි ව්‍යාපෘති සඳහා ඉඩම් ආයෝජකයින්ට බදු පදනම මත ඉඩම් බැහැර කිරීම සිදුකර ඇත.

**ආයෝජන ව්‍යාපෘති ප්‍රගති සාරාංශය (2016 අවසන් වන විට)**

| අනු අංක | මහවැලි කලාප | බැහැර කර ඇති ආයෝජන ව්‍යාපෘති සංඛ්‍යාව | වපසරිය (හෙක්.) | ලබා දී ඇති ව්‍යාපෘති | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | | | වානිජ බෝග | ? සත්තව | විසිතුරු මසුන් | ඇගළුම් | වී මෝල් | බලශක්ති | සංචාරක ව්‍යාපාර | ව්‍යාපාර වන | වෙනත් |
| 1 | බී කලාපය | 297 | 2833.6 | 168 | 19 | 31 | 3 | 18 | 4 | 9 | 12 | 33 |
| 2 | සී කලාපය | 20 | 971.3 | 8 | - | - | 1 | 3 | 2 | 1 | 3 | 2 |
| 3 | ඩී කලාපය | 8 | 698.05 | 7 | 1 | - | - | - | - | - | - | - |
| 4 | එච් කලාපය | 33 | 209.14 | 15 | 1 | 2 | 4 | 6 | - | 2 | 2 | - |
| 5 | එල් කලාපය | 38 | 406 | 36 | - | - | - | - | - | - | 2 | 1 |
| 6 | වලව කලාපය | 37 | 331.8 | 13 | - | - | 3 | - | 7 | 4 | - | 10 |
| 7 | රඹකැන්ඔය කලාපය | 6 | 42.89 | 2 | 1 | - | 1 | - | - | 1 | - | 1 |
| 8 | වික්ටෝරියා කලාපය | 24 | 30.33 | 1 | - | - | 2 | - | - | 2 | 1 | 18 |
| 9 | හුරුළු වැව | 5 | 65.4 | 1 | - | - | 1 | 2 | - | 1 | - | - |
| | | **468** | **5588.51** | **251** | **22** | **33** | **15** | **29** | **13** | **20** | **20** | **65** |

**මෙහි සඳහන් කර ඇති ආයෝජන ව්‍යාපෘති සඳහා ලබාදුන් ඉඩම්වල පිහිටුවා ඇති වී මෝල සංඛ්‍යාවට අමතරව කලාපවල වී මෝල් 620ක් ස්ථාපිතව ඇත.**

- මහවැලි ජලාශවල බෝට්ටු සේවා ආරම්භ කිරීම

මහවැලි දිරිය ණය යෝජනා ක්‍රමය (2016 දෙසැම්බර් දක්වා)

| කලාපය | ණය ලබාදුන් ගොවි සංවිධාන ගණන | ණය මුදල රු |
|---|---|---|
| එච් | 09 | 12,700,000.00 |
| වලව | 02 | 4,735,000.00 |
| එකතුව | 11 | 17,435,000.00 |

මහවැලි සවිය ණය යෝජනා ක්‍රමය (2016 දෙසැම්බර් දක්වා)

| කලාපය | ණය ලබාදුන් ගොවි සංවිධාන ගණන | ණය මුදල රු |
|---|---|---|
| එච් | 162 | 27,040,000.00 |
| සී | 87 | 15,455,000.00 |
| බී | 479 | 81,800,000.00 |
| ජී | 99 | 14,545,000.00 |
| ඩී | 64 | 10,730,000.00 |
| රඹකැන්ඔය | 3 | 400,000.00 |
| හුරුළුවැව | 134 | 7,340,000.00 |
| වික්ටෝරියා | 7 | 543,400.00 |
| වලව | 183 | 37,740,000.00 |
| **එකතුව** | **1218** | **190,593,400.00** |

# සිව්වැනි පරිච්ඡේදය
# මානව සම්පත් හා මූල්‍ය කළමනාකරණ අංශය

## 4.1 මානව සම්පත් කළමණාකරණ අංශය

ශ්‍රී ලංකා මහවැලි අධිකාරියේ 4628 ක් පමණ වන කාර්ය මණ්ඩලය සඳහා මානව සම්පත් සැළසුම් සකස් කිරිම මානව සම්පත් අත්පත්කර ගැනිම් සඳහා තෝරාගැනිම්, බඳවාගැනීමේ හා පත්කිරිම් , ධාරිතා සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරිම් , සේවක ස්ථානගත කිරිම්, සෑම තනතුරක් සඳහාම කාර්ය නිර්ණය කිරිම් සහ කාර්ය ඵල ඇගයිම් , කාර්‍ය්‍යක්‍ෂම ඇගයිම් , උසස්වීම් විශ්‍රාම ගැන්වීම්, සේවක වැටුප් හා ප්‍රතිලාභ ලබාදීම් , සේවක විනය පවත්වාගෙන යාම,කාර්ය මණ්ඩල පරිපාලනයට අදාළ කම්කරු ප්‍රඥප්ති ක්‍රියාත්මක කිරිම් හා ඊට අදාළ ව්‍යවස්ථාපිත ආයතන මගින් ලබා දෙන තීන්දු තීරණ ක්‍රියාත්මක කිරීම්, ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය සතු වාහන, නිල නිවාස, සංචාරක නිකේතන, සම්මන්ත්‍රණ ශාලා, පුහුණු මධ්‍යස්ථාන වෙන්කිරිම් හා පරිපාලන හා කළමනාකරණය, වැනි විශේෂිත වූ කාර්යභාරයන් මෙම අංශය මගින් සිදු කරනු ලැබේ.

- කාර්යය මණ්ඩලය සැලසුම් කිරීම
- සේවක සංඛ්‍යාව හඳුනා ගැනීම හා කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අනුමැතිය ලබා ගැනීම
- අයදුම්පත් කැඳවීම, විභාග/සම්මුඛ පරීක්ෂණ පැවැත්වීම හා සුදුස්සන් තෝරාපත් කරගැනීම
- විනය පරිපාලන කටයුතු
- මානව සම්පත් ධාරිතා සංවර්ධන හා පුහුණු වැඩමුළු පැවැත්වීම
- දේශීය විදේශීය ශිෂ්‍යත්ව ලබාදීම
- මානව සම්පත් අභිප්‍රේරණය හා ආකල්ප කුසලතා වර්ධන වැඩසටහන් පැවැත්වීම
- ස්ථානමාරු, විශ්‍රාම ගැන්වීම් හා පාරිතෝෂික දීමනා ඇතුළු අනෙකුත් ප්‍රතිලාභ ලබාදීම
- මහජන සම්බන්ධතාවය
- පාර්ලිමේන්තු උපදේශකකාරකසභා, මහජන පෙත්සම් කාරක සභා වල වාචික ප්‍රශ්න වලට පිළිතුරු සැපයීම

**පිරිස් හා පාලන අංශය 2016 වර්ෂයේ අත් කර ගත් ප්‍රගතිය**

**බඳවා ගැනීම්**

<table>
<tr><th colspan="3">බඳවා ගැනීම</th><th>උසස් වීම්</th></tr>
<tr><th>අ/අ</th><th>සේවා ගණය</th><th>තනතුරු සංඛ්‍යාව</th><th>තනතුරු සංඛ්‍යාව</th></tr>
<tr><td>01</td><td>HM 1-1</td><td>01</td><td>01</td></tr>
<tr><td>02</td><td>MM 1-1</td><td>56</td><td>45</td></tr>
<tr><td>03</td><td>JM 1-1</td><td>12</td><td>68</td></tr>
<tr><td>04</td><td>MA 2-2</td><td rowspan="3">262</td><td rowspan="3">62</td></tr>
<tr><td>05</td><td>MA 1-2</td></tr>
<tr><td>06</td><td>PL 1</td></tr>
<tr><td>06</td><td>එකතුව</td><td>331</td><td>176</td></tr>
</table>

## විශ්‍රාමගැන්වීම

| අ/අ | සේවා ගණය | තනතුරු සංඛ්‍යාව |
|---|---|---|
| 01 | HM 1-1 | 04 |
| 02 | MM 1-1 | 22 |
| 03 | JM 1-1 | 10 |
| 04 | MA 2-2 | 20 |
| 05 | MA 3 | 01 |
| 06 | MA 1-2 | 06 |
| 07 | PL 1 | 01 |
| 08 | PL 3 | 06 |
| | **එකතුව** | **70** |

| 2016 වර්ෂයේ පුහුණු කිරීම් | | |
|---|---|---|
| **වැඩසටහන් වර්ගීකරණය** | **සහභාගි වූ සංඛ්‍යාව** | **පැවැත්වූ වැඩසටහන් ගණන** |
| දැනුවත් කිරීමේ වැඩසටහන් | 85 | 03 |
| කුසලතා සංවර්ධන වැඩසටහන් | 200 | 8 |
| කළමනාකරණ වැඩසටහන් | 60 | 3 |
| ධාරිතා සංවර්ධන වැඩසටහන් | 95 | 3 |
| කෘෂිකර්ම සංවර්ධන වැඩසටහන් | 250 | 10 |
| තාක්ෂණික සංවර්ධන වැඩසටහන් | 10 | 1 |

## 4.2 නීති අංශය

1979 අංක 23 දරණ මහවැලි අධිකාරි පනත හා ඊට අනුශාංගික පනත් 23 කට අදාළ නීතිමය කටයුතු සැලසුම් කිරිම, ක්‍රියාත්මක කිරිම , විවිධ ආයතන හා පුද්ගලයින් අතර සිදුවන නෛතික ගිවිසුම් සැකසුම් හා ක්‍රියාවට නැංවීම , සේව්‍ය සේවක ගැටළු සම්බන්ධයෙන් යොමුවුනු පැමිණිලි සම්බන්ධව පාර්ලිමේන්තු උපදේශන කාරක සභාව, පෙත්සම් කාරක සභාව, පරිපාලන කටයුතු පිළිබඳ පාර්ලිමේන්තු කොමසාරිස් , බේරුම්කරණය , කම්කරු විනිශ්වය සභාව , මානව හිමිකම් කොමිෂන් සභාව වැනි නෛතික ආයතන සමග සම්බන්ධිකරණය මෙම අංශයට පැවරි ඇති රාජකාරි අතර ප්‍රධාන තැනක් ගනී.

## 4..3 මුදල් අංශය

ආයතනයේ සංයුක්ත සැලසුම් හා වාර්ෂික සැලසුම් අනුව ඇස්තමේන්තු පිළියෙල කිරිම , ජාතික අයවැය ලේඛනය යටතේ මහවැලි අධිකාරිය සඳහා කරනු ලබන ප්‍රතිපාදන මත අයවැය යෝජනා සැලැස්ම , මාසිකව අවශ්‍ය මුදල් පිළිබඳ පුරෝකථනය කිරිම හා භාණ්ඩාගාරයේ අත් මුදල් ලබා ගැනීම් , දේශිය හා විදේශීය ව්‍යාපෘති වල වාර්ෂික ඇස්තමේන්තු පිළියෙල කිරිම හා ප්‍රතිපාදන ලබා ගන්නා වූ සේවක වැටුප් හා අනෙකුත් ගෙවීම් කළමණාකරන ආයතනයක් භෞතික සම්පත් කළමණාකරනය , විගණන විමසුම් සහ රාජ්‍ය ව්‍යයසාය පිළිබඳ පාර්ලිමේන්තු කාරක සභාවේ විමසුම් අනුව තොරතුරු සැපයීම වැනි මූල්‍ය කළමණාකරන කටයුතු මෙම අංශය වෙත පැවරෙන විශේෂ කාර්යභාරය වේ.

**වගුව 53 - 2016 වර්ෂයට අදාලව ආයතනය වෙත වෙන්කරන ලද ප්‍රතිපාදන හා වියදම්**

| | | | | |
|---|---|---|---|---|
| **ප්‍රතිපාදන හා වියදම් පිළිබඳ විස්තර - 2016** | | | | |
| | | | | **රු'000** |
| | | **ප්‍රාග්ධන මූල** | **ප්‍රතිපාදන** | **වියදම්** |
| 160-2-4-1503 | පුනරාවර්තන වියදම් | දේශීය | 3,054,493 | 2,949,426 |
| 160-2-4-5-2201 | ප්‍රාග්ධන වියදම් | දේශීය | 2,000,000 | 1,810,160 |
| | **අනිකුත් මහවැලි ව්‍යාපෘති** | | | |
| | | | | |
| 160-2-5-3-2001 | මහවැලි ඒකාබද්ධ සංවර්ධන ව්‍යාපෘතිය | දේශීය | **500,000** | 494,216 |
| 160-2-5-6-2105 | රිදීමාලියද්ද සංවර්ධන ව්‍යාපෘතිය | දේශීය | **120,000** | 99,974 |
| 160-2-5-7-2105 | වැලිඔය ඒකාබද්ධ සංවර්ධන ව්‍යාපෘතිය | දේශීය | **605,000** | 580,508 |
| 160-2-5-8-2105 | මාදුරුඔය දකුණ ඉවුර සංවර්ධන ව්‍යාපෘතිය | දේශීය | **225,000** | 182,852 |
| 160-2-5-10-2502 | ගැටබේ මහවැලි ගඟ ඉවුරු සංවර්ධන ව්‍යාපෘතිය | දේශීය | **125,000** | 63,000 |
| 118-2-6-8-2105 | ප්‍රධාන හා මධ්‍යම වාරිමාර්ග පුනරුත්ථාපන ව්‍යාපෘතිය | දේශීය | **200,000** | 178,207 |
| | | | | 1,598,757 |

**වගුව 54 - වත්කම් හා දේපල හා උපකරණ**

| | | | | | | රු' 000 |
|---|---|---|---|---|---|---|
| විස්තරය | 2016.01.01 දිනට, පිරිවැය | මිලදී ගැනීම් | විකිණීම්, ඉවත් කිරීම්, මාරු කිරීම් | 2016.12.31 දිනට, පිරිවැය | ක්ෂයවීම | ක්ෂය අඩුකළ පසු |
| ඉඩම් | 14,929 | - | - | 14,929 | - | 14,929 |
| ඉඩම් හා ගොඩනැගිලි - කාර්යාල | 1,610,749 | 129,094 | 9,813 | 1,749,656 | 334,352 | 1,415,304 |
| ඉඩම් හා ගොඩනැගිලි - වෙනත් | 2,772,895 | 108,719 | (9,813) | 2,871,801 | 1,188,149 | 1,683,652 |
| වාහන | 1,091,291 | 8,200 | (6,060) | 1,093,431 | 574,636 | 518,795 |
| කාර්යාල උපකරණ | 57,323 | 30,934 | (969) | 87,288 | 16,928 | 70,360 |
| විදුලි ජනක | 13,702 | 3,144 | 901 | 17,747 | 4,258 | 13,489 |
| යන්ත්‍ර හා උපකරණ | 10,274 | 1,189 | 1,493 | 12,956 | 3,472 | 9,484 |
| යන්ත්‍ර හා උපකරණ - ඉදිකිරීම් | 334,210 | 1,823 | (2,123) | 333,910 | 94,561 | 239,349 |
| යන්ත්‍ර හා උපකරණ - පොදු | 85,754 | 11,695 | 322 | 97,771 | 33,869 | 63,902 |
| ගෘහ උපකරණ හා සවිකිරීම් | 150,077 | 33,269 | (2,762) | 180,584 | 84,375 | 96,209 |
| පරිගණක හා උපාංග | 67,355 | 32,406 | (134) | 99,627 | 29,376 | 70,251 |
| එකතුව | 6,208,559 | 360,473 | -9,332 | 6,559,700 | 2,363,976 | 4,195,724 |

## 4..4 මහවැලි ආරක්ෂක බලකාය

ශ්‍රී ලංකා මහවැලි අධිකාරියේ බල ප්‍රදේශයට අයත් ඉඩම් , ගොඩනැගිලි, නිලනිවාස , විශාල වාරිමාර්ග පද්ධති ජලාශ බලාගාර හා වැඩබිම් වල කාර්යමණ්ඩල හා ජානපදිකයින්ගේ ආරක්ෂක කටයුතු විශේෂ උත්සව කටයුතු වලදී ප්‍රභූ සම්මාන පැවැත්වීම් , ඉඩම් රාජකාරි හා සම්බන්ධ කැළැ ආඥාපනත , සන්තකය ආපසු ලබා ගැනීම් පනත , ක්‍රියාවට නැංවීමේදි ආරක්ෂක කටයුතු සම්බන්ධයෙන් සහයෝගය ලබාගැනීමත් මහවැලි ආරක්ෂක බලකායේ කාර්ය භාරය අතර ප්‍රධාන තැනක් ගනී.

ඒ අනුව බල ප්‍රදේශ 10ක් යටතේ අනුකාණ්ඩ 40 ක ආරක්ෂක නියාමකයින් යොදවා නේවාසික ව්‍යාපාර බල ප්‍රදේශ ව්‍යාපෘති කාර්යාල හා සියළුම ප්‍රධාන ජලාශ භාර ඉංජිනේරු කාර්යාල තුළ ආරක්ෂක කටයුතු සිදු කරනු ලැබේ.

## 4.5 මහවැලි කේන්ද්‍රය

ශ්‍රී ලංකා මහවැලි අධිකාරි බල ප්‍රදේශයේ දූවා දරුවන්ගේ අධ්‍යාපන, සංස්කෘතික හා සමාජීය ප්‍රවර්ධනය සඳහා ප්‍රතිපත්ති සම්පාදනය කිරිම , මහවැලි ප්‍රජාවගේ හා කාර්යමණ්ඩලයේ කලා කුසලතා , සන්නිවේදනය , ජනමාධ්‍ය හැකියාව , සදාචාර ප්‍රවර්ධනය ඇතිකිරිම , වාරි ශිෂ්ටාචාරය හා සාම්ප්‍රදායික ගොවිතැන් ක්‍රම පිලිබඳව ප්‍රජාව දැනුවත් කිරිමේ අරමුණින් වාරි කෞතුකාගාරයක් පවත්වාගෙන යාම වැනි කාර්යන් ඉටුකිරිමේ අරමුණින් මහවැලි කේන්ද්‍රය පිහිටුවා ඇත.

ඒ අනුව 2016 වර්ෂය තුළ අපේක්ෂිත අරමුණු කරා ළගා වෙමින් කටයුතු කර ඇති අතර පැරණි වාරි ශිෂ්ටාචාරයේ මහිමයත් මහවැලි සංවර්ධනයේ ප්‍රගතියත් විදහා දැක්වෙන තොරතුරු මධ්‍යස්ථානයක් වශයෙන් ප්‍රශස්ථ සංවර්ධන සංනිවේදන කාර්‍යයක නිරත වෙමින් මහවැලි ජනපදිකයින්ගේ සමාජ සංස්කෘතික අභිවෘද්ධිය මැනවින් ස්ථාපිත කරමින් සාඩම්බර වාරි ශිෂ්ටාචාරයක උරුමය, සංවර්ධන සංකල්ප හා කුසලතා අධ්‍යයනය කරමින් තිරසාර සංවර්ධනය ප්‍රවේශයට ක්‍රියාකාරි වන පාසැල් හා විශ්ව විද්‍යාල සිසුන්ට සහ සැලසුම් සම්පාදනයට තොරතුරු සම්පාදනයෙන් සහය වීම තුලින් මෙම වර්ෂය තුළ පහත සඳහන් ප්‍රගතින් අත්කරගෙන ඇත.

- මහවැලි කේන්ද්‍රයේ 2016 වර්ෂය සඳහා සංශෝධිත වැඩ සැලැස්ම අනුව වෙන්කර ඇති මුදල් ප්‍රතිපාදනය රුපියල් මිලියන 25.084 ක් වන අතර සියලුම කලාපයන් සඳහා රුපියල් මිලියන 32.12 ක මුදල් ප්‍රතිපාදනයක් වෙන්කර තිබුණි. 2016 වර්ෂය අවසානය වන විට මහවැලි ක්‍රීඩා සහ මහවැලි ප්‍රතිභා වැඩසටහන් සඳහා කලාපීය මුදල් ප්‍රතිපාදනය සමග සමස්ථ ප්‍රතිපාදනය වන රුපියල් මිලියන 57.2 ක මුදලින් රුපියල් මිලියන 48.54 ක මුදලක් වියදම් කර තිබූ අතර, මෙම ප්‍රගතිය භෞතිකව 84% ක් වේ. කලාපීය මට්ටමින් සැලසුම් කර තිබූ මහවැලි ක්‍රීඩා සහ මහවැලි ප්‍රතිභා වැඩසටහන් ප්‍රසස්ථ මට්ටමින් ඉටු කර තිබුණු අතර, මහවැලි කේන්ද්‍රයේ සමස්ථ වැය රුපියල් මිලියන 18.91 ක් ද, එය භෞතිකව 75.39 % ක ප්‍රගතියක් පෙන්නුම් කර ඇත.
- 2016 වාර්ෂික වැඩ සැලැස්ම අනුව මහවැලි කේන්ද්‍රය නවීකරණ කටයුතු සඳහා සහ ශ්‍රව්‍ය දෘෂ්‍ය උපකරණ මිළදී ගැනීම සඳහා 14.824 ක මුදල් ප්‍රතිපාදනයක් වෙන්කර තිබූ අතර, නවීකරණ කටයුතු සඳහා සකස් කළ සැලැස්මෙන් ආරම්භක පියවරක ප්‍රගතියක් ලගාකර ගත හැකිව තිබුණි. දියවර වාරි පුවත් සංග්‍රහය කලාප දෙකක් මුද්‍රණය කර බෙදා හැරීමට කටයුතු සිදුකර ඇත.
- කලාප මට්ටමින් ක්‍රීඩා සඳහා දක්ෂ දරු දැරියන් 15,028 දෙනෙකු තෝරා ක්‍රීඩා සමාජ සහ ක්‍රීඩා සංවිධානත්, කලාප මට්ටමින් තෝරාගන්නා ලද දරු දැරියන් 4300 දෙනෙකුගේ සාමාජිකත්වයෙන් සංස්කෘතික බලකායන් සහ සංස්කෘතික මධ්‍යස්ථාන පිහිටුවීමටත් කටයුතු කර ඇත.

**ක්‍රීඩා සමාජ සහ සංවිධාන පිළිබද විස්තර**

| අනු අංකය | කලාපය | ක්‍රීඩා සමාජ | ක්‍රීඩා සංවිධාන |
|---|---|---|---|
| 1 | බී කලාපය | 48 | 08 |
| 2 | සී කලාපය | 12 | 07 |
| 3 | ඩී කලාපය | 04 | 02 |
| 4 | ජී කලාපය | 11 | 03 |
| 5 | එච් කලාපය | 25 | 07 |
| 6 | එල් කලාපය | 11 | 02 |
| 7 | හුරුලුවැව කලාපය | 05 | 05 |
| 8 | වලව කලාපය | 12 | 06 |
| 9 | වික්ටෝරියා කලාපය | 05 | 02 |
| 10 | රඹකැන්ඔය කලාපය | 48 | 02 |

සංස්කෘතික බලකායන් සහ සංස්කෘතික මධ්‍යස්ථාන පිළිබද විස්තර

| අනු අංකය | සංස්කෘතික බලකාය | සංස්කෘතික මධ්‍යස්ථාන සංඛ්‍යාව | සිසුන් ප්‍රමාණය |
|---|---|---|---|
| 1 | බී කලාපය | 07 | 900 |
| 2 | සී කලාපය | 08 | 825 |
| 3 | ඩී කලාපය | 02 | 750 |
| 4 | ජී කලාපය | 04 | 250 |
| 5 | එච් කලාපය | 08 | 400 |
| 6 | එල් කලාපය | 03 | 75 |
| 7 | හුරුලුවැව කලාපය | 05 | 400 |
| 8 | වලව කලාපය | 05 | 250 |
| 9 | වික්ටෝරියා කලාපය | 02 | 200 |
| 10 | රඹකැන්ඔය කලාපය | 03 | 250 |

## 4..6 ප්‍රවාහන අංශය

ශ්‍රී ලංකා මහවැලි අධිකාරියේ රථවාහන 558 ක් ප්‍රමාණයක් පවතින අතර , එකි වාහන අත්පත් කර ගැනීම් ,නඩත්තු හා කළමණාකරනය ප්‍රවාහන අංශය වෙත පැවරී ඇත. දැනට බොහෝමයක් වාහන අලුත්වැඩියා තත්වයේ පවතින අතර වර්ෂය තුළ පහත සදහන් කාර්යයන් ප්‍රවාහන අංශය තුලින් සිදුකර ඇත.

**2016 වසරේ සිදු කළ කාර්යභාරයන්**

2016 වර්ෂයේ අයවැයෙන් රු. 1200000 ක මුදලක් වෙන් කර තිබූ අතර ඒ අනුව පහත සදහන් කාර්යයන් ඉටු කර ඇත.

1. වාහන 321 ක අළුත්වැඩියා කටයුතු සිදුකර ඇති අතර, ඒ සදහා රු. 14820047.38 ක මුදලක් වැය කිරීම
2. පෞද්ගලික ආයතන වලින් වාහන 101 ක වාර සේවාවන් ඉටු කර ගෙන ඇති අතර, එ සදහා රු. 2114524.91 ක මුදලක් වැය කර ඇත.
3. වාහන 68 ක වාර සේවා කටයුතු යාන්ත්‍රික වැඩ පළෙන් ඉටු කර ගෙන ඇත.
4. තුන්වෙනි පන්තියේ රක්ෂණය හා පූර්ණ රක්ෂණ ගාස්තු වශයෙන් 2016 වසරේ ප්‍රතිපාදන වලින් රු. 1205325.22 වැය වී ඇත

# පස්වන පරිච්ඡේදය

## 5.1 ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය යටතේ පිහිටුවනු ලැබ ඇති සමාගම්

සමාගම් පනත යටතේ ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය විසින් සිදුකළ ව්‍යාපාරික කටයුතු වලින් කොටසක් කළමණාකරනය සඳහා පහත සඳහන් පෞද්ගලික සමාගම් වෙත පවරා දී ඇත.

1. **සී/ස මහවැලි පශු සම්පත් හා කෘෂි ව්‍යාපාර (පුද්ගලික) සමාගම**
   **Mahawali Livestock & Agro Entreprices (Pvt) Ltd**

2. **සී/ස මහවැලි උපදේශණ සේවා කාර්යංශ (පුද්ගලික) සමාගම**
   **Mahawali Consultancy Bureau (Pvt) Ltd**

3. **ස්වාභාවික සම්පත් කළමනාකරණ සේවා (පුද්) සේවා සමාගම**
   **Natural Resources Management Services (Pvt) Ltd**

**2016 වර්ෂය තුළ සමාගම් වල කාර්‍ය සාධනය**

| අනු අං: | සමාගම | වර්ෂය තුළ ඉටුකළ කාර්ය /තත්වය |
|---|---|---|
| 01 | සී/ස මහවැලි පශු සම්පත් හා කෘෂි ව්‍යාපාර )පුද්ගලික ( සමාගම | ❖ පළාතේ ගොවීන්ගෙන් කිරි එකතු කිරීම හා සේවාවන් සැපයීම.<br>❖ කිරි ආශ්‍රිත නිෂ්පාදන කටයුතු<br>❖ ගම් කුකුල් ව්‍යාපෘතියක් මඟින් ගොවීන් වෙත පැටවුන් ලබා දීම.<br>❖ පූං ගවයන් ලෙස යොදා ගැනීම සඳහා මීගවයන් සත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුව වෙත ලබා දීම.<br>❖ තත්වයෙන් උසස් බ්‍රොයිලර් මස් නිෂ්පාදනය කර අලෙවිය. |
| 02 | සී/ස වෙන්චර් කැපිටල් (පුද්ගලික) සමාගම | වසා දැමීමට කටයුතු සිදුකරමින් පවති. |
| 03 | සී/ස මහවැලි උපදේශන සේවා කාර්යංශ (පුද්ගලික) සමාගම | ශක්‍යතා අධ්‍යනයන්ගෙන් හා කොන්ත්‍රාත් කටයුතු වලින් 2016 වසරේ මෙහෙයුම් ආදායම් උත්පාදනය කර ඇත. |
| 04 | ස්වාභාවික සම්පත් කළමනාකරණ සේවා (පුද්ගලික) සමාගම | පහත කටයුතු වලින් 2014වසරේ මෙහෙයුම් ආදායම් උත්පාදනය කර ඇත.<br>• වික්ටෝරියා හා කොත්මලේ කලාපයේ ඉඩම් මිනුම්කරනය සහ සැලසුම් සකස් කිරීම - රු.213,800.00<br>• පාංශු පර්යේෂණ ව්‍යාපෘතිය- රු.1,018,479.01<br>• H-Q measurement of Nanuoya & Coledoniya gauging station -රු.437,472.00<br>• මාතලේ දිස්ත්‍රික්කයේ පුවක්පිටිය සහ ඉලුක්කුඹුර කාබනික ගොවිපළ ව්‍යාපෘතිය- රු.200,000.00<br>• හපුතලේ ප්ලාන්ටේෂන් ව්‍යාපෘතිය- රු.160,000.00 |

| සමාගමේ නම | ආරම්භ කල වර්ෂය | ලියාපදිංචිය | කොටස් කරුවන් | කොටස් | සභාපති | අධ්‍යක්ෂ මණ්ඩලය | ප්‍රධාන කාර්යාලීය ලිපිනය | 2015 වන විට සමාගමේ තත්වය | 2015 ගිණුම් විගණනය කර ඇත්ද |
|---|---|---|---|---|---|---|---|---|---|
| සී/ස වෙන්චර් කැපිටල් ) පුද්ගලික ( සමාගම | 1997.03.17 | 2007 අංක 07 දරණ සමාගම් පනත යටතේ PV9854 | K.H.S. ගුණතිලක මයා<br>ලලිත් ගොඩමුන්න මයා<br>පෝල් ලෙස්ලි බෙන්ඩික් මයා | 01<br>01<br>01 | නැත | M.විජිතසේන මයා<br>රත්නසිරි වේරගල මයා | 07වන මහල ,ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය , අංක ,500 ටී.බී .ජයා මාවත , කොළඹ10- | වසා දැමීමට කටයුතු කෙරෙමින් පවතී | 2015 සඳහා විගණන කෙටුම්පත් වාර්තා ඉදිරිපත් කර ඇත. |
| සී/ස මහවැලි පශු සම්පත් හා කෘෂි ව්‍යාපාර ) පුද්ගලික ( සමාගම | 1999.06.14 | 2007 අංක 07 දරණ සමාගම් පනත යටතේ ලියාපදිංචි යට යවා ඇත . පැරණි ලි.ප . N)PVS(23849 | මහවැලි අධිකාරිය | | නිමල් එන් . පීරිස් මයා | එඩ්වඩ් ද මැල් මහතා<br>ඔස්මන් ද සිල්වා මහතා<br>ඉන්ද්‍රානි රාමනායක මිය | අංක- ,20/260බෙස්ලයින් පාර , කොළඹ10- | ක්‍රියාත්මක තත්වයේ පවතී. | විගණනය කර ඇත. |
| සී/ස මහවැලි උපදේශන සේවා කාර්යංශ ) පුද්ගලික ( සමාගම | 1998.06.18 | 2007 අංක 07 දරණ සමාගම් පනත යටතේ PV23849 | මහවැලි අධිකාරිය<br>තිස්ස සේනාරත්න මයා | 6385<br>01 | හර්ෂ සමරවීර මයා | ඉංජි එල්.ආර්.එච්. පෙරේරා මහතා<br>කේ.එල්.එස්.සහබන්දු මහතා<br>වෛද්‍ය හර්ෂ සමරවීර මහතා | අංක ,11- ජාවත්ත , පාර , කොළඹ.05- | ක්‍රියාත්මක තත්වයේ පවතී. | විගණනය කර ඇත. |
| ස්වාභාවික සම්පත් කළමනාකරණ සේවා ) පුද්ගලික ( සමාගම | 1999.07.30 | 2007 අංක 07 දරණ සමාගම් පනත යටතේ PV4398 | මහවැලි අධිකාරිය<br>H.M. මන්ත්‍රීතිලක මයා<br>D.R.වනිගරත්න මයා | 1500<br>01<br>01 | විරාජ් ඩයස් මයා | ඒ.එම්.කේ.බී . අත්තනායක මහතා<br>බී.ඩබ්.එම්.ඩබ්. සෙනෙවිරත්න මහතා<br>මහාචාර්ය ලාල් ධර්මසිරි මයා | වෙල්ල පෙදෙස , පොල්ගොල්ල | ක්‍රියාත්මක තත්වයේ පවතී. | විගණනය කර ඇත. |

# වාර්ෂික ගිණුම්

## II කොටස

# මූලාශ්‍ර ප්‍රකාශ සඳහා සටහන්

## 1. වාර්තාකරණ ව්‍යුහය

1979 අංක 23 දරණ පනත යටතේ ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය ස්ථාපිත කරන ලදී. 1979 අංක 23 දරණ පනත යටතේ කාර්යයන් ස්ථාපිත කෙරිණ. ශ්‍රී ලංකා මහවැලි අධිකාරියේ කාර්යයන් එම පනතේ 12 වගන්තියෙහි දක්වා ඇති අතර මහවැලි සංවර්ධන වැඩ පිළිවෙල ක්‍රියාත්මක කිරීමේ කාර්යභාරය එමගින් පැවරි ඇත.

මහවැලි පනත අනුව යම් විශේෂ ප්‍රදේශයක හෝ විශේෂ ප්‍රදේශයක් සම්බන්ධයෙන් අධිකාරියෙහි කර්තව්‍ය පහත දැක්වෙන කර්තව්‍ය විය යුතුය.

(අ) ජලාශ, වාරිමාර්ග බෙදාහැරීමේ ක්‍රම සහ විදුලිබලය නිපදවීම සහ සැපයීම සඳහා වූ යන්ත්‍රස්ථාන ඉදිකිරීම සහ මෙහෙයවීම ඇතුළු මහවැලි ගඟ සංවර්ධන යෝජනා ක්‍රමය සැලසුම් කිරීම හා ක්‍රියාවට නැගීම: එසේ වුවද විදුලි බලය බෙදා හැරීමට අදාල කර්තව්‍යය වෙනත් යම් ලිඛිත නීතියක් යටතේ එසේ කිරීමට බලය ඇති වෙනත් යම් අධිකාරියක් විසින් ද කරනු ලැබිය හැකිය.

(ආ) යම් විශේෂ ප්‍රදේශයක පූර්ණ සහ ඒකාග්‍ර සංවර්ධනයට ප්‍රතිශ්ඨාධාරවීම සහ ඒ සංවර්ධනය සුරක්ෂිත කිරීම.

(ඇ) යම් විශේෂ ප්‍රදේශයක් තුළ කෘෂිකාර්මික ඵලදා වර්ධනය සහ සේවා නියුක්ති හැකියාවන් උපරිම ත්ත්තවයට පත් කිරීම සහ ආර්ථික සහ කෘෂිකාර්මික සංවර්ධනය ඇති කිරීම සහ ඒ සංවර්ධනය සුරක්ෂිත කිරීම.

(ඈ) යම් විශේෂ ප්‍රදේශයක් තුළ භෞතික පරිසරය සංරක්ෂණය කිරීම සහ එය පවත්වා ගෙන යාම:

(ඉ) යම් විශේෂ ප්‍රදේශයක් තුළ ප්‍රජාවගේ පොදු සුබ සාධනය සහ සංස්කෘතික ප්‍රගතිය දියුණු කරලීම සහ එම ප්‍රදේශයේ පරිපාලනය කිරීම:

(ඊ) අභ්‍යන්තර වූ සහ බාහිර වූ උභය පෞද්ගලික / ප්‍රාග්ධනය යම් විශේෂ ප්‍රදේශයක ආර්ථික සහ කෘෂිකාර්මික සංවර්ධනයෙහි යෙදවීම නංවාලීම කිරීම සහ සුරක්ෂිත කිරීම:

(උ) මහවැලි ගඟ සංවර්ධන යෝජනා ක්‍රමය සැලසුම් කිරීමෙහි සහ ක්‍රියාවට නැගීමෙහි දී ද යම් විශේෂ ප්‍රදේශයක් සංවර්ධනය කිරීමෙහි දී ද ආණ්ඩුවේ දෙපාර්තමේන්තුවල, රාජ්‍ය

ආයතනවල, පළාත් පාලන ආයතනවල, රජයේ සංස්ථාවල සහ පෞද්ගලික හෝ රජයේ වූ වෙනත් තැනැත්තන්ගේ සහයෝගය ලබා ගැනීම සහ එය නංවාලීම හා සුරක්ෂිත කිරීම. ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය පරිපාලිත සමාගම් හතරකින් සහ ආශ්‍රිත සමාගමකින් සමන්විත වේ. එනම් මහවැලි වෙන්චර් කැපිටල් පුද්ගලික සමාගම, සීමාසහිත ස්වාභාවික සම්පත් කළමනාකරණ සේවා (පුද්ගලික) සමාගම, සීමාසහිත මහවැලි පශු සම්පත් හා කෘෂි ව්‍යවසාය (පුද්ගලික) සමාගම, සීමාසහිත මහවැලි ඉංජිනේරු සේවා (පුද්ගලික) සමාගම, සීමාසහිත මහවැලි උපදේශක කාර්යංශ (පුද්ගලික) සමාගම සහ සීමාසහිත මහවැලි පශු සම්පත් ව්‍යවසාය සමාගම වේ.

සමාගම් සියල්ල 2007 අංක 07 දරණ සමාගම් පනත යටතේ නීතිගත කරන ලද අතර පහත සඳහන් ප්‍රධාන කාර්යයන් ඉටු කරනු ලබයි.

## මහවැලි සමාගම්වල මූලික ක්‍රියාකාරකම්

### පරිපාලිත සමාගම්

අ. සී/ස. මහවැලි වෙන්චර් කැපිටල් (පුද්.) සමාගම.

i. මහවැලි ව්‍යවසායකයින් හට ණය පහසුකම් සැපයීම හා ඒ සඳහා මගපෙන්වීම් ලබාදීම.

ii. සමාගමට අරමුදල් උපයා ගත හැකි වානිජ ව්‍යවසාය ආයෝජන ඉටුකරදීම.

ආ. සී/ස. ස්වභාවික සම්පත් කළමනාකරණ සේවා (පුද්.) සමාගම.

i. ස්වභාවික සම්පත් කළමනාකරණ ක්ෂේත්‍රය යටතේ එන නිර්මාණ සැලසුම, පුහුණුකිරීම්, ද්‍රව විද්‍යාත්මක අධීක්ෂණය, ඉඩම් භාවිතා සිතියම්කරණය, ජලාධාර ප්‍රදේශ සංරක්ෂණය සහ වනය ආශ්‍රිත කටයුතු පිළිබඳව වෘත්තීයමය උපදෙස් හා සේවා සැපයීම.

ii. තොරතුරු හා දත්ත සැපයීම, ශක්‍යතා අධ්‍යයන සැකසීම, පරිසර බලපෑම් තක්සේරු අධ්‍යයන හා මූලික පාරිසරික ඇගැයුම් වාර්තා සැකසීම ආදිය.

ඇ. සී/ස. මහවැලි පශු සම්පත් හා කෘෂි ව්‍යවසාය (පුද්.) සමාගම.

i. මහවැලි ගොවීන්හට උසස් ගුණාත්මකතාවින් යුත් සතුන් සැපයීම.

ii. කිරි හා මස් නිෂ්පාදනය සහ අලෙවිකරණය.

ඈ. සී/ස. මහවැලි උපදේශණ සේවා කාර්යාංශය (පුද්.) සමාගම

i. ගොඩනැගිලි, වාරිමාර්ග, ඉඩම් ජලාපවාහන හා මාර්ග ආදී ඉදිකිරීම් ක්ෂේත්‍රයන්හි උපදේශන සේවා සැපයීම.

ii. ගොඩනැගිලි, වාරිමාර්ග, ඉඩම් ජලාපවාහන හා මාර්ග ආදී ඉදිකිරීම් කොන්ත්‍රාත් භාරගැනීම.

**ආශ්‍රිත සමාගම**

අ.) සී/ස. මහවැලි පශු සම්පත් ව්‍යවසාය (පුද්.) සමාගම

i. කුකුල් මස් (බ්‍රොයිලර්) නිෂ්පාදනය හා අලෙවිය

ii' මහවැලි ගොවීන් බ්‍රොයිලර් නිෂ්පාදන කළ පසු මිලදී ගැනීමේ ගිවිසුම්වලට එළැඹීම.

කෙසේ වෙතත් මහවැලි වෙන්චර් කැපිටල් පුද්ගලික සමාගම විසුරුවා හැරීමට 2012 වර්ෂයේදී අධ්‍යක්ෂ මණ්ඩලය තීරණය කර ඇත.

## 2. ගිණුම්කරණ පදනම

**2.1. අනුකූලතා ප්‍රකාශය :** මූල්‍ය තාවය පිළිබද ප්‍රකාශය, මෙහෙයුම් ප්‍රකාශනය, ශුද්ධ වත්කම් හා හිමිකම් වෙනස්වීම් පිළිබඳ ප්‍රකාශනය, අරමුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශන පිළිබඳ සටහන්වලින් මෙම මූල්‍ය ප්‍රකාශන සමන්විත වේ. ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරීන්ගේ ආයතනය විසින් සම්පාදිත ශ්‍රී ලංකා

ගිණුම්කරණ ප්‍රමිතීන්ට අනුකූලව මෙකී ගිණුම් ප්‍රකාශන සකසා ඇත. මෙම ගිණුම් ප්‍රකාශනයන් ඉකුත් මූල්‍ය වසරේ අනුගමනය කරන ලද ප්‍රමිතීන්ට අනුකූල වේ.

## 2.2 ගණනය කිරීමේ පදනම

දේපළ හා යන්ත්‍රෝපකරණ පිළිබඳ හෙළිකිරීම්වලදී හැර මෙම මූල්‍ය ප්‍රකාශන, ඓතිහාසික පිරිවැය පදනමින් සකසන ලදී.

## 2.3 ක්‍රියාත්මක වන සහ ඉදිරිපත් කෙරෙන මුදල් වර්ගය

මෙම මූල්‍ය ප්‍රකාශන, ශ්‍රී ලංකා රුපියල් වලින් ඉදිරිපත් කර ඇත. මෙහි එන සෑම මූල්‍ය තොරතුරක්ම ආසන්නතම දහස දක්වා පූර්ණ කර ඇත.

## 2.4 ඇස්තමේන්තු සහ තීන්දු භාවිතය

ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතීන්ට අනුකූලව මූල්‍ය ප්‍රකාශන සැකසීමේදී ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ වත්කම්, වගකීම්, ආදායම් හා වියදම්වල ප්‍රකාශිත වටිනාකම්වලට බලපෑමක් ඇති කරන සුළු තීන්දු, ඇස්තමේන්තු හා උපකල්පන වලට එළැඹීමට කළමනාකාරීත්වයට සිදු වේ. ඓතිහාසික අත්දැකීම් සහ පවත්නා සංසිද්ධීන්ට අනුව සාධාරණ යැයි විශ්වාස කළ හැකි අපේක්ෂිතයන් ද ඇතුළත් වන පරිදි, තීන්දු හා ඇස්තමේන්තු පදනම් වේ. කරුණු එසේ හෙයින් තත්‍ය අත්දැකීම් හා ප්‍රතිඵල, එකී තීන්දු හා ඇස්තමේන්තු වලින් විතැන් විය හැකිය.

මෙකී ඇස්තමේන්තු හා පාදක උපකල්පන, අඛණ්ඩ පදනමකින් විචාරිය යුතු වේ. ගිණුම්කරණ ඇස්තමේන්තුවල ප්‍රතිශෝධනයක් සිදු කළේ නම්, එකී ප්‍රතිශෝධනයන් එකී කාලසීමාවට පමණක් බලපාන්නේ නම් පමණි.

## 2.5 ගිණුම්කරණ ප්‍රතිපත්තීන්හි වෙනස්වීම්

පෙර වර්ෂයේ අනුගමනය කළ ගිණුම්කරණ ප්‍රතිපත්ති ඒ ආකාරයෙන්ම ප්‍රවර්ථන වර්ෂය සඳහාද අනුගමනය කර ඇත.

## 3. සුවිශේෂී ගිණුම්කරණ ප්‍රතිපත්ති

මෙම ගිණුම්කරණ ප්‍රකාශන බලපාන සමස්ත කාලසීමාවටම පහත දක්වා ඇති ගිණුම්කරණ ප්‍රතිපත්ති අඛණ්ඩව අනුකූල විය.

## 3.1 ඒකාබද්ධ කිරීමේ පදනම

3.1.1 අධිකාරියේ සහ පරිපාලන සමාගම්වල මූල්‍ය ප්‍රකාශන සමායෝජනය කිරීම ද ඇතුළත්ව, ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශන, සකසා ඇත්තේ ඒකාබද්ධ ක්‍රමවේදයන් අඛණ්ඩව යොදාගනිමිනි, ඒ අනුව පැහැදිලි වන්නේ, ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය තනි ආර්ථික ව්‍යුහයක් පරිද්දෙන්ම මෙකී ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශනයන්හි නිරූපණය වන මූල්‍යමය තොරතුරුවලින් පිළිබිඹු වන බවයි.

### 3.2 දේපළ හා යන්ත්‍රෝපකරණ

3.2.1 වත්කම් ගැනුම්මිල, හෝ ඉදිකිරීම් පිරිවැය සහ එම වත්කම භාවිතාවට අපේක්ෂිත කාර්ය උදෙසා ක්‍රියාත්මක ස්වරූපයට පත්කිරීමට ඍජුවම යෙදුණු පිරිවැය යනාදී වියදම්, "වත්කම්වල පිරිවැය" යන්නෙන් අදහස් වන අතර, මෝටර් රථ වාහන, ලීබඩු හැර අනෙකුත් වත්කම්, 2015 වර්ෂයේදී ප්‍රත්‍යාගණනය කර ඇත.

3.2.2 සින්නක්කර ඉඩම් හැර අනෙකුත් සියළු දේපළ හා යන්ත්‍රෝපකරණ පිරිවැය මත හෝ ප්‍රත්‍යාගණන වටිනාකම මත, සරල රේඛීය ක්‍රමයට ක්ෂය ප්‍රතිපාදන සපයා ඇති අතර එකී වත්කමේ පිරිවැය, එකී වත්කම් වර්ගයේ ජීව කාලය අනුව ගලපා ක්‍රමක්ෂය කෙරේ. වත්කම හිමිකරගත් මාසයේ සිට ක්ෂයවීම ගණනය කරන අතර පහත සඳහන් ක්ෂය අනුපාතයන්ට අනුව ක්ෂය වීම සිදුකෙරේ

| | | | වාර්ෂිකව |
|---|---|---|---|
| 1. | ගොඩනැගිලි | - කාර්යාල | 2 1/2% |
| | | - අනෙකුත් | 5% |
| 2. | මෝටර් රථ | | 20% |
| 3. | යන්ත්‍රෝපකරණ | | |
| | - කාර්යාලයීය උපකරණ හා සුහසාධන භාණ්ඩ | | 15% |
| 4. | යන්ත්‍රෝපකරණ | - විදුලි ජනක යන්ත්‍ර | 15% |
| 5. | යන්ත්‍රෝපකරණ | - ඉදිකිරීම් | 15% |
| 6. | යන්ත්‍රෝපකරණ | - සාමාන්‍ය | 15% |
| 7. | ගෘහභාණ්ඩ හා සවිකිරීම් | | 10% |
| 8. | පරිගණක හා උපාංග | | 20% |

### 3.3 ආයෝජන

#### 3.3.1 ආශ්‍රිත සමාගමේ සිදුකළ ආයෝජන

ආශ්‍රිත සමාගමේ සිදුකළ ආයෝජනය පිරිවැයට ගණන් බලා, ශේෂ පත්‍රයේ දිගු කාලීන ආයෝජන යටතේ වෙන්කර දක්වා ඇත. මෙම ආයෝජන සමාගමේ මූල්‍ය හා මෙහෙයුම් ප්‍රතිපත්තිමය තීරණ කෙරෙහි, අධිකාරියට කිසිදු සැලකියයුතු මට්ටමේ බලපෑමක් කළ නොහැකි බැවින් ඒකීය ව්‍යුහයක් වශයෙන් ගිණුම්කරණය යොදාගැනීම අනුචිත වේ.

#### 3.3.2 අනෙකුත් ආයෝජන

අනෙකුත් ආයෝජන, දිගුකාලීන ආයෝජන වශයෙන් සලකා පිරිවැයට ගණනය කර ශේෂ පත්‍රයේ දක්වා ඇත.

### 3.4 භාණ්ඩ තොග වාර්තා

භාණ්ඩ තොග තක්සේරු කර ඇත්තේ අඩු පිරිවැය හා නිෂ්කාශණය කරගත හැකි ශුද්ධ වටිනාකම මත වේ. අවශ්‍ය තැන්හී නිතර නිකුත් නොවන, දෝෂ සහිත සහ යල්පැනගිය භාණ්ඩ සඳහා ප්‍රතිපාදන වෙන් කර ඇත

## 3.5 වෙළෙඳ හා අනෙකුත් ලැබිය යුතු ආදායම්

වෙළෙඳ හා අනෙකුත් ලැබිය යුතු ආදායම් දක්වා තිබෙන්නේ බොල් හා අඩමාන ණය පසුව ලැබීම් සඳහා ප්‍රතිපාදන වෙන් කිරීමෙන් පසු නිශ්කාෂණය කරගත හැකි වෙතැයි උපකල්පිත වටිනාකම මත වේ.

## 3.6 මුදල් හා මුදල් සමාන දෑ

මුදල් හා මුදල් සමාන දෑ යනුවෙන් දක්වා ඇත්තේ මුදල් ශේෂයන් හා ඉල්ලූ විට ගෙවිය යුතු බැංකු අයිරා ද ඇතුළත් වටිනාකම වන අතර ශ්‍රී ලංකා මහවැල අධිකාරියේ මුදල් කළමනාකරණය ද එක් මුදල් සංඝඨකයක් ලෙසින් දක්වා ඇත්තේ අරමුදල් ප්‍රවාහය ප්‍රකාශ කිරීම සඳහා වේ.

## 3.8 වගකීම් හා ප්‍රතිපාදන

ශේෂ පත්‍රයේ ජංගම වගකීම් යටතේ වෙන්කර දක්වා ඇති වගකීම්, ඉල්ලූවිට ගෙවිය යුතු බැඳීම් සහ ශේෂ පත්‍ර දිනයේ සිට වර්ෂයක් ඇතුළත ගෙවා නිමකළ යුතු ඒවාය. ජංගම නොවන වගකීම් යනුවෙන් වෙන්කර දක්වා ඇති සියල්ල, ශේෂ පත්‍ර දිනයේ සිට වසරක් ඉක්ම වූ පසුවත් පවතින බැඳීම් වේ.

මූල්‍ය ප්‍රකාශන සැකසීමේදී දැන සිටි සියළු වගකීම් ගිණුම්ගත කර ඉදිරිපත් කර ඇත.

## 3.10 විශ්‍රාම ප්‍රතිලාභ සැලසුම

සියළු සේවකයින්ට විශ්‍රාම පාරිතෝෂිත ගෙවීමට ප්‍රතිපාදන සලසා තිබේ. පාරිතෝෂිත සඳහා සුදුසුකම් ලබන අඩමසක වැටුප, පළමු සේවා වසරේ පටන් සෑම වසර අගකදීම ගණනය කර මෙම ප්‍රතිපාදනය වෙන්කර ඇත.

## 3.11 ආදායම් ප්‍රකාශනය

3.11.1 මහා භාණ්ඩාගාරයෙන් ලැබෙන ප්‍රදානය, ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය පරිපාලනය යටතේ පවතින ඉඩම් බදු දීමෙන් ලබන බදු කුලිය, නිල නිවාස වල රාජ්‍යභාගය, ආයෝජන වලින් ලබන ආදායම සහ පොලිය යනාදී අංගයන්ගෙන් ශ්‍රී ලංකා මහවැලි අධිකාරියේ අයභාරය සමන්විත වේ.

3.11.2 ශ්‍රී ලංකා මහවැලි අධිකාරියට ආර්ථික ප්‍රතිලාභ ලැබීමේ වැඩි සම්භාවිතාව අනුව මෙන්ම විශ්වාසනීය අන්දමකින් එය මැනිය හැකිවීම මත අයභාරය ගණනය කර ඇත. බදු කුලී, අනෙකුත් කුලී, රාජ්‍ය භාගය, පොලී ආදායම ගණනය කරන ලද්දේ උපචිත පදනමිනි.

## 3.12 වියදම

ආයතනයේ දෛනික වියදම්, දේපළ හා යන්ත්‍රෝපකරණ කාර්යක්‍ෂමතාවයෙන් පවත්වාගෙන යෑමට යන වියදම් ද ඇතුළු සියලු වියදම් සැලකිල්ලට ගෙන ආදායම් ප්‍රකාශනයේ සඳහන් වසරේ ලාභය/පාඩුව ගණනය කර ඇති අතර බොල් හා අඩමාන ණය, දන්නා සියළු වගකීම් මෙන්ම දේපළ හා යන්ත්‍රෝපකරණ ආදියේ ක්‍ෂයවීම්වලට ද ප්‍රතිපාදන වෙන්කර තිබේ.

## 3.13 ශේෂ පත්‍ර දිනයෙන් පසුව සිදු කළ ගනු දෙනු

ශේෂ පත්‍ර දිනයෙන් පසුව සිදු වූ සියළු භෞතික කාර්යයන් අවශ්‍ය පරිදි ගලපා ඇත.

## 3.14 අසම්භාව්‍යතා

ශ්‍රී ලංකා මහවැලි අධිකාරියට එරෙහිව පවරා ඇති නඩු වලදී 2015.12.31 දිනට පැවැති අසම්භාව්‍ය වගකීම රු. මිලි. 33.55 ක් විය.

**ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය**
**අංක 500 ටී.බී. ජයා මාවත**
**කොළඹ 10**

## 2016.12.31 දිනට ඒකාබද්ධ මූල්‍ය තත්වය පිළිබඳ වාර්තාව

| | | සමූහය | | | මහවැලි අධිකාරිය | |
|---|---|---|---|---|---|---|
| | | **රු'000** | **රු'000** | | **රු'000** | **රු'000** |
| | සටහන | **2016** | **2015** | | **2016** | **2015** |
| **වත්කම්** | | | | | | |
| **ජංගම නොවන වත්කම්** | | | | | | |
| දේපල යන්ත්‍රෝපකරණ හා උපකරණ | (1) | 4,195,724 | 4,316,432 | | 4,121,704 | 4,236,588 |
| ආයෝජන | (2) | 178,556 | 150,341 | | 522,897 | 489,274 |
| නොනිමි වැඩ | | 41,301 | 74,286 | | 41,301 | 74,286 |
| ජංගම නොවන වත්කම්වල එකතුව | | 4,415,581 | 4,541,059 | | 4,685,902 | 4,800,148 |
| | | | | | | |
| ffජව වත්කම් -ප්‍රාග්ධන | | 101,940 | | | 95,997 | - |
| යො ˈජිත ලියා හැරීම් | | 859 | | | | |
| **ජංගම වත්කම්** | | | | | | |
| ගබඩා තොග | (3) | 168,173 | 155,663 | | 164,489 | 145,562 |
| ffජව වත්කම් -fjf<\| | | 22,630 | | | 20,995 | - |
| වෙළඳ සහ අනෙකුත් ලැබිය යුතු දෑ | (4) | 1,730,015 | 1,278,682 | | 1,656,666 | 1,216,559 |
| කලින් ගෙවීම් | | 8,754 | 5,172 | | 8,754 | 5,172 |
| බැංකු ඇපකර | | 4,153 | 1,372 | | | - |
| මුදල් සහ මුදල් සමායනයන් | (5) | 312,750 | 427,869 | | 282,264 | 387,421 |
| ජංගම වත්කම් එකතුව | | 2,246,475 | 1,868,758 | | 2,133,168 | 1,754,714 |
| **මුළු වත්කම්වල එකතුව** | | 6,764,855 | 6,409,817 | | 6,915,067 | 6,554,862 |
| | | | | | | |
| **වගකීම්** | | | | | | |
| **ජංගම වගකීම්** | | | | | | |
| ණයහිමියන්ට ගෙවියයුතු දෑ | (6) | 376,737 | 339,958 | | 330,232 | 266,028 |
| **කල්බදු ඒලයන්ස් මූල්‍ය සමාගම** | | 3,080 | | | | |
| උපචිත වියදම් | (7) | 122,286 | 47,074 | | 95,434 | 44,096 |
| ජංගම වගකීම් එකතුව | | 502,103 | 387,032 | | 425,666 | 310,124 |
| | | | | | | |
| **ජංගම නොවන වගකීම්** | | | | | | |
| පාරිතෝෂිත දීමනා සඳහා වෙන්කිරීම් | (8) | 1,489,288 | 1,557,487 | | 1,478,830 | 1,547,380 |
| බැංකු ණය | | 2,455 | 600 | | - | |
| කල්බදු | | 2,653 | 11,247 | | - | |
| විලම්බිත බදු | | 612 | 612 | | - | |
| **ජංගම නොවන වගකීම් වල එකතුව** | | **1,495,008** | **1,569,946** | | **1,478,830** | **1,547,380** |
| මුළු වගකීම් | | 1,997,111 | 1,956,978 | - | 1,904,496 | 1,857,504 |
| **ශුද්ධ වත්කම් එකතුව** | | **4,767,744** | **4,452,839** | | **5,010,571** | **4,697,358** |
| | | | | | | |
| **ශුද්ධ වත්කම්/හිමිකම්** | | | | | | |
| සමුච්චිත අරමුදල | (9) | 24,066,161 | 23,715,096 | | 24,063,157 | 23,712,092 |
| සංචිත ඨ ඉරුගෙනා අදායම් වියදම් ගිණුමේ ශේෂය | | (23,369,566) | (23,334,844) | | (23,071,615) | (23,033,762) |
| ආදායම් සංචිත - සමාගම්වල | | 52,121 | 53,560 | | - | - |
| ප්‍රත්‍යාගන ලාභය | | 4,019,027 | 4,019,027 | | 4,019,027 | 4,019,027 |
| **ශුද්ධ වත්කම්/හිමිකම් එකතුව** | | **4,767,743** | **4,452,839** | | **5,010,569** | **4,697,357** |

**ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය**
**අංක 500 ටී.බී. ජයා මාවත**
**කොලඹ 10**

**2016.12.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා**
**<u>මුදල් ප්‍රවාහ ප්‍රකාශනය</u>**

| | | සමූහය | අධිකාරිය |
|---|---|---|---|
| | | **('රු'000)** | **('රු'000)** |
| මෙහෙයුම් කටයුතුවලින් ලද මුදල් ප්‍රවාහය | | (33,576) | (37,828) |
| (පසුගිය වර්ෂයට අදාල ගැලපුම් සමග ) | | | |
| **මුදලින් නොවූ ගනුදෙනු** | | | |
| | ක්ෂයවීම | 476,655 | 472,675 |
| | පාරිතෝෂික දීමනා සඳහා වෙන්කිරීම් | (68,199) | (68,550) |
| | වැඩිවූ ffජව වත්කම්වලින් උපයා ගැනීම් - | (101,940) | (95,997) |
| | වත්කම් මාරු කිරීම් | 3,208 | (7,186) |
| | බදු | (1,000) | |
| | ලාභාංශ | (120) | |
| | උපචිත වියදම් වැඩිවීම/අඩුවීම | 75,212 | 51,338 |
| **මෙහෙයුම් ක්‍රියාකාරකම්** | | | |
| | ගෙවියයුතු දෑ වැඩිවීම/අඩුවීම | 33,120 | 64,204 |
| | තොගයේ වැඩිවීම / අඩුවීම | (35,140) | (39,922) |
| | අනෙකුත් ලැබියයුතු දෑ වැඩිවීම | (457,696) | (443,689) |
| **මෙහෙයුම් ක්‍රියාකාරීත්වයෙන් ලද ශුද්ධ මුදල් ප්‍රවාහය** | | **(109,476)** | **(104,955)** |
| **ආයෝජන ක්‍රියාකාරකම්වලින් ලද මුදල් ප්‍රවාහය** | | | |
| | දේපල, යන්ත්‍රඋපකරණ හා උපකරණවල සංචලනයෟ | (360,473) | (351,065) |
| | වත්කම් විකිණීමෙන් | 434 | 434 |
| | ආයෝජන හා නොනිම් වැඩවල වැඩිවීම | 4,770 | (638) |
| **ආයෝජන ක්‍රියාකාරකම්වලින් ලද ශුද්ධ මුදල් ප්‍රවාහය** | | **(355,269)** | **(351,269)** |
| **මූල්‍ය ක්‍රියාකාරකම්වලින් ලද මුදල් ප්‍රවාහය** | | | |
| | ප්‍රාග්ධන ප්‍රදාන | 349,626 | 351,065 |
| **මූල්‍ය ක්‍රියාකාරකම්වලින් ලද ශුද්ධ මුදල් ප්‍රවාහය** | | **349,626** | **351,065** |
| මුදල් සහ මුදල් සමායයන්හි ශුද්ධ වැඩිවීම/අඩුවීම | | **(115,119)** | **(105,159)** |
| 2016.01.01 දිනට මුදල් සහ මුදල් සමායයන්හි ශේෂය | | 427,869 | 387,421 |
| 2016.12.31 දිනට මුදල් සහ මුදල් සමායයන්හි ශේෂය | | **312,750** | **282,262** |

**ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය**
**අංක 500 ටී.බී. ජයා මාවත**
**කොළඹ 10**

**2016.12.31 දිනෙන් අවසන් වර්ෂයේ මූල්‍ය ක්‍රියාකාරිත්වය පිළිබඳ වාර්තාව**

| සමූහය | අධිකාරිය | | | සමූහය | අධිකාරිය |
|---|---|---|---|---|---|
| **රු'000** | **රු'000** | | | **රු'000** | **රු'000** |
| **2015** | **2015** | | උපලේඛන | **2016** | **2016** |
| | | **අදායම්** | (1) | | |
| 212,102 | 212,102 | බදු | | 270,109 | 270,109 |
| 214,113 | 214,113 | පුරස්කාරක | | 290,752 | 290,752 |
| 34,735 | - | කොන්ත්‍රාත් සේවා\ | | 43,355 | - |
| 9,058 | 5,528 | ගොවිපල නිශ්පාදන විකුණුම් | | 6,267 | - |
| 1,147 | 1,147 | චක්‍රිය ආදායම් | | 1,448 | 1,448 |
| 3,277 | - | ආයෝජන අදායම් (MCB, NRMS & Venture Cap | | 6,651 | 120 |
| 90,865 | 90,299 | වෙනත් ආදායම් | | 76,050 | 75,366 |
| **565,297** | **523,189** | **උත්පාදිත ආදායම** | | **694,632** | **637,795** |
| 2,555,590 | 2,555,590 | භාණ්ඩාගාර ප්‍රදාන - පුනරාවර්තන | | 2,680,000 | 2,680,000 |
| 1,900,794 | 1,900,794 | - ප්‍රාග්ධන | | 2,300,694 | 2,300,694 |
| 5,021,681 | 4,979,573 | | | **5,675,326** | **5,618,489** |
| | | **අඩුකලා : වියදම්** | (2) | | |
| 2,852,205 | 2,828,909 | පුද්ගලික පඩි නඩි | | 2,558,421 | 2,531,241 |
| 38,013 | 37,871 | ගමන් වියදම් හා යැපුම් දීමනා | | 39,470 | 39,234 |
| 133,740 | 127,588 | සැපයුම්/ප්‍රවාහන | | 164,663 | 160,251 |
| 105,147 | 104,629 | නඩත්තු වියදම් | | 95,980 | 94,531 |
| 105,836 | 103,930 | ගිවිසුම්ගත සේවා | | 108,095 | 107,188 |
| 861 | 861 | රක්ෂණ | | 276 | 276 |
| 74,356 | 70,021 | වෙනත් වියදම් | | 69,979 | 54,922 |
| 458,049 | 455,666 | ක්ෂයවීම | | 471,953 | 468,608 |
| 38,772 | 38,772 | ආදායම් ලියාහැරීම් | | - | - |
| 1,464,131 | 1,464,131 | පුනරුත්ථාපන ඉදිකිරීම්,අනෙකුත් නඩත්තු,ද | (3) | 2,227,532 | 2,227,532 |
| | | සහ ජනපදික සේවා | | - | - |
| | - | සංචාරක බංගලා | | | - |
| | - | යාන්ත්‍රික වැඩපල අලාභ | | 12,520 | 12,520 |
| 54 | 54 | සංවර්ධන පුහුණු මධ්‍යස්ථාන අලාභ | | 29 | 29 |
| | | පැළ තවාන් අලාභ | (4) | 101 | 101 |
| 29,282 | 29,282 | ගොවිපල අලාභ | (5) | (40,118) | (40,118) |
| 5,300,446 | 5,261,714 | **මෙහෙයුම් වියදම් එකතුව** | | **5,708,901** | **5,656,315** |
| (278,765) | **(282,141)** | **මෙහෙයුම් ක්‍රියාකාරීත්වයෙන් ලැබූ අතිරික්තය/(ඌන** | | **(33,575)** | **(37,826)** |
| 8,691 | **8,691** | එකතුකලා : වත්කම් විකිණීමෙන් ලද ලාභය | (6) | (25) | (25) |
| (1,172) | | අඩුකළා; බදු | | **1,000** | - |
| (271,246) | (273,450) | **බදු පසු අතිරික්තය /(ඌනතාවය)** | | **(34,602)** | **(37,851)** |
| | | **ලාභාංශ** | | **(120)** | |
| (23,063,600) | **(22,760,312)** | 2016.01.01 දිනට ඉදිරියට ගෙනා ශේෂය | | (23,334,846) | (23,033,762) |
| **(23,334,846)** | **(23,033,762)** | ඉදිරියට ගෙනයන ශුද්ධ අතිරික්තය/(ඌනතාවය) | | **(23,369,568)** | **(23,071,613)** |

ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය
අංක 500 ටී.බී. ජයා මාවත
කොළඹ 10

## හිමිකම් වෙනස්වීම් දක්වන ප්‍රකාශය

| | සමූහය | | | රු.'000 |
|---|---|---|---|---|
| | සමුච්චිත අරමුදල | සංචිත | රඳවා ගත් ඉපයුම් | එකතුව |
| 2015.01.01 දිනට ශේෂය | 23,422,602 | 3,860,282 | (23,049,330) | 4,233,554 |
| වර්ෂය තුල | 292,494 | 212,305 | (285,514) | 219,285 |
| **2015.12.31 දිනට ශේෂය** | **23,715,096** | **4,072,587** | **(23,334,844)** | **4,452,839** |
| 2016.01.01 දිනට ශේෂය | 23,715,096 | 4,072,587 | (23,334,844) | 4,452,839 |
| වර්ෂය තුල | 351,065 | (1,439) | (34,722) | 314,905 |
| **2016.12.31 දිනට ශේෂය** | **24,066,161** | **4,071,148** | **(23,369,566)** | **4,767,744** |

## හිමිකම් වෙනස්වීම් දක්වන ප්‍රකාශය

| | මහවැලි අධිකාරිය | | | රු.'000 |
|---|---|---|---|---|
| | සමුච්චිත අරමුදල | සංචිත | රඳවා ගත් ඉපයුම් | එකතුව |
| 2015.01.01 දිනට ශේෂය | 23,409,448 | 3,792,966 | (22,745,674) | 4,456,740 |
| වර්ෂය තුල | 302,644 | 226,061 | (288,088) | 240,617 |
| **2016.12.31 දිනට ශේෂය** | **23,712,092** | **4,019,027** | **(23,033,762)** | **4,697,357** |
| 2016.01.01 දිනට ශේෂය | 23,712,092 | 4,019,027 | (23,033,762) | 4,697,357 |
| වර්ෂය තුල | 351,065 | - | (37,853) | 313,212 |
| **2016.12.31 දිනට ශේෂය** | **24,063,157** | **4,019,027** | **(23,071,615)** | **5,010,569** |

# විගණකාධිපති වාර්තාව

## III කොටස

විගණකාධිපති දෙපාර්තමේන්තුව
கணக்காய்வாளர் தலைமை அதிபதி திணைக்களம்
**AUDITOR GENERAL'S DEPARTMENT**

මගේ අංකය / எனது இல. / My No. } අයිඊඑන්/බී/එම්ඒඑස්එල්/01/16/49    ඔබේ අංකය / உமது இல. / Your No. }    දිනය / திகதி / Date } 2018 ජූනි 29 දින

අධ්‍යක්ෂ ජනරාල්

ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය.

**ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය සහ එහි පරිපාලිත සමාගම්වල 2016 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව 1971 අංක 38 දරන මුදල් පනතේ 14(2)(සී) වගන්තිය ප්‍රකාර විගණකාධිපති වාර්තාව.**

---

ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය සහ එහි පරිපාලිත සමාගම්වල 2016 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, ශුද්ධ වත්කම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය හා වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2016 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශන 1971 අංක 38 දරන මුදල් පනතේ 13(1) වගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. මුදල් පනතේ 14(2)(සී) වගන්තිය ප්‍රකාර අධිකාරියේ වාර්ෂික වාර්තාව සමඟ ප්‍රකාශයට පත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

## 1.2 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම

---

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

අංක 306/72, පොල්දූව පාර, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව, - இல. 306/72, பொல்துவ வீதி, பத்தரமுல்லை, இலங்கை. - No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka
+94-11-2887028-34   +94-11-2887223   oaggov@sltnet.lk   www.auditorgeneral.gov.lk

## 1.3 විගණකගේ වගකීම

---

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් උත්තරීතර විගණන ආයතනයන්ගේ ජාත්‍යන්තර විගණන ප්‍රමිතිවලට (ISSAI 1000-1810) අනුරූප ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදු කරන ලදී. ආචාර ධර්මවල අවශ්‍යතාවන්ට මම අනුකූල වන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබා ගැනීම පිණිස විගණනය සැලසුම්කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි.

ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට අදාලවන විගණන සාක්ෂි ලබා ගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරාගත් පරිපාටීන්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගේ අවදානම් තක්සේරු කිරීම්ද ඇතුළත් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරුකිරීම්වලදී, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අධිකාරියේ සහ එහි පරිපාලිත සමාගම්වල මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාල වන්නා වූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් අධිකාරියේ සහ පරිපාලිත සමාගම්වල අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදා ගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගයීමද විගණනයට ඇතුළත් වේ. විගණනයේ විෂය පථය හා ප්‍රමාණය තීරණය කිරීම සඳහා 1971 අංක 38 දරන මුදල් පනතේ 13 වගන්තියේ (3) හා (4) උපවගන්තිවලින් විගණකාධිපති වෙත අභිමතානුසාරී බලතල පැවැරේ.

මාගේ විගණන මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

## 1.4 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

---

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

## 2. මූල්‍ය ප්‍රකාශන

### 2.1 තත්ත්වාගණනය කළ මතය

#### 2.1.1 සමූහය

මෙම වාර්තාවේ 2.2 හා 2.3 ඡේදවල දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර මූල්‍ය ප්‍රකාශනවලින් 2016 දෙසැම්බර් 31 දිනට ශ්‍රී ලංකා මහවැලි අධිකාරියේ සහ එහි පරිපාලිත සමාගම්වල මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට හා කුඩා හා මධ්‍යම පරිමාණ ව්‍යාපාර සඳහා වූ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

#### 2.1.2 අධිකාරිය

මෙම වාර්තාවේ 2.3 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර මූල්‍ය ප්‍රකාශනවලින් 2016 දෙසැම්බර් 31 දිනට ශ්‍රී ලංකා මහවැලි අධිකාරියේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම - සමූහය

#### 2.2.1 මූල්‍ය ප්‍රකාශන ඒකාබද්ධ කිරීම

අධිකාරිය සහ පූර්ණ හිමිකාරිත්වය සහිත පරිපාලිත සමාගම් 03 ක් ඒකාබද්ධ කර ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශන සකස් කර තිබුණු අතර එක් සමාගමක් ඇවරකරමින් පැවතුණි. එයින් ණයහිමියන්ට ගණන්බේරා වසාදැමීමේ කටයුතු සිදුකරනු ලබන මහවැලි වෙන්චර් කැපිටල් ( පුද්) සමාගමේ රු.15,510,548 ක වත්කම් හා රු. 406,708 ක වගකීම් ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශනවලට ඇතුළත්කර නොතිබුණි.

### 2.2.2 කුඩා හා මධ්‍යම පරිමාණ ව්‍යාපාර සඳහා වූ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) ප්‍රමිතයෙහි 17 පරිච්ඡේදයේ 17.19 වන වගන්තිය පරිදි මහවැලි උපදේශක සේවා කාර්යාංශ (පුද්ගලික ) සමාගමේ ජංගම නොවන වත්කම් සඳහා ඵලදායී ජීවිත කාලය වාර්ෂිකව සමාලෝචනය නොකිරීම හේතුවෙන් පිරිවැය රු.3,519,602 ක් වූ ස්ථාවර වත්කම් සම්පූර්ණයෙන් ක්ෂය කර ඇතත් තවදුරටත් ප්‍රයෝජනයට ගනිමින් පැවතුණි. ඒ අනුව ඇති වූ ඇස්තමේන්තුගත දෝෂය ප්‍රතිශෝධනය කිරීමට කටයුතු කර නොතිබුණි.

(ආ) මහවැලි පශු සම්පත් සහ කෘෂි ව්‍යාපාර (පුද්ගලික) සමාගම විසින් ප්‍රමිතයෙහි 3 පරිච්ඡේදයේ 3.8 වන වගන්තිය ප්‍රකාරව සමාගමේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳව හා 33 පරිච්ඡේදයේ 9 වගන්තිය ප්‍රකාරව සමාගමට සම්බන්ධිත පාර්ශවයන් පිළිබඳ මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව් කර නොතිබුණි.

(ඇ) ස්වාභාවික සම්පත් කළමනාකරණ සේවා (පුද්ගලික) සමාගම විසින් ප්‍රමිතයෙහි 4 පරිච්ඡේදයේ 4.5 වගන්තිය ප්‍රකාරව මාස හයකින් කල්පිරෙන රු. 6,926,566 ක ස්ථාවර තැන්පතු ජංගම වත්කම් ලෙස දැක්විය යුතු වුවත් ජංගම නොවන වත්කම් ලෙස මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි.

### 2.2.3 ගිණුම්කරණ අඩුපාඩු

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) මහවැලි උපදේශක සේවා කාර්යාංශ ( පුද්ගලික ) සමාගම එකතුකළ අගය මත බදු රහිතව විදේශ විශේෂඥයින්ට මාර්තු මාසයේ උපදේශක ගාස්තුව ලෙස රු.4,135,400 ක් ගෙවා තිබුණද එහි ඇතුලත් නොවූ රු.539,400 ක එකතුකල අගය මත බද්දක් දේශීය ආදායම් බදු දෙපාර්තමේන්තුවට ගෙවිය යුතු බදුවලින් හිලව් කර ගනිමින් ගිණුම්තැබීම නිසා මූල්‍ය ප්‍රකාශනවල උපදේශක ගාස්තු වියදම එම ප්‍රමාණයෙන් අඩුවෙන් දක්වා තිබුණි.

(ආ) මහවැලි පශු සම්පත් සහ කෘෂි ව්‍යාපාර (පුද්ගලික) සමාගම

(i) ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය වෙත නිදහස්කර තිබුණු කළමනාකරණ සහකාරවරයෙකු වෙනුවෙන් 2010 වර්ෂයේ සිට සමාලෝචිත වර්ෂයේ අවසානය දක්වා සමාගමේ අරමුදලින් ගෙවන ලද රු.1,242,000 ක වැටුප් අධිකාරියෙන් ලැබියයුතු ලෙස මූල්‍ය ප්‍රකාශනවල දක්වා නොතිබුණි.

(ii) හඳුනාගොනගත් අන්තර් ගොවිපල ණයගැති ශේෂ වටිනාකම රු.35,682,485 ක් අවිනිශ්චිත ගිණුමක ඇතුලත් කර සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන තුලනය කර තිබුණි.

(ඇ) ස්වාභාවික සම්පත් කළමනාකරණ සේවා ( පුද්ගලික ) සමාගම

(i) ධාරණ අගය ශූන්‍ය වූ පිරිවැය රු.865,700 ක් වටිනා පරිගණක හා පරිගණක උපකරණ සමාලෝචිත වර්ෂයේදී විකුණා තිබුණද ඒවායේ පිරිවැය සහ සමුච්චිත ක්ෂය අදාල ගිණුම්වලින් ඉවත් කර නොතිබුණි.

(ii) රාජ්‍ය බැංකුවකින් ලබාගෙන තිබුණු රු.600,000 ක ණය මුදල 2016 ජනවාරි 11 දින පොලිය සමඟ සම්පූර්ණ මුදලම පියවා තිබුණද ඊට අදාල රු.14,748 ක ණය පොලිය තවදුරටත් ගෙවියයුතු ලෙස ගිණුම්වල දක්වා තිබුණි.

## 2.2.4 පැහැදිලි නොකළ වෙනස්කම්

-----------------------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) මහවැලි උපදේශක සේවා කාර්යාංශ ( පුද්ගලික ) සමාගමේ මූල්‍ය ප්‍රකාශන අනුව කල්බදු සමාගම් දෙකක ණයහිමි වටිනාකම් පිළිවෙලින් රු.4,732,952 ක් හා රු.1,000,448 ක් වුවද ශේෂ සනාථ කිරීම් අනුව ඒවා පිළිවෙලින් රු.4,850,729 ක් හා රු.892,285 ක් විය.

(ආ) මහවැලි පශු සම්පත් සහ කෘෂි ව්‍යාපාර (පුද්ගලික) සමාගමේ මූල්‍ය ප්‍රකාශන අනුව ස්ථාවර වත්කම්වල වටිනාකම රු.88,183,837 ක් වුවද ලෙජර් ගිණුම් අනුව එම වටිනාකම රු.88,094,019 ක් වීමෙන් රු. 89,818 ක වෙනසක් විය.

### 2.2.5 විගණනය සඳහා සාක්ෂි නොවීම

පහත සඳහන් විෂයයන් ඉදිරියෙන් දක්වා ඇති සාක්ෂි විගණනයට ඉදිරිපත් නොවිය.

(අ) මහවැලි පශු සම්පත් සහ කෘෂි ව්‍යාපාර (පුද්ගලික) සමාගම

| විෂයය | වටිනාකම | ඉදිරිපත් නොකළ සාක්ෂිය |
|---|---|---|
| | රු | |
| මහවැලී ආර්ථික ඒජන්සිය | 405,218,731 | ප්‍රාග්ධන ප්‍රදාන ලෙස ගිණුම් ගත කර ඇති මෙම වටිනාකම් සනාථකර ගැනීමට හා ගිණුම් ගත කිරීමට අදාල ලියවිලි |
| කොත්මලේ කිරි සංවර්ධන අරමුදල | 2,900,000 | |
| යුරෝපා ආර්ථික කොමිසමේ ප්‍රාග්ධන ප්‍රදාන | 3,583,706 | |
| විදේශ ආධාර | 5,729,782 | |
| ස්ථාවර වත්කම් කපාහැරීම් | 859,256 | වටිනාකම සකස් වූ ආකාරය හා අදාල අනුමැතිය |
| ලැබියයුතු ගිණුම් - මහවැලි පශු සම්පත් හා කෘෂි ව්‍යාපාර (පුද්) සමාගම | 1,382,468 | ශේෂ සනාථ කිරීම් |

(ආ) ස්වාභාවික සම්පත් කළමනාකරණ සේවා ( පුද්ගලික ) සමාගම

| විෂයය | වටිනාකම | ඉදිරිපත් නොකළ සාක්ෂිය |
|---|---|---|
| | රු. | |
| ලැබිය යුතු ආදායම් | 391,154 | ශේෂ සනාථ කිරීම් |
| ගෙවිය යුතු භාණ්ඩ හා සේවා බදු | 109,498 | බදු ගණනය කිරීමේ උපලේඛන |
| අස්පෘශ්‍ය වත්කම් | 29,500 | වටිනාකම තහවුරු කරගැනීමට අදාල ලිඛිත සාක්ෂි |

## 2.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම - අධිකාරිය

### 2.3.1 ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති

ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 07 හි 47 ඡේදය ප්‍රකාරව සාධාරණ වටිනාකම සැලකියයුතු තරම් වෙනස්වන හා ඉක්මන් වෙනස්වීම් වලින් යුක්තවන වත්කම් ප්‍රත්‍යගණනය කර සාධාරණ වටිනාකම් ගිණුම්ගත කළ යුතු වුවත් අධිකාරිය විසින් 1984 -1989 කාලයේදී මිලදී ගෙන තිබුණු පිරිවැය රු.67,440,853 ක් වූ ඉඩම් කට්ටි 03 ක සාධාරණ අගය ගිණුම්ගත කිරීමට කටයුතුකර නොතිබුණි.

### 2.3.2 ගිණුම්කරණ ප්‍රතිපත්ති

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) මහවැලි අධිකාරිය ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත හා එහි පරිපාලිත සමාගම් කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර සඳහා වූ ගිණුම්කරණ ප්‍රමිත අනුගමනය කර තිබුණද ඒ පිළිබඳ මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව්කර නොතිබුණි.

(ආ) මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් රු. 124,570,000 ක් වටිනා කෘෂි හා පශු සම්පත් තොගයේ වටිනාකම තීරණය කිරීමට යොදාගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිය හෙළිදරව්කර නොතිබුණි.

### 2.3.3 ගිණුම්කරණ අඩුපාඩු

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) වික්ටෝරියා කලාපයේ පුස්තකාල පොත් 7,588 ක් පැවතුණද එය වත්කම් ලෙස මූල්‍ය ප්‍රකාශනවල දක්වා නොතිබුණු අතර සමාලෝචිත වර්ෂයේදී එල් කලාපය මිලදී ගෙන තිබුණු රු.985,960 ක පුස්තකාල පොත් වියදම් ලෙස ගිණුම්ගතකර තිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂයේදී කුඩා ජලවිදුලි බලාගාරවලින් නිෂ්පාදිත විදුලි බලය වෙනුවෙන් විදුලිබල මණ්ඩලයෙන් ලැබියයුතු රු.7,700,890 ක් ලැබියයුතු ආදායම් ලෙස ගිණුම් ගත කර නොතිබුණු අතර ඉකුත් වර්ෂය වෙනුවෙන් ලැබී තිබුණු රු.3,912,069 ක් සමාලෝචිත වර්ෂයේ ආදායම් ලෙස දක්වා තිබුණි.

(ඇ) විගණනයේ ගණනය කිරීම් අනුව කලාප 06 ක හා ගොවිපලක ස්ථාවර වත්කම් ක්ෂය රු.4,003,885 ක් අඩුවෙන් ගිණුම්ගතකර තිබුණි.

(ඈ) වෙලි ආරක්ෂණ හා ජල සම්පත් සැලසුම්කරණ ව්‍යාපෘතියෙන් අධිකාරිය වෙත 2016 සැප්තැම්බර් 27 දින පවරන ලද රු.671,503,748 ක්වූ ස්ථාවර වත්කම්වල වටිනාකම ගිණුම්ගත කිරීමට හා හෙළිදරව් කිරීමට කටයුතු කර නොතිබුණි.

(ඉ) වැලිඔය කලාපය විසින් 2015 වර්ෂයේදී මිලදී ගන්නා ලද රු. 363,025 ක් වූ ගවයින්ගේ බර මිණුම්කරන තරාදිය එම වර්ෂයේ වියදම් ලෙස කපා හැර තිබීම නිසා ජංගම නොවන වත්කම් අඩුවෙන් දක්වා තිබුණි.

(ඊ) හුරුළුවැව කලාපයේ ජනපදිකයින්ට බෙදාදීම සඳහා 2016 වර්ෂයේදී මිලදී ගෙන තිබුණු රු.247,800 ක් වටිනා සෝජ් මහන මැෂින් 07 ක් තොග ලෙස ගිණුම්ගතකළ යුතු වුවත් ස්ථාවර වත්කම් ලෙස ගිණුම්ගත කර තිබුණි.

(උ) සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට කලාප දෙකක පැවති විවිධ පැලවර්ග 59,484 ක එකතු වටිනාකම හා එක් කලාපයක රු.352,620 ක් වටිනා විවිධ පැලවර්ග 8,765 ක් අවසාන තොගය ලෙස ගිණුම්ගතකර නොතිබුණි.

(ඌ) 2016 වර්ෂයේදී වික්ටෝරියා කලාපයට පවරාගත් වෝටර් පිල්ඩ් ආයතනයේ ගොඩනැගිලිවල වටිනාකම තක්සේරුකර ගිණුම්ගතකර නොතිබුණි.

(එ) "බී" කලාපය විසින් අරලගංවිල බීජ ගොවිපලේ එළගාලක් හා මහවැලිතැන්න ඒකකයේ වී ගබඩාවක් ඉදිකිරීම සඳහා දරන ලද රු. 3,027,198 ක ප්‍රාග්ධන ස්වරූපයේ වියදම් පුනරාවර්තන වියදම් ලෙස දක්වා තිබුණි.

(ඒ) ඉකුත් වර්ෂ වෙනුවෙන් සමාලෝචිත වර්ෂයේදී ලැබී තිබුණු රු.20,960,226 ක හිඟ දේපල බදු ආදායම සමාලෝචිත වර්ෂයේ ආදායම් ලෙස මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි.

(ඔ) සුළු පරිමාණ ජල විදුලි බලාගාර 3 ක් ඉදිකිරීම සඳහා ආයෝජකයින්ට ලබා දී තිබුණු ඉඩම්වලින් අයවිය යුතු රු.19,299,125 ක බදුකුලී ගිණුම්ගත කර නොතිබුණි.

### 2.3.4 නොසැසැඳුණු පාලන ගිණුම්

අධිකාරියේ කලාප අතර ස්ථාවර වත්කම් හුවමාරු කිරීමේදී අදාල කලාපවලට ස්ථාවර වත්කම් ලැබීම් හා නිකුත් කිරීම් ගිණුම් ඒකාබද්ධ කිරීමේදී තුලනය වියයුතු වුවද, කලාපවලින් ලැබුණු රු.136,709,000 ක් වටිනා වත්කම් හා කලාපවලට යවනලද රු.128,730,000 ක් වටිනා වත්කම් සම්බන්ධයෙන් ගිණුම් ඒකාබද්ධ කිරීමේදී රු.7,979,000 ක වෙනසක් නිරීක්ෂණය විය.

### 2.3.5 අවිනිශ්චිත ගිණුම්

අධිකාරියට අයත් පරිපාලිත සමාගමක මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් රු. 35,682,485 ක අවිනිශ්චිත ගිණුම් හදුනාගෙන නිරවුල් කිරීමකින් තොරව ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශනවල ජංගම වත්කම් යටතේ ණයගැතියන් ලෙස දක්වා තිබුණි.

### 2.3.6 විගණනය සඳහා සාක්ෂි නොවීම

පහත සඳහන් ගිණුම් ශේෂ ඉදිරියෙන් දක්වා ඇති සාක්ෂි විගණනයට ඉදිරිපත් නොවීය.

| ගිණුම් විෂයය | වටිනාකම රු. | ඉදිරිපත් නොවූ සාක්ෂි |
|---|---|---|
| ආයෝජන - මහවැලි පශුසම්පත් හා කෘෂි ව්‍යාපාර (පුද්) සමාගම | 10,000,000 | ආයෝජන සහතික |
| - මහවැලි වෙන්චර් කැපිටල් (පුද්) සමාගම | 9,800,000 | |
| - මහවැලි උපදේශක කාර්යාංශ (පුද්) සමාගම | 64,000 | |
| - ස්වාභාවික සම්පත් කළමනාකරණ (පුද්) සමාගම | 15,000 | |
| - මහවැලි පශු සම්පත් ව්‍යාපාර සමාගම | 10,000,000 | |
| ඉතිරිකිරීමේ ගිණුම | 2,632,908 | (i) ශේෂ සනාථ කිරීම්<br>(ii) බැංකු පාස් පොත |

| | | |
|---|---|---|
| ස්ථාවර තැන්පතු | 727,481 | (i) ශේෂ සනාථ කිරීම<br>(ii) තැන්පතු සහතික |

## 2.4 ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) සමාලෝචිත වර්ෂය අවසානයට පැවති ලැබියයුතු බදුකුලී ආදායම වූ රු.662,953,920 ක් තුල වර්ෂ 05 ඉක්මවූ රු.140,623,878 ක් ද වර්ෂ 03 සිට වර්ෂ 05 ට අදාල රු.35,119,000 ක් ද විය. අධිකාරිය සතු ඉඩම් බදුදීම්වලින් බදු ආදායම් රැස්කිරීමට අදාලව පනවා තිබුණු නියමයන් හා කොන්දේසි නිසි පරිදි ක්‍රියාත්මක නොකිරීම, මෙසේ හිඟ බදු ආදායම් ශේෂය වැඩිවීමට ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

(ආ) අධිකාරියට අයත් ගොඩනැගිලි බාහිර පාර්ශව වෙත කුලියට ලබාදීමේදී අදාල විදුලිය, ජලය හා පවිත්‍රතා වියදම් ප්‍රතිපූර්ණය කිරීමේ පදනම මත ලබාදී තිබුණද 2016 දෙසැම්බර් 31 දින වන විට අධිකාරිය විසින් දරන ලද රු. 3,228,320 ක වියදම්, බාහිර පාර්ශව 06 කින් ප්‍රතිපූර්ණය කරගෙන නොතිබුණි.

(ඇ) සමාලෝචිත වර්ෂය අවසානය වන විට ගෙවිය යුතු ගිණුම්වල වටිනාකම රු.330,231,855 ක් වූ අතර, ඉන් රු. 12,082,658 ක් වසර 05 ඉක්මවා තිබුණි. එම ශේෂවල ඇතුළත් රු.5,053,925 ක රැඳවුම් මුදල්වලට අදාළ කොන්ත්‍රාත් වැඩවල සම්පූර්ණත්වය තහවුරුකර ගෙන රැඳවුම් මුදල් නිරවුල් කිරීමට කටයුතුකර නොතිබුණි.

(ඈ) 2010 වර්ෂයේදී අධිකාරිය සතු කලංකුටටිය ගොවිපලෙන් අක්කර 25ක භූමි ප්‍රමාණයක් වෙනත් අමාත්‍යාංශයකට අයත් පශු සම්පත් ව්‍යාපාරික සමාගමට විධිමත් පරිදි බදු දී නොතිබුණු අතර 2010 වර්ෂයේ සිට සමාලෝචිත වර්ෂය දක්වා අයවිය යුතු බදු මුදල රු.5,985,000 ක් වී තිබුණි.

(ඉ) වික්ටෝරියා - කොත්මලේ කලාපයේ නිවාස වෙනුවෙන් අයවියයුතු බදු ආදායමින් රු.8,847,821 ක් මහවැලි සේවකයන්ගෙන් අයවියයුතු අතර බදුදී තිබුණු සිනමා ශාලාව සහිත ඉඩමෙන් 2016 දෙසැම්බර් 31 වන විට රු.1,507,427 ක බදු මුදලක් අයවිය යුතුව පැවතුණි. මෙම හිඟ බදු අයකිරීම සඳහා නඩු පවරා නොතිබුණි.

(ඊ) මාදුරුඔය 1 බලාගාරයේ විදුලි මීටරයේ දෝෂයක් හේතුවෙන් 2015 දෙසැම්බර් 12 සිට 2016 ජනවාරි 06 දක්වා කාලයට අඩුවෙන් ගණනයකර තිබූ කිලෝවොට් ප්‍රමාණය සඳහා රු. 4,128,992 ක් විදුලිබල මණ්ඩලයෙන් අයවියයුතුව තිබුණි.

(උ) මහවැලි උපදේශක සේවා කාර්යාංශ (පුද්) සමාගමේ, සමාලෝචිත වර්ෂය අවසානයට වර්ෂ 03 ක් ඉක්මවා තිබුණු රු.1,852,118 ක් වූ ලැබිය යුතු ගිණුම් ශේෂයන් අයකරගැනීමට කටයුතු කර නොතිබුණි.

(ඌ) 2010 වර්ෂයේදී වාරිමාර්ග හා ජල සම්පත් සංවර්ධන අමාත්‍යාංශයට පවරා තිබුණු මහවැලි පශු සම්පත් හා කෘෂි ව්‍යාපාර සමාගමේ නිරාවිය ගොවිපලේ පශු සම්පත් තොගය වෙනුවෙන් එම අමාත්‍යංශයෙන් ලැබිය යුතු රු.5,820,430 ක් අයකර ගෙන නොතිබුණු අතර වසර 05 ක කාලයක් ඉක්මවූ රු.690,784 ක ණයගිම් ශේෂ නිරවුල් කර නොතිබුණි.

(එ) "සී" කලාපයේ ඉඩම්වලින් 2015 මැයි සිට 2016 දෙසැම්බර් 31 දින දක්වා ලබාගත් වැලි කියුබ 75,941 ක් වෙනුවෙන් ලැබියයුතු ඉඩම් පරිහරන ගාස්තුව වූ රු.37,970,500 ක් තාක්ෂණික සේවා පුද්ගලික සමාගමෙන් අයකරගැනීමට කටයුතුකර නොතිබුණි.

## 2.5 නීති රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම

පහත සඳහන් නීති රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවූ අවස්ථා නිරීක්ෂණය විය.

| නීති රීති හා රෙගුලාසිවලට යොමුව | අනුකූල නොවීම |
| --- | --- |
| (අ) 1979 අංක 23 දරන ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය පනත | |
| (i) 39 (1) වගන්තිය | පරිපාලිත සමාගම්වල අධ්‍යක්ෂ මණ්ඩලය, ආණ්ඩුවේ අධ්‍යක්ෂවරුන් සහ කොටස්කාර |

| | |
|---|---|
| | අධ්‍යක්ෂවරුන් 07 දෙනෙකුගෙන් සමන්විත විය යුතු වුවත් එම සමාගම්වල අධ්‍යක්ෂ මණ්ඩලය තිදෙනෙකුගෙන් පමණක් සමන්විත වී තිබුණි. |
| (ii) 42 (1) වගන්තිය | පරිපාලිත සමාගම්වල කොටස් ප්‍රාග්ධනය රු.100 සාමාන්‍ය කොටස්වලින් සමන්විත වියයුතු වුවද ස්වාභාවික සම්පත් කළමනාකරණ සේවා (පුද්) සමාගමේ අනුදත් ප්‍රාග්ධනය රු.10 සාමාන්‍ය කොටස් 10,000,000 කින් හා මහවැලි පශු සම්පත් සහ කෘෂි ව්‍යාපාර (පුද්ගලික) සමාගමේ ප්‍රාග්ධනය රු.10 සාමාන්‍ය කොටස් 5,000,000 කින් සමන්විත වී තිබුණි. |
| (iii) 45(1) වන වගන්තිය | සමාගම්වල අධ්‍යක්ෂ මණ්ඩලය විසින්, එම අධ්‍යක්ෂවරුන් අතරින් එක් අධ්‍යක්ෂවරයෙක් සමාගමේ සභාපති ලෙස තෝරා පත්කර ගතයුතු වුවද, සමාගම් දෙකක ජේෂ්ඨ අමාත්‍යවරයා හා අධිකාරියේ අධ්‍යක්ෂ ජනරාල් විසින් අධ්‍යක්ෂවරයෙකු සභාපති ලෙස පත්කර තිබුණු අතර එක් සමාගමක 2015 සැප්තැම්පර් සිට සභාපතිවරයෙකු පත්කර නොතිබුණි. |
| (ආ) 2013 අංක 17 දරන එකතු කල අගය මත බදු (සංශෝධිත) පනතේ 10 (ආ) වගන්තිය | සමාලෝචිත වර්ෂයේ හා ඉකුත් වර්ෂයේදී මාස 12 ක කාලසීමාව සඳහා භාණ්ඩ හා සේවා සැපයුම් හෝ භාණ්ඩ හා සේවා සැපයුම් වල මුළු වටිනාකම රු.මිලියන 12 ඉක්මවන්නේ නම් පනත යටතේ එකතුකල අගය මත බදු සඳහා ලියාපදිංචි වියයුතු නමුත් අධිකාරිය විසින් අදාල ආදායම් ප්‍රභවයන්ගෙන් ඉකුත් වර්ෂයේදී රු.මිලියන 18 ක් හා සමාලෝචිත |

| | |
|---|---|
| | වර්ෂයේ රු. මිලියන 87 ක ආදායමක් රැස්කර තිබුණද එකතු කල අගය මත බදු සඳහා ලියාපදිංචිවීමට කටයුතු කර නොතිබුණි. |
| (ඈ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය | |
| (i) මුදල් රෙගුලාසි 104(4) | බාහිර පාර්ශව දෙකකට මුද්‍රාහැර තිබුණු වාහන දෙකක් අනතුරුවලට ලක්වී තිබුණද මුදල් රෙගුලාසි ප්‍රකාරව විධිමත් පරීක්ෂණයක් සිදුකර නොතිබුණු අතර අලාභ තක්සේරුකර වගකිවයුතු පාර්ශවයන්ගෙන් අයකරගැනීමට කටයුතුකර නොතිබුණි. |
| (ii) මුදල් රෙගුලාසි 756 | හුරුළු වැව කලාපයේ සමාලෝචිත වර්ෂයේ සිදුකළ වත්කම් සමීක්ෂණයේදී හදුනාගන්නා ලද අතිරික්තතා 292 ක් හා ඌනතා 50 ක් සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතුකර නොතිබුණි. |
| (ඇ) 2016 ජනවාරි 01 දිනැති අංක 01/2016 දරන විගණන හා කළමනාකරණ දෙපාර්තමේන්තු චක්‍රලේඛය | චක්‍රලේඛය ප්‍රකාරව ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය විසින් වාහන සම්බන්ධයෙන් පරිගණකගත තොරතුරු පද්ධතියක් පවත්වාගෙන ගොස් නොතිබුණු බැවින් අධිකාරිය සතු වාහන සංඛ්‍යාව, එම වාහනවල ලියාපදිංචි අයිතිය, වාහන අනුයුක්තකර ඇති අංශය සහ එහි රියදුරු වැනි තොරතුරු මෙන්ම අධිකාරියට අයිති වාහන කොපමණ ප්‍රමාණයක් පවතීද යන්න පිළිබඳ නිවැරදි තොරතුරක් ලබාගැනීමට අපහසු විය. |

| | | |
|---|---|---|
| (ඉ) | අධිකාරියේ මූල්‍ය කාර්ය පරිපාටි සංග්‍රහයේ 1.5.1 ඡේදය හා අධ්‍යක්ෂ ජනරාල්ගේ 2012 මාර්තු 15 දිනැති අංක 02/2012 දරන අභ්‍යන්තර චක්‍රලේඛයේ 05 වන වගන්තිය | (i) අත්තිකාරම් ලබාගත් කාර්යය අවසන් වී දින 07 ක් ඇතුළත අත්තිකාරම් පියවියයුතු වුවද "එල්" කලාපයේ මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් වර්ෂ එකකට වඩා වැඩි නොපියවූ අත්තිකාරම් වටිනාකම රු. 11,881,612 ක් විය.<br><br>(ii) ලබාගත් අත්තිකාරම් පියවීමකින් තොරව නැවත අත්තිකාරම් ලබාගත නොහැකි වුවද ඊට පටහැනිව කලාප 6 ක් විසින් අවස්ථා 61 කදී රු.1,137,401 ක් ඉන්ධන හා මිලදී ගැනීමේ අත්තිකාරම් වශයෙන් ලබාදී තිබුණි. එම අත්තිකාරම් වර්ෂය අවසානය වන විටද පියවා නොතිබුණි. |
| (ඊ) | 2011 පෙබරවාරි 11 දිනැති අංක 57 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛය හා 2015 මාර්තු 31 දිනැති අංක 2/2015 දරන ජාතික අයවැය චක්‍රලේඛයේ 08 ඡේදය | මහවැලි උපදේශක සේවා කාර්යාංශ (පුද්) සමාගම විසින් සමාලෝචිත වර්ෂයේදී අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතියකින් තොරව ත්‍යාග සඳහා රු.539,000 ක් වියදම් කර තිබුණි. |

## 3. මූල්‍ය සමාලෝචනය

### 3.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශන අනුව සමාලෝචිත වර්ෂයේදී සමූහයේ හා අධිකාරියේ මූල්‍ය ප්‍රතිඵල පිළිවෙලින් රු.34,602,000 ක හා රු.37,853,000 ක ඌනතාවයන් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ ඌනතාවයන් රු.271,246,000 ක් හා රු.273,450,000 ක් වූයෙන් ඉකුත් වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලයෙහි පිළිවෙලින් රු.236,644,000 ක හා රු.235,597,000 ක ඌනතාවයන්ගේ අඩුවීමක් පෙන්නුම් කෙරුණි.

සමාලෝචිත වර්ෂය හා ඉකුත් වර්ෂ 04 ක අධිකාරියේ මූල්‍ය ප්‍රතිඵල විග්‍රහ කිරීමේදී 2012 වර්ෂයේ රු.350,271,000 ක්ව පැවති ඌනතාවය උච්ඡාවචනය වෙමින් 2016 වර්ෂයේදී රු. 37,853,000 ක් වී තිබුණි. මූල්‍ය ප්‍රතිඵලයට සේවක පාරිශ්‍රමික, ජංගම නොවන වත්කම් සඳහා ක්ෂය හා බදු නැවත ගැලපීමේදී 2012 වර්ෂයේ රු.1,876,561,000 ක්ව පැවති අධිකාරියේ දායකත්වය 2013 හා 2014 වර්ෂ වලදී අඛණ්ඩව වැඩිවී 2015 වර්ෂයේදී රු.3,081,393,000 ක් වී තිබුණද සමාලෝචිත වර්ෂයේදී රු.2,520,568,000 ක් ලෙස අඩු වී තිබුණි.

## 3.2 විග්‍රහාත්මක මූල්‍ය සමාලෝචනය

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) 2015 වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේදී ගොවිපල නිෂ්පාදන විකුණුම්වලින් ලැබුණු ආදායම රු.81,911,000 කින් වැඩිවී තිබුණි. මොරගහකන්ද ව්‍යාපෘතියට අයත්ව තිබුණු නිරාවිය ගොවිපල සමාලෝචිත වර්ෂයේදී අධිකාරියට පැවරීම මෙයට හේතුවී තිබුණි.

(ආ) ජනපදිකයින් පුනරුත්ථාපනය, වර්ධනය හා නඩත්තු වියදම් 2015 වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂය තුලදී රු.763,401,000 කින් වැඩිවී තිබුණි. සමාලෝචිත වර්ෂයේදී "බී" කලාපයේ ඒකාබද්ධ සංවර්ධන ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම මෙයට හේතු වී තිබුණි.

## 3.3 අධිකාරියට එරෙහිව හෝ අධිකාරිය විසින් ආරම්භ කර ඇති නෛතික සිද්ධි

ප්‍රධාන කාර්යාලය , කලාප 07 ක්, අංශ දෙකක් හා ව්‍යාපෘතියක් විසින් විගණනයට ඉදිරිපත් කරන ලද තොරතුරු අනුව බාහිර ආයතන හා පුද්ගලයන් විසින් නිවාස සන්තකය ආපසු ලබාගැනීම සඳහා අධිකාරියට එරෙහිව නඩු 161 ක් ගොනු කර තිබුණි. එහි මූල්‍ය බැදීම රු.මිලියන 8.491 ක් වුවද මූල්‍ය ප්‍රකාශනවල එය රු.මිලියන 25.395 ක් ලෙස වැඩියෙන් දක්වා තිබුණි. තවද අධිකාරිය විසින් නිවාස හා ඉඩම් සන්තකය ලබාගැනීම හා වෙනත් හේතූන් මත රු.10,230,554 ක වන්දි ඉල්ලුම්කර බාහිර ආයතන හා පුද්ගලයන්ට එරෙහිව අධිකරණවල නඩු 60 ක් ගොනුකර තිබුණද ඒ බව මූල්‍ය ප්‍රකාශනවල දක්වා නොතිබුණි.

## 4. මෙහෙයුම් සමාලෝචනය

### 4.1 කාර්යසාධනය

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) මහවැලි මහ සැලැස්ම

මහවැලි මහ සැලැස්මට අනුව මහවැලි ගඟේ ඝන මීටර් මිලියන 6,900 ක පමණ වූ ජල ප්‍රමාණයෙන් විදුලි බල නිෂ්පාදනයට හා මහවැලි කලාප 13 ක ඉඩම් හෙක්ටයාර් 365,853 ක් සඳහා වාරි පහසුකම් සැපයීමට යෝජිතව තිබුණි. සමාලෝචිත වර්ෂය අවසානයට ඉඩම් හෙක්ටයාර 85,252 ක් සඳහා පමණක් වාරි පහසුකම් සපයා තිබුණු අතර විදුලි බලය නිෂ්පාදනය සඳහා යෙදවීමට යෝජිත ජලාශ 11 න් ජලාශ 06 ක් පමණක් උපයෝජනය කරගනිමින් ජල විදුලිය නිෂ්පාදනය කර තිබුණි.

1968 වර්ෂයේදී සකස් කර ඇති මහවැලි මහ සැලැස්ම වර්තමාන අවශ්‍යතාවයන්, ස්වාභාවික සම්පත්වල ස්වභාවය හා භාවිතය සැලකිල්ලට ගෙන යාවත්කාලීන සැලැස්මක් ලෙස සකස් කිරීම වෙලි ආරක්ෂණ හා ජල සම්පත් සැලසුම්කරණ ව්‍යාපෘතියේ එක් කාර්යයක් වූ අතර, එම සැලසුම් 2013 වර්ෂයේදී සකස් කර අවසන් කර තිබුණි. එහෙත් එම සැලැස්ම සමාලෝචිත වර්ෂය අවසානය දක්වාම ක්‍රියාත්මක කිරීම සඳහා අවශ්‍ය ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.

(ආ) ඉඩම් අංශයේ ක්‍රියාකාරී සැලැස්ම හා කාර්යසාධන වාර්තා අනුව සමාලෝචිත වර්ෂයේ දී වාණිජ හා ආයෝජන ව්‍යාපෘති සඳහා ඉඩම් කට්ටි 665 ක් බෙදා දීමට සැලසුම්කර තිබුණද ඉඩම් කට්ටි 91 ක් පමණක් බෙදා දී තිබුණි. තවද ඉඩම් කට්ටි 635 ක් සඳහා ප්‍රදානපත්‍ර/දීමනාපත්‍ර/ දීර්ඝකාලීන බදු බලපත්‍ර බෙදාදීමට සැලසුම්කර තිබුණද ඉඩම් කට්ටි 227 ක් සඳහා පමණක් එම බලපත්‍ර ලබාදී තිබුණි.

(ඇ) ජනපදිකයින් සඳහා ණය යෝජනා ක්‍රමයන් ක්‍රියාත්මක කිරීමේ අරමුණින් 2002 වර්ෂයේ චක්‍රීය අරමුදලක් ඇති කිරීමට අධිකාරිය විසින් ඌව සංවර්ධන හා රජරට සංවර්ධන බැංකුවේ රු. 48,000,000 ක් ආයෝජනය කර තිබුණද බැංකු සමඟ ඇති කරගෙන තිබුණු ගිවිසුම් කොන්දේසි ක්‍රියාත්මක නොවීම නිසා උක්ත අරමුණු ඉටුවී නොතිබුණි.

(ඇ) මහවැලි උපදේශක සේවා කාර්යාංශ ( පුද්) සමාගමේ සාංගමික සංස්ථා පත්‍රයට අනුව ලංකාව තුළ සහ ඉන් පිටත ඉඩම් සහ ජල සම්පත් සංවර්ධන ව්‍යාපෘතිවලට අදාලව ශක්‍යතා අධ්‍යයනයන් සිදුකිරීම, ඉඩම් පරිහරණ සහ ජල සම්පත් ව්‍යාපෘති සැලසුම් කිරීම හා ක්‍රියාත්මක කිරීම, සමාජ ආර්ථික යටිතල පහසුකම් සංවර්ධන ව්‍යාපෘති සැලසුම් කිරීම, නිර්මාණය කිරීම හා ක්‍රියාත්මක කිරීම, පාරිසරික ඉදිකිරීම් ව්‍යාපෘති සමීක්ෂණ කිරීම, සැලසුම් කිරීම හා ක්‍රියාත්මක කිරීම , පරිසර දූෂණය පාලනය කිරීමේ ව්‍යාපෘති ක්‍රියාවට නැංවීම යන අරමුණු ක්‍රියාත්මක කර නොතිබුණි. තවද ක්‍රියාකාරී සැලැස්මට අනුව අදාල අංශවල අපේක්ෂිත ඉලක්කයන් දක්වා නොතිබීම හා කාර්යසාධන වාර්තා ක්‍රියාකාරී සැලැස්මට අනුව සකස්කර නොතිබීම හේතුවෙන් සැලසුම්කළ පරිදි එක් එක් අංශවල කාර්යසාධනය ළඟාකරගෙන ඇත්දැයි පරීක්ෂාකළ නොහැකි විය.

(ඉ) මහවැලි පශු සම්පත් සහ කෘෂි ව්‍යාපාර (පුද්) සමාගමේ සාංගමික සංස්ථා පත්‍රයට අනුව ගොවිපලවල වගා කටයුතු සිදුකිරීම, තොග සහ සිල්ලර වශයෙන් කුකුල් පාලනය සිදුකිරීම, ගොවීන්ට කුකුල් පාලනය සඳහා අවශ්‍ය කෑම නිෂ්පාදනය, ගව, ඌරන්, කුකුලන් ආදී සතුන් බෝ කිරීම, විකිණීම, වැඩිදියුණු කිරීම, සැකසීම හා අපනයන කටයුතු හා පලතුරු, ධාන්‍ය වර්ග ආශ්‍රිත ව්‍යාපාරික කටයුතු සිදුකිරීම යන අරමුණු ඉටුකර නොතිබුණු අතර මීගව, එළගව, කුකුල්, ඌරන් හා එළු පාලනය සුළු වශයෙන් සහ කිරි ආශ්‍රිත නිෂ්පාදන කිරීමේ කටයුතු පමණක් සිදුකරමින් පැවතුණි.

(ඊ) ස්වාභාවික සම්පත් කළමනාකරණ සේවා ( පුද් ) සමාගමේ සාංගමික සංස්ථා පත්‍රය අනුව ශ්‍රී ලංකාවේ සහ ඉන් පිටත සිදුකරන භූමි සමීක්ෂණ, ගුවන් ඡායාරූපකරණය, චන්ද්‍රිකා ඡායාරූපකරණය , භූගෝලීය තොරතුරු පද්ධතිය, ගෝලීය පිහිටීම් පද්ධති මගින් පස්, භූමි ආකෘති භූ ලක්ෂණ, ඉඩම් භාවිතය, වෘක්ෂලතා, ජෛව විවිධත්වය, ජලයේ ගුණත්වය ආදී පාරිසරික පරාමිතීන් සිතියම්ගත කිරීම, විශ්ලේෂණය කිරීම , භූ සම්පත් තක්සේරුව, භූ පරිහරණ සැලසුම්, පාංශු බාදනය හා පාංශු රක්ෂණය, ආරක්ෂිත ප්‍රදේශ කළමනාකරණය, ශාඛ ඖෂධ වගාව හා තිරසාර කාබනික වගා පද්ධති සඳහා උපදෙස්දීම, සැලසුම් සකස්කිරීම සහ පුහුණු කිරීම කළ යුතු වුවද පාරිසරික වාර්තා ලබාදීම පමණක් සමාගමේ ප්‍රධාන කාර්යයක් වී තිබුණි. තාක්ෂණික දැනුම සහිත කාර්ය මණ්ඩලයක් සමාගම සතු නොවූ බැවින් බාහිර පාර්ශ්වයකින් පාරිසරික වාර්තා සකස් කර ලබාගන්නා අතර එම වාර්තාවල නිවැරදිභාවය සහතික කිරීමේ හැකියාවක් ද සමාගම සතු නොවිය.

## 4.2 කළමනාකරණ ක්‍රියාකාරකම්

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) මහවැලි " එච්" කලාපයට අවශ්‍ය භාණ්ඩ මිලදී ගැනීමේදී සැපයුම්කරුවන්ගේ ලිඛිත ඉල්ලීමක් හෝ ගිවිසුමක් නොමැතිව ප්‍රසම්පාදන කමිටුවේ අනුමැතිය හා ගැණුම් ඇණවුම මත සැපයුම් අත්තිකාරම් ලෙස සැපයුම්කරුවන් නමට ලියන ලද රු. 5,123,027 ක් වටිනා චෙක්පත් 28 ක් අධිකාරියේ එක් එක් අංශවල නිළධාරීන් වෙත නිකුත් කර තිබුණි. අදාල කාර්යය ඉටුනොවීම මත එම චෙක්පත් මාස 03 කට පසුව අවලංගු කර තිබුණි

(ආ) පිරිවැය රු.42,520,000 ක් වූ ඉඩම් කට්ටි 02 ක් ගාස්තු ගෙවීමෙන් තොරව බාහිර පාර්ශවයන් විසින් භාවිතයට ගනිමින් පැවතුණද එම ඉඩම් අත්පත්කර ගැනීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි

(ඇ) කොත්මලේ භූගෝලීය තොරතුරු පද්ධති අංශය විසින් වර්ග කි.මී 3,118 ක් පමණ වන ඉහළ මහවැලි ජලාධාර කලාපයේ භූගෝලීය තොරතුරු දත්ත ගබඩාවක් පිළියෙල කිරීම සහ යාවත්කාලීන කිරීම, චන්ද්‍රිකා ඡායාරූප මඟින් මහවැලි කලාපවල ඉඩම් පරිහරණ රටාවන් පිළිබඳ සිතියම් සකස්කිරීම සහ යාවත්කාලීන කිරීම, ඉහළ මහවැලි ජලාධාර ප්‍රදේශයේ ඉඩම් පරිහරණ රටාවන්වල වෙනස්කම් පාලනය කිරීම, නැවත වන වගාවන් සඳහා සුදුසු ඉඩම් සහ පාංශු සංරක්ෂණය කළ යුතු ප්‍රදේශ හඳුනාගැනීම, වර්ෂාපතන තොරතුරු අනුව සිතියම් සකස්කිරීම සහ යාවත්කාලීන කිරීම, භූගෝලීය තොරතුරු පද්ධතිය සහ චන්ද්‍රිකා ඡායාරූප මඟින් ඉඩම් පරිහරණ කටයුතු සැලසුම් කිරීම සහ ජලාධාර කළමනාකරණ කටයුතු සිදු කිරීම යන කාර්යයන් සඳහා 2006 වර්ෂයේදී නිලධාරීන් 11 දෙනෙකු රාජකාරි ඉටුකරමින් පැවතියද 2006 වර්ෂයෙන් පසුව එක් නිලධාරියෙකු පමණක් සේවයේ යොදවා තිබුණි. එබැවින් වර්තමානයේ අදාල කාර්යයන් ඉටුනොවීම මත ඉහළ මහවැලි ජලාධාර කලාපයේ ඇතුළු මහවැලි කලාපවල පරිසර හා වන සංරක්ෂණ කටයුතු කළමනාකරණය කිරීම ක්‍රමවත්ව සිදු කිරීමට තිබුණු අවස්ථාව අහිමි වී තිබුණි. ඒ අනුව අවශ්‍ය නිලධාරීන් වැඩිකර ඉහළ කාර්යය සාධනයක් ළගාකර ගැනීමට කටයුතුකර නොතිබුණි.

(ඇ) ඉකුත් වර්ෂයට අදාල වාර්ෂික භෞතික තොග සත්‍යාපන කමිටුවේ නිර්දේශ අනුව වික්ටෝරියා කලාපයේ ප්‍රයෝජනයට ගත නොහැකි ලී බඩු, කාර්යාල උපකරණ හා පිරියත අයිතමයන් 126 ක් අපහරණය කිරීමට 2016 අගෝස්තු 18 දින නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල් (පාලන හා මුදල්) විසින් අනුමැතිය ලබාදී තිබුණද 2017 දෙසැම්බර් 31 දින වනවිටද ඒ සඳහා අවශ්‍ය පියවර නොගෙන වරාපිටිය ගබඩා පරිශ්‍රයේ තබා තිබුණි.

(ඉ) වික්ටෝරියා කලාපයට අයිති වරාපිටියේ පිහිටි ගබඩා 3 ක් සහ නේවාසික කාමරයකින් සමන්විත වූ ගබඩා පරිශ්‍රයෙන් ගබඩා 2 ක් හා නේවාසික කාමරය සෞඛ්‍ය දෙපාර්තමේන්තුවේ වෛද්‍ය සැපයුම් අංශය විසින් භාවිතා කරමින් පැවතුණද ඒවා නීත්‍යානුකූලව එම අංශයට භාරදී නොතිබුණි. තවද එම පරිශ්‍රයේ පවතින අනෙක් ගොඩනැගිල්ල දීර්ඝ කාලයක සිට අළුත්වැඩියා නොකිරීම හේතුවෙන් විනාශ වෙමින් පැවතුණි.

(ඊ) අධිකාරිය විසින් සමාගම් 05 ක සිදුකර තිබුණු රු. 439,000,000 ක ආයෝජන සඳහා වසර ගණනාවක් සිට කිසිදු ප්‍රතිලාභයක් ලැබී නොතිබුණි.

(උ) කොත්මලේ පටක රෝපණ අංශය විසින් පසුගිය වර්ෂ පහ තුල උණ පැළ 734,458 ක් නිෂ්පාදනයකර පැළ 515,837 ක් අදාල ක්ෂේත්‍රය වෙත නිකුත් කර තිබුණි. එම පැළ සිටුවීම, නඩත්තුව, රැකබලාගැනීම සහ වර්ධනය පිළිබඳ පසු විපරම් සිදුකර නොතිබුණි.

(ඌ) 1979 අංක 23 දරන ශ්‍රී ලංකා මහවැලි අධිකාරි පනතේ 13(13) වගන්තිය ප්‍රකාරව අධිකාරිය විසින් සපයනු ලබන ජලය සඳහා හෝ සලසනු ලබන යම් සේවාවක් සඳහා අයකිරීමක් හෝ ගාස්තුවක් පැනවිය හැකි බව නිශ්චය කර තිබුණි. මහවැලි ජලය භාවිතා කරන බාහිර පාර්ශවයන්ගෙන් ගාස්තුවක් අයකරනු ලැබුවද මහවැලි ජලාශවලින් විදුලිය නිපදවීම සඳහා 1985 වර්ෂයේ සිට 2016 දෙසැම්බර් 31 දක්වා ජල කියුබික් මීටර් මිලියන 211,391.93 ක් විදුලිබල මණ්ඩලය විසින් භාවිතයට ගෙන තිබුණද ඒ සඳහා ගාස්තුවක් අයකර ගෙන නොතිබුණි. එසේ වුවද එම ජලාශ හා වේලි නඩත්තු සහ මෙහෙයවීම් වෙනුවෙන් වේලි ආරක්ෂණ හා ජල සම්පත් සැලසුම් ව්‍යාපෘතිය හා මහවැලි අධිකාරිය විසින් ආරම්භයේ සිට 2016 දෙසැම්බර් 31 දින දක්වා රු. මිලියන 8,210 ක් වැයකර තිබුණි.

(එ) කොත්මලේ, වික්ටෝරියා හා රන්දෙණිගල යන ඉහළ මහවැලි ජලාධාර ප්‍රදේශයේ මහවැලි ගඟේ ප්‍රධාන අතු ගංගාවල ජලය සහ රක්ෂිත ඉඩම් භාවිතාකරමින් ක්‍රියාත්මක

වන සුළු පරිමාණ ජල විදුලි බලාගාර 46 ක් හා ක්‍රියාත්මක කිරීමට අනුමැතිය ලැබී තිබුණු ජලවිදුලි බලාගාර 24 ක් පැවතියද ඒවායින් 1979 අංක 23 දරන ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය පනතේ 3(1),12 සහ 13 වගන්ති ප්‍රකාරව රාජ්‍ය භාගය අයකර ගැනීමට සුදුසු වැඩපිළිවෙලක් සකස්කර නොතිබුණි.

(ඒ) අධිකාරිය සතු නොවූ ජාවත්ත ප්‍රදේශයේ පිහිටි ඉඩම්වල අධිකාරිය විසින් රු.76,580,000 ක් වටිනා ගොඩනැගිලි ඉදිකර තිබුණු අතර එම ඉඩම්වල අයිතිය අධිකාරිය වෙත පවරා ගැනීමට 2016 දෙසැම්බර් 31 දින වනවිටත් කටයුතුකර නොතිබුණි.

(ඔ) නඩත්තු වියදම අධිකවීම හා සතුන්ගෙන් ලැබෙන ආදායම අඩුවීම නිසා සමාලෝචිත වර්ෂයේදී එච් කලාපයේ නිරාවිය ගොවිපලට අයත්ව තිබුණු රු.7,347,608 ක් වටිනා සතුන් 383 දෙනෙක් ජාතික පශු සම්පත් හා සංවර්ධන මණ්ඩලය වෙත භාරදී තිබුණි. සතුන්ගේ වටිනාකම අයකර ගැනීම සඳහා දෙපාර්ශවය විසින් එකඟතාවයකට එළඹ නොතිබීම හේතුවෙන් පශු සම්පත් තොගයේ වටිනාකම අයකර ගැනීමට නොහැකිවී තිබුණු අතර, අයවියයුතු මුදලක් ලෙස හෝ මූල්‍ය ප්‍රකාශනවල දක්වා නොතිබුණි.

(ඕ) (i) මහවැලි උපදේශක සේවා කාර්යාංශ ( පුද්ගලික ) සමාගම

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

- 2016 මාර්තු 24 දිනැති අංක 16/0416/704/012 දරන අමාත්‍ය මණ්ඩල තීරණය මගින් මොරගහකන්ද ජලාශයේ ඉදිකිරීම් කොන්ත්‍රාත්තුවට අදාල සැලසුම් ඇගයීම් කර අනුමත කිරීම සහ ඉදිකිරීම් වැඩ අධීක්ෂණය සඳහා වූ වර්ෂයක උපදේශක කොන්ත්‍රාත්තුව රු. 167,174,700 ක මුදලකට ( බදු රහිත ) 2016 මාර්තු 15 දින සිට සමාගම වෙත ලබා දී තිබුණි. සමාගම විසින් ප්‍රසම්පාදන ක්‍රියාවලිය අනුගමනයකර උපදේශකවරුන් තෝරා ගැනීම වෙනුවට මොරගහකන්ද ව්‍යාපෘතියේ ව්‍යාපෘති අධ්‍යක්ෂ විසින් නම්කර තිබූ නිලධාරීන් පස් දෙනෙකු දේශීය උපදේශකයින් ලෙස පත්කර උපදේශන හා අධීක්ෂණ කටයුතු ඔවුන් වෙත පවරා තිබුණි. සමාගම විසින් ඊට අදාල බිල්පත් සකස් කිරීමේ කටයුතු පමණක් සිදු කර තිබුණි. තවද කොන්ත්‍රාත්තුවට අදාලව විදේශීය

උපදේශකයින් සේවයේ යෙදවීම සඳහා පෞද්ගලික උපදේශක ඉංජිනේරු සමාගමකට උප කොන්ත්‍රාත්තුවක් ලබා දී තිබුණි.

- 2011 වර්ෂයේදී සමාගමට එරෙහිව බාහිර පාර්ශවයක් විසින් වන්දි ඉල්ලා පවරා තිබූ නඩුව වෙනුවෙන් සමාගම පෙනී නොසිටීම හේතුවෙන් 2013 වර්ෂයේ අධිකරණ නියෝගය පරිදි රු.මිලියන 4.5 ක වන්දියක් ගෙවීමට සිදුවී තිබුණි. මේ සඳහා 2013, 2014 සහ 2015 වර්ෂවල මූල්‍ය ප්‍රකාශනවල ගෙවියයුතු වන්දි වෙනුවෙන් කිසිදු ප්‍රතිපාදනයක් සිදු කර නොතිබුණු අතර 2016 වර්ෂයේදී රු.2,000,000 ක් ප්‍රතිපාදනය කර 2017 වර්ෂයේදී එම මුදල ගෙවා තිබුණි. මෙම නඩුව සම්බන්ධයෙන් සමාගම් ලේකම්වරිය විසින් සිය රාජකාරී වගකීම් නිසි පරිදි ඉටුකර නොතිබියදී ඒ සම්බන්ධයෙන් විධිමත් පරීක්ෂණයක් නොපවත්වා සේවයෙන් ඉවත්වීමට ඉඩ දී තිබුණු අතර අනුමැතියකින් තොරව බඳවාගෙන තිබුණු ඉහත නඩුවට සම්බන්ධ වියදුරුද අනතුර සම්බන්ධයෙන් අදාලව පරීක්ෂණයක් නොපවත්වා සේවයෙන් ඉවත්කර තිබුණි.

(ii) මහවැලි පශු සම්පත් සහ කෘෂි ව්‍යාපාර (පුද්ගලික) සමාගම

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

- ගිරාදුරුකෝට්ටේ ගොවිපල තුළ 1986 වර්ෂයේ දී ආරම්භකරන ලද කිරි සැකසුම්හලෙහි ආරම්භයේ සිට භාවිතා කරන ලද යන්ත්‍ර සූත්‍ර පැවතීම, කර්මාන්තශාලා ගොඩනැගිලි පැරණිවීම , වහලය අබලන්වීම හා වැසි ජලය කර්මාන්තශාලාව තුළට පැමිණීම, කානු පද්ධතිය අබලන්වීම, අභ්‍යන්තර පිරිසිදු කිරීම් පද්ධතිය දුර්වලව පැවතීම නිසා සෞඛ්‍යාරක්ෂිත ගැටළු පැනනැගීම හේතුවෙන් නිෂ්පාදන කටයුතු සිදුකිරීමට අපහසු වී තිබුණි. තවද දුර්වල පරිසර තත්ත්වයන් මත නිෂ්පාදන කාර්යයන් සිදුකිරීම නිසා ඉදිරියේදී නීතිමය ගැටළු පැනනැගීමට හැකියාව පැවතියද ඒ සම්බන්ධයෙන් කළමනාකරණය විසින් සුදුසු ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.

- 2014 වර්ෂයේ සිට 2016 වර්ෂය දක්වා සේවක අර්ථසාධක අරමුදලට රු.8,237,607 ක් හා සේවක භාරකාර අරමුදලට රු. 334,846 ක දායක මුදලක් ගෙවිය යුතුව පැවතීම නිසා ඉදිරියේදී සමාගමට අධිභාර ගෙවීමට සිදුවිය හැකි බව නිරීක්ෂණය විය.

- මූල්‍ය ප්‍රකාශනවල ජංගම නොවන වත්කම් යටතේ දක්වා තිබුණු රු.14,929,159 ක් වටිනා ඉඩම්වල නීත්‍යානුකූල අයිතිය පවරා ගැනීමට කටයුතුකර නොතිබුණි.

- සමාගමේ අනුදත් ප්‍රාග්ධනය වූ රු.10 කොටස් 5,000,000 න් කොටස් 03 ක් ප්‍රාරම්භක අධ්‍යක්ෂවරුන් වන වෙනත් පුද්ගලික සමාගමක අධ්‍යක්ෂවරුන් තිදෙනෙකු වෙත නිකුත්කර තිබුණද ඉතිරි කොටස් සමාලෝචිත වර්ෂය අවසානය දක්වාම නිකුත්කර නොතිබුණි. මහවැලි අධිකාරිය සඳහා සමාගමේ කිසිදු කොටසක් ලබාදී නොතිබුණු නිසා සමාගම සම්බන්ධයෙන් අධිකාරියේ හිමිකාරිත්වය පිළිබඳ ගැටළු සහගත තත්ත්වයක් නිරීක්ෂණය විය.

(iii) ස්වභාවික සම්පත් කළමනාකරණ සේවා (පුද්ගලික) සමාගම

පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ.

සමාගම විසින් මහවැලි අධිකාරියට අයත් දිගන පිහිටි ගොඩනැගිල්ලක තම කාර්යාලය පවත්වාගෙන යන අතර ඒ සඳහා ගිවිසුමක් නොවීය. එසේම අධිකාරිය වෙත මාසික බදු කුලී ගෙවීම සඳහා නිශ්චිත පදනමක් ද නොවූ අතර 2015 දෙසැම්බර් 31 දිනට ඊට අදාල ගෙවියයුතු කුලිය රු.600,000 ක් සමාගම විසින් ගිණුම්ගත කර තිබුණි. පසුව එම ගෙවියයුතු මුදල කිසිදු අනුමැතියකින් තොරව සමාලෝචිත වර්ෂයේදී කපාහැර වෙනත් ආදායම් ලෙස ගිණුම් ගත කර තිබුණි.

**4.3 මෙහෙයුම් ක්‍රියාකාරකම්**

-----------------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) අධිකාරියේ නිරාවිය ගොවිපලට අයත් අක්කර 26 ක් පමණ ඉඩම අනුරාධපුර ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලය විසින් 1989 ඔක්තෝබර් 26 දිනැති අංක 2060 හා එල්/4/තඹු/6/102 දරන දීර්ඝකාලීන බදුකරය මගින් තිස් අවුරුදු කාලයකට පශු සම්පත් ව්‍යාපාරික සමාගම වෙත බදුදී තිබුණි. බාහිර පාර්ශවයක් විසින් සිදුකර තිබුණු මෙම බදුදීම නිවැරදිකර අධිකාරියට බදු අයකර ගැනීමට කටයුතුකර නොතිබුණි. එසේම ගර්බීය අමාත්‍යාංශ ලේකම්ගේ 2010 සැප්තැම්බර් 20 දිනැති ලිපිය අනුව නිරාවිය ගොවිපල සතු

කුකුල් කූඩු 07 ක් උක්ත සමාගමට බදු දී තිබුණද ඊට අදාල බදු මුදල් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ආ) අධිකාරියට අයත් රු.104,394,675 ක් වටිනා ගොඩනැගිලි ගිවිසුම්ගතවීමකින් තොරව රාජ්‍ය ආයතන 13 ක් විසින් භාවිතයට ගන්නා නමුත් ඒ සඳහා කුලියක් අයකර ගැනීමට 2016 දෙසැම්බර් 31 දින වනවිටත් අධිකාරිය පියවර ගෙන නොතිබුණි. එසේම මහවැලි ආරක්ෂක බළකාය සතු රු.26,030,780 ක් වටිනා ගොඩනැගිල්ලක්, පුහුණු ශාලා 03 ක්, හා නිල නිවාස 24 ක් ගිවිසුමකින් තොරව 2012 දෙසැම්බර් 24 දින සිට තාවකාලික පදනමින් කොත්මලේ ජාත්‍යන්තර පුහුණු ආයතනයට භාරදී තිබුණද බාරදුන් දින සිට එමඟින් කුලී ආදායමක් ලබාගැනීමට කටයුතු කර නොතිබුණි.

(ඇ) සන්නිවේදන කුළුණු 10 ක් ස්ථාපිත කිරීම සඳහා මාධ්‍ය ආයතන වෙත එච් කලාපයේ අධිකාරිය සතු ඉඩම් ලබාදීමේදී අදාල බදුකරුවන් සමඟ ගිවිසුම්වලට එළඹ නොතිබුණු අතර ඉඩම් 05 ක වෙළඳපල අගය රජයේ තක්සේරුකරුගෙන් ලබානොගෙන අධිකාරියේ දළ තක්සේරුව මත වාර්ෂික බදු කුලී තීරණය කර තිබුණි.

(ඈ) ඉහළ මහවැලි ජලාධාර ප්‍රදේශයේ කුඩා ජල පෝෂක ප්‍රදේශ 7 ක රු. 2,277,100 ක් වියදම් කර ස්ථාපිත කර තිබුණු ස්වයංක්‍රීය ජල මිනුම් දත්ත රැස්කිරීමේ උපකරණ පද්ධතිය මඟින් මහවැලි ගඟ සහ එහි අතු ගංගාවල ජලමට්ටම් තොරතුරු ඉතා ඉක්මනින් සහ පහසුවෙන් ලබා ගත හැකි වී තිබුණු නමුත් මෙම දත්ත විශ්ලේෂණය කර අවශ්‍යතාවයන් අනුව කාලීනව වාර්තාකිරීමට ක්‍රමවේදයක් ස්ථාපිත කර නොතිබුණි.

(ඉ) වැලිඔය කලාපයේ වාහන 12 ක් වර්ෂ 01 ත් වර්ෂ 10 ත් අතර කාලයක් අලුත්වැඩියා නොකර තබා තිබීම නිසා එම වාහන අලුත්වැඩියා කළ නොහැකි තත්ත්වයට පත්වී තිබුණු අතර වාහන අපහරණය කිරීමට හෝ වෙනත් ක්‍රියාමාර්ගයක් ගැනීමට හෝ කටයුතුකර නොතිබුණි.

(ඊ) එච්, ඩී හා බී කලාපවල ආයෝජකයින්ට ව්‍යාපෘති ආරම්භ කිරීම සඳහා අධිකාරිය විසින් ලබාදුන් ඉඩම් අක්කර 4342.51 කින් ව්‍යාපෘති ආරම්භ කරන ලද ඉඩම් ප්‍රමාණය අක්කර 2744.32 ක් පමණක් විය. ඒ අනුව ඉතිරි ඉඩම් අක්කර 1598.19 ක් ගිවිසුම් ප්‍රකාරව ව්‍යාපෘති ආරම්භ නොකිරීමට හේතු සොයා බලා අවශ්‍ය නීතිමය ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.

(උ) වගා කටයුතු සඳහා එල්" කලාපයේ අක්කර 755 ක් වැනි විශාල ඉඩම් ප්‍රමාණයක් ආයෝජකයින් 30 දෙනෙකු වෙත 2013 හා 2014 වර්ෂවලදී ලබාදී ඇති නමුත්, 2017 ජූලි 14 දින වනවිටද කිසිදු වගා කටයුත්තක් ආරම්භකර නොතිබුණි. ඉඩම් ලබාදීමට පෙර සුදුසු ඉඩම් තෝරා නොගැනීම නිසා වන සතුන්ගෙන් වගා හානි වලක්වාගත නොහැකිවී තිබීමෙන් ඉඩම් ලබාදුන් අරමුණ ඉටුවී නොතිබුණු අතර එහි දැව ඉවත් කිරීම නිසා විශාල පරිසර හානියක්ද සිදුවී තිබුණු බව නිරීක්ෂණය විය.

(ඌ) "බී " කලාපය මඟින් කෘෂි ව්‍යාපෘති සඳහා ව්‍යාපාරිකයන් 123 දෙනෙකු වෙත 2009-2014 කාලපරිච්ඡේදය තුල ලබාදී තිබුණු ඉඩම් අක්කර 1700 ක 2017 ජූනි 30 වනවිටද කෘෂි ව්‍යාපාර ආරම්භ කර නොතිබුණු අතර, වර්ෂ ගණනාවක් ගතවී තිබුණද ගිවිසුම් ප්‍රකාරව එම ඉඩම් ආපසු ලබාගැනීමට කටයුතු කර නොතිබුණි. එමෙන්ම ආයෝජකයින් 49 දෙනෙකු වෙත ඉඩම් ලබාදීම සඳහා ලබාගත් අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතියද විගණනයට ඉදිරිපත් නොවිය.

(එ) දිගුකාලීන බදු පදනම මත ලබාදුන් ඉඩම් සඳහා ආයෝජකයින් 149 දෙනෙකුගෙන් සමාලෝචිත වර්ෂය අවසානයට රු.52,685,874 ක බදුකුලියක් අයවිය යුතුව තිබුණද ඒවා අයකර ගැනීමට අධිකාරිය කටයුතුකර නොතිබුණි.

(ඒ) පරිපාලිත සමාගමක් වූ මහවැලි පශු සම්පත් සහ කෘෂි ව්‍යාපාර (පුද්) සමාගම යටතේ 1999 වර්ෂයේ සිට ගොවිපලවල් 07 ක් ක්‍රියාත්මක වී තිබුණද ඉන් ගොවිපලවල් 05 ක් අධිකාරියට හා බාහිර පාර්ශවයන්ට බදු පදනමට හා සින්නකර අයිතිය පවරාදීම මත ලබාදී තිබුණද එම ගොවිපලවල් වලට අයත් රු.16,806,745 ක් වටිනා ගොඩනැගිලි හා රු.6,583,340 ක් වටිනා වාහන හා වෙනත් වත්කම් සමාගමේ මූල්‍ය ප්‍රකාශනවල තවදුරටත් දේපල, පිරියත හා උපකරණ ලෙස දක්වා තිබුණි.

## 4.4 මතභේදයට තුඩුදෙන ගනුදෙනු

----------------------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) ජලාශයන්හි රැස්කරන ජලය විදුලිබල උත්පාදනය සඳහා නිවැරදිව ඇගයීම්කර භාවිතා කිරීමට සැලසුම් නොකිරීම හේතුවෙන් 1985 වර්ෂයේ සිට 2016 වර්ෂය අවසානය දක්වා වර්ෂාපතන කාලසීමාවන් වලදී මහවැලි ජලාශ 05 කින් ජල ඝනමීටර් මිලියන 19,302 ක් ජලාශවලින් පිටාර ගලා ගොස් තිබුණි. අවසානයට ජල විදුලිය නිෂ්පාදනය

කරන රත්ටැඹේ සහ බෝවතැන්න ජලාශවලින් පමණක් පිටාර ගොස් ඇති ජල ප්‍රමාණය කියුබික් මීටර් මිලියන 8495 ක් වූ අතර ගණනය කිරීම්වලට අනුව එහි වටිනාකම රු.මිලියන 57,125 ක් වී තිබුණි.

(ආ) විදුලි රැහැන් පද්ධති ඉදිකිරීම විදුලිබල මණ්ඩලය විසින් කළයුතු කාර්යයක් වුවද, මාදුරු ඔය 1 හා 2 විදුලි බලාගාරවල ධාරිතාවය වැඩිකිරීම සඳහා නව විදුලි රැහැන් පද්ධතියක් ආයෝජකයෙකු විසින් රු.150,000,000 ක පිරිවැයක් දරා ඉදිකර තිබුණි. මෙම වියදම ආයෝජකයා හා අධිකාරිය අතර රාජ්‍ය භාගය බෙදාගන්නා 65.8 : 34.2 අනුපාතයට බෙදාගත යුතු බව ඒ සඳහා පත්කළ කමිටුවකින් නිර්දේශකර තිබුණි. එසේම අධිකාරියට ආයෝජකයාගෙන් ලැබෙන රාජ්‍ය භාගය හා අධිකාරිය විසින් ආයෝජකයාට ගෙවියයුතු මුදලට හිලව්කරගැනීම සඳහා මහවැලි අධිකාරිය, විදුලිබල මණ්ඩය සහ ආයෝජකයා අතර ත්‍රෛපාර්ශවික ගිවිසුමකට එළඹියයුතු බව අධ්‍යක්ෂ මණ්ඩලය තීරණය කර තිබුණි. අදාල පාර්ශවයන් ත්‍රෛපාර්ශවික ගිවිසුමකට එළඹ නොතිබුණු අතර උක්ත කමිටු නිර්දේශය අනුව ආයෝජකයා දරනලද වියදමින් රු.51,300,000 ක් අධිකාරිය විසින් දැරියයුතු වුවද ඊට පටහැනිව රු.75,000,000 ක් අධිකාරියට ලැබෙන රාජ්‍ය භාගයෙන් අඩුකර ගෙන තිබුණි.

(ඇ) 1992 ජූලි 08 හා ඔක්තෝබර් 14 දින පැවති අමාත්‍ය මණ්ඩල රැස්වීම් තීරණවලට අනුව විත්‍රපට ස්ථාන සංකීරණයක් හා ක්‍රියාකාරී භූමියක් ඉදිකිරීම සඳහා තක්සේරු වටිනාකමින් සියයට 6 ක් හෝ උපරිමය සියයට 10 කට නොවැඩි දිගුකාලීන බදු ප්‍රතිශතයකට යටත්ව වසර 50 ක කාලයකට අධිකාරියේ දිගන පිහිටි හෙක්ටයාර් 4.23089 ක ඉඩම සහ ගොඩනැගිලි සංකීර්ණය විදේශ සමාගමක් වෙත ලබාදීමට අනුමැතිය ලබාදී තිබුණි. 1993 මැයි 21 දින සමාගම සමඟ එළඹි අවබෝධතා ගිවිසුම අනුව ගොඩනැගිලි සංකීර්ණය සහ භූමිය රු.මිලියන 20 කට තක්සේරුකර තිබුණි. අමාත්‍ය මණ්ඩල තීරණයට අනුව තක්සේරු වටිනාකමින් සියයට 6 ක බදු ප්‍රතිශතයක් යටතේ 1993 වර්ෂයේ සිට සමාලෝචිත වර්ෂය අවසානයට අයවියයුතු කුලිය රු.28,800,000 ක් සහ කලාපය විසින් මේ සඳහා ලබාදී තිබුණු නවත් නිවාස 11 වෙනුවෙන් අයවියයුතු බදුකුලිය රු.4,542.500 ක් සමාලෝචිත වර්ෂය අවසානවන විටද අයකර ගෙන නොතිබුණි. කෙසේ වුවද වර්තමානයේදී මෙම වත්කම් වල සන්තකය ආපසු ලබාගැනීම

සඳහා අධිකාරිය විසින් අධිකරණ ක්‍රියාමාර්ග ගෙන තිබුණද ඊට අදාල තීන්දුව සමාලෝචිත වර්ෂය අවසානය දක්වාම ලැබී නොතිබුණි.

(ඇ) එච් කලාපයට අයත් එප්පාවල පොස්පේට් නිදිය සහිත හෙක්ටයාර් 17.942 ක ඉඩම සඳහා රජය හා රාජ්‍ය පතල් කැනීම් හා ඛනිජ සංවර්ධන සංස්ථාව විසින් 1992 අප්‍රේල් 09 දින අත්සන් කරන ලද ගිවිසුම අනුව බදු මුදල් පළාත් ඉඩම් කොමසාරිස් වෙත ගෙවීම නිසා මෙම ඉඩමෙන් 1992 සිට 2015 වර්ෂය දක්වා කිසිදු බදු මුදලක් අධිකාරියට අයවී නොතිබුණි. පසුව අධිකාරිය 2016 /2017 වර්ෂවලදී ලංකා පොස්පේට් සමාගම සමඟ ඇතිකරගත් ගිවිසුම අනුව පොස්ෆේට් කියුබ් එකක් සඳහා රු.300 ක සේවා ගාස්තුවක් ගෙවීමට එකඟ වී තිබුණද, අධිකාරියේ අධීක්ෂණය යටතේ කැණීම් සිදුනොවීම නිසා සත්‍ය වශයෙන් කණිනලද පොස්පේට් ප්‍රමාණය දැනගැනීමට නොහැකි වී තිබුණි. සමාගමේ වාර්තා අනුව කියුබ් 6,011 ක් සඳහා රු.1,803,300 ක් පමණක් අයකර ගෙන තිබුණු අතර කැනීම්වලින් පසු භූමිය පුනරුත්තාපනය නොකිරීම නිසා භූමියෙහි තැනින් තැන විශාල පාෂාණ ඉතිරි වී තිබුණි.

මහවැලි බල ප්‍රදේශයේ තවත් හෙක්ටයාර් 9 ක ඇපටයිට් කැනීම් සිදුකර තිබුණද කැනීම් බලපත්‍ර පරීක්ෂාවේදී ඉඩමේ අයිතිය ප්‍රාදේශීය ලේකම්ට අයත්ව තිබුණු බව අනාවරණය වූවද මෙම තත්ත්වය නිරවුල්කර ගැනීමට කටයුතුකර නොතිබුණි.

(ඉ) මාර්ග සංවර්ධන අධිකාරියේ දක්ෂිණ අධිවේගී මාර්ග සංවර්ධන ව්‍යාපෘතිය සඳහා පස් කියුබ් 500,000 ක් පමණ සැපයීම සඳහා වලව බල ප්‍රදේශයේ මයුරපුර කොට්ඨාශයේ මහවැලි අධිකාරිය සතු ඉඩම් අක්කර 671 ක් මැනුම් සිදුකර පස් කැපීම සඳහා පුද්ගලයින් 29 දෙනෙකු වෙත අවසර පත් නිකුත් කිරීමට සැලසුම් කර දෙදෙනෙකුට කැණීම් බලපත්‍ර ලබාදී තිබුණි. ඒ සම්බන්ධයෙන් පහත කරුණු නිරීක්ෂණය විය.

(i) මහවැලි අධිකාරියේ අභ්‍යන්තර චක්‍රලේඛ ප්‍රකාරව බලප්‍රදේශයේ ඛනිජ ද්‍රව්‍ය ඉවත් කිරීම සඳහා කලාපීය භෞතික සැලසුම් කමිටුවේ අනුමැතිය හා ඉඩම් ලබාදීම සඳහා ප්‍රධාන කාර්යාලයේ අනුමැතිය ලබාගෙන නොතිබුණු අතර මූලික පාරිසරික පරීක්ෂණ වාර්තාවක් හෝ පාරිසරික බලපෑම් තක්සේරු කිරීමේ වාර්තාවක් ලබාගෙන නොතිබුණි.

(ii) බදු පදනම මත පස් කැපීම සඳහා බදුකරුවන්ට ලබාදී තිබූ අක්කර 08 ක ඉඩම් ප්‍රමාණය 2016 මාර්තු 23 දිනැති බදුකරුගේ ඉල්ලීම අනුව නිසි අනුමැතියකින් තොරව අක්කර 50 දක්වා වැඩිකිරීමට නේවාසික ව්‍යාපාර කළමනාකරු විසින්

අනුමැතිය ලබාදී තිබුණි. එසේම පාරිසරික නිර්දේශ ලබාගැනීමෙන් තොරව අවස්ථා දෙකකදී නේවාසික ව්‍යාපාර කළමනාකරු විසින් කැණීම් බලපත්‍රය දීර්ඝකිරීමද නිර්දේශකර තිබුණි.

(iii) ඉඩම් පරිහරණ සැලසුම් අධ්‍යයනයකින් හා විධිමත් පාරිසරික ඇගැයීමකින් තොරව කලාපභාර නිලධාරීන්ගේ අනුමැතිය පරිදි අනුමත සීමාව ඉක්මවා පස් කැපීම නිසා වනජීවීන්ගේ වාසභූමි අහිමිවීම , වාණිජමය වටිනාකමක් සහිත හා රහිත ශාක විනාශවීම සහ භූගත ජල මට්ටමට බලපෑමක් ඇතිවීම වැනි විවිධ පාරිසරික ගැටළු මතුවී තිබුණි. මැනුම්කරන ලද ඉඩම්වලින් අක්කර 115 ක් වන අලි කළමනාකරණ ප්‍රදේශයට අයත්ව තිබීම හේතුවෙන් ඒ සඳහා මධ්‍යම පරිසර අධිකාරිය හා වනජීවී දෙපාර්තමේන්තුවේ නිර්දේශ ලබාදී නොතිබුණි.

(iv) භූවිද්‍යා හා පතල් කාර්යාංශයේ නියමය පරිදි කැණීම් ධාරිතාව කියුබ් 1000 ක් හා කැණීම් ගැඹුර අඩි 08 කට නොවැඩි වියයුතු වුවද, අනුමැතියකින් තොරව නේවාසික ව්‍යාපාර කළමනාකරු විසින් කැණීම් ගැඹුර මීටර 15 ක් (අඩි 49) ලෙසත් කැණීම් ධාරිතාව කියුබ් 3,000 දක්වාත් වැඩිකර තිබුණි. පස් ඉවත් කිරීමෙන් පසු භූමියෙහි ජලය එකතුවන ලෙස "පතන" නිර්මාණය කිරීමට යෝජිත නමුත් එහි වපසරිය, ගැඹුර, පිහිටීම පිළිබඳ සැලැස්මක් ඉදිරිපත්කර නොතිබුණි.

(v) නිසි සැලැසුමකට අනුව ඉඩම් ලබා නොදීම නිසා අනුමත සීමාව ඉක්මවා පස් කපා තිබුණු අතර මිනුම් වාර්තාවන්ට අනුව පස් කැපීම සඳහා ලබා දී තිබුණු ස්ථාන දෙකෙන් කපා ඉවත් කර ඇති පස් ප්‍රමාණය කියුබ් 137,719 ක් වූ නමුත් පස් කියුබ් 5,000 ක් සඳහා පමණක් රු. 2,800,000 ක ඉඩම් පරිහරණ ගාස්තු අධිකාරිය වෙත ලැබී තිබුණි. වැඩියෙන් ඉවත්කර ගන්නා ලද පස් කියුබ් 132,719 ක් සඳහා ලැබියයුතු රු..85,522,640 ක් අයකරගෙන නොතිබුණි. එසේම මෙම ව්‍යාපෘතියට අවශ්‍ය පස් විධිමත් පරිදි ඉවත් කිරීමට සැලැසුම් නොකිරීම හේතුවෙන් මාර්ග සංවර්ධන ව්‍යාපෘතිය නිමකිරීමට ඵලදායී දායකත්වයක් සැපයීමටත්, පරිසර හානිය අවම වන පරිදි පස් ඉවත් කිරීමටත්, පස් වෙනුවෙන් අධිකාරියට රු.මිලියන 280 ක පමණ ආදායමක් උපයා ගැනීමටත් තිබූ අවස්ථාව අහිමිවී තිබුණි.

(ඊ) වික්ටෝරියා - කොත්මලේ කලාපය විසින් දිගන, ඩොලමයිට් නිධිය 2005 වර්ෂයේදී මහවැලි වෙන්චර් කැපිටල් (පුද්) සමාගම වෙත බදු දී තිබුණි. 2014 වර්ෂයේදී ඩොලමයිට් නිධිය නැවත කලාපයට පවරාදීම සඳහා පත්කළ කමිටුවේ නිර්දේශ පරිදි ඩොලමයිට් ව්‍යාපෘතියේ ලියවිලි, වෙඩිබෙහෙත් ගබඩාව, අදාල බලපත්‍ර විධිමත්ව භාරගැනීමට හා සමාගම යටතේ සේවය කළ සේවකයින්ට හිමිවිය යුතු සියළු ණය මුදලක් සමාගමට කිසිදු මුදලක් අයවීමට නොමැති බව තහවුරු කරගෙන එම පුද්ගලයින් සමඟ ගිවිසුම් ගත වන ලෙස අධ්‍යක්ෂ ජනරාල් විසින් 2014 සැප්තැම්බර් 17 දින කලාපයේ නේවාසික ව්‍යාපාර කළමනාකරු වෙත දන්වා තිබුණද 2017 දෙසැම්බර් 31 දින වන විටද ඒ අනුව කටයුතුකර නොතිබුණි.

## 4.5 නිෂ්ක්‍රීය හා ඌන උපයෝජිත වත්කම්

-----------------------------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) දෛනික වියදම් සඳහා ප්‍රමාණවත් මුදලක් අතරදවාගෙන ඉතිරි මුදල් ආයෝජනය කිරීම සඳහා අවධානය යොමුකිරීමකින් තොරව සමාලෝචිත වර්ෂය අවසානයට ප්‍රධාන කාර්යාලය හා කලාප 11 ක එකතුව රු.254,043,270 ක් අතැති මුදල් ලෙස රඳවාගෙන තිබුණි.

(ආ) කලාප 06 ක හා අධිකාරියේ එක් අංශයක රු. 131,696,730 ක් වටිනා නිෂ්කාර්යව පවතින ගොඩනැගිලි 442 ක් අතරින් භාවිතයට ගත නොහැකි ගොඩනැගිලි 262 ක් පාවිච්චියට සුදුසු ගොඩනැගිලි 34 ක් හා අලුත්වැඩියා කර නැවත භාවිතා කළ හැකි ගොඩනැගිලි 146 ක් පවතින බැවින් එම ගොඩනැගිලි තවදුරටත් විනාශවීමට පෙර අලුත්වැඩියා කිරීමට කඩිනම් ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.

(ඇ) නිරාවිය ගොවිපලේ ලොරි 02 ක්, ට්‍රැක්ටර් 03 ක් , නිවාස 04 ක්, ගොඩනැගිලි 02 ක්, කුකුළු කොටු 12 ක්, ඌරු කොටු 05 ක්, එළගාලක් සහ කුකුළු මස් නිපදවන ස්ථානයක් නිශ්කාර්යව පැවතුණු බැවින් එම වත්කම් අපහරණය කිරීමට හෝ ප්‍රයෝජනයට ගැනීමට විධිමත් වැඩපිළිවෙලක් ක්‍රියාත්මක කර නොතිබුණි.

(ඈ) පොල්ගොල්ලේ පිහිටා තිබූ භූගෝලීය තොරතුරු පද්ධති ( GIS ) අංශය 2007 වර්ෂයේදී කොත්මලේ පරිසර හා වන සංරක්ෂණ අංශයට මාරුකර තිබීම නිසා අංශය සතුව පැවතුණු පරිගණකයක් , ලැප්ටොප් එකක්, ජීපීඑස් උපකරණ 03ක්, මේස 06ක්, පුටු 07ක්, ප්‍රින්ටර් 03ක්, ලිපිගොනු කබඩ් 06 ක්, ඩිජිටල් කැමරාවක්, ඩිජිටල් සේප්පුවක්, ස්කෑනර්යක් නිෂ්කාර්යව පැවතුණි.

(ඉ) අධිකාරිය සතුව වැලිඔය කලාපයේ රු.9,953,619 ක් වටිනා කාමර 10 ක සංචාරක බංගලාවක් හා තවත් ගොඩනැගිල්ලක්ද "බී" කලාපයේ දකුණු ඉවුර සංවර්ධන ව්‍යාපෘතියට අයත් රු.5,492,833 ක් වටිනා ප්‍රාථමික පාසැල් ගොඩනැගිල්ල හා වැසිකිළි පද්ධතිය 2015 වර්ෂයේ සිට ප්‍රයෝජනයට ගැනීමෙන් තොරව නිෂ්කාර්යව පැවතුණි.

(ඊ) මහවැලි එච් කලාපයේ රු.1,484,500 ක් වටිනා ගොයම්පැල සිටුවන හා වල්පැල ගලවන යන්ත්‍ර 10 ක් 2016 වර්ෂයේ සිට නිෂ්කාර්යව පවතින අතර වැලිඔය කලාපයේ ගවයින් 20 ක් ගාල්කිරීමට ඉදිකළ ගවගාලක් තුල ගවයින් 6 ක් පමණක් ගාල් කර ඇති බව භෞතික පරීක්ෂාවේදී තහවුරු විය.

(උ) වැලිඔය ප්‍රදේශයේ නැවත පදිංචි කළ ජනතාවට බෙදාදීම සඳහා 2013 වර්ෂයේදී මිලදීගත් එකතුව රු.6,513,390 ක් ක් වටිනා උපකරණ හා ද්‍රව්‍ය අයිතම 6,409 ක් හා 1992, 2015 හා 2016 වර්ෂවල මිලදී ගෙන තිබුණු රු. 2,425,065 ක් වටිනා ලී බඩු හා උපකරණ එල් කලාපයේ ගබඩාවක් තුල හා සංචාරක බංගලාවක් තුල නිශ්කාර්යව පැවතුණි.

(ඌ) මහවැලි අධිකාරියේ "සී" කලාපය විසින් මහවැලි පශු සම්පත් සහ කෘෂි ව්‍යාපාර (පුද්) සමාගමට අයිති ගිරාදුරුකෝට්ටෙ ගොවිපල සත්ව පාලන පුහුණු මධ්‍යස්ථානයක් බවට පරිවර්තනය කිරීමේ අරමුණින් 2014/2015 වර්ෂවලදී රු.12,501,900 ක් වැයකර ඉදිකරනලද ගවගාල්, එළුගාල් ඇතුළු ඉදිකිරීම් හා භාණ්ඩ රු.8,967,600 කට අගයකර 2016 පෙබරවාරි 08 දින පශුසම්පත් හා කෘෂි ව්‍යාපාර සමාගමට පවරා දී තිබුණි. මෙම ඉදිකිරීම් හා භාණ්ඩ ප්‍රයෝජනයට ගැනීම සඳහා නිශ්චිත සැලසුමක් හෝ ක්‍රමවේදයක් සමාගම සතු නොවු බැවින් පවරා දුන් දිනයේ සිට එම වත්කම නිෂ්කාර්යව දිරාපත් වෙමින් තිබුණි.

(එ) මහවැලි පශු සම්පත් හා කෘෂි ව්‍යාපාර සමාගම සතු ගිරාදුරුකෝට්ටේ අක්කර 1,054 ක පමණ වූ ගොවිපල භූමියෙහි කිසිදු බෝගයක් වගා කර නොතිබූ අතර, සත්ත්ව පාලන කටයුතුද සුළු වශයෙන් සිදුකිරීම හේතුවෙන් භූමිය ඌන උපයෝජිතව පැවතුණි. තවද එහි පැවති කිරි ආශ්‍රිත නිෂ්පාදන කර්මාන්තශාලාවෙහි රු.2,720,000 ක් වටිනා ස්ථාවර වත්කම් 2013 වර්ෂයේ සිට නිෂ්කාර්යව පැවතුණු අතර පිරිවැය රු.2,056,000 ක් වූ අබලන් වාහන 06 ක් හා යන්ත්‍රයක් ගිරාදුරුකෝට්ටේ ගොවිපල කාර්යාල භූමියෙහි නිෂ්කාර්යව තබා තිබුණි.

## 4.6 හඳුනාගන්නා ලද පාඩු

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) මහවැලි උපදේශක සේවා කාර්යාංශ ( පුද්ගලික ) සමාගම විසින් 2000 වර්ෂයේ සිට 2012 වර්ෂය දක්වා වූ කාලසීමාවට අදාලව එකතු කළ අගය මත බදු , ජාතිය ගොඩනැගීමේ බදු සහ උපයන විට ගෙවීම් බදු දේශීය ආදායම් දෙපාර්තමේන්තුව වෙත නිසි පරිදි ප්‍රේෂණය නොකිරීම නිසා සමාලෝචිත වර්ෂයේදී සමාගමට රු. 1,810,836 ක දඩ මුදලක් ගෙවීමට සිදුවී තිබුණි. තවද නියමිත කාලසීමාව තුළ ලාභාංශ ප්‍රකාශ නොකිරීම හේතුවෙන් 2015 වර්ෂයේ ලාභයට අදාලව සමාලෝචිත වර්ෂයේදී රු.55,807 ක ලාභාංශ මත බද්දක් ( Deemed dividend tax ) ගෙවීමට සිදු වී තිබුණි.

(ආ) මහවැලි "එල් " කලාපය විසින් ජනපදිකයින් සඳහා ඉදිකර තිබුණු නළ ළිංවලින් ජලය පොම්පකිරීමට අවශ්‍ය විදුලිය ලබාගැනීමට විදුලි බල මණ්ඩලය වෙත 2016 දෙසැම්බර් 30 දින ලියන ලද රු.25,202,879 ක් වටිනා චෙක්පත් දෙකක් නිකුත් නොකර ළඟ තබාගෙන 2017 මාර්තු 24 දින නිකුත් කර තිබුණි. 2017 වර්ෂයේදී ඇස්තමේන්තු මිලගණන් වැඩි වී තිබුණු බැවින් මණ්ඩලය වෙත ගෙවියයුතු එම ගෙවීම් ප්‍රමාදවීම හේතුවෙන් නව ඇස්තමේන්තු මිල ගණන් මත ගෙවීමට සිදුවීම නිසා රු. 2,121,320 ක අමතර මුදලක් ගෙවීමට සිදු වී තිබුණි.

## 4.7 ප්‍රසම්පාදන හා කොන්ත්‍රාත් ක්‍රියාවලිය

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) අමාත්‍ය මණ්ඩල අනුමැතිය මත රු.466,312,000 ක කොන්ත්‍රාත් වටිනාකමකට වැලිඔය ගජබාපුර ග්‍රාමයේ සිට නැදුන්කර්නි නගරය දක්වා මාර්ගය 2016 දෙසැම්බර් 08 දින සිට මාස 06 කින් ඉදිකර මහවැලි අධිකාරියට භාරදීමට එකඟ වෙමින් අධිකාරිය විසින් මාර්ග සංවර්ධන අධිකාරිය සමඟ කොන්ත්‍රාත් ගිවිසුමකට එළඹ තිබුණි. 2017 අප්‍රේල් වන විට කොන්ත්‍රාත් මුදලින් රු.390,085,714 ක් ගෙවා තිබුණු අතර 2017 ජුලි 11 දින සිදුකල භෞතික පරීක්ෂාවේදී කැලෑ ප්‍රදේශය එළිකර කුඩා පාලම්/බෝක්කු 23 ක් පමණක් ඉදිකර තිබුණු බව නිරීක්ෂණය විය. කෙසේ වුවද 2017 ජුනි 08 දින ඉදිකිරීම් අවසන්කළ යුතු මෙම කොන්ත්‍රාත් කාර්යය අවසන් කර නොතිබුණද ඒ සම්බන්ධයෙන් ගිවිසුම් ප්‍රකාරව අවශ්‍ය ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.

(ආ) වැලිඔය කලාපයේ වගා ළිං ඉදිකිරීම සඳහා ජල භූ විද්‍යා සමීක්ෂණයක් ( ශක්‍යතා අධ්‍යයනයක් ) සිදුකිරීම සඳහා රජරට විශ්වවිද්‍යාලයේ කෘෂිකර්ම පීඨයට රු.2,530,000 ක් 2014 වර්ෂයේදී ගෙවීම්කර තිබුණි. එමගින් ස්ථාන 48 ක වගා ළිං/කෘෂි ළිං ඉදිකිරීමට නිර්දේශ කර සෙසු ස්ථාන 32 සඳහා නිසි අධ්‍යයනයකින් අනතුරුව නල ළිං ඉදිකිරීම යෝග්‍ය බවට නිර්දේශ කර තිබුණි. කෙසේ වුවද 2014 හා 2015 වර්ෂවලදී රු.4,203,200 ක් වැය කර තිබුණු ළිං 17 ක ඉදිකිරීම් අතර මග නතර කර තිබුණි.

(ඇ) වැලිඔය කලාපයේ 2014 වර්ෂයේදී නළ ළිං ( Bore hole ) 25 ක් හා 2015 හා 2016 වර්ෂවල නළ ළිං 40 ක් ඉදිකිරීම, ජලධාරිතා සහ ජල සාම්පල් පරීක්ෂණ සිදුකිරීම, ඒ සඳහා අවශ්‍ය ජල ටැංකි රඳවන 25 ක් ඉදිකිරීම (වතුර පොම්ප සහිතව) සඳහා සමාලෝචිත වර්ෂය අවසන් වන විට එකතුව රු. 46,412,996 ක් වැය කර තිබුණද 2017 අගෝස්තු 21 දින වන විටත් එම ළිංවල ජලය භාවිතා කිරීමට හැකි ආකාරයට වැඩ අවසන් කර නොතිබුණි. තවද මෙම ව්‍යාපෘතියේ ප්‍රතිලාභ ලබාගැනීම සඳහා අවශ්‍ය විදුලිය ලබාගැනීමට හා ජල ටැංකි රඳවන සඳහා තවදුරටත් රු.73,205,264 ක් දැරීමට සිදුවන බව නිරීක්ෂණය විය.

(ඇ) ප්‍රසම්පාදන ක්‍රියාවලියෙන් බැහැරව සමාලෝචිත වර්ෂයේදී මහවැලි පශු සම්පත් සහ කෘෂි ව්‍යාපාර (පුද්) සමාගම් රු.8,407,159 ක් වටිනා කුකුළු කෑම හා රු.2,278,000 ක් වටිනා කුකුළු පැටවුන් 19,000 ක් මිලදී ගෙන තිබුණි. පැටවුන් විවිධ ආයතනවලින් මිලදී ගැනීම හේතුවෙන් පැටවෙකුගේ මිල රු.70 සිට රු.155 ක් දක්වා පරාසයක මිල විචලනයන් නිරීක්ෂණය විය.

## 4.8 වාහන උපයෝජනය

-------------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) අධිකාරිය සතුව වාහන 881 ක් පැවති අතර ඉන් වාහන 790 ක් වර්ෂ 20 කට වඩා පැරණි වාහන වීම හේතුවෙන් වාහන අලුත්වැඩියා හා නඩත්තු වියදම පිළිවෙලින් ඉකුත් වර්ෂයේ රු. 67,800,000 ක් හා සමාලෝචිත වර්ෂයේ රු.102,600,000 ක් විය. අලුත්වැඩියා හා නඩත්තු වියදම් වැඩි පැරණි වාහන ඉවත්කිරීමට හෝ ඒ සම්බන්ධයෙන් වෙනත් සුදුසු ක්‍රියාමාර්ගයක් නොගැනීම නිසා ඉකුත් වර්ෂයට වඩා සමාලෝචිත වර්ෂයේදී රු.34,800,000 කින් හෙවත් සියයට 51.3 කින් අලුත්වැඩියා හා නඩත්තු වියදම වැඩිවී තිබුණි.

(ආ) මූලික වැඩපාලන ක්‍රියාකරවුම් හා නඩත්තු අංශයේ 2008 වර්ෂයේ සිට අක්‍රියව පැවතුණු වාහන 12 ක් 2010 සහ 2014 වර්ෂවලදී අපහරණය කිරීමට හා ටෙන්ඩර් මඟින් විකිණීමට කටයුතුකරන ලෙස එම අංශයේ අධ්‍යක්ෂ විසින් දන්වා තිබුණද සමාලෝචිත වර්ෂය අවසාන වන විටත් ඒ අනුව කටයුතු කර නොතිබුණි.

(ඇ) අධිකාරිය විසින් බාහිර පාර්ශවයන්ට අයිති වාහන 22 ක් ප්‍රයෝජනයට ගනිමින් පැවතියද එම වාහනවල අයිතිය නිරවුල් කර අධිකාරියට පවරා ගැනීමට කටයුතුකර නොතිබුණි.

## 4.9 ප්‍රමාද වූ ව්‍යාපෘති

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) මහවැලි අධිකාරියේ වැලිඔය ප්‍රදේශයේ ක්‍රියාත්මක කිරීමට යෝජිත කිවුල්ඔය ජලාශ ව්‍යාපෘතිය සඳහා 2012 වර්ෂයේ සිට 2016 වර්ෂය දක්වා රු.මිලියන1,775 ක් ප්‍රතිපාදන වෙන්කර තිබුණද ව්‍යාපෘතිය ආරම්භ කිරීම සඳහා පාරිසරික අනුමැතිය ලබා ගැනීමට නොහැකි වූ බැවින් එය ක්‍රියාත්මක කිරීමට නොහැකි වී තිබුණි. එම ජලාශ ව්‍යාපෘතිය සඳහා වෙන්කල ප්‍රතිපාදනවලින් රු.මිලියන 182 ක් අධිකාරියේ වැලිඔය කලාපය විසින් ක්‍රියාත්මක කරන වැලිඔය ඒකාබද්ධ ව්‍යාපෘතියේ කාර්යයන් වූ පිවිසුම් මාර්ග, ගම්මාන සංවර්ධනය, යටිතල පහසුකම් සංවර්ධනය කිරීම සඳහා වැයකර තිබුණි.

(ආ) ජනපදිකයින්ට පිරිසිදු ජලය සැපයීමට අවශ්‍ය ජල පිරිපහදු යන්ත්‍ර සවිකර වසර 10 ක් නඩත්තු කිරීම සඳහා රු.මිලියන 30 ක මුදලකට 2015 සැප්තැම්බර් 11 දින ජාතික ප්‍රජා ජල සැපයුම් දෙපාර්තමේන්තුව සමඟ අධිකාරිය ගිවිසුමකට එළඹ තිබුණි. ගිවිසුම් ප්‍රකාරව 2015 නොවැම්බර් 30 දිනට පෙර තෝරාගත් ස්ථාන 12 ක ජල පිරිපහදු යන්ත්‍ර සවිකර අවසන් කළ යුතු වුවද 2017 වර්ෂය අවසන් වන විටත් ස්ථාන තුනක වැඩ කටයුතු අවසන් කර නොතිබුණි.

## 4.10 වෙනත් රාජ්‍ය ආයතන වෙත ලබාදුන් අධිකාරියේ සම්පත්

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) මහවැලි ආරක්ෂක බලකායේ ආරක්ෂක නිලධාරීන් 40 දෙනෙකු 2012 වර්ෂයේ දී රාජ්‍ය ආයතනවලට මුදාහැර තිබුණු අතර එම නිලධාරීන් සඳහා සමාලෝචිත වර්ෂයේදී අධිකාරිය විසින් රු.29,976,062 ක වැටුප් හා 2015 හා 2016 වර්ෂවල රු.18,720,252 ක අතිකාල හා ගමන් වියදම් ද ගෙවා තිබුණද 2017 සැප්තැම්බර් 30 දින දක්වාම අදාල ආයතන වෙතින් එම මුදල් ප්‍රතිපූර්ණය කරගැනීමට කටයුතුකර නොතිබුණි.

(ආ) අධිකාරියේ හුරුළුවැව කලාපයේ කළමනාකරණ සහකාරවරයකු සහ රියදුරකු වෙළඳ අමාත්‍යාංශය වෙත අනුයුක්ත කර අධිකාරිය විසින් සමාලෝචිත වර්ෂයේදී රු. 697,324 ක වැටුප් ගෙවා තිබුණද එම මුදල් ප්‍රතිපූරණය කර ගෙන නොතිබුණි.

## 4.11 කාර්ය මණ්ඩලය පරිපාලනය

-----------------------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) 2016 දෙසැම්බර් 31 දිනට අධිකාරියේ ජ්‍යෙෂ්ඨ කළමනාකරණ මට්ටමේ පුරප්පාඩු 12 ක්, මධ්‍යම කළමනාකරණ මට්ටමේ පුරප්පාඩු 169 ක් හා 118 ක අතිරික්ත කාර්යමණ්ඩලයක් විය. අනුමත නොවූ තනතුරු සඳහා තාවකාලිකව බඳවාගෙන තිබුණු 41 දෙනෙකු අතිරික්ත කාර්යමණ්ඩලයට ඇතුළත් වී තිබුණි.

(ආ) නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල් (පාලන හා මුදල්), අධ්‍යක්ෂ (ඉඩම්), අධ්‍යක්ෂ (සැලසුම් හා නියාමන) , අධ්‍යක්ෂ (මහවැලි කේන්ද්‍රය) හා "සී", "බී" හා හුරුළුවැව කලාපවල නියෝජ්‍ය නේවාසික ව්‍යාපාර කළමනාකාර යන තනතුරු සඳහා බඳවාගැනීමේ පරිපාටිය ප්‍රකාරව සුදුසු නිලධාරීන් ස්ථිර පදනමින් බඳවා ගැනීමට කටයුතු නොකර පුරප්පාඩු වූ තනතුරුවල රාජකාරි ආවරණය කිරීම සඳහා කොන්ත්‍රාත් පදනමින් හා ද්විතීක පදනමින් නිලධාරීන් බඳවා ගෙන තිබුණි.

(ඇ) සමාලෝචිත වර්ෂය අවසානයට අධිකාරියේ නියෝජ්‍ය අධ්‍යක්ෂකවරයෙකු, සමාජ විද්‍යාඥයෙකු, භූ විද්‍යාඥයෙකු, ඉංජිනේරුවරුන් 40 දෙනෙකු , ඉංජිනේරු සහකාරවරු 13 දෙනෙකු, කාර්මික නිලධාරීන් 12 දෙනෙකු හා කළමනාකරණ සහකාර 51 දෙනෙකු ඇතුළු නිලධාරීන් 369 ක කාර්යමණ්ඩලයක් වාරිමාර්ග හා ජල සම්පත් කළමනාකරණ අමාත්‍යාංශයට සහ මහවැලි සංවර්ධන හා පරිසර අමාත්‍යාංශවලට අයත් ව්‍යාපෘතිවලට අනුයුක්තකර තිබුණි. එසේ නිලධාරීන් නිදහස් කිරීම නිසා අධිකාරියේ අනුමත කාර්යමණ්ඩලයේ තනතුරුවල සේවය කිරීමට එකී නිලධාරීන්ට නොහැකි වන අතර එම නිදහස්කරන කාර්යමණ්ඩලයේ තනතුරුවල පුරප්පාඩුද නොමැතිවීම හේතුවෙන් බැවින්, එම තනතුරුවලට නවක නිලධාරීන් බඳවා ගැනීමටද නොහැකිවී තිබුණි.

(ඈ) ස්වාභාවික සම්පත් කළමනාකරණ සේවා (පුද්) සමාගම හා මහවැලි උපදේශක සේවා කාර්යාංශ (පුද්) සමාගම සඳහා නිශ්චිත කාර්යමණ්ඩලයක් හා ඊට අදාලව බඳවාගැනීමේ කාර්ය පරිපාටියක් කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවෙන් හෝ අධ්‍යක්ෂ මණ්ඩලය මඟින් හෝ අනුමත කරගෙන නොතිබුණි.

(ඉ) වෙනත් අමාත්‍යාංශයක ස්ථිර පත්වීමක් දරන අයෙක් මහවැලි උපදේශක සේවා කාර්යාංශ (පුද්ගලික) සමාගමේ ලේකම් ලෙස කොන්ත්‍රාත් පදනමින් බඳවාගෙන තිබුණු අතර විධිමත් සම්මුඛ පරීක්ෂණයක් නොපවත්වා ගණකාධිකාරී තනතුර සඳහා ස්වාභාවික සම්පත් කළමනාකරණ සේවා (පුද්) සමාගම විසින් කොන්ත්‍රාත් පදනමින් නිලධාරිනියක් බඳවාගෙන තිබුණි.

(ඊ) 2010 ඔක්තෝබර් සිට රේඛීය අමාත්‍යාංශය යටතට ගෙන තිබුණු මහවැලි පශු සම්පත් සහ කෘෂි ව්‍යාපාර (පුද්) සමාගම සතු නිරාවිය ගොවිපලට අනුයුක්ත සමාගමේ සේවකයින් 06 දෙනෙකුගේ වැටුප්, සේවක අර්ථසාධක හා සේවක භාරකාර අරමුදල්වල දායක මුදල් අමාත්‍යාංශය විසින් හා වර්තමානයේදී මහවැලි අධිකාරිය විසින් ගෙවමින් පැවතුණද මෙම සේවකයින් විධිමත් පරිදි මුදාහැරීමට සමාගම කටයුතුකර නොතිබුණි.

## 5. ගිණුම් කටයුතුභාවය හා යහපාලනය

### 5.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

2003 ජූනි 02 දිනැති අංක පීඊඩී/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 6.5.1 වගන්තිය ප්‍රකාරව මූල්‍ය වර්ෂය අවසන් වී දින 60 ක් ඇතුළත මූල්‍ය ප්‍රකාශන හා කෙටුම්පත් වාර්ෂික වාර්තාව විගණනය වෙත ඉදිරිපත් කළ යුතු වුවද මහවැලි උපදේශක සේවා කාර්යාංශ (පුද්) සමාගම හා ස්වාභාවික සම්පත් කළමනාකරණ සේවා ( පුද්) සමාගම විසින් 2017 ජූනි මාසයේදී හා අධිකාරිය විසින් 2017 දෙසැම්බර් මාසයේදී විගණනය සඳහා මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කර තිබුණද ඒ සමඟ කෙටුම්පත් වාර්ෂික වාර්තාව ඉදිරිපත් කර නොතිබුණි.

### 5.2 සංයුක්ත සැලැස්ම

2014 පෙබරවාරි 17 දිනැති අංක 1/2014 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය අනුව සංයුක්ත සැලැස්ම සකස් කළයුතු වුවද සමාලෝචිත වර්ෂයේ සංයුක්ත සැලැස්ම සකස්කර අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය ලබාගෙන නොතිබුණි. තවද මහවැලි පශු සම්පත් සහ කෘෂි ව්‍යාපාර (පුද්) සමාගම හා ස්වාභාවික සම්පත් කළමනාකරණ සේවා (පුද්) සමාගම විසින් තම අරමුණු ඉටුකරගැනීම සඳහා ඉදිරි සැලසුම් ඇතුළත්කර සංයුක්ත සැලැස්මක් සකස්කර නොතිබුණි.

## 5.3 ක්‍රියාකාරී සැලැස්ම

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) 2014 පෙබරවාරි 17 දිනැති අංක 1/2014 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය අනුව සකස්කළයුතු වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම සකස්කර නොතිබුණු අතර සමාලෝචිත වර්ෂයේ කාර්යසාධනයට අනුකූලව සකස් කරන ලද සංශෝධිත ක්‍රියාකාරී සැලැස්ම 2016 දෙසැම්බර් 29 දින අධ්‍යක්ෂ මණ්ඩල විසින් අනුමත කර තිබුණි. ක්‍රියාකාරී සැලැසුමට අනුව සකස් කරන ලද අධිකාරියේ කාර්යසාධන වාර්තාව 2018 ජනවාරි 10 වන දින වනවිටද විගණනයට ලබා දී නොතිබුණි.

(ආ) 2014 පෙබරවාරි 17 දිනැති අංක 01/2014 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය ප්‍රකාරව සමාලෝචිත වර්ෂයේ කාර්යයන් නිසි පරිදි මෙහෙයවීම සඳහා මහවැලි පශු සම්පත් සහ කෘෂි ව්‍යාපාර (පුද්) සමාගම හා ස්වාභාවික සම්පත් කළමනාකරණ සේවා (පුද්) සමාගම විසින් වාර්ෂික ක්‍රියාකාරී සැලැසුම් සකස්කර නොතිබුණි.

## 5.4 අභ්‍යන්තර විගණනය

2010 වර්ෂයේ සිට 2015 වර්ෂය දක්වා වසර 05 කට අධික කාලයක් පුරප්පාඩුව පැවතුණු අධිකාරියේ අභ්‍යන්තර විගණන (අධ්‍යක්ෂ) තනතුරෙහි 2015 වර්ෂයේ සිට ප්‍රධාන අභ්‍යන්තර විගණක විසින් රාජකාරී ඉටුකරමින් සිටින අතර බඳවාගැනීමේ පරිපාටියේ සඳහන් සුදුසුකම් සම්පූර්ණකරන ලද නිලධාරියෙකු එම තනතුර සඳහා බඳවාගැනීමට සමාලෝචිත වර්ෂය අවසාන වනවිටද අධිකාරිය අපොහොසත් වී තිබුණි.

## 5.5 අයවැය ලේඛනමය පාලනය

ස්වාභාවික සම්පත් කළමනාකරණ සේවා (පුද්) සමාගම විසින් සමාලෝචිත වර්ෂය සඳහා අයවැය ලේඛනයක් සකස්කර නොතිබුණු අතර අධිකාරියේ, මහවැලි උපදේශක සේවා කාර්යාංශ (පුද්) සමාගමේ හා මහවැලි පශු සම්පත් සහ කෘෂි ව්‍යාපාර (පුද්) සමාගමේ අයවැයගත හා සත්‍ය වියදම අතර විචලනය පිළිවෙලින් සියයට 10 සිට සියයට 582 දක්වාත් සියයට 11 සිට සියයට 121 දක්වාත් හා සියයට 14 සිට සියයට 100 දක්වාත් වී තිබුණි. ඒ අනුව අයවැය ලේඛනය ඵලදායී කළමනාකරණ පාලන කාරකයක් ලෙස යොදා ගෙන නොතිබුණු බව නිරීක්ෂණය විය.

## 5.6 නොවිසඳී ඇති විගණන ඡේද

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) ලංකා විදුලිබල මණ්ඩලයේ මුළු ජල විදුලිබල නිෂ්පාදනයෙන් සියයට 50 ක් පමණ මහවැලි ජලාශ ආශ්‍ර කොට ඉදිකර ඇති ජල විදුලිබලාගාර මඟින් නිපදවන අතර, පොල්ගොල්ල, වික්ටෝරියා සහ කොත්මලේ යන ජලාශවල වේලි මත වූ විදුලි පහන් සඳහාද අධිකාරිය විසින් ලංකා විදුලිබල මණ්ඩලයට විදුලි ගාස්තු ගෙවන බව නිරීක්ෂණය විය. ජලාශ නඩත්තුව හා විදුලිබල මණ්ඩලය ප්‍රයෝජනයට ගන්නා ජලය වෙනුවෙන් ගාස්තු ගෙවීමක්ද සිදුනොකරන බැවින්, මෙම ප්‍රධාන වේලිවල විදුලි අවශ්‍යතාවය නොමිලේ සපයා ගැනීමට අධිකාරිය විසින් අවධානය යොමු කර නොතිබුණි.

(ආ) පොල්ගොල්ල, කොත්මලේ, බෝවතැන්න, මාපාකඩ, මාදුරුඔය හා වික්ටෝරියා ජලාශ ආශ්‍රිත රක්ෂිත භූමි භාග තුළ අනවසර පදිංචිකරුවන් 655 දෙනෙක් සිටින බව හෙළිදරව් වූ අතර, මෙම අනවසර පදිංචිකරුවන් ඉවත් කිරීමට හා නැවත පදිංචිවන අනවසර පදිංචිකරුවන් පැමිණීම වැලැක්වීමට අධිකාරිය අපොහොසත්වී තිබුණි.

## 6. පද්ධති හා පාලනයන්

විගණනයේදී නිරීක්ෂණය වූ පද්ධති හා පාලන දුර්වලතාවයන් වරින් වර අධිකාරියේ අධ්‍යක්ෂ ජනරාල්වරයාගේ අවධානයට යොමු කරන ලදී. පහත සඳහන් පාලන ක්ෂේත්‍ර පිළිබඳව අධිකාරියේ විශේෂ අවධානය යොමු කළයුතු වේ.

| පද්ධති හා පාලන ක්ෂේත්‍ර | නිරීක්ෂණ |
|---|---|
| (අ) ස්ථාවර වත්කම් කළමනාකරණය | වත්කම්වල පැවැත්ම තහවුරුකර ගැනීම සඳහා වාර්ෂික වත්කම් සත්‍යාපනය සිදුකර තිබුණද අදාල වාර්තා ඉදිරිපත් කර නොතිබීම, නිෂ්ක්‍රීය හා ඌන උපයෝජිත වත්කම් සම්බන්ධයෙන් නිසි ක්‍රියාමාර්ග නොගැනීම. |

| | | |
|---|---|---|
| (ආ) | ඉඩම් හා ගොඩනැගිලි උපයෝජනය | බාහිර පාර්ශවයන් විසින් අධිකාරියට අයත් ගොඩනැගිලි, කුලී රහිතව ප්‍රයෝජනයට ගැනීම, කලාපවල ගොඩනැගිලි නිශ්කාර්යව පැවතීම හා ඛණිජ සම්පත් සහිත ඉඩම් නිසි පරිදි කළමනාකරණය කර ආදායම් උපයා ගැනීමට කටයුතු කර නොතිබීම. |
| (ඇ) | ආදායම් හා වියදම් කළමනාකරණය | බදු ආදායම හා හිඟ බදු ආදායම රැස්කිරීම සඳහා නිවැරදි ක්‍රමවේදයක් නොතිබීම හා බදු ආදායම් රැස්කිරීමට අදාල නියමයන් හා කොන්දේසි ක්‍රියාත්මක කර නොතිබීම, මුදල් රෙගුලාසි ප්‍රකාරව ලබාගත් අත්තිකාරම් පියවා නොතිබීම. |
| (ඇ) | කොන්ත්‍රාත් පරිපාලනය | දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන මණ්ඩලයකින් අනුමැතිය ලබාගතයුතුව තිබුණු කොන්ත්‍රාත් සඳහා ප්‍රාදේශීය ප්‍රසම්පාදන මණ්ඩලය මගින් අනුමැතිය ලබාගත හැකිවන පරිදි කිසිදු පදනමකින් තොරව අදාල කොන්ත්‍රාත් කාර්යයන් කොටස්කර ලංසු කැඳවා තිබීම. |
| (ඉ) | ව්‍යාපෘති කළමනාකරණය | ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමට පෙර පරිසර ඇගයීම් වාර්තා හා අනෙකුත් අදාල ආයතන වලින් ලබාගත යුතු අනුමැතීන් ලබා නොගැනීම. |
| (ඊ) | වාහන පාලනය | බාහිර පාර්ශවයන් වෙත නිදහස් කර තිබුණු වාහන ආපසු ලබා ගැනීමට කටයුතු නොකිරීම හා වාහන සම්බන්ධයෙන් වාර්ෂික සමීක්ෂණ සිදුකර නොතිබීම. |

එච්.එම්.ගාමිණී විජේසිංහ

විගණකාධිපති

# විගණකාධිපති වාර්තාව පිළිබඳව අධ්‍යක්ෂ ජනරාල්වරයා කරුණු ඉදිරිපත් කිරීම

## IV කොටස

**ශ්‍රී ලංකා මහවැලි අධිකාරියේ සහ එහි පරිපාලිත සමාගම්වල 2016 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව 1971 අංක 38 දරණ මුදල් පණතේ 14 ( 2) ( සී) වගන්තිය ප්‍රකාර විගණකාධිපති වාර්තාව**

උක්ත කරුණ සම්බන්ධයෙන් ඔබ විසින් මා වෙත යොමු කරන ලද අංක අයිආර්එන්/බී/එම්ඒඑස්එල්/01/16/49 හා 2018.06.29 දිනැති 1971 අංක 38 දරණ මුදල් පනතේ 14 (2) (සී) වගන්තිය ප්‍රකාර විගණකාධිපති වාර්තාව සම්බන්ධයෙන් මාගේ අදහස් පහත සඳහන් පරිදි වේ.

**2.2. මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම - සමූහය**

**2.2.1. මූල්‍ය ප්‍රකාශන ඒකාබද්ධ කිරීම**

පිළිගනිමි - 2017 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන මගින් නිවැරදි කර ඇත.

**2. 2. 2. කුඩා හා මධ්‍යම පරිමාණ ව්‍යාපාර සඳහා වූ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති**

(අ) පිළිගනිමි -2017 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන මගින් නිවැරදි කර ඇත.

(ආ) පිළිගනිමි -2017 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන මගින් නිවැරදි කර ඇත.

2016 වර්ෂයේදී සමාගමේ අධ්‍යක්ෂවරු කිසිදු ව්‍යාපාරික කටයුත්තක් සඳහා සමාගම සමඟ කොන්ත්‍රාත් අත්සන් කර නොමැත.

(ඇ) 2017 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන මඟින් නිවැරදි කර ඇත.

**2.2.3 ගිණුම්කරණ අඩුපාඩු**

(අ) 2017 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන මඟින් නිවැරදි කර ඇත.

(ආ) (i) 2017 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන මඟින් නිවැරදි කර ඇත.

කෙසේ නමුත් මේ වන විට 2010 වර්ෂයේ සැප්තැම්බර් මස සිට 2017 ඔක්තොම්බර් මාසය දක්වා වූ වැටුප් වෙනුවෙන් වූ මුදල් ප්‍රතිපූර්ණය කර ඇත.

(ii) 2017 වර්ෂය තුළ මෙම අවිනිශ්චිත ගිණුමේ ශේෂය රු.14,117,549.97 දක්වා අඩු වී ඇත. ඒ අනුව රු.21,564,936.00ක ප්‍රමාණයක් නිවැරදි කර ඇත. ඉතිරි ප්‍රමාදය 2017 වර්ෂයේදි ගිණුම් මගින් නිවැරදි කිරීමට අදාල සමාගම වෙත උපදෙස් ලබා දී ඇත.

(ඇ) (i) 2017 මූල්‍ය ප්‍රකාශන මඟින් නිවැරදි කර ඇත.

(ii) 2017 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන මගින් නිවැරදි කර ඇත.

**2.2.4 පැහැදිලි නොකළ වෙනස්කම්**

(අ) 2017 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන මඟින් නිවැරදි කිරීමට සටහන් කර ගත් බව අදාළ සමාගම වෙතින් දැනුම් දී ඇත.

ආ) 2017 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන මඟින් නිවැරදි කිරීමට සටහන් කර ගත් බව අදාළ සමාගම වෙතින් දැනුම් දී ඇත.

**2.2.5. විගණනය සඳහා සාක්ෂි නොමැති වීම**

**(අ) මහවැලි පශු සම්පත් සහ කෘෂි ව්‍යාපාර (පුද්ගලික) සමාගම.**

| | | |
|---|---|---|
| මහවැලි ආර්ථික ඒජන්සිය | රු.405,218,731.00 | මෙම ශේෂයන් 1999 වර්ෂයේ සිට පැවත එන ශේෂයන් බවත් මෙම ප්‍රාග්ධන යෙදවුම් සම්බන්ධයෙන් කිසිදු ලියවිල්ලක් සොයා ගැනීමට නොමැති බවත් සමාගම වෙතින් වාර්තා කර ඇත. |
| කොත්මලේ කිරි සංවර්ධන අරමුදල | රු. 2,900,000.00 | |
| යුරෝපා ආර්ථික කොමිසමේ ප්‍රාග්ධන ප්‍රදාන විදේශ ආධාර | රු. 5,729,782.00 | |
| ස්ථාවර වත්කම් කපා හැරීම | රු.859,256.00 - | මේ සම්බන්ධව ඉදිරි කටයුතු සඳහා ශ්‍රී ලංකා මහවැලි අධිකාරියේ සාමාජිකයන් දෙදෙනෙකු ද ඇතුලත් කමිටුවක් පත් කර ඉදිරි කටයුතු කරගෙන යයි. |
| ලැබිය යුතු ගිණුම් - මහවැලි පශු සම්පත් හා කෘෂි ව්‍යාපාර (පුද්ගලික) සමාගම | රු.382,780.00 | මෙය සී/ස මහවැලි සත්ත්ව ව්‍යාපාරික සමාගමෙන් ලැබිය යුතු මුදලක් වන අතර ඉදිරියට එන ශේෂයකි. ඉදිරියේදී ඉදිරිපත් කිරිමට සටහන් කර ගන්නා ලදී. |

(ආ) පිළිගනිමි. - ඉදිරියේදී විගණනයට ලබා දීමට අදාළ පාර්ශව දැනුවත් කිරීමට කටයුතු කරමි.

## 2.3. මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

### 2.3.1. ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති

අදාළ පරිශ්‍ර 3හි මිණුම් කටයුතු සිදු කර ඉඩමේ සැලසුම් ද සමඟ ඉඩම තක්සේරු කිරීම සඳහා තක්සේරු දෙපාර්තමේන්තුව වෙත යොමු කර ඇත. මේ වන විට එම ඉඩම් අතුරින් දෙමටගොඩ, බේස්ලයින් පාර, අංක 260/20 දරණ ස්ථානයේ පිහිටි ඉඩම සඳහා අදාළ තක්සේරු අගය සහිත වාර්තාව ලැබී ඇත. ඒ අනුව 2017

මූල්‍ය ප්‍රකාශන සමඟ එම වටිනාකම ගිණුම්ගත කිරීමට පියවර ගන්නා අතර ඉතිරි ඉඩම් කට්ටි 02හි ද තක්සේරු අගය ලද වහාම නිසි පරිදි ගිණුම්ගත කිරීමට කටයුතු කරන බව දන්වමි.

**2.3.2. ගිණුම්කරණ ප්‍රතිපත්ති**

(අ) 2017 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන මගින් නිවැරදි කර ඇත.

(ආ) කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ සමාජ ආර්ථික සැලසුම් අංශය මගින් 2012 වර්ෂයේ ප්‍රකාශිත පළතුරු සහ මල් වගා භෝග ව්‍යවසායක අත්පොතෙහි Source Crop Enterprise Budget of " Fruits & Floriculture Crops, Socio Economic and Planning Center Department of Agriculture at Peradeniya – August 2012 " ගණනය කිරීම පාදක කොට ගනිමින් තක්සේරු වාර්තා පිළියෙල කර ඇත.

**2.3.3. ගිණුම්කරණ අඩුපාඩු**

(අ) වික්ටෝරියා කොත්මලේ කලාපයේ ඇති දිගන , නීලගම පිහිටි මහවැලි මහජන පුස්තකාලය සතුව ඇති පොත් 7588 ක් අගය කර වත්කම් වශයෙන් ගිණුම්ගත කිරීම සඳහා ත්‍රිපුද්ගල කමිටුවක් වික්ටෝරියා කලාපයේ නේවාසික ව්‍යාපෘති කළමනාකාර විසින් පත් කර ඇති අතර ඒ අනුව 2017 වර්ෂයේදී මූල්‍ය ප්‍රකාශන මගින් නිසි පරිදි ගිණුම් ගත කිරීමට කටයුතු කර ඇත.

එල් කලාපයේ පොත් තොගයේ වටිනාකම රු. 1,200,000.00ක් වශයෙන් විගණන විමසුමෙහි සඳහන් වුවද එහි වටිනාකම රු. 985,960.00ක් පමණ වේ. එහි වටිනාකම 2016 වර්ෂයේ වියදම් ගිණුමට හර කර තිබූ අතර එය නිවැරදි කර 2017 වර්ෂයේ මුල්‍ය ප්‍රකාශන මගින් ස්ථාවර වත්කම් ලෙස ගිණුම් ගත කර ඇත.

(ආ) කුඩා පරිමාණ විදුලි බලාගාරවලින් නිෂ්පාදිත විදුලිය වෙනුවෙන් 2016 වර්ෂය සඳහා විදුලි බල මණ්ඩලයෙන් ලැබිය යුතු මුදලක් ලෙස දක්වා තිබු රු. 7,700,890.00ක් සඳහා වූ ආදායම් , ගිණුම්ගත නොවීම 2017 වර්ෂයේ ප්‍රධාන කාර්යාලයේ අංක 107 දරණ ජර්නල් සටහන මගින් නිවැරදි කර ඇත. තවද ඉකුත් වර්ෂය වෙනුවෙන් ලැබී තිබි සමාලෝචන වර්ෂයේ ආදායම ලෙස ගිණුම් ගත කර තිබූ රු.3,912,069.00 ක් වූ ආදායම් 2016 වර්ෂයේ ජර්නල් සටහන් අංක 02 මගින් නිවැරදි කර ඇත.

(ඇ) 2017 වර්ෂයේ මුල්‍ය ප්‍රකාශන මගින් මෙය නිවැරදි කිරීමට කටයුතු කර ඇත.

(ඈ) වේලි ආරක්ෂණ හා ජල සම්පත් සැලසුම්කරණ ව්‍යාපෘතියේ පළමු අදියර අවසාන වීමත් සමඟ එම ස්ථාවර වත්කම් ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය වෙත පවරා ගන්නා ලෙස දැනුම් දී තිබුණද එම ස්ථාවර වත්කම් මිලදී ගත් දින සිට භාරදෙන දිනය තෙක් ක්ෂය වීම් ගණනය කර අදාල ගැළපිම් සිදු කර නොතිබුණි.

එහෙයින් එම වත්කම් නැවත අගය කල යුතු (Revaluation) අතර ඒ සඳහා තක්සේරු දෙපාර්තුමේන්තුව වෙත භාර දෙන ලදි. මේ වනවිටද අදාල අගයන් ලැබෙමින් පවතින අතර ඒ ඒ කලාපයට අදාල ප්‍රාදේශීය තක්සේරුකරුවන් විසින් තක්සේරු අගය සහිත වාර්තා ඉදිරිපත් කරන අතර මේ වන විට බෝවතැන්න හා කලාඔය ගංගාද්‍රෝණි කාර්යාලයට අයත් වත්කම්, තක්සේරු කර අදාළ වාර්තා ලැබි ගිණුම්ගත කර

ඇත. අදාල සියළු තක්සේරු වාර්තා තක්සේරු දෙපාර්තුමේන්තුවෙන් ලබාගෙන එම ස්ථාවර වත්කම්වල තක්සේරු අගය, ගිණුම්ගත කිරීමට කටයුතු කරමි.

(ෘ) 2015 දෙසැම්බර් මස මිල දී ගෙන ඇති බිම් තරාදිය අතපසු වීමකින් ස්ථාවර වත්කම් වශයෙන් සටහන් වී නොමැත. එය නිවැරදි කර ස්ථාවර වත්කම් වශයෙන් 2017 වර්ෂයේදී ගිණුම්ගත කිරීමට කටයුතු කරන ලදී.

2011 වර්ෂයේ වෙහෙරතැන්න ප්‍රදේශය සඳහා නැවත පදිංචි කිරීමේදී විදුලි බලය ලබා දීම සඳහා කාර්යභාර ඉංජිනේරු, ප්‍රධාන වැඩ මෙහෙයුම් අංශය, බෝවතැන්න කාර්යාලයට අයත්ව තිබූ මැරතන් වර්ගයේ 200KVA ජෙනරේටර් යන්ත්‍රයක් ගෙනවිත් ස්ථාපනය කිරීමට අපේක්ෂා කරන ලද බැවින් අදාල ජෙනරේටර් යන්ත්‍රය සඳහා අවශ්‍ය අමතර කොටස් තොගයන්ද කාර්යභාර ඉංජිනේරු, මාදුරුඔය කාර්යාල වෙතින් මෙම කලාපය වෙත ගෙන ඒමට කටයුතු කර ඇත. එහෙත් වෙහෙරතැන්න ප්‍රදේශයට එම වර්ෂය අවසානයේ ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය මගින් විදුලි බලය ලබා දීමට කටයුතු කරන ලද බැවින් ඉහතින් සඳහන් කරන ලද ජෙනරේටර් යන්ත්‍රය ලබා ගැනීමට අවශ්‍ය නොවීය. එමෙන්ම මෙම අමතර කොටස් තොගය එම වර්ගයේ ම ජෙනරේටර් යන්ත්‍රයක් ඇති වෙනත් කලාපයකට යැවීමට කටයුතු කරන අතර වෙනත් කාර්යාලවලට අවශ්‍ය නොවන්නේ නම් විධිමත් පරිදි ඉදිරියේදී අපහරණය කිරීමට කටයුතු කරමි.

(ඊ) විගණන වාර්තාව මඟින් මෙම කරුණු හුරුලුවැව කලාපය ලෙස දන්වා තිබුණ ද එය H කලාපය ලෙස නිවැරදි විය යුතු බව නිරීක්ෂණය කරමි.

50% දායකත්වය ක්‍රමවේදය යටතේ ජනපදිකයන් වෙත ලබා දීමට එච් කලාපය විසින් 2016 වසරේ මිලටගත් “ සෝජ් ” වර්ගයේ මහන මැෂින් 07 ක් නේවාසික ව්‍යාපෘති කළමනාකාර කාර්යාලයේ ස්ථාවර වත්කම්වලින් ඉවත්කර ගිණුම් නිවැරදි කිරීමට 2017 වර්ෂයේ මුල්‍ය ප්‍රකාශන මගින් කටයුතු කරන ලදි.

(උ) ගොවිපළවල නිපදවන සියළු පැල වර්ග හා පැල තවාන්වල (NUSARY) සියළුම පැල වර්ග වත්කම් වශයෙන් දක්වනු නොලැබේ. සියළු පශු සම්පත් හා ස්ථාපනය කරන ලද ස්ථිර බෝග වගාවන් පමණක් (BIO ASSET) කෘෂි වත්කම් ලෙස දක්වනු ලැබේ.

තවාන්වල පැළ හා ගොවිපලවල අලෙවිය සඳහා සකස් කරන පැල තොග ලේඛනයක් (Inventory) යටතේ ගොවිපළ ගිණුම් සකස් කිරීමේදි කෘෂි තොගයක් වශයෙන් (වෙළඳ තොග) භාවිතා කරන බව සඳහන් කරමි.

(ඌ) මෙම ගොඩනැගිලිවල වටිනාකම ගිණුම් පොත්වලට ගැනීමට පෙර එය තක්සේරු කල යුතු නිසා තක්සේරු කිරීම සඳහා තක්සේරු දෙපාර්තමේන්තුව වෙත මේ වන විට යොමු කර ඇත. අදාල තක්සේරුව ලද විගස අදාල වටිනාකම පොත්වලට ගැනීමට කටයුතු කරමි.

(එ) අරලගංවිල බීජ ගොවිපලේ ඉදිකරන ලද එළු ගාල (වටිනාකම රු. 1,964,346.00) හා සිංහපුර කොට්ඨාශයේ මහවැලිතැන්න ඒකකයේ ඉදි කරන ලද වී ගබඩාව (වටිනාකම රු 1,062,852..00) මහවැලි බී කලාපයේ නේවාසික ව්‍යාපෘති කළමනාකරණ කාර්යාලය පිළිවෙලින් 2016-11-03 දින හා 2017-12-20 දින භාර ගත් බව ලිඛිතව අප වෙත දැනුම් දී ඇත. ඒ අනුව 2017 වර්ෂයේදී ඊට අදාල වටිනාකම නැවත ප්‍රාග්ධනිත කොට අදාල ආයතනය වෙත හරපත් මගින් මාරු කරන ගිණුම් නිවැරදි කරන ලදි.

(ඒ) පසුගිය වර්ෂවලට අදාලව 2016 වර්ෂයේදී ලැබී තිබූ ආදායම රු 20,960,266.00ක් සමාලෝචිත වර්ෂයේ ආදායම් ලෙස මූල්‍ය ප්‍රකාශන වල දක්වා තිබීම වැරදීමකින් සිදු වී ඇත. එය වික්ටෝරියා කලාපයේ 20 වන ජර්නල් සටහන මගින් 2017 වර්ෂයේදී නිවැරදි කර ඇත.

(ඔ) 2017 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන මගින් අදාල නිවැරදි කිරීම් සිදු කර ඇත.

**2.3.4. නොසැසැඳුණු පාලන ගිණුම්**

ශ්‍රී ලංකා මහවැලි අධිකාරියේ ස්ථාවර වත්කම් මාරු කිරීම් තුලනය නොවීම

( රු 136,709,000.00 – 128,730,000.00 ) - රු 7,979,000.00

මහවැලි පශු සම්පත් හා කෘෂි ව්‍යාපාර ( පුද්ගලික) සමාගම වෙතින් නිරාවිය ගොවිපල වෙත ලැබුණු ගොඩනැගිල්ල , විවිධ උපකරණ හා ගංගාද්‍රෝණි කළමනාකරණ අංශයෙන් මොරගහකන්ද ව්‍යාපෘතියට මාරු කරන ලද වාහනයේ වටිනාකම නිසා මෙම වෙනස ඇති වී ඇත. එය ගිණුම් ඒකාබද්ධ කිරීමේදී තුලනය වී ඇත.

**2.3.5. අවිනිශ්චිත ගිණුම**

පිළිගනිමි.

2017 වර්ෂය තුළ දී මෙම අවිනිශ්චිත ගිණුමේ දක්වා තිබූ රු21,564,936.00ක වටිනාකමක් හඳුනා ගෙන අවිනිශ්චිත ගිණුමෙන් ඉවත් කර නිවැරදි කිරීම සිදු කර ඇත. ඉතිරි අගය ද ඉදිරියේදී නිවැරදිව විශ්ලේෂණය කර හඳුනා ගෙන නිවැරදි කිරීමට කටයුතු කරන බව දන්වමි.

**2.3.6. විගණනය සඳහා සාක්ෂි නොවීම**

| | |
|---|---|
| ආයෝජන සඳහා වූ ආයෝජන සහතික | ඉදිරියේදී ඉදිරිපත් කිරීමට සටහන් කර ගන්නා ලදී. (අදාළ අංශ වෙත උපදෙස් ලබා දී ඇත.) |
| ඉතිරි කිරීමේ ගිණුම - ශේෂ සනාථ කිරීම බැංකු පාස් පොත | |
| ස්ථාවර ස්ථාවර තැන්පතු - ශේෂ සනාථ කිරීම තැන්පතු සහතික | |

**2.4. ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්**

(අ) ඉඩම් බදු ආදායම් අය කිරීම රජයේ ඉඩම් ආඥාපනත යටතේ සිදු කරනු ලබයි. ඒ අනුව ඉඩම් කාර්ය සංග්‍රහයට අනුව නිවාස ඉඩම් බදු , ව්‍යාපාර ඉඩම් බදු හා ආයෝජන ව්‍යාපෘති බදු වශයෙන් වර්ග කිරීම් සිදු කර බදු අය කරනු ලබයි. නමුත් කඩිනම් මහවැලි වැඩ පිළිවෙල යටතේ රජයේ තක්සේරුව නොමැතිව මුල් කාල පරිච්ඡේදවල ඉඩම් බැහැර කිරීම් සිදුකර ඇත. එහිදි දළ තක්සේරුව මත ඉතා අඩු මුදලක් වාර්ෂික බදු වශයෙන් අයකර ඇත. රජයේ තක්සේරුව ලබා ගැනීමට දීර්ඝ කාලයක් ගත වී ඇති බැවින් රජයේ තක්සේරුව ලබා ගන්නා අවස්ථාව වනවිට බදු කරුවන්ට විශාල හිඟ බදු මුදලක් ගෙවීමට සිදුවීම නිසාත් එම බදු බර අදාල බදු කරුවන්ට දැරීමට අපහසු වීම නිසාත් මෙම තත්ත්වය උදාවී ඇත.

මහවැලි මහ සැලැස්මට අනුව වාණිජ ඉඩම් වශයෙන් හදුනාගෙන ඇති ඉඩම්වලින් ඇතැම් ඉඩම් කට්ටි මේ වනතුරුත් වාණිජ ඉඩම් වශයෙන් දියුණු වී නැත. නමුත් වාණිජ ඉඩම් සඳහා අධික බදු මුදලක් ගෙවිය යුතු වූවත් අදාල බදු කරුවන්ට මෙම බදු බර දැරීමට හැකියාවක් නොමැති බැවින් මෙවැනි විශාල බදු මුදලක් ඇති වීමට හේතු වී ඇත.

(ආ)

- වාරිමාර්ග හා ජල සම්පත් කළමනාකරණ අමාත්‍යාංශ කාර්යාලය
- NCP ව්‍යාපෘතිය
- NWP ව්‍යාපෘතිය

ඉහත ආයතනය වෙත අදාල මුදල් කඩිනමින් ගෙවන ලෙස අධ්‍යක්ෂ (මුදල්)ගේ යොමු අංක MASL/FIN/DDP/16/1 හා 2016-08-10 දිනැති ලිපිය මගින් දැනුම් දී තිබුනි . ඒ අනුව වාරිමාර්ග හා ජල සම්පත් අමාත්‍යශය අදාල මුදල් ගෙවීම් කර ඇත. ඉහත ඉතිරි ආයතනය එම මුදල් පියවීමට කටයුතු කර නොමැති බව දන්වමි. මෙම මුදල් අය කර ගැනිම සම්බන්ධව ඉදිරියටත් කටයුතු කරන බව දන්වමි.

- මොරගහකන්ද ව්‍යාපෘතිය

මේ සම්බන්ධව අදාල ආයතනය වෙත ලිඛිතව දැනුම් දීම සිදු කර තිබුණද මේ දක්වා පියවීම් සිදු කර නොමැති බව දන්වා ඇත.

(ඇ) වර්ෂ 05 ඉක්මවා ඇති ගෙවිය යුතු ගිණුම්වල වටිනාකම් පිලිබඳ සොයා බලා කඩිනමින් නිරවුල් කිරීමට හා එහි යම් ගැටළුකාරි තත්ත්වයක් පවතින්නේ ද යන්න පිළිබඳව පරීක්ෂා කර බලන ලෙසත් අදාල අංශ / කලාප වෙත උපදෙස් ලබා දී ඇත.

(ඈ) අමාත්‍යාංශ දෙකට අදාළ නිළධාරීන් සමඟ දැනටමත් සාකච්ඡා පවත්වා ඇති අතර ඒ අනුව ඉදිරි කටයුතු කර ගෙන යන බව දන්වමි.

(ඉ) වික්ටෝරියා - කොත්මලේ කලාපයේ ඇති නිල නිවාස සම්බන්ධව සංගණනයන් සිදු කර එය විධිමත් කිරීම හා අදාළ ගාස්තු අය කර ගැනීමට කටයුතු කිරීමේ ක්‍රමවේදය සකස් කිරීම සම්බන්ධව ප්‍රධාන කාර්යාලය, මූලික වැඩපාලන ක්‍රියාකරවුම් හා නඩත්තු අංශය (දිගන) හා නේවාසික ව්‍යාපෘති කළමණාකරණ කාර්යාලය (වික්ටෝරියා/කොත්මලේ) යන අංශ/කලාපවල නිළධාරීන්ගෙන් සමන්විත කමිටුවක් පත් කර ඇත. එම කමිටුවට අදාළ කලාප/අංශ/කොට්ඨාස/කාර්යභාර ඉංජිනේරු කාර්යාල මට්ටම දක්වා වූ අනු කමිටු පත් කර මෙම කාර්යය මේ වන විට සිදු කර ගෙන යන බව දන්වමි. සිනමා ශාලාව සහිත ඉඩමෙන් අය විය යුතු බදු මුදල් අය කර ගැනීමට අවශ්‍ය නීතිමය පියවර ගෙන ඇත.

(ඊ) මාදුරුඔය 01 බලාගාරයේ විදුලි මීටරයේ දෝෂයක් හේතුවෙන් 2015 දෙසැම්බර් 12 සිට 2016 ජනවාරි 06 කාලය තුල අඩුවෙන් ගණනය කර ඇති විදුලි ඒකක ප්‍රමාණය වෙනුවෙන් අය විය යුතු

රු 4, 128,992.00 ක මුදල් ගෙවන ලෙස 2016-05-20 දින විදුලි බල මණ්ඩලයෙන් ඉල්ලීමක් කර ඇති අතර ඒ සම්බන්ධයෙන් නැවත සිහි කැඳවීම් ද කර ඇත.

(උ) අදාළ සමාගම වෙත විධිමත්ව මෙම මුදල් අය කර ගන්නා ලෙස දැනුම් දී ඇති අතර ඉදිරියේදී අය කර ගැනීමට සටහන් කර ගන්නා ලදී.

(ඌ) දෙපාර්ශවය අතර සාකච්ඡාවන් පවත්වා ඇත. ඒ අනුව මෙම ගැටලුව ඉදිරියේදී නිරාකරණය කර ගැනීමට කටයුතු කරන බව දන්වමි.

(එ) අමාත්‍යාංශ ලේකම්තුමාගේ ප්‍රධානත්වයෙන් දෙපාර්ශවය කැඳවා මෙම මුදල් අයකර ගැනීම සම්බන්ධව මූලික සාකච්ඡා පවත්වා ඇත. ඒ අනුව ඉදිරි අයකර ගැනීම සිදුකර ගැනීමට නියමිත බව දන්වමි.

**2.5. නීති,රීති,රෙගුලාසි හා කළමණාකරණ තීරණවලට අනුකූල නොවීම**

(අ) (i) (ii) හා (iii)

විෂයභාර අමාත්‍යවරයාගේ එකගත්වය මත ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය සතු සියළුම පරිපාලිත සමාගම් වසා දැමීමට ප්‍රතිපත්තිමය තිරණයක් ගෙන ඇත.

(ආ) මේ සඳහා අභ්‍යන්තර කමිටුවක් පත් කර ඇති අතර එකතු කල අගය මත බදු සඳහා ලියාපදිංචි වීමට අවශ්‍ය කටයුතු කරමින් පවතී. එහි මූලාරම්භය ලෙස අධ්‍යක්ෂ (මුදල්) නියෝජ්‍ය අධ්‍යක්ෂ (ආදායම්) හා නියෝජ්‍ය අධ්‍යක්ෂ (ගෙවීම්) යන නිලධාරීන් දේශීය ආදායම් දෙපාර්තමේන්තුවේ අදාල අංශයේ නිලධාරීන් සමග මූලික සාකච්ඡාවක් සිදු කර ඇත.

(ඇ) (i) විධිමත් පරීක්ෂණයක් සිදු කර අලාභ අය කර ගැනීමට කටයුතු කර ඇත.

(ii) අදාල සත්‍යාපන වාර්තා විගණනයට මේ වන විට ඉදිරිපත් කිරීමට කටයුතු කර ඇත.

(ඈ) ) විමසුම මගින් දක්වා ඇති තොරතුරු නිවැරදි කිරීම පිණිස පරිගණක තොරතුරු පද්ධතියක් ස්ථාපිත කිරීමට කටයුතු කරන බව දන්වමි .

(ඉ) (i) මෙම අත්තිකාරම් කඩිනමින් පියවීමට අවශ්‍ය කටයුතු කරන ලෙසත් මෙවැනි තත්ත්වයක් ඉදිරියේදී ඇති නොවන පරිදි කටයුතු කරන ලෙසත් නේවාසික ව්‍යාපාර කළමනාකාර (එල්) වෙත උපදෙස් ලබා දී ඇත.

(ii) මෙම අත්තිකාරම් දැනට පියවා ගැනීමට කටයුතු කර ඇති අතර ඉදිරියේදී මෙවැනි තත්වයක් වළක්වා ගැනීමට ගණකාධිකාරිවරුන් දැනුවත් කිරීමට පියවර ගෙන ඇත.

(ඊ) සොයා බලා ඉදිරි කටයුතු කිරීමට සටහන් කර ගන්නා ලදී.

**3. මූල්‍ය සමාලෝචනය**

**3.1. මූල්‍ය ප්‍රතිපල**

පිළිගනිමි

**3.2. විග්‍රහාත්මක මූල්‍ය සමාලෝචනය**

(අ) පිළිගනිමි.

(ආ) පිළිගනිමි.

**3.3.අධිකාරියට එරෙහිව හෝ අධිකාරිය විසින් ආරම්භ කර ඇති නෛතික සිද්ධි**

පිළිගනිමි. 2017 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන මඟින් නිවැරදි කිරීමට සටහන් කර ගන්නා ලදී.

**4. මෙහෙයුම් සමාලෝචනය**

**4.1. කාර්ය සාධනය**

(අ) **මහවැලි මග සැලැස්ම**

පිළිගනිමි. යාවත්කාලීන කර සකස් කර ඇති සැලසුම් පරිදි ඉදිරි කටයුතු සිදු කිරීමට සටහන් කර ගන්නා ලදී.

(ආ) **ඉඩම් අංශයේ කාර්ය සාධනය**

)i 2016 (වර්ෂයට අදාළ ඉඩම් අංශයේ ක්‍රියාකාරී සැලැස්මට අනුව කලාප 10සදහා පහත පරිදි ඉලක්ක ලබා දී තිබුණි.

| අනු අංකය | ප්‍රධාන ක්‍රියාකාරකම | උප ක්‍රියාකාරකම | ඉලක්කය |
|---|---|---|---|
| .1 | ඉඩම් බෙදාදීම | 1.2රජයේ ඉඩම් අඥාපනත යටතේ දීර්ඝ කාලීන බදු ලබාදීම /භුක්තිය බාරදීම | |
| | | .1වාණිජ | 620 |
| | | .2ආයෝජන ව්‍යාපෘති | 45 |
| .2 | ප්‍රදාන පත්‍ර /දීර්ඝකාලීන බදු /බලපත්‍ර නිදහස් දීමනා පත්‍ර ලබා දීම | 2.1ඉඩම් සංවර්ධන ආඥා පනත යටතේ ප්‍රදාන පත්‍ර ලබා දීම | |
| | | .3කෘෂි වර්ෂා පෝෂිත | 185 |
| | | 2.3රජයේ ඉඩම් අඥාපනත යටතේ දීර්ඝ කාලීන බදුකර ලබාදීම | |
| | | .2වාණිජ | 240 |
| | | .3ආයෝජන ව්‍යාපෘති | 95 |
| | | .4වෙනත් | 115 |

2016 වර්ෂය තුළ වාණිජ කටයුතු සඳහා දීර්ඝකාලීන බදු පදනම මත ඉඩම් 620 ක් ලබා දීම හා ඒවායේ භුක්තිය බාර දීමට ඉලක්ක කර තිබුණ ද එතරම් ඉඩම් ප්‍රමාණයක් සඳහා ඉල්ලීම් නොලැබීම හේතුවෙන් භුක්තිය භාරදීමේ කටයුතු සිදු කරනු ලැබුවේ ඉඩම් කට්ටි 84ක් සඳහා පමණි.

එම වර්ෂයේදී ආයෝජන ව්‍යාපෘති 45ක් සඳහා ඉඩම් භාර දීම ඉලක්ක කර තිබුණ ද බදු අනුමැතිය ලබා ගැනීමෙන් අනතුරුව භුක්තිය භාර දීමට හැකියාව ලැබුණේ ඉඩම් 7ක් පමණි .එයට හේතුව වූයේ ඉඩම් බැහැර කිරීමට තරම් සුදුසු ව්‍යාපෘති යෝජනා සහිතව ආයෝජන ඉල්ලීම් නොලැබීමයි.

ඉඩම් සංවර්ධන ආඥා පනත යටතේ කෘෂි /වර්ෂා පෝෂිත ඉඩම් බෙදා දී එම ඉඩම් සඳහා ප්‍රදාන පත්‍ර 185ක් ලබා දීම ඉලක්ක කළ ද ඒ සඳහා ලබා දීමට හැකි වූයේ ප්‍රදාන පත්‍ර 70ක් පමණි.

එහිදී , ඩී කලාපය සඳහා ප්‍රදාන පත්‍ර 100ක ඉලක්කයක් ලබා දී තිබුණ ද එකදු ප්‍රදාන පත්‍රයක්වත් ලබා දීමට නොහැකි විය .ඩී කලාපය නව සංවර්ධන කලාපයක් ලෙස සංවර්ධනය කරමින් පැවති අතර මූලික යටිතල පහසුකම් එනම් මාර්ග හා ඇල මාර්ග සැලසුම් කර තිබුණ ද ඒවා භූමියේ ස්ථාපනය කර ඉදිකිරීම් අවසන් වී නොතිබුණ බැවින් ඉඩම් මැන සිතියම් සකස්කිරීමේ හැකියාව මිනින්දෝරු දෙපාර්තමේන්තුවට නොතිබුණි . ඒ හේතුවෙන් කෘෂි හා වර්ෂා පෝෂිත ඉඩම් වලට අදාල පිඹුරු පත් සකස් කිරීමට නොහැකි වූ අතර එම ඉඩම් සඳහා පිඹුරු සහිත ප්‍රදාන පත්‍ර ලබාදීමට හැකියාව නොලැබුණි.

(ඈ) අදාල අරමුදල සඳහා ව්‍යාපාර සංවර්ධන අංශයේ අධීක්ෂණය යටතේ ජනපදික ගොවි ජනතාවට ණය මුදල් ලබාදීම වෙනුවෙන් ප්‍රදේශීය සංවර්ධන බැංකුව වෙත ලබා දීමට අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය ලබා දී ඇති අතර ඒ සඳහා කටයුතු සූදානම් කරමින් පවතී.

(ඈ) ,(ඉ) සහ (ඊ)

පිළිගනිමි.

විෂයභාර අමාත්‍යවරයාගේ ද එකගතාවය ඇතිව මෙම පරිපාලිත සමාගම් වසා දැමීමට

ප්‍රතිපත්තිමය තීරණයක් ගෙන ඇත.

## 4.2. කළමණාකරණ ක්‍රියාකාරකම්

(අ) මෙවැනි තත්ත්වයක් ඉදිරියේදී ඇති නොවන පරිදි කටයුතු කරන ලෙස සියලු අධ්‍යක්ෂවරුන් හා නේවාසික ව්‍යාපෘති කළමනාකරුවන් දැනුවත් කර ඇත.

(ආ) අවශ්‍ය ක්‍රියාමාර්ග සමග සටහන් කර ගන්නා ලදි.

(ඈ) පිළිගනිමි.

භූගෝලීය තොරතුරු පද්ධති අංශය සඳහා ක්ෂේත්‍රය පිළිබඳ පළපුරුද්ද හා වෘත්තීය සුදුසුකම් සහිත කාර්ය මණ්ඩලයේ හිඟතාවය මත විගණනය මගින් පෙන්වා දී ඇති තත්ත්වය ඇති වීමට හේතු වී ඇත. එහෙත් මේ වන විට පරිසර අංශය තුල පැවති බොහොමයක් පුරප්පාඩු සම්පූර්ණ කර ඇත.

උදා. පරිසර නිලධාරී තනතුර

ඒ අනුව 2019 වර්ෂයේ සිට මෙම අංශයේ කටයුතු ඵලදායී හා කාර්යක්ෂම ලෙස පවත්වාගෙන යාමට කටයුතු කරන බව දන්වමි.

(ඇ) 2015 වර්ෂයේදී අපහරණය නොකළ අයිතම 2016 වර්ෂයේදී ද 2016 වර්ෂයේ අපහරණය නොකළ අයිතම 2017 වර්ෂයේ ද සත්‍යාපනයට භාජනය වන බැවින් 2018 සත්‍යාපනයෙන් පසු අපහරණය සිදු කිරීමට කටයුතු සලසා ඇත.

(ඉ) වික්ටෝරියා කලාපය මගින් භාවිතා කල වරාපිටියේ පිහිටි ගබඩා 3 ක් සහ නේවාසික කාමරයකින් සමන්විත වූ ගබඩා පරිශ්‍රයේ වර්ග අඩි 1423. 5 ක් වූ එක් ගබඩාවකින් කොටසක් මාගේ අනුමැතිය ඇතිව 2012 අගෝස්තු 29 දින තාවකාලිකව සෞඛ්‍ය දෙපාර්තමේන්තුවේ වෛද්‍ය සැපයුම් අංශයට භාර දී ඇති අතර එය විධිමත් කිරීමට කටයුතු කරමි.අනික් ගොඩනැගිල්ල අළුත්වැඩියාව සඳහා වෛද්‍ය සැපයුම් අංශය සමග අවබෝධතා ගිවිසුමක් ඇති කර ගත්ත ද එම ගොඩනැගිල්ල මීටර් 100 සීමාවේ පවතින අතර එය ජලයෙන් යට වන බැවින් ගොඩනැගිල්ල කඩා ඉවත් කිරීම සඳහා ඒ සඳහා පත්කල කමිටුවක් මගින් නිර්දේශ කර තිබුණි. ඒ අනුව විධිමත් අනුමැතියෙන් පසු විනාශ කිරීමට කටයුතු කරමි.

(ඊ) එම සමාගම් අතුරින් මෙහෙයුම් ලාභ ලබා තිබූ සී/ස මහවැලි උපදේශන කාර්යංශය (පුද්ගලික) සමාගම 2016 වර්ෂය දක්වා ලාභාංශ අධිකාරිය වෙත ගෙවා ඇත. අනෙකුත් සමාගම් වාර්ෂිකව අලාභ මට්ටමේ පවතින බැවින් අධිකාරියට කිසිදු ප්‍රතිලාභයක් ලැබී නොමැත.

(උ) ඉදිරි ක්‍රියාමාර්ග සඳහා සටහන් කර ගන්නා ලදි.

(ඌ) ඉදිරි ක්‍රියාමාර්ග සඳහා සටහන් කර ගන්නා ලදි.

(එ) මේ පිළිබඳ කරුණු සොයා බැලීමේදී මෙම කුඩා පරිමාණ සුළු ජල විදුලි බලාගාර පිහිටි ඉඩම්වලට අදාල ප්‍රදේශයේ, ප්‍රාදේශීය ලේකම්ගේ හිමිකමක්ද තිබෙන බැවින් අදාල ආයෝජකයින් ප්‍රාදේශීය ලේකම් වෙත ද බදු මුදලක් ගෙවන බව වාර්තා වී ඇත. කෙසේ වුවද තවදුරටත් අප ආයතනය මහවැලි ජලය භාවිතා කිරීම සඳහා අදාල ආයෝජකයින්ගෙන් ගාස්තුවක් අය කල යුතු බැවින් ඒ පිළිබඳව සොයා බලා අවශ්‍ය කටයුතු පිළියෙල කරන ලෙස නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල් (තාක්ෂණ සේවා) වෙත උපදෙස් ලබා දී ඇත. මේ වන විට අදාල පාර්ශව රැස් වී මූලික කටයුතු සිදු කරගෙන යයි.

(ඒ) මෙම ඉඩම් මහවැලි අධිකාරිය වෙත පවරා දෙන ලෙස ශ්‍රී ලංකා මහවැලි අධිකාරියේ අධ්‍යක්ෂ ජනරාල්ගේ අංක 2007/1/22, 2007/03/05 2007/03/13 දිනැති ලිපි මගින් ප්‍රාදේශිය ලේකම්, තිඹිරිගස්යාය - ඉඩම් කොමසාරිස් - ඉඩම් කොමසාරිස් කාර්යාලය වෙත ඉල්ලීම් කර ඇත. අදාල ආයතන මට්ටමින් මේ දක්වා ප්‍රතිචාර දක්වා නොමැති අතර විදේශ කටයුතු අමාත්‍යශෙයේ ලේකම්ගේ EA/AD/MU/07/12 හා 2017-11-20 දිනැති ලිපිය මගින් අදාල ඉඩම, විදේශ සේවා නියුක්ති කාර්යාංශයේ ප්‍රයෝජනය සඳහා ලබා දීමට අමාත්‍ය මණ්ඩල අනු කමිටුව මගින් නිර්දේශ කර ඇති හෙයින් මෙම ඉඩම ශ්‍රී ලංකා මහවැලිය අධිකාරියට පවරා ගැනීමේ කටයුතු තාවකාලිකව අත්හිටුවීමට සිදු වී ඇත.

(ඹ) 2018 වර්ෂයේදී මුල්‍ය ප්‍රකාශන මගින් නිවැරදි කර ඇත.

(ඕ) )i( සොයා බලා ඉදිරි කටයුතු කිරීමට සටහන් කර ගන්නා ලදි.

(ii) සමාගමේ පවතින දැඩි මූල්‍ය අර්බුද හේතුවෙන් වාර්තාවේ පෙන්වා දී ඇති කරුණු සඳහා ක්‍රියාමාර්ග ගැනීම අපහසු තත්ත්වයක පවතී. මෙම තත්ත්වය අධ්‍යක්ෂ මණ්ඩලයේ අවධානයට යොමු වී හා ශ්‍රී ලංකා මහවැලි අධිකාරියේ අධ්‍යක්ෂ මණ්ඩලයේ ද එකඟතාවය මත පෞද්ගලික - රාජ්‍ය හවුල් ව්‍යාපාරයක් ලෙස සමාගම පවත්වා ගෙන යාමට සුදුසු ආයෝජනය තෝරා ගැනීම සඳහා පුවත්පත් දැන්වීමක් පළ කර තිබුණි. ඒ අනුව ඉදිරි කටයුතු සිදු කරමින් පවතී.

2014 වර්ෂයේ සිට 2016 වර්ෂය දක්වා සේවක අර්ථ සාධක අරමුදලට නොගෙවා තිබූ දායක මුදලින් රුමිලියන 2.5ක් 2018 වර්ෂයේ මාර්තු මාසයේදී ගෙවා ඇත. ඉතිරි හිඟ මුදල් නිරාවිය සත්ත්ව ගොවිපළ පවරා දීමේදී එහි ජීව තොග (සතුන්) වටිනාකම හා අනිකුත් තොගවල වටිනාකම අය කර ගෙවීමට සැලසුම් කර ඇත.

මූල්‍ය ප්‍රකාශනවල ජංගම නොවන වත්කම් යටතේ රු.14,929,159.00ක් වටිනා ඉඩම්වල වටිනාකම දන්වා තිබුණ ද එහි නෛතික අයිතිය සමාගම වෙත නොමැති බැවින් එය මූල්‍ය ප්‍රකාශන මඟින් නිවැරදි කිරීමට සමාගමේ අධ්‍යක්ෂ මණ්ඩලයේ අනුමැතිය ලබා ගෙන ඇත.

මේ සම්බන්ධව නෛතික තත්ත්වය සොයා බලා නිවැරදි කිරීමට සටහන් කර ගන්නා ලදී.

(iii) 2018 සමාගමේ මුල්‍ය ප්‍රකාශන මගින් නිවැරදි කිරීමට පරිපාලිත සමාගම වෙත උපදෙස් දී ඇත.

## 4.3. මෙහෙයුම් ක්‍රියාකාරකම්.

(අ) මේ පිළිබඳව සොයා බලා ඉදිරි ක්‍රියාමාර්ග ගැනීමට සටහන් කර ගන්නා ලදී.

(ආ) මෙම ගොඩනැඟිලි භාවිතා කරන ඒ ඒ ආයතනවලින් කුලී මුදල් අය කර ගැනීම සඳහා එම ගොඩනැඟිලි තක්සේරු කිරීමක් සිදු කළ යුතු බැවින් එම ගොඩනැඟිලි තක්සේරු කිරීම සඳහා තක්සේරු දෙපාර්තමේන්තුව වෙත යොමු කර තිබුණි. දීර්ඝ කාලයක් යන තෙක් එම ගොඩනැඟිලිවල තක්සේරු වටිනාකම තක්සේරු දෙපාර්තමේන්තුව වෙතින් නොලැබීම මත කුලී ගිවිසුම් යටතේ ඒ ඒ ආයතන වෙත ගොඩනැඟිලි විධිමත්ව ලබා දිය නොහැකි විය. ඒ මත කුලිය අය කර ගත නොහැකි විය. කෙසේ නමුත් 2018.04.25 දින එම ගොඩනැඟිලි සඳහා තක්සේරු වාර්තාව ලැබී ඇති හෙයින් කඩිනමින් කුලී ගිවිසුම් යටතේ ඒ ඒ ආයතන වෙත ලබා දීමට පියවර ගන්නා බව දන්වමි.

තව ද වාර්තාවේ සඳහන් සමහරක් ආයතන මේ වන විට ක්‍රියාත්මක තත්ත්වයේ නොමැති බැවින් තක්සේරුව ලැබුණ ද එම ආයතනවලින් කුලිය අය කර ගැනීමට නොහැකි තත්ත්වයක් පැන නැඟී ඇත.

උදා : ප්‍රොයරි උපදේශන සේවා සමාගම.

වයඹ පළාත් ව්‍යාපාර කාර්යාලය.

ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය, වාරිමාර්ග හා ජල කළමනාකරණ අමාත්‍යාංශය යටතේ තිබියදී මෙම පුහුණු පාසල මහවැලි අධිකාරියට හා වාරිමාර්ග දෙපාර්තමේන්තුවට අවශ්‍ය කාර්මික නිලධාරීන් පුහුණු කිරීම සඳහා පිහිටවනු ලැබීය. පසුව මෙම ආයතන දෙක අමාත්‍යාංශ දෙකකට වෙන් කිරීම නිසා මෙම ගැටලුව පැන නගින ලදී. ඉදිරියේදී මෙම ආයතනය ඉහත අමාත්‍යාංශ දෙකෙන් එකකට විධිමත්ව පැවරීමට අවශ්‍ය කටයුතු කරගෙන යයි.

(ඇ) සන්නිවේදන කුළුණු ස්ථාපිත කිරීම සම්බන්ධව අදාල අනුමැතීන් හා රජයේ තක්සේරුව ලබා ගෙන මෙම කරුණු විධිමත් කිරීමට ක්‍රියාමාර්ග ගැනීමට කටයුතු කරමි.

(ඈ) ඉහළ මහවැලි ජලධාරක ප්‍රදේශයේ තෝරා ගන්නා ලද උප ජල පෝෂක (Sub Water Sheds) ප්‍රදේශවලින් ස්වාභාවික ගංගාවලට එකතු වන රොන් මඩ ප්‍රමාණය ගණනය කිරීමේ ක්‍රමවේදයක් පවත්වා ගෙන යනු ලැබේ. මෙහිදී එම පිහිටුවන ලද ස්ථානවලින් ගලා යන ජල ප්‍රමාණයන් සහ රොන් මඩ ප්‍රමාණයන් (Water, Silt and Sand Discharges) මාසිකව ගණනය කරනු ලැබේ. මෙසේ රැස් කරනු ලබන දත්ත උපයෝගී කර ගෙන මාස 03ක කාලසීමාවන් තුලදී (කාර්තු වශයෙන්) ජල පෝෂක ප්‍රදේශයෙන් ගංගාවලට එකතු වන රොන් මඩ පිළිබඳ වාර්තා සකස් කරනු ලැබේ.
මේ ආකාරයට ජල පෝෂක ප්‍රදේශය තුල පිහිටුවා ඇති මිණුම් ගන්නා ස්ථානය හා සම්බන්ධ දත්ත සකස් කර ප්‍රධාන කාර්යාලයට හා ප්‍රධාන කාර්යාලය මගින් රජයේ අදාළ ආයතන වෙත (උදා. කෘෂිකර්ම දෙපාර්තමේන්තුව,ජල සම්පත් මණ්ඩලය,වාරිමාර්ග දෙපාර්තමේන්තුව) . ඔවුන්ගේ අවශ්‍යතාවය අනුව දත්ත නිකුත් කිරීමේ වැඩ පිළිවෙලක් සකස් කර ක්‍රියාත්මක කිරීමට කටයුතු කල හැකි බව දන්වමි. තවද, මේ පිළිබඳ ආයතන දැනුවත් කිරීමේ වැඩසටහන් 2019 වර්ෂයේ සිට ක්‍රියාත්මක කිරීමට සැලසුම් කරනු ලැබේ.

(ඉ) අදාළ අලුත්වැඩියාවන් සඳහා අවශ්‍ය මුදල් නොමැති වීම නිසා මෙම වාහන අළුත්වැඩියාව සඳහා වැඩි කාලයක් ගත විය. කෙසේ නමුත් අළුත්වැඩියා කළ නොහැකි තත්ත්වයේ පැවති වාහන මේ වන විට අපහරණය කොට ඇත.

(ඊ) ආයෝජන ව්‍යාපෘතිවල ප්‍රගතිය හා ඒවා පිළිබඳ සමීක්ෂණ වාර්තා නේවාසික ව්‍යාපෘති කළමනාකරුවන් විසින් සිදු කළ අතර එමගින් හිඟ ශේෂ ඇති ව්‍යාපාර පිළිබඳවත්, ආයෝජන ව්‍යාපෘති සඳහා බැහැර කළ ද සංවර්ධනය නොකල ඉඩම් අවලංගු කිරීම්, බදු නොගෙවීම වෙනුවෙන් නීතිමය කටයුතු ආරම්භ කර ඇත.

(උ) මහවැලි එල් කලාපය සමාජ ආර්ථික වශයෙන් දියුණු තත්ත්වයට ළගා කරවීමේ යහපත් අරමුණින් මෙම මහා පරිමාණ ආයෝජන ඉඩම් ලබා දීම සිදු කරනු ලබයි. ආයෝජන සිදු කිරීම සඳහා සුදුසු ආයෝජකයන් තේරීම, ඒ සඳහා විධිමත් අනුමැතිය ලබා දීම, ආයෝජකයන් සඳහා සුදුසු ඉඩම් වෙන් කිරීම හා අදාල ව්‍යාපෘති වෙනුවෙන් බැහැර කිරීම් සිදු කර ඇති අතර කලාපයේ පවත්නා දුෂ්කරතාවය හේතුවෙන් සීඝ්‍ර සංවර්ධනයක් අපේක්ෂා කළ නොහැකි විය. ඉදිරියේදි මේ සම්බන්ධව වැඩි අවධානයක් යොමු කිරීමට සටහන් කර ගන්නා ලදි.

(ඌ) ආයෝජන ව්‍යාපෘතිවල ප්‍රගතිය හා ඒවා පිළිබඳ සමීක්ෂණ වාර්තා නේවාසික ව්‍යාපෘති කළමනාකරුවන් විසින් සිදු කළ අතර එමගින් හිඟ ශේෂ ඇති ව්‍යාපාර පිළිබඳවත්, ආයෝජන ව්‍යාපෘති සඳහා බැහැර කළ ද සංවර්ධනය නොකල ඉඩම් අවලංගු කිරීම්, බදු නොගෙවීම වෙනුවෙන් නීතිමය කටයුතු ආරම්භ කර ඇත.

(එ) අසාර්ථක ව්‍යාපෘතිවලට අදාළ ඉඩම් හඳුනාගෙන එම ඉඩම් ආපසු ලබා ගැනීම සඳහා 2016-12-31 දිනට අදාළව වාර්තාවක් පිළියෙල කර ඇත. එම වාර්තාව ප්‍රකාරව ශ්‍රී ලංකා මහවැලි අධිකාරියේ ඉඩම් බලපත්‍ර අවලංගු කිරීමේ ක්‍රමවේදය අනුව 2018-02-15 දිනෙන් පසු එම කාර්යය සිදු කරගෙන යයි.සතුටුදායක ලෙස සංවර්ධන කටයුතු සිදු නොකරන ලද හා බදු ගෙවීම් පැහැර හැර ඇති ආයෝජන ව්‍යාපෘති සඳහා ලබා දී ඇති ඉඩම් අවලංගු කිරීම සඳහා ඉහත සඳහන් පරිදි ඉදිරි කටයුතු සිදු වන බව දන්වමි.

(ඒ) 2018 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන මගින් මෙම තත්වය නිවැරදි කිරීමට කටයුතු කරමි.

## 4.4. මතභේදයට තුඩු දෙන ගනුදෙනු

(අ) මෙම පිටාර ගැලීම කිනම් ජලාශවලින්ද යන බව වාර්තාව මගින් පැහැදිලි නොමැති බැවින් ඒ පිළිබඳව අදහසක් ඉදිරිපත් කිරීම අසීරු බව සඳහන් කරමි. උදාහරණයක් ලෙස පොල්ගොල්ල ජලාශය විශාල ධාරිතාවක් නොමැති අතර එහි විදුලි බලාගාරයේ (උකුවෙල) උපරිම විදුලි උත්පාදන ධාරිතාවය මගින් දිනකට හරවා යැවිය හැකි උපරිම ජල ප්‍රමාණය ඝණ මීටර් මිලියන 04 ක් වේ. නමුත් වර්ෂා කාලයේ මෙම ජලාශයට දෛනික ජලය ගලා ඒමත් ඝණ මීටර් මිලියන 50 ක් පමණ වන අවස්ථාද ඇත. එබැවින් ඉහත ගණනය කිරීමට මෙම ජලාශයේ පිටාර ජල ප්‍රමාණය ඇතුලත් වුවද යන්න අපැහැදිලිය. බෝවතැන්න හා රන්ටැඹේ ජලාශවලට ජලය ගලා ඒම 1985 වර්ෂයේ සිට 2016 දක්වා පිළිවෙලින් ඝණ මීටර් මිලියන 5442 ක් හා 7566 ක් වේ. එම කාලය තුළ වාන් දමන ලද ජල ප්‍රමාණය පිළිවෙලින් ඝණ මීටර් මිලියන 1156 ක් හා 3457 ක් වේ. ඒ අනුව මෙම ජලාශ දෙකෙන් වාන් දමන ලද ප්‍රමාණය ඝණ මීටර් මිලියන 4613 කි. එයට අමතරව බෝවතැන්න ජලාශයේ පිටාර යන ජලයට දත්තයන් මොඩියුල් ගත කිරීමේදී වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ පැරණි වාරි ව්‍යාපෘති සඳහා ජලාශයේ පහළ අවහැරවුම් මගින් නිකුත් කරන ලද ජල ප්‍රමාණයද එකතු වේ. එම ප්‍රමාණය ඝණ මීටර් මිලියන 1696 කි.

තවද බෝවතැන්න හා රන්ටැඹේ ජලාශ ජලය බෙදාහැරීමක් සඳහා පද්ධති කර ඇති ජලාශයන් වන අතර වර්ෂා කාලවලදී ඒවා පූර්ණ ධාරිතාවයෙන් විදුලිය උපදවනු ලබයි. එම ජලාශ දෙක ජලය රැස් කර ගැනීමට භාවිතා කළ හැකි ජලාශ නොවන අතර ඒවායේ ධාරිතාවයන් ඉතා කුඩා වේ. එනම් බෝවතැන්න ජලාශයේ උපරිම ධාරිතාවය ඝන මීටර් මිලියන 23.5 ක් හා රන්ටැඹේ ජලාශයේ ඝණ මීටර් 07 ක් වේ.

(ආ) ඒ සම්බන්ධව පහත කරුණු ඉදිරිපත් කරමි.

(I) විදුලි රැහැන් පද්ධතිය වෙනුවෙන් ආයෝජකයා දරණ ලද වියදමින් රු. මි.75 ක් අධිකාරිය විසින් දරා ඇත්තේ 2013-10-25 දින පැවති අධ්‍යක්ෂ මණ්ඩල (Board Paper No.2013/247/3688) තීරණයට අනුකූලවය.

(II) මේ සම්බන්ධයෙන් මහවැලි අධිකාරිය ආයෝජකයා සහ විදුලි බල මණ්ඩලය අතර ත්‍රෛයි පාර්ශවික ගිවිසුම අනුව විදුලි බල මණ්ඩලය විසින් රු. මි.75 ක මුදල මහවැලි අධිකාරිය වෙත විදුලිය ඉපයීම වෙනුවෙන් ලැබිය යුතු මුදලින් ආයෝජකයා වෙත ගෙවීමට එකඟතාවය පළ කර ඇත.

(III) ජල විදුලි බලාගාරයක විදුලි උත්පාදනය ,ජල කඳේ උස සහ මුදාහරිනු ලබන ජල ධාරිතාවය මත රඳා පවතී. කම්ටු වාර්තාවේ සඳහන් රු. 131,157,653.00 ක අපේක්ෂිත වාර්ෂික ආදායම මෙම වකවානුවේ පසුගිය අවුරුදුවල තත්ත්වයන් අනුව ඇස්තමේන්තු කරන ලද්දකි. එසේ වුවද අදාල කාලය තුළ පැවති ජලය මුදා හැරීමේ අඩු වීම ඇතුළු භෞතික තත්ත්වයන් මත විදුලි උත්පාදනය කිරීම අඩු වී ආදායම රු. 62,865,408.00ක් ලෙස වෙනස් වී ඇත.

(IV) මාදුරුඔය 01 බලාගාරයේ විදුලි මීටරයේ දෝෂයක් හේතුවෙන් 2015 දෙසැම්බර් 12 සිට 2016 ජනවාරි 06 කාලය තුළ අඩුවෙන් ගණනය කර ඇති විදුලි ඒකක ප්‍රමාණය වෙනුවෙන් අය විය යුතු රු. 4, 128,992.00 ක මුදල් ගෙවන ලෙස 2016-05-20 දින විදුලි බල මණ්ඩලයෙන් ඉල්ලීමක් කර ඇති අතර ඒ සම්බන්ධයෙන් නැවත සිහි කැඳවීමක් කර අදාළ මුදල ලබා ගැනිමට කටයුතු කරමි.

(ඇ) මේ පිළිබඳව අධිකරණ ක්‍රියාමාර්ග අවසන් වී නොමැත. අධිකරණ තීන්දුව අනුව ඉදිරි කටයුතු කරමි.

(ඈ) විගණනය විසින් දක්වා ඇති කරුණු සම්බන්ධයෙන් මේ වන විට අවශ්‍ය ක්‍රියාමාර්ග ගෙන ඇත.

(ඉ) මෙම සිද්ධියට සම්බන්ධ නිලධාරීන් තිදෙනෙකු දැනටමත් වැඩ තහනමට ලක් කර ඇති අතර ඒ සඳහා විධිමත් විනය පරික්ෂණය මේ වන විට ආරම්භ කර පවත්වාගෙන යයි. විගණනය විසින් දක්වා ඇති කරුණු සම්බන්ධව ඉදිරි කටයුතු සිදු කර ගෙන යන බව දන්වමි.

**<u>4.5. නිෂ්ක්‍රීය හා උඟණ උපයෝජිත වත්කම්.</u>**

(අ) මේ පිළිබඳව පහත සඳහන් කරුණු ඉදිරිපත් කරමි.

(ii) මාර්ගස්ථ මුදල් වශයෙන් අදාළ වර්ෂයට ලැබිය යුතු ආදායම ඊළඟ වර්ෂයේ ලැබීම් ගිණුම්ගත කිරීමේ මුදල් ශේෂයන් ද

(iii) ස්ථාවර තැන්පතු හා සත්දින තැන්පතුවල කර ඇති ආයෝජන මුදල් සම්බන්ධ මුදල් ශේෂයන්වලින් ද සමන්විත වී ඇත.

(ආ) ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය සතු ගොඩනැගිලි සියල්ල පූර්ණ සමික්ෂණයකට භාජනය කර භාවිතා කල හැකි , එහෙත් භාවිතා නොකරන ගොඩනැගිලි 442ක් හඳුනාගෙන ඇත. එම ගොඩනැගිලි රාජ්‍ය දේපළ හෙයින් අවශ්‍යතාවය අනුව ලබා දීම පිණිස ඒ ඒ ගොඩනැගිලි අයත් දිස්ත්‍රික්කවල දිසාපතිවරුන් වෙත දැනුම් දී ප්‍රාදේශිය ලේකම්වරුන්ගේ අවශ්‍යතා අනුව ඉල්ලීම් ඉදිරිපත් කිරීම පිණිස දැනටමත් යොමු කර ඇත. එහෙත් ශ්‍රී ලංකා මහවැලි අධිකාරියේ වත්කම් පවරා දීමේ ක්‍රමවේදය යටතේ ගොඩනැගිලි සඳහා වටිනාකම ගෙවීමට දිසාපතිවරුන් අකමැත්ත පළ කර ඇත.

මෙම පැවරීම් සම්බන්ධයෙන් අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය ලබා ගෙන ඇති අතර ඉහත සියළු ඉල්ලීම් ලද පසු අමාත්‍ය මණ්ඩල අනුමැතිය වෙත යොමු කර එම අනුමැතිය ලද පසු ඒ ඒ රාජ්‍ය නිළධාරින් වෙත විධිමත් පවරා දීමට කටයුතු සූදානම් කර ඇත.

(ඇ) ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය සතු භාවිතයෙන් ඉවත් කිරීමට යෝජිත වාහන පිලිබඳ තොරතුරු 2018 වර්ෂයට අදාළව සහකාර අධ්‍යක්ෂ (ප්‍රවාහන) විසින් සකස් කරමින් පවතින අතර නිරාවිය ගොවිපලට

අයත් විමසුමේ සඳහන් වාහන ද ඊට ඇතුලත්ව ඇත. ඒ අනුව ඉදිරියේදී සිදු කරන අපහරණ ක්‍රියාවලිය මගින් එම වාහන අපහරණය කිරීමට කටයුතු සූදානම් කර ඇත. කුකුළු කොටු සඳහා විදුලිය සැපයීමට කටයුතු කරමින් පවතී. ඉන් අනතුරුව ප්‍රයෝජනයට ගෙන සත්ත්ව නිෂ්පාදන යළි ඇරඹීමට කටයුතු යොදා ඇත.

ඌරන්, එළුවන්, කුකුළු කොටුවල සිටි සතුන් ඉවත් කිරීම නිසා මෙම තත්ත්වය පැන නැගී ඇත. යළි (NLDB) පශු සම්පත් සංවර්ධන මණ්ඩලය විසින් ලබා ගත් සතුන්ගේ වටිනාකමට උසස් වර්ගයේ සතුන් ලබා ගැනීමට කටයුතු කරමින් පවතින අතර,එසේ ලබා ගත් පසු උක්ත ගොඩනැගිලි පරිශ්‍රය යළි භාවිතයට ගැනෙන බව කාරුණිකව සඳහන් කරමි.

(ඈ) මෙම භාණ්ඩ අතුරින් දැනට භාවිතයට ගත හැකි භාණ්ඩ හදුනා ගෙන ඒවා ඵලදායී ලෙස අදාළ අංශ / කලාප වෙත නිකුත් කිරීමට ත් එසේ නොවන භාණ්ඩ විධිමත් අපහරණ ක්‍රමවේදය භාවිතා කර අපහරණය කිරීමටත් අවශ්‍ය උපදෙස් ලබා දී එය දැනට ක්‍රියාත්මකව පවතී.

(ඉ) **(1) i). වී කෙටීමේ මෝල සවිකිරීමේ ගොඩනැගිල්ල**

කලාපය තුළ දුගී බව පිටුදැකීමේ සංකල්පය යටතේ සහල් නිෂ්පාදන ගම්මාන ව්‍යාපෘතියක් 2018 වසරේදී ආරම්භ කිරීමට හා ඒ සඳහා ප්‍රතිපාදන ද මේ වන විට අනුමත කර ඇත. ඒ අනුව මෙම ගොඩනැගිල්ල ඵලදායී ලෙස ප්‍රයෝජනයට ගැනීමට කටයුතු යොදා ඇත.

**ii). සංචාරක බංගලාව**

කාමර 10 ක් සහිත සංචාරක බංගලාව ඉදිකිරීමෙන් අනතුරුව “එල් “කලාපය වෙත පැමිණෙන නව නිලධාරීන් හට නිල නිවාස ලබා දෙන තුරු නවාතැන් පහසුකම් ලබා දීම වෙනුවෙන් යොදා ගන්නා අතර පැරණි සංචාරක බංගලාවේ ඉඩ පහසුකම් නොමැති සෑමවිටම මෙම සෑම නිවසකම නවාතැන් පහසුකම් වෙනුවෙන් යොදා ගනු ලැබේ. ඒ බැවින් මෙම ගොඩනැගිල්ල නිශ්කාර්යව නොපවතින අතර ප්‍රයෝජනය සඳහා ගත හැකි සෑම විටම මෙය යොදා ගනු ලැබේ.

කාමර 10 ක් සහිත සංචාරක බංගලාව ගොඩනැගිල්ලෙහි ඉදි කිරීම් කටයුතු අවසානයේ නඩත්තු කාලසීමාව තුල ඇති වූ දෝෂ නිවැරදි කිරීමට ලිඛිතව දන්වා ඇති අතර, කොන්ත්‍රාත්කරු නඩත්තු කටයුතු කිරීමට අපොහොසත් විය. ඉන්පසු එම නඩත්තු කටයුතු සඳහා ඇස්තමේන්තුවක් සකස් කර එම මුදල් රැඳවුම් මුදල් මගින් කපා ගැනීමටත් ඉන්පසු එම මුදල් මගින් දැනට පවතින ගොඩනැගිල්ලේ අඩුපාඩු සකස් කිරීමටත් අදහස් ඇතිව ඒ සඳහා අනුමැතිය ලබා ගන්නා ලදී. සුළු අඩුපාඩු 2018 මාර්තු වන විට අවසන් කර භාර දිය හැකි බව දන්වමි.

**iii). ගව ගාල සඳහා වූ ගොඩනැගිලි**

සත්ත්ව ගොවිපල සංවර්ධනය කරන අවස්ථාවේදී ගොවිපලේ ඇති කරනු ලැබූ ගවයින් උසස් ආරයේ වැඩි නිෂ්පාදනයක් සහිත සතුන් නොවීය. එබැවින් එම සතුන් ජාතික පශු සම්පත් මණ්ඩලයේ අනුමත මිල ගණන්වලට මිල තීරණය කිරීමේ කමිටුවක් මගින් අලෙවි කරන ලදී. ඉන්පසුව 2016 වාර්ෂික වැඩ සැලැස්මේ අනුමත මූල්‍ය ප්‍රතිපාදනවලින් වැඩි නිෂ්පාදනයක් සහිතව උසස් ආරයේ කිරි ගවයින් 06 දෙනෙක් මිල දී ගන්නා ලදී. මහවැලි ගොවිපලවල් සඳහා යොදවා ගත්

ශ්‍රමිකයන් සීමා කිරීමත් මිල දී ගත් ගවයින් අභිජනනයෙන් උසස් ආරයේ පැටව් නිෂ්පාදනය මගින් ගොවිපලේ සතුන් සංයුතිය වැඩි කිරීමේ අරමුණ හේතුවෙන් සතුන් මිල දී ගැනීම 06 කට සීමා විය. මේ වන විට එළදෙනුන් 6ක් (05 ක් ගැබ් ගෙන ඇත) පුන් ගවයින් 01 ක් හා මී ගවයින් 10 ක් ලෙස මුළු ගණන 17 ක් වේ.

**(2)** මහවැලිතැන්න ඒකකයේ ප්‍රාථමික පාසල් ගොඩනැගිල්ල හා වැසිකිළි පද්ධතිය භාර ගන්නා ලෙස මනම්පිටිය කලාප අධ්‍යාපන අධ්‍යක්ෂ වෙත ලිඛිතව සහ වාචිකව දැනුම් දෙන ලදී. එහිදී 2018 වර්ෂයේදී පාසල ආරම්භ කිරීමට කටයුතු යොදා ඇති බවත් ඒ අනුව ඉදිරියේදී අදාළ ගොඩනැගිලි භාර ගැනීමට කටයුතු කරන බවත් ප්‍රකාශ කර ඇත. කෙසේ නමුත් 2018-01-29 දින මේ පිළිබඳව මනම්පිටිය කලාප අධ්‍යාපන අධ්‍යක්ෂ කාර්යාලයට ගොස් විමසීමේදී ගොඩනැගිල්ල භාර ගැනීම ඉදිරි මාසයේදී සිදු කරන බව දැනුම් දෙන ලද බව දන්වමි.

(ඊ) එලදායී කාර්යයක මෙම භාණ්ඩ යෙදවීමට කටයුතු කරන ලෙස නේවාසික ව්‍යාපෘති කළමනාකරු (එච් කලාපය) වෙත උපදෙස් ලබා දී ඇත.

(උ) **බෙදාදීමට ලබා ගත් උපකරණ හා ද්‍රව්‍ය**

ගබඩාව තුළ ඇති එම ද්‍රව්‍ය 2013 වර්ෂයේ නව පදිංචිකරුවන් හට ලබා දීම සඳහා ප්‍රධාන කාර්යාලයෙන් මිල දී ගෙන එල් කලාපය වෙත ලබා දුන් ද්‍රව්‍යයන් වන අතර ඒවා එම පදිංචිකරුවන්ට මුල් අවස්ථාවේදී ලබා දුන් ද්‍රව්‍යයන් වේ. අපේක්ෂිත ප්‍රමාණයට නැවත පදිංචිකරුවන් නොපැමිණීම නිසා ගබඩාව තුළ එම ද්‍රව්‍ය එම ප්‍රමාණවලින් ඉතිරි විය. කෙසේ නමුත් වෙහෙරතැන්න කොට්ඨාශයේ මහවැලි ජනපදිකයන් ලෙසට ඇතුළත් කොට ගත් බෝගස්වැව ඒකකයේ ජනපදිකයන් හට බෙදාදීමට කටයුතු කරගෙන යන අතර තවදුරටත් ඉතිරි ද්‍රව්‍ය පවතී නම් එම ද්‍රව්‍ය අවශ්‍ය වෙනත් කලාප වෙත ලබා දීමට කටයුතු කරන බව දන්වමි.

(ඌ) සහා (එ) මෙම සමාගම් සඳහා නව ආයෝජනයක් ලෙස රාජ්‍ය- පෞද්ගලික හවුල් ව්‍යාපාරයක් ලෙස පවත්වා ගෙන යාමට (PPP) ඉදිරි කටයුතු කරගෙන යයි.

## 4.6. හඳුනා ගන්නා ලද පාඩු

(අ) සී/ස මහවැලි උපදේශක සේවා කාර්යංශය (පෞද්ගලික) සමාගම 2016.12.31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳ විගණකාධිපති වාර්තාව සඳහා ඔබ වෙත ලබා දී ඇති 2017.06.28 දිනැති පිළිතුරු මඟින් මේ තත්ත්වය පිළිගෙන ඉදිරියේදී නිසි පරිදි ව්‍යවස්ථාපිත ගෙවීම් සිදු කරන බව දැනුම් දී ඇත. ඒ පිළිබඳව සොයා බලා කටයුතු කිරීමට සටහන් කර ගනිමි.

(ආ) නළ ළිං සඳහා විදුලි බල මණ්ඩලයේ ඇස්තමේන්තු ලබා දෙන ලද්දේ 2016 වර්ෂයට අදාළ වන පරිදි වන අතර එය රු. 46,526,370.48 කි. 2016 වර්ෂයේ එම සම්පූර්ණ ඇස්තමේන්තුගත මුදල ගෙවීමට ප්‍රමාණවත් අරමුදල් භාණ්ඩාගාරය වෙතින් නොලැබුණි. එයින් රු. 25, 202,878.68 ක මුදලක් 2016 වර්ෂයේදී ගෙවූ අතර, ඉතිරි මුදල් ගෙවීමට සිදු වූයේ 2017 වර්ෂයේ මුදල් ලැබුණු පසුවය. නමුත් විදුලිබල

මණ්ඩලයේ නීති රීති අනුව මුළු මුදලම ගෙවන තුරු ඇස්තමේන්තුවට අදාලව වැඩ කටයුතු ආරම්භ කිරීමට හැකියාවක් නොමැති බව පවසන ලදී. ඒ අනුව 2017 වර්ෂයේ මිල ගණන් සංශෝධනයවීමත් සමග 2016 වර්ෂයේ සකස් කරන ලද මුළු ඇස්තමේන්තුවටම මිල ගණන් සංශෝධනය සිදු කර ඇත. ඒ අනුව රු. 1,282,081.58 අමතර මුදලක් ගෙවීමට සිදු වූ බව දන්වමි.

2016 වර්ෂයේ විදුලිබල මණ්ඩලය විසින් අප වෙත එවා තිබූ රු. 45,526,370.48ක ඇස්තමේන්තුව ගෙවීමට අප සතුව මුදල් තිබුණේ නම් මෙම අමතර මුදල ගෙවීමට සිදු නොවන බව කාරුණිකව දන්වමි.

## 4.7. ප්‍රසම්පාදන හා කොන්ත්‍රාත් ක්‍රියාවලිය.

(අ) වැලිඔය ගජබාපුර ග්‍රාමයේ සිට නැදුන්කර්නි නගරය දක්වා මාර්ගය වැඩි දියුණු කිරීම අමාත්‍ය මණ්ඩල අනුමැතිය මත සෘජුවම මාර්ග සංවර්ධන අධිකාරියට පවරා ඇත. ඒ අනුව පළමුව බෝක්කු සහ පාළම් ඉදි කිරීම සිදු කර ඇත. 2017 අප්‍රේල් වන විට රු. 390, 085,714.00 ක් ගෙවීම් කර ඇත්තේ ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය විසින් මාර්ග සංවර්ධන අධිකාරියට වන අතර ඒ අතර අදාළ කොන්ත්‍රාත් සමාගම වැඩ නිම කරන අයුරින් මාර්ග සංවර්ධන අධිකාරිය කොන්ත්‍රාත්කරු හට ගෙවීම් සිදු කර ඇත. ගිවිසුම් ප්‍රකාරව 2017 මැයි මස 09 වන දින කොන්ත්‍රාත්තුව අවසන් කල යුතු වුවත් කොන්ත්‍රාත්තුවට බොරලු සපයා ගැනීමේ අපහසුතාවය මත කොන්ත්‍රාත් කාලය දීර්ඝ කර ඇත. මේ බව දන්වා 2017 මැයි මස 03 වන දින මාර්ග සංවර්ධන අධිකාරිය විසින් ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය වෙතද ලිපියක් යොමු කර ඇති බව දන්වමි.

(ආ) සහ (ඇ)

මේ සම්බන්ධව ක්ෂේත්‍ර පරික්ෂණයක් සිදු කර ඉදිරි කටයුතු කරන ලෙස අධ්‍යක්ෂ (කෘෂිකර්ම) හා නේවාසික ව්‍යාපෘති කළමනාකාර (L කලාපය) වෙත උපදෙස් දුන් අතර ඒ සම්බන්ධව ඔවුන් ඉදිරිපත් කල වාර්තාව අනුව ඉදිරි කටයුතු සිදු කරන බව දන්වමි.

(ඇ) මේ පිළිබදව සොයා බලා ඉදිරියේදී කටයුතු කරමි.

## 4.8. වාහන උපයෝජනය

(අ) ශ්‍රී ලංකා මහවැලි අධිකාරියේ අරමුණුගත කාර්යයන් බහුල වශයෙන් ක්ෂේත්‍රය හරහා සිදු වන බැවින් එම කටයුතු සඳහා නිලධාරීන්හට නිරන්තරව ක්ෂේත්‍රයට යාමට සිදු වේ. ඒ හේතුව නිසා සෑම කලාපයකම / අංශයකම වාහනවල දැඩි අවශ්‍යතාවයක් පවතී. එහෙත් අධිකාරිය සතු වාහන බොහොමයක් දැනට වසර 20කට වඩා පැරණි වුව ද අළුතින් වාහන මිල දී ගැනීමට රජය මගින් ප්‍රතිපත්තිමය වශයෙන් අනුමැතිය ලබා නොදීම මත ඉහත අවශ්‍යතාවය වෙනුවෙන් පැරණි වාහන හෝ භාවිතයට ගැනීමට සිදු වේ. කෙසේ නමුත් 2017 වසරේදී වාහන 48 ක් පමණ විධිමත් අපහරණ ක්‍රමවේදය යටතේ අපහරණය කිරීමට කටයුතු කර ඇත.

(ආ) මූලික වැඩ පාලන ක්‍රියාකරවුම් හා නඩත්තු ඒකකය මගින් අපහරණය සඳහා යොමු කරන ලද වාහන අතරින් 50-2641, 36-3573, 42-0889 යන වාහන 2017 වර්ෂයේදී අපහරණය කර ඇත. අනිකුත් වාහන ලියාපදිංචි හිමිකම හා ලියාපදිංචි විස්තර සමඟ නොගැලපීම හේතුවෙන් 2017 වසරේදී අපහරණය කිරීමට නොහැකි විය. එහෙත් 2018 වර්ෂයේදී අපහරණය සඳහා දැනටමත් කටයුතු කරමින්

පවතී. එම වාහන ලියාපදංචි වී ඇත්තේ උපදේශක සේවා සපයන ලද ආයතන IAZAMATODA – SKANSKA නම් වලිනි. දැනට මෙම ආයතන ද ශ්‍රී ලංකාව තුළ නැත. එහෙයින් මුදල් අමාත්‍යාංශය තුළ සංස්ථාපනය කර ඇති කොන්ප්ට්‍රෝලර් ජනරාල් කාර්යාලය හරහා ක්‍රියාත්මක වෙමින් උක්ත වාහන අපහරණය කිරිමට කටයුතු කරන බව දන්වමි.

(ආ) බාහිර පාර්ශවයන්ට තාවකාලිකව ලබා දී ඇති වාහන ආපසු ලබා දෙන ලෙස පළමු පියවර වශයෙන් ඔවුන් වෙත දැනුම් දී ඇති අතර එසේ ලබා නොදෙන්නේ නම් මුදල් අමාත්‍යාංශය යටතේ පිහිටුවා ඇති කොන්ප්ට්‍රෝලර් ජනරාල් කාර්යාලය හරහා එම වාහන වල හිමිකම් නිවැරදි කර ගැනිමට හෝ ආපසු ලබා ගැනීමට කටයුතු කරමි.

## 4.9. ප්‍රමාද වූ ව්‍යාපෘති

(අ) ව්‍යාපෘතියේ ප්‍රධාන අරමුණ වන වැව් බැම්ම ඉදි කිරිම සඳහා EIA අනුමැතිය ලබා ගත යුතු වුවත් එය මේ වන තෙක් ලැබි නොමැත. නමුත් ලබා දුන් ප්‍රතිපාදන තුලින් ව්‍යාපෘති බල ප්‍රදේශයේ යටිතල පහසුකම් වැඩි දියුණු කිරිම ,ගම්මාන සංවර්ධනය කිරිම , නිල නිවාස හා කාර්යාල ඉදි කිරිම සිදු කල බව දන්වමි.

(ආ) මේ සම්බන්ධව ක්ෂේත්‍ර පරික්ෂණයක් සිදු කර ඉදිරි කටයුතු කරන ලෙස අධ්‍යක්ෂ (කෘෂිකර්ම) හා නේවාසික ව්‍යාපෘති කළමනාකාර (L කලාපය) වෙත උපදෙස් දුන් අතර ඒ සම්බන්ධව ඔවුන් ඉදිරිපත් කල වාර්තාව අනුව ඉදිරි කටයුතු සිදු කරන බව දන්වමි.

## 4.10. වෙනත් රාජ්‍ය ආයතන වෙත ලබා දුන් අධිකාරියේ සම්පත්

(අ) **i)** බාහිර ආයතන වෙත නිදහස් කර ඇති සේවකයන් අතුරින් ආරක්ෂක අමාත්‍යාංශයට හා ජනාධිපති ලේකම් කාර්යාලයට මුදා හල සේවකයන්ගේ මුදාහැරීම් ලිපියෙහි වැටුප් හා දීමනා තවදුරටත් ශ්‍රී ලංකා මහවැලි අධිකාරියෙන් ගෙවීමේ පදනම මත නිදහස් කර ඇත.

ආපදා කළමනාකරණ අමාත්‍යාංශයට නිදහස් කර සේවකයන්ගේ වැටුප් හා දීමනා ප්‍රතිපූර්ණය කර ගැනීම සඳහා අදාල අමාත්‍යාංශය වෙත දැනුම් දී ඇත.

මහවැලි සංවර්ධන හා පරිසර අමාත්‍යාංශය, රාජ්‍ය අමාත්‍යාංශය හා නියෝජ්‍ය අමාත්‍ය කාර්ය මණ්ඩලය වෙත නිදහස් කල නිලධාරින් සම්බන්ධයෙන් ඔවුන්ගේ වැටුප් තවදුරටත් මෙම අධිකාරියෙන් ගෙවීමට කටයුතු කර ඇති අතර රේඛීය අමාත්‍යාංශයට , රාජ්‍ය අමාත්‍යාංශයට හා නියෝජ්‍ය අමාත්‍ය කාර්ය මණ්ඩලයට නිදහස් කර ඇති සේවකයන් සඳහා ගෙවා ඇති අතිකාල හා ගමන් වියදම් ප්‍රතිපූර්ණය කර ගැනීමට කටයුතු කර ඇත.

**ii)** රේඛිය අමාත්‍යාංශය , ජනාධිපති ලේකම් කාර්යාලය හා ආරක්ෂක අමාත්‍යාංශය වෙත අනුයුක්ත නිලධාරින් වෙනුවෙන් ගෙවන ලද අතිකාල, සංයුක්ත දීමනා , ගමන් වියදම් දීමනා ප්‍රතිපූර්ණය කිරිම මේ වන විටත් සිදු වෙමින් පවතී.

(ආ) මෙම සේවකයාගේ වැටුප් හා දීමනා මෙම අධිකාරියෙන් තවදුරටත් ගෙවීමේ පදනම මත නිදහස් කර ඇති බැවින් අදාල අය කර ගැනීම් සිදු කිරිමට කටයුතු කර නොමැති බව දන්වමි.

## 4.11.කාර්යය මණ්ඩලය පරිපාලනය

(අ),(ආ) සහ (ඇ)

**2016.12.31 වන දින වන විට අනුමත කාර්යය මණ්ඩලය හා තථ්‍ය කාර්යය මණ්ඩලය පිළිබඳ විස්තර**

| අනු අංකය | සේවා කාණ්ඩය | අනුමත සේවක සංඛ්‍යාව | තථ්‍ය සේවක සංඛ්‍යාව | අතිරික්ත/ (පුරප්පාඩු) |
|---|---|---|---|---|
| 1 | ජ්‍යෙෂ්ඨ කළමනාකාර මට්ටම | 33 | 21 | (12) |
| 2 | මධ්‍ය කළමනාකාර මට්ටම | 442 | 337 | (105) |
| 3 | කණිෂ්ඨ කළමනාකාර මට්ටම | 362 | 298 | (64) |
| 4 | වෙනත් (MA 3 - PL 1 දක්වා) | 3787 | 3864 | 77 |
| 5 | වෙනත් (තාවකාලික) | - | 41 | - |

ශ්‍රී ලංකා මහවැලි අධිකාරියේ 2016.12.31 වන දින වන විට උක්ත කාර්යය මණ්ඩලය සේවයේ යෙදී සිටි අතර, ජ්‍යෙෂ්ඨ කළමනාකාර මට්ටමේ තනතුරු 117 ක් හා කණිෂ්ඨ කළමනාකාර මට්ටමේ තනතුරු 64 ක් පුරප්පාඩුව පැවතිණි.

කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව විසින් 2011.08.22 හා 2012.12.19 වන දින ලිපි මඟින් උපදෙස් හා විධිවිධාන ලබා දෙමින් අනුමත කර එවන ලද සේවක සංඛ්‍යාවට අදාළව බඳවා ගැනීමේ පරිපාටිය සකස් කර 2013 වර්ෂය වන විට කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවෙන් අනුමත කර ගෙන අවසන්ව තිබුණ ද, නැවතත් කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අංක. DMS/G2/15/02(TEM) හා 2013.10.31 වන දිනැති ලිපියෙන් බඳවා ගැනීමේ පරිපාටිය අදාළ ආකෘතිපත්‍ර භාවිතා කරමින් සංශෝධනය කර අනුමත කර ගන්නා ලෙස දන්වා එවන ලදි. ඒ අනුව විටින් විට විවිධ සංශෝධනයන් කරමින් ශ්‍රී ලංකා මහවැලි අධිකාරියේ සියලුම සේවා ගණයන්හි බඳවා ගැනීමේ පරිපාටිය සංශෝධනය කර කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවෙන් 2016.09.26 වන දින වන විට අනුමත කර ගන්නා ලද අතර, ඒ වන විට බඳවා ගැනීමේ පරිපාටියේ සඳහන් තනතුරු පුරප්පාඩු පිරවීමට කඩිනමින් කටයුතු කරන ලදි. මේ අනුව බඳවා ගැනීමේ පටිපාටිය කොටස් වශයෙන් වරින්වර සංශෝධනය කරවීම හා අනුමත කිරීමට සිදුවීම නිසා අදාල වර්ෂය තුල පැවති පුරප්පාඩු සඳහා සම්පූර්ණයෙන් බඳවා ගැනීමට නොහැකි විය.

2017 වර්ෂය අවසන් වන විට අභ්‍යන්තර තනතුරු උසස්වීම් 212 ක් හා බාහිර නව බඳවා ගැනීම් 268 ක් ලබා දීමට කටයුතු කරන ලදි. ඉන් ජ්‍යෙෂ්ඨ කළමනාකාර මට්ටමේ අභ්‍යන්තර තනතුරු උසස්වීම් 25 ක් හා බාහිර නව බඳවා ගැනීම් 46 ක් සිදු කිරීමට කටයුතු කර ඇත. තවද කණිෂ්ඨ කළමනාකාර මට්ටමේ අභ්‍යන්තර තනතුරු උසස්වීම් 64 ක් හා බාහිර නව බඳවා ගැනීම් 04 ක් සිදු කිරීමට කටයුතු කරන ලදි.
එසේ ම වෙනත් වශයෙන් දක්වා ඇත්තේ ආශ්‍රිත නිලධාරි (MA 3) සේවා ගණයේ සිට ප්‍රාථමික ශිල්පීය නොවන (PL 1) සේවා ගණයේ සේවකයින් පිළිබඳ තොරතුරු වන අතර, එම තොරතුරු අනුව 77 ක අතිරික්ත සේවක සංඛ්‍යාවක් පෙන්නුම් කරනු ලබයි.

රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක. 25/2014 හා 25/2014 (I) අනුව ශ්‍රී ලංකා ලංකා මහවැලි අධිකාරියේ කළමනාකරණ සහකාර (තාක්ෂණික නොවන) සේවා ගණයේ (MA 1-2) සිට ප්‍රාථමික ශිල්පීය නොවන සේවා ගණය (PL 1) දක්වා අඛණ්ඩව දින 180 ක සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර ඇති සේවකයින්ට ස්ථිර පත්වීම් ලබා දෙන ලදි.

ඒ අනුව ඊට අදාළ සේවක සංඛ්‍යාව කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවෙන් අනුමත කර ගන්නා ලෙස දන්වා ඇති අතර, ඒ අනුව සේවක සංඛ්‍යාව සංශෝධනය වී නොමැති බැවින් ඔවුන් අතිරික්තව සිටියි. එසේම සමහර තනතුරුවල එවකට සිටි ස්ථිර සේවක සංඛ්‍යාවට වඩා තනතුරු සඳහා අනුමත කර තිබූ බැවින් අතිරික්තව පැවතුනි. මේ අනුව ඉදිරියේදී ඔවුන් විශ්‍රාමයාමත් සමඟ අනුමත සංඛ්‍යාව සමාන වනු ඇත.

ඉහත 41 ක සංඛ්‍යාවට පශු සම්පත් සංවර්ධන සහකාර පුහුණුලාභීන්, ද්විතීයන මට්ටමේ නිලධාරීන් හා කොන්ත්‍රාත් පදනම මත බඳවා ගත් නිලධාරීන්/ සේවකයින් ඇතුළත්ව ඇත.

(ඈ) සහ (ඉ) පිළිගනිමි.

නිශ්චිත කාර්යය මණ්ඩලයක් හා ඊට අදාළ බඳවා ගැනීමේ කාර්යය පටිපාටියක් පිළියෙළ කර කළමණාකරණ සේවා දෙපාර්තමේන්තු අනුමැතිය ලබා ගැනීමට කටයුතු කරන බව අදාළ සමාගම්වල සභාපතිවරු වෙත දැනුම් දී ඇත.

(ඊ) මෙම තත්වයන් විධිමත් කිරීමට කටයුතු කරගෙන යන බව දන්වමි.

**05. ගිණුම් කටයුතුභාවය හා යහපාලනය**

**5.1. මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම**

පිළිගනිමි.

ශ්‍රී ලංකා මහවැලි අධිකාරියේ අවසන් ගිණුම් නියමිත කාලය තුල පිළියෙල කර අවසන් කර තිබුණ ද එහි පරිපාලිත සමාගම්වල පැවති ගිණුම්මය දෝෂ නිසා ඒවා නිවැරදි කර විගණකාධිපති වෙතින් විගණනය කරන ලද අවසන් ගිණුම් අප වෙත ඉදිරිපත් කරන තුරු ශ්‍රී ලංකා මහවැලි අධිකාරියේ ගිණුම් හා පරිපාලිත සමාගම්වල ගිණුම් ඒකාබද්ධ කර ඒකාබද්ධ අවසාන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඉදිරිපත් කිරීමට ප්‍රමාද විය.

**5.2. සංයුක්ත සැලැස්ම**

පිළිගනිමි.

ඉදිරියේදී මෙම තත්ත්වය නිවැරදි කිරීමට කටයුතු කරමි.

**5.3. ක්‍රියාකාරී සැලැස්ම**

(අ) පිළිගනිමි.

(ආ) පිළිගනිමි.

**5.4. අභ්‍යන්තර විගණනය**

අධ්‍යක්ෂ (අභ්‍යන්තර විගණන) තනතුර සඳහා 2016-09-29 වන දින අභ්‍යන්තරින් හා 2016-07-01 බාහිරින් අයදුම්පත් කැඳවන ලද අතර අනුමත බඳවා ගැනීමේ පරිපාටියට අනුව අදාල සුදුසුකම් අයදුම්කරුවන් අතරින් එක් අයදුම්කරුවෙකු වත් සපුරා නොමැත. එසේ හෙයින් මේ වන රාජකාරි ඉටු කිරීමට නිලධාරියෙක් පත් කර ඇත. එහෙත් මේ වන විට අධ්‍යක්ෂ (අභ්‍යන්තර විගණන) තනතුර සඳහා නිළධාරිනියක් ස්ථිර පදනමින් පත්කර ඇත

**5.5. අය වැය ලේඛනයමය පාලනය**

අය වැය ලේඛනය ඵලදායී කළමණාකරණ පාලන කාරකයක් ලෙස යොදා ගැන්මට ඉදිරියේදී කටයුතු කරමි.

**5.6. නොවිසඳී ඇති විගණන ඡේද**

(අ) මේ පිළිබඳව ඉදිරි ක්‍රියාමාර්ග ගැනීමට සටහන් කර ගන්නා ලදී.
(ආ) මේ පිළිබඳව ඉදිරි ක්‍රියාමාර්ග ගැනීමට සටහන් කර ගන්නා ලදී.

**6. පද්ධති හා පාලනයන්**

(අ) සිට (ඊ) විශේෂ අවධානයට යොමු කර කටයුතු කිරීමට සටහන් කර ගන්නා ලදී.

ආචාර්ය ඩී.එම්.එස්.දිසානායක,
අධ්‍යක්ෂ ජනරාල්,
ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය.

පිටපත - ලේකම් - මහවැලි සංවර්ධන හා පරිසර අමාත්‍යාංශය - කා.දැ.ගැ.ස.
ලේකම්- මුදල් හා ජන මාධ්‍ය අමාත්‍යාංශය - කා.දැ.ගැ.ස.
අධ්‍යක්ෂ (අභ්‍යන්තර විගණන) - දැ.ගැ.පි. සහ අ.ක.ස

# ශ්‍රී ලංකා මහවැලි අධිකාරියේ කාර්යසාධන වාර්තාව

# ආයෝජන සැලැස්ම

# 2016

## 1. 2016 වසර තුළ සිදු කරන ලද සංවර්ධන ක්‍රියාකාරකම්

### 1.1 සමුච්චිත මූල්‍ය ප්‍රගතිය

2016 වර්ෂය සඳහා ප්‍රාග්ධන අය වැය ප්‍රතිපාදන (සංශෝධිත) රු. මි. 3,775 වේ. මෙයට අමතරව විදෙස් අධාර ව්‍යාපෘතීන් වන මොරගහකන්ද කළුගඟ සංවර්ධන ව්‍යාපෘතිය (ඔපෙක් , කුවේට්, චීනය) ,වේලි ආරක්ශණ හා ජල සම්පත් කළමනාකරණ ව්‍යාපෘතිය (ලෝක බැංකුව), උමාඔය බහුකාර්ය සංවර්ධන ව්‍යාපෘතිය (ඉරානය) හා දේශගුණික අවබලපෑම් අවම කිරීමේ ව්‍යාපෘතිය (ලෝක බැංකුව) ආදී ව්‍යාපෘතීන් මහවැලි සංවර්ධන කලාප ආවරණය කරමින් ක්‍රියාත්මක කෙරේ.ඒ අනුව 2016 වර්ෂය සඳහා මූල්‍යගත මුලු ප්‍රාග්ධන ආයෝජනය රු.මි. 46,621 කි. මුදල් වර්ෂය සඳහා මූල්‍ය ප්‍රගතිය පහතින් දක්වා ඇත.

රු. මිලියන

| විස්තරය | අය වැය ප්‍රතිපාදන | මුදා හරින ලද මුදල (2016 දෙසැම්බර් අග වන තුරු) | වියදම (2016 දෙසැම්බර් අග වන තුරු) |
|---|---|---|---|
| **මහවැලි ව්‍යාපෘති** | **44,621.00** | **31,335.89** | **31,308.31** |
| මහවැලි ඒකාබද්ධ ව්‍යාපෘතිය (ඒ.අ ) | 500.00 | 499.00 | 494.22 |
| බී කලාපයේ මාදුරුඔය දකුණු ඉවුරු සංවර්ධන ව්‍යාපෘතිය (ඒ.අ ) | 225.00 | 192.10 | 182.85 |
| රිදීමාලියද්ද ඒකාබද්ධ සංවර්ධන ව්‍යාපෘතිය (ඒ.අ ) | 120.00 | 100.29 | 99.98 |
| වැලිඔය ඒකාබද්ධ සංවර්ධන ව්‍යාපෘතිය - එල් කලාපය (ඒ.අ ) | 605.00 | 580.50 | 580.50 |
| මහවැලි ගැටඔේ හං ඉවුර ආරක්ෂාකිරීමේ වැඩසටහන ක්‍රියාවට නැංවීම (ඒ.අ ) | 125.00 | 63.00 | 63.00 |
| හදිසි යටිතල පහසුකම් ප්‍රතිසංස්කරණය ඇතුළු විශාල හා මධ්‍යම වාරිමාර්ග ව්‍යාපෘති ප්‍රතිසංස්කරණය කිරීම (ඒ.අ ) | 200.00 | 191.45 | 178.21 |
| * මොරගහකන්ද කළුගඟ සංවර්ධන ව්‍යාපෘතිය (වි.ණ ),(ප්‍ර.වි ),(වි.අ ) | 22,500.00 | 19,797.5 | 19,797.5 |
| * වේලි ආරක්ශණ හා ජල සම්පත් කළමනාකරණ ව්‍යාපෘතිය (මහවැලි කොටස) (වි.ණ ), (වි.අ ) | 709.00 | 1,099.00 | 1,099.00 |
| * උමාඔය බහුකාර්ය සංවර්ධන ව්‍යාපෘතිය (වි.අ ) | 19,176.00 | 8,354.05 | 8,354.05 |
| ** දේශගුණික අවබලපෑම් අවම කිරීමේව්‍යාපෘතිය ( මහවැලි කොටස ) (වි.ණ ), (වි.අ ) | 461.00 | 459.00 | 459.00 |
| **පරිපාලන හා නඩත්තු (ඒ.අ )** | **2,000.00** | **1,053.00** | **1,663.38** |
| **එකතුව** | **46,621.00** | **32,388.89** | **32,971.69** |

*මහවැලි සංවර්ධන කලාප තුළ මෙම ව්‍යාපෘති ක්‍රියාත්මක කෙරෙන අතර සෘජුවම මහවැලි සංවර්ධන හා පරිසර අමිත්‍යාංශය මගින් අධික්ෂණය කරනු ලැබේ. කටයුතු සාර්ථකව අවසන් කිරීමෙන් අනතුරුව සියලුම ව්‍යාපෘති ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය වෙත භාර දෙනු ලැබේ.

**මෙම ව්‍යාපෘතීන් සෘජුවම මහවැලි සංවර්ධන හා පරිසර අමිත්‍යාංශය යටතේ මහවැලි කලාපවල අර්ධ වශයෙන් ක්‍රියාත්මක කරනු ලැබේ.

ඒ.අ –ඒකාබද්ධ අරමුදල්, වි.ණ – විදේශ ණය, ප්‍ර.වි – ප්‍රතිපූර්ණය කළ හැකි විදේශ ණය, වි.අ – විදේශ අරමුදල්

## 1.2. මහවැලි ව්‍යාපෘති

### 1.2.1

**මහවැලි ඒකාබද්ධ ව්‍යාපෘතිය**

මූල්‍ය ප්‍රතිපාදන : දේශීය අරමුදල්

ඇස්තමේන්තු පිරිවැය : රු.මි 4,910 (සංශෝධිත අයවැය)

ව්‍යාපෘති කාලසීමාව : 2007-2018

මහවැලි ඒකාබද්ධ ව්‍යාපෘතිය වාරි ජල සැපයුම සුරක්ෂිත කරමින් කෘෂි ආර්ථිකය නැංවීම හරහා මාදුරුඔය වම් ඉවුර ප්‍රදේශයේ වෙසෙන ග්‍රාමීය ප්‍රජාවගේ ආර්ථිකය සංවර්ධනය කිරීම අරමුණු කර ආරම්භ කරන ලදි. ව්‍යාපෘති ක්‍රියාකාරකම් යටතට 1986 - 1986 කාලයේ ඉදිකරන ලද වාරිමාර්ග පද්ධති ප්‍රතිසංස්කරණය කිරීම ඇතුලත් වේ. (අ) මාදුරු ඔය දකුණු ඉවුර වාරිමාර්ග ප්‍රතිසංස්කරණය යටතේ යටතේ කි. මී. 52 ක් වන ප්‍රධාන ඇල, කි. මී. 65 ක් වන ශාඛා ඇලවල්, කි. මී. 459 ක් වන බෙදාහැරීමේ ඇලවල්, කි. මී. 1,138 ක් වන කෙත් ඇලවල්, කි. මී. 54 ක් වන පරිවහන ඇලවල්, කි. මී. 80 ක් ග්‍රාමීය මාර්ග මෙහෙයුම් හා නඩත්තු කටයුතු, හා කුඩා වැව් ප්‍රතිසංස්කරණ කටයුතු ඇතුළුව ජල කළමනාකරණය සඳහා මාදුරුඔය වම් ඉවුරේ 1981 – 1986 කාලය තුල ඉදිකරන ලද වාරිමාර්ග ජාලය ප්‍රතිසංස්කරණය කිරීම (ආ) ග්‍රාමීය ස්වයං ආධාරක ව්‍යාපෘති යටතේ ගොඩනගන ලද තෝරාගත් ජල සැපයුම් සේවා විධිමත් කර ප්‍රවර්ධනය කිරීම (ඇ) කෘෂිකාර්මික සංවර්ධනය උදෙසා සහය ලබා දීම මෙන්ම ගොවි සංවිධාන ශක්තිමත් කිරීම හා (ඈ) යෝග්‍ය පාරිසරික සංරක්ෂණ වැඩසටහන් ක්‍රියාත්මක කිරීම ඇතුළත් වේ.

2016 වර්ෂය සඳහා මූල්‍ය ප්‍රතිපාදන (සංශෝධිත) රු. මි. 500 ක් වන අතර 2016 වර්ෂය තුළදී රු. මි. 494.21

| අනු අංක | ක්‍රියාකාරකම් | ඒකකය | භෞතික ප්‍රගතිය 2016 ජනවාරි සිට දෙසැම්බර් දක්වා |
|---|---|---|---|
| 01 | කෙත් ඇල ඉදිකිරීම / ප්‍රතිසංස්කරණ කටයුතු | කි.මී | 140 |
| 02 | බෙදුම් ඇල ඉදිකිරීම / ප්‍රතිසංස්කරණ කටයුතු | කි.මී | 11.1 |
| 04 | ග්‍රාමීය වැව් ප්‍රතිසංස්කරණය | සංඛ්‍යාව | 05 |
| 05 | පරිවහන ඇලවල් ඉදිකිරීම | කි.මී | 40.2 |
| 06 | ග්‍රාමීය මාර්ග ප්‍රතිසංස්කරණය | කි.මී | 2.2 |

(99%) ඵලදායී ලෙස භාවිත කර ඇත.









### 1.2.2 බී කලාපයේ මාදුරුඔය දකුණු ඉවුරු සංවර්ධන ව්‍යාපෘතිය (මල්වැන්න සහ මහවැලිතැන්න)

මූලාා ප්‍රතිපාදන : දේශීය අරමුදල්

ඇස්තමේන්තු පිරිවැය : රු.මි.935.49

ව්‍යාපෘති කාලසීමාව : 2014-2018

පොලොන්නරුව හා මඩකලපුව පරිපාලන දිස්ත්‍රික්කයන්හි මහවැලි බී කලාපය ආවරණය කරන සිංහපුර ඉහළ කොටසේ මහවැලිතැන්න සහ මල්වැන්න මහවැලි කලාප පිහිටා ඇති අතර ව්‍යාපෘතිය යටතේ සංවර්ධනය කරනු ලැබේ. මෙම ප්‍රදේශයන්හි ඉකුත් දශක කිහිපයේ පැවති අභ්‍යන්තර අර්බුදකාරී වාතාවරණය හේතුවෙන් නැවත පදිංචි කරුවන් බොහෝමයක් අභ්‍යන්තරික වශයෙන් අවතැන් විය. එහි ප්‍රතිපලයක් ලෙස දළ වශයෙන් නැවත පදිංචි කරවූ පවුල් 1200 ක් පමණ නැවත ඔවුන්ගේ මුල් ගම් බිම් වෙත ගියහ.

අර්බුදකාරී වාතාවරණය සමනය වීමත් සමගම 2014 වර්ෂයේදී මෙම විශේෂ ව්‍යාපෘතිය යටතේ නැවත පදිංචි කිරීම සහ පුනරුත්ථාපන කටයුතු ආරම්භ කරන ලදී. මෙහිදී සිංහපුර කොට්ඨාසයේ මල්වැන්න හා මහවැලිතැන්න ඒකකවල ගෙවතු ඉඩම් 859 ක් හා වාරි ඉඩම් 859 සංවර්ධනය සංවර්ධනය කිරීමට යෝජනා විය. ව්‍යාපෘතියේ ප්‍රධාන කාර්යයන් වශයෙන් (අ) පවුල් 859 ක් සිංහපුර කොටසේ නැවත පදිංචි කිරීම හා පදිංචිය නැවත ස්ථාපිත කිරීම (ආ) දැනට පවත්නා වාරි පදනම් වූ හෙක්ටයාර 521 ක් කෘෂිකර්මාන්තය සඳහා සංවර්ධනය කිරීම හා හෙක්ටයාර 174 ක් වූ ගෙවතු ඉඩම් සංවර්ධනය නිරීම සහ (ඇ) මහවැලිතැන්න වැව හා අනෙකුත් වාරි පද්ධතිය ඉදි කිරීම දක්වා ඇත.

| අනු අංක | ක්‍රියාකාරකම් | ඒකකය | භෞතික ප්‍රගතිය 2016 ජනවාරි සිට දෙසැම්බර් දක්වා |
|---|---|---|---|
| 01 | කැළෑ එළිකිරීම් සහ රළු මට්ටම් | හෙක්. | 37.06 |
| 02 | බෙදුම් ඇල ඉදිකිරීම් කටයුතු | කි.මී. | 3.1 |
| 03 | කෙත් ඇල ඉදිකිරීම් කටයුතු | කි.මී. | 5.85 |
| 04 | පරිවහන ඇලවල් ඉදිකිරීම | කි.මී. | 5.7 |
| 05 | ග්‍රාමීය මාර්ග ඉදිකිරීම් | කි.මී. | 3.34 |

2016 වර්ෂය සඳහා මූල්‍ය ප්‍රතිපාදන (සංශෝධිත) රු. මි. 225 ක් වන අතර 2016 වර්ෂය තුළදී එයින් රු. මි.182.85 (81%) ඵලදායී ලෙස භාවිත කර ඇත.

### 1.2.3 රිදීමාලියද්ද ඒකාබද්ධ සංවර්ධන ව්‍යාපෘතිය

මූල්‍ය ප්‍රතිපාදන : දේශීය අරමුදල්

ඇස්තමේන්තු පිරිවැය : රු.මි.1,100

ව්‍යාපෘති කාලසීමාව : 2012-2018

ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව විසින් සිදු කරන ලද ගෘහස්ථ ආදායම් හා වියදම් සමීක්ෂණයට අනුව බදුල්ල පරිපාලන දිස්ත්‍රික්කයේ රිදීමාලියද්ද ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය ඉතා දුර බැහැර පිහිටි මෙන්ම වඩාත් දරිද්‍රතාවයෙන් යුත් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයක් වශයෙන් හඳුනාගෙන ඇත. එබැවින් ඉහත ප්‍රදේශය සංවර්ධනය කිරීමේ අරමුණින් ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය විසින් පස් අවුරුදු ආයෝජන සැලැස්මක් සකස් කරන ලදි. මෙම ප්‍රදේශයේ යටිතල පහසුකම් වැඩිදියුණු කිරීම හා මෙම ප්‍රදේශයේ වෙසෙන පවුල්වලට කෘෂිකර්මය මත පදනම් වූ ඵලදායී මෙන්ම තිරසාර ආර්ථික ප්‍රවේශයන් විවර කරදීම මෙම ව්‍යාපෘතියේ මූලික අරමුණු වේ. මේ යටතේ (අ) වාණිජ බෝග නිෂ්පාදනය වැඩිදියුණු කිරීම (ආ) පශු සම්පත් සංවර්ධනය (ඇ) ව්‍යවසායකත්ව සංවර්ධනය කෙරෙහි මූලික වශයෙන් අවධානය යොමු කෙරේ.

2016 වර්ෂය සඳහා මූල්‍ය ප්‍රතිපාදන (සංශෝධිත) රු. මි. 120 ක් වන අතර 2016 වර්ෂය තුළදී එයින් රු. මි. 99.97 (83%) භාවිත කිරීමට හැකියාව ලැබී ඇත.

| අනු අංක | ක්‍රියාකාරකම් | ඒකකය | භෞතික ප්‍රගතිය 2016 ජනවාරි සිට දෙසැම්බර් දක්වා |
|---|---|---|---|
| 01 | ග්‍රාමීය මාර්ග ප්‍රතිසංස්කරණය | කි.මී | 10 |
| 02 | වැව් සහ වැව් බැමි ප්‍රතිසංස්කරණය | සං. | 3 |
| 03 | කෘෂි ළිං ඉදිකිරීම | සං. | 40 |
| 04 | ග්‍රාමීය යටිතල පහසුකම් සංවර්ධනය (ගබඩා, සායන ආදිය) | ගොඩනැගිලි | 18 |
| 05 | සනීපාරක්ෂක වැසිකිලි ඉදිකිරීමේ වැඩසටහන | සං. | 300 |
| 06 | පානීය ජල ළිං තැනීම | සං. | 90 |

මෙයට අමතරව ව්‍යාපෘති ප්‍රදේශය තුළ වෙසෙන ජනතාවගේ කුසලතා මෙන්ම පුද්ගල සංවර්ධනය උදෙසා විවිධ විෂයයන් ඇසුරෙන් පුහුණු වැඩ සටහන් 82 ක් පවත්වා ඇත.



දුනුකේවල මාර්ගය ඉදි කිරීම



දෙහිගම පාසල් ගොඩනැගිල්ල

### 1.2.4 වැලිඔය ඒකාබද්ධ සංවර්ධන ව්‍යාපෘතිය - එල් කලාපය

මූල්‍ය ප්‍රතිපාදන : දේශීය අරමුදල්

ඇස්තමේන්තු පිරිවැය : රු.මි.3,957

ව්‍යාපෘති කාලසීමාව : 2012-2018

මෙම ව්‍යාපෘතිය, අනුරාධපුරය, වවුනියා, ත්‍රිකුණාමලය හා මුලිතිවු යන දිස්ත්‍රික්කවලට අයත් හෙක්ටයාර 62,000 කට වඩා වැඩි භූමි ප්‍රමාණයක පැතිර පවත්නා මහවැලි එල් කලාපයේ සංවර්ධන කටයුතු ක්‍රියාවට නැංවීම කෙරෙහි අවධානය යොමු කරයි. ව්‍යාපෘති ප්‍රදේශය කලාප 09 කින් සමන්විත වන අතර 1981 වර්ෂයේදී පවුල් 3,100 පදිංචිකරවමින් 4 සහ 5 කලාප කලාපවල මූලික යටිතල පහසුකම් සැපයීම සම්පූර්ණ කර ඇත. කෙසේ වුවද, 1980 මැද භාගයේ සිට උතුරු, උතුරු මැද හා නැගෙනහිර පළාත්වල පැතිරී තිබූ අනාරක්ෂිත තත්ත්වය හේතුවෙන් ව්‍යාපෘති ප්‍රදේශයේ සංවර්ධන කටයුතු සිදු කිරීමට නොහැකි විය.

ප්‍රදේශයේ ජීවත් වන ජනතාවට දැඩි ලෙස බලපාන අයුරින් ග්‍රාමීය වැව්, වාරි පද්ධතිය, මාර්ග ජාලය මෙන්ම පොදු ගොඩනැගිලි වැනි යටිතල පහසුකම් බෙහෝමයක් ද ත්‍රස්තවාදී කටයුතු හේතුවෙන් දැඩි ලෙස හානියට පත් විය.

මෙම කරුණු හේතු කොට ගෙන (අ) දළ වශයෙන් පවුල් 7,000 ක් පමණ නැවත පදිංචි කරවීම හා (ආ) එම ප්‍රදේශයේ යටිතල පහසුකම් ප්‍රතිසංස්කරණය සිදු කිරීම අරමුණු කොට මෙම ව්‍යාපෘතිය හඳුනවා දී ඇත.

මෙම ව්‍යාපෘතිය සඳහා 2016 වර්ෂයේදී මූල්‍ය ප්‍රතිපාදන (සංශෝධිත) රු.මි. 605 ක් වන අතර 2016 වර්ෂය තුළදී එයින් රු. මි. 580.51 (96%) ඵලදායී ලෙස භාවිත කර ඇත.

| අනු අංක | ක්‍රියාකාරකම් | ඒකකය | භෞතික ප්‍රගතිය 2016 ජනවාරි සිට දෙසැම්බර් දක්වා |
|---|---|---|---|
| 01 | කැළෑ එළිකිරීම් සහ රළු මට්ටම් කිරීම | ඉඩම් කට්ටි | 581 |
| 02 | මාර්ග ප්‍රතිසංස්කරණය | කි.මී. | 40.2 |
| 03 | බෙදුම් ඇළ මාර්ග ඉදිකිරීම හා ප්‍රතිසංස්කරණය | කි.මී. | 5.19 |
| 04 | කෙත් ඇළ මාර්ග ඉදිකිරීම හා ප්‍රතිසංස්කරණය | කි.මී. | 10.52 |
| 05 | පානීය ජල ළිං තැනීම | සංඛ්‍යාව | 100 |
| 06 | කෘෂි ළිං හැරීම හා ඉදි කිරීම | සංඛ්‍යාව | 30 |
| 07 | තවාන් පැටි බෙදා දීම | සංඛ්‍යාව | 10,200 |
| 08 | සනීපාරක්ෂක වැසිකිලි ඉදිකිරීම | සංඛ්‍යාව | 857 |

### 1.2.5 මහවැලි ගැටඹේ ගං ඉවුර ආරක්ෂා කිරීමේ වැඩසටහන

මූල්‍ය ප්‍රතිපාදන : දේශීය අරමුදල්

ඇස්තමේන්තු පිරිවැය : රු.මි.698.97 (සංශෝධිත)

ව්‍යාපෘති කාලසීමාව : 2013-2017

මහනුවර පරිපාලන දිස්ත්‍රික්කයේ පේරාදෙනිය ගැටඹේ ප්‍රදේශයේ ගංගා ඉවුර ආශ්‍රිතව පැවති දැඩි පාංශු ඛාදනය හේතු කොට ගෙන සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍යය දෙපාර්තමේන්තුවේ සිට මහින්ද රාජපක්ෂ තොරතුරු

තාක්ෂණ මධ්‍යස්ථාන පරිශ්‍රය දක්වා මී. 15 ක උසින් යුත් මීටර 499 දිගට ගේබියන් බැම්මක් ඉදි කිරීම සඳහා මෙම ව්‍යාපෘතිය 2013 වර්ෂයේ ආරම්භ කෙරිණ. 2015 දෙසැම්බර් මස අවසන් වන විට යෝජිත ගේබියන් බැම්මෙන් මීටර් 176 දක්වා ඉදි කිරීම් කටයුතු අවසන් කර ඇත.

මෙම ව්‍යාපෘතියට 2016 වර්ෂය සඳහා මූල්‍ය ප්‍රතිපාදන (සංශෝධිත) රු.මි. 125ක් වන අතර 2016 වර්ෂය තුළදී එයින් රු. මි. 63 (50%) භාවිත කර ඇත.

| අනු අංක | ක්‍රියාකාරකම් | ඒකකය | භෞතික ප්‍රගතිය 2016 ජනවාරි සිට දෙසැම්බර් දක්වා |
|---|---|---|---|
| *01* | *මහවැලි ගැටඹේ ඉවුරු ආරක්ෂණ ගේබියන් බැම්ම ඉදි කිරීම (අදියර 01 )* | මී | 41 |





*ගේබියන් බැම්ම ඉදි කිරීම*

## 1.2.6 හදිසි යටිතල පහසුකම් ප්‍රතිසංස්කරණය ඇතුළු විශාල හා මධ්‍යම වාරිමාර්ග ව්‍යාපෘති ප්‍රතිසංස්කරණය කිරීම

මූල්‍ය ප්‍රතිපාදන : දේශීය අරමුදල්
ඇස්තමේන්තු පිරිවැය : රු.මි.825
ව්‍යාපෘති කාලසීමාව : 2015-2018

(අ) මූලික වැඩ හා ජලාශ අළුත්වැඩියා කිරීම හා නඩත්තු කිරීම (ආ) වාරි යටිතල පහසුකම් ප්‍රතිසංස්කරණය කිරීම හා (ඇ) හුරුලුවැව, උඩවලව, මහවැලි කලාප බී, සී, එච්, එල් හා මූලික වැඩ පාලන ක්‍රියා කරවුම් නඩත්තු හා මෙහෙයුම් අංශය යටතේ වන කාර්යය භාර ඉංජිනේරු අංශවල වාරි බෙදුම් ඇලවල් අතර මාර්ග ඉදි කිරීම් හා ප්‍රතිසංස්කරණය මෙම ව්‍යාපෘතිය මගින් අරමුණු කෙරේ.

2016 වර්ෂය සඳහා මූල්‍ය ප්‍රතිපාදන (සංශෝධිත) රු.මි. 200 ක් වන අතර 2016 වර්ෂය තුළදී එයින් රු. මි. 178.21 (89%) ඵලදායී ලෙස භාවිත කර ඇත.

## 1.3 නඩත්තු සහ සංවර්ධනය

ජාතික ආහාර නිෂ්පාදන වැඩසටහනට සමගාමීව කෘෂි කර්මාන්තය සංවර්ධන කිරීමේ අරමුණ පෙරදැරිව ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය එහි කලාප 10 තුළ හෙක්. 105,522 ක් වන වාරි ඉඩම් සඳහා ජල සැපයුම තහවුරු කරනු වස් විශාල, මධ්‍යම හා කුඩා ප්‍රමාණයේ ජලාශ 333 කින් සමන්විත කි.මී. 10,821 ක් වූ වාරි මාර්ග ජාලයේ මෙහෙයුම් හා නඩත්තු කටයුතු සිදු කිරීම සම්බන්ධයෙන් වගකීම දරන ආයතනය වේ. මේ අතර පවුල් 276,000 කට වැඩි ප්‍රතිලාභ සපයනු වස් මහවැලි මාර්ග පද්ධතිය හා අනෙකුත් යටිතල පහසුකම් නඩත්තු කිරීම හා ප්‍රතිසංස්කරණය කිරීම ද ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය යටතට ගැනෙන කාර්යයන් වේ.

තවද, ප්‍රදේශය තුළ දැනට වෙසෙන හා ඉදිරි පරම්පරාවේ උන්නතිය උදෙසා සඵලදායී අයුරින් ඉඩම් පරිපාලනය, ව්‍යවසායකත්ව සංවර්ධනය, පරිසර සංරක්ෂණය සහ ආයතනික සංවර්ධන කටයුතු මෙන්ම මහවැලි ජනපද ප්‍රදේශවල ක්‍රීඩා කටයුතු සංවර්ධනය කිරීම ශ්‍රී ලංකා මහවැලි අධිකාරියේ ප්‍රධාන කාර්යයන් වේ. මේ සඳහා 2016 වසරට අය වැය ප්‍රතිපාදන රු.මි. 2,000 ක් වන අතර 2016 වර්ෂය තුළදී එයින් රු. මි. 1663.38 (83%) ඵලදායී ලෙස එම ප්‍රදේශයේ ජනතාවට පහසුකම් සැලසීම සඳහා යොදවා ඇත.

### 1.3.1 වාරිමාර්ග පද්ධතිය නඩත්තුව

දෙවනි වර කැලෑ එළි කිරීම, වාරිමාර්ග ඇල පද්ධතියෙහි රොන්මඩ ඉවත් කිරීම, වාරි මාර්ග පද්ධතිය හා නිර්මිත අළුත්වැඩියාව සහ සංවර්ධනය, මාර්ග බොරළු ඇතිරීම ආදිය මහවැලි වාරිමාර්ග පද්ධතිය නඩත්තු කටයුතු යටතට ගැනේ. 2016 වසර සඳහා රු.මි. 337.09 ක් වාරිමාර්ග පද්ධතිය නඩත්තු කටයුතු වෙනුවෙන් වෙන්කර ඇති අතර ඉහත කාර්යයන් සාක්ෂාත් කර ගනු වස් ඉන් රු.මි.299.31 (89%) ක් මෙම කාලය තුළදී ඵලදායී අයුරින් වැය කර ඇත.

මහවැලි කලාප තුළ ගොවි සංවිධාන 1,007 ක් ක්‍රියාත්මකව පවතින අතර 2016 වර්ෂයේ අවසානය වන විට බෙදා හැරීමේ ඇළ පද්ධති නඩත්තු හා මෙහෙයුම් කටයුතු ඉහළ ක්‍රියාශීලීත්වයකින් යුත් ගොවි සංවිධාන 10 ක් වෙත පවරා දී ඇති අතර 2016 වර්ෂයේ අවසාන භාගය වන විට සමුච්චිතව ගොවි සංවිධාන 789 කට පවරා දී ඇත.ආයතනික සංවර්ධන අංශයේ උපදෙස් මත 2016 වර්ෂයේ දී ගොවි සංවිධාන 20 ක් ආදර්ශ ගොවි සංවිධාන මට්ටමටත්, ගොවි සංවිධාන 36 ක් වාණිජ මට්ටමටත් ඉහළ නංවන ලදී.

### 1.3.2 ඉඩම් ප්‍රදානය

මෙම කාල පරිච්ඡේදය තුළ රජයේ ඉඩම් ආඥා පනත යටතේ ඉඩම් කට්ටි 82 ක් නිවාස සඳහා ද ඉඩම් කට්ටි 06 වාණිජ අරමුණු සඳහා ද ලබාදී ඇත. එමෙන්ම මෙම කලාපවල පදිංචි කරවූවන්ගේ ඉඩම් අයිතිය තහවුරු කරනු වස් ප්‍රදාන/බලපත්‍ර 60,574 ක් නිකුත් කර ඇති අතර විහාරස්ථානවලට ප්‍රදාන පත්‍ර 50 ක් ද නිකුත් කර ඇත. 2016 දෙසැම්බර් අග වන විට ඉඩම් කට්ටි 13,291 ක මැනුම් කටයුතු අවසන් කර ඇත. 2016 වර්ෂය තුළදී එකතුකරන ලද බදු කුලී ආදායම රු.මි. 217.2 කි.

### 1.3.3 කෘෂි කාර්මික හා පශු සම්පත් සංවර්ධනය

**කෘෂිකාර්මික ඵලදායීතා සංවර්ධන වැඩසටහන**

ජාතික ආහාර නිෂ්පාදන වැඩසටහනට සමගාමීව දේශීය ආහාර සුරක්ෂිතතාවය සහතික කිරීම හා කෘෂිකාර්මික ආනයන අවම කිරීම කෙරෙහි යොමු වන වැඩි ඵලදායී දේශීය භෝග වගාව හා සත්ව නිෂ්පාදන ප්‍රවර්ධනය කිරීම සඳහා මෙම වැඩ සටහන ආරම්භ කර තිබේ. අනෙකුත් භෝග වගාව ප්‍රවර්ධනය කිරීම, දෙමුහුන් බිත්තර වී නිෂ්පාදනය හඳුන්වාදීම, කාබනික පොහොර භාවිතය වැඩි දියුණු කිරීම, නව ගොවිපලවල් හා පැල තවාන් ස්ථාපිත කිරීම, අපනයන තත්ත්වයේ සහල් නිෂ්පාදන වැඩි දියුණු කිරීම මෙන්ම පාරම්පරික දේශීය සහල් වර්ග වගා කිරීම දිරි ගැන්වීම වැනි වැඩ සටහන් මාලාවක් මෙම ව්‍යාපෘතිය යටතේ ප්‍රවර්ධනය කරන ලදි. එමෙන්ම පශු සම්පත් සංවර්ධන වැඩසටහන යටතේ කිරි ආශ්‍රිත නිෂ්පාදන, කුකුළු ගොවිපල පාලනය, මිරිදිය හා විසිතුරු මත්ස්‍ය කර්මාන්ත සංවර්ධන කටයුතු පිළිබඳ දැනුවත් කිරීමේ වැඩසටහන් හා වැඩමුළු ක්‍රියාත්මක කරන ලදි.

**කෘෂිකාර්මික භෝග වගාව**

2015/2016 මහ කන්නයේදී මහවැලි ප්‍රදේශවල වී වගාකර ඇති ඉඩම් ප්‍රමාණය හෙක්. 94,735 ක් වන අතර මහවැලි කලාපවල වී නිෂ්පාදනය දළ වශයෙන් මෙ. ටො. 541,000 ක් විය. මෙම වර්ෂයේදි මහවැලි කලාපවල සාමාන්‍යය වී අස්වැන්න හෙක්ටයාරයකට මෙ. ටො. 5.62 ක් වී ඇත. 2016 යල කන්නයේ වී වගාකර ඇති භූමි ප්‍රමාණය හෙක්. 63,893 වන අතර ඇස්තමේන්තු වී නිෂ්පාදනය මෙ. ටො. 343,454 වේ. 2015/2016 මහ සහ 2016 යල කන්නයේ වාර්තා වී ඇති මුලු වී නිෂ්පාදනය මෙ. ටො. 884,868 වේ.

අනෙකුත් බෝග වගා කිරීම ( අනෙකුත් ක්ෂේත්‍ර භෝග, පළතුරු,එළවළු සහ නිත්‍ය භෝග) හෙක්. 43,908 ක් වූ අතර එය සෝයා බෝංචි හෙක්. 2,421 ක්ද, බඩ ඉරිඟු හෙක්. 4,373 ක්ද, ලොකු ළූණු හෙක්. 1,713 ක්ද මිරිස් හෙක්. 821 ක්ද, කළු කවුපි හෙක්. 813 ක්ද, කවුපි හෙක්. 1,238 ක් සහ රට කජු හෙක්. *536* වශයෙන් සමන්විත විය. වර්ෂය අවසානයේදී වගා තීව්‍රතාව 178 ලෙස වාර්තාගත විය. තවද, හෙ. 13,046 ක් පලතුරු ද හෙ.7,111 නිත්‍ය භෝග ද වගා කොට ඇත.

කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ දත්තවලට අනුව 2016 වර්ෂය තුළදී වී අස්වැන්න 20%, සෝයා බෝංචි 55%, ලොකු ළූණු 35% හා මිරිස් 8% ආදී වශයෙන් දේශීය කෘෂි නිෂපාදන හා සංවර්ධනය කාර්යයන් හිදී ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය ඉතා ඉහළ දායකත්වයක් දරයි.

**කිරිගව සංවර්ධන වැඩසටහන**

ශ්‍රී ලංකා මහවැලි අධිකාරියේ පශු සම්පත් සංවර්ධන අංශය හරහා මහවැලි ප්‍රදේශ වල අතිරේක ආදායම් මාර්ග හඳුන්වාදීම හා මහවැලි ජනපදිකයින්ගේ පෝෂණ තත්වය ඉහළ නැංවීම අරමුණු කරගෙන කිරිගව පාලනය ප්‍රවර්ධනය කිරීමට ක්‍රියාකරනු ලැබේ. මහවැලි කලාපවල කිරි නිෂ්පාදනයේ සංවර්ධන කටයුතු සිදු කිරීම සහ මෙහෙයවීම ශ්‍රී ලංකා මහවැලි අධිකාරියේ පශු සම්පත් සංවර්ධන අංශයේ වගකීම වේ.

2016 වර්ෂය තුළදී මහවැලි ප්‍රදේශවල 110,630 ක මුළු ගව ගහනයක් වාර්තා වූ අතර එම කාලය තුළ දල වශයෙන් කිරි ලීටර් මිලියන 30 ක් පමණ නිෂ්පාදනය කර ඇත. මෙම කාල පරිච්ඡේදය තුළදී ගව ගාල් 135 ක්

ඉදි කරන ලද අතර අවශ්‍ය කිරි ගොවීන් හට කිරි දෙවීම් යන්ත්‍ර 11 බෙදා දී ඇත. තවද සත්ව අභිජනන හැකියාව වැඩිදියුණු කිරීම යටතේ අභිජනනන මධ්‍යස්ථාන 06 පිහිටුවන ලදී.

මෙම කාල පරිච්ඡේදය තුළ පුද්ගල සංවර්ධනය ඉහළ නැංවීම සඳහා සඳහා ගොවීන්, පාසැල් ළමුන් හා ක්ෂේත්‍ර නිලධාරීන් හට පුහුණු වැඩසටහන් 118 ක් පවත්වා ඇත. තවද සතුන්ගේ සෞඛ්‍ය තත්වය ඉහළ නැංවීම සඳහා සත්ව සායන 39 පවත්වා ඇත. මෙයට අමතරව 2016 වර්ෂය තුළදී කිරි සීත කිරීමේ මධ්‍යස්ථාන 03 ස්ථාපනය කරන ලද අතර "කිරි සතිය" වැඩසටහන යටතේ වැඩසටහන් 22 ක්ද පවත්වා ඇත.

**මිරිදිය මත්ස්‍ය කර්මාන්තය හා විසිතුරු මත්ස්‍ය රෝපණය**

මහවැලි ජනපදිකයින්ගේ පෝෂණය හා ආර්ථික තත්වය නැංවීමෙහි ලා මහවැලි ජලාශවල මිරිදිය මත්ස්‍ය කර්මාන්තය සංවර්ධනය කිරීම ප්‍රධාන කාර්යයක් වේ. 2016 වර්ෂය තුළදී මත්ස්‍ය නිෂ්පාදනය මෙ. ටො. 14,650 ක් ලෙස වාර්තා විය. මහවැලි ප්‍රදේශයන්හි මත්ස්‍ය ගහණය ඉහළ නැංවීම සඳහා ඇඟිල්ලන් 632,000 මුදාහැර ඇති අතර අභිජනන මධ්‍යස්ථාන 04 ක් ස්ථාපනය කර ඇත. තවද විසිතුරු මත්ස්‍ය නිෂ්පාදනය ඉහළ නැංවීම සඳහා මඩ පොකුණු 93 ඉදි කර ඇති අතර එකතු කිරීමේ මධ්‍යස්ථාන 02 ක් ස්ථාපනය කර ඇත. මීට අමතරව ධීවර ජනතාව ශක්තිමත් කිරීම සඳහා ධීවර සංවිධාන 07 ක් මෙම කාලය තුළ පිහිටුවා ඇත.

### 1.2.4 ආයතනික සංවර්ධනය

ව්‍යවසායකත්ව අවස්ථා, පුද්ගල සංවර්ධනය, ආයතනික සවිබල ගැන්වීම, කාන්තාව සවිබලගැන්වීම, සමාජ හා සංස්කෘතික සංවර්ධනය ජනපදිකයන් වෙත ලබා දෙමින් මහවැලි පදිංචි කරුවන්ගේ සමාජ ආර්ථික තත්ත්වය ඉහළ නැංවීම ඔවුන් පදිංචි කරවීමේ පශ්චාත් සමයේ ශ්‍රී ලංකා මහවැලි අධිකාරියේ ප්‍රධාන කාර්යන් වේ. ඒ අනුව, පදිංචි කරුවන්ගේ දෙවන හා තුන්වන පරම්පරාවල අභිවෘද්ධිය තකා ශ්‍රී ලංකා මහවැලි අධිකාරියේ ආයතනික සංවර්ධන අංශය ඉහත ක්ෂේත්‍ර ආවරණය වන පරිදි විවිධ වැඩ සටහන් හා වැඩමුළු සංවිධානය කරන ලදි.

2016 වර්ෂය තුලදී ආයතනික සංවර්ධන වැඩසටහන් 3,067 ක් , ප්‍රජා සංවර්ධන වැඩසටහන් 736 ක් සහ කාන්තා අභිවෘද්ධියට අදාළ වන වැඩසටහන් 61 ක් පවත්වා ඇත.

### 1.3.5 වනාන්තර හා පරිසරය

**වනාන්තර හා පරිසර සංරක්ෂණය**

පාරිසරික අංශය විසින් මහවැලි ප්‍රදේශ වල පාරිසරික කටයුතු කළමනාකරණය හා සම්බන්ධීකරණය අඛණ්ඩව සිදු කරනු ලබයි. ජාතික පාරිසරික වැඩසටහන යටතේ වන "පුනරුදය" තුන් අවුරුදු ක්‍රියාකාරී සැලැස්ම සඳහා ප්‍රමුඛතා ලබා දෙමින් පරිසර අමාත්‍යාංශය සමග එක්ව 206 වර්ෂයේදී ආරම්භ කරන ලද "නීල හරිත" වැඩසටහන හරහා මහවැලි ප්‍රදේශ තුළ හරිත සංකල්පය ප්‍රායෝගිකව ක්‍රියාවට නැංවීමට කටයුතු කරමින් සිටියි.

පරිසර හා වන සංරක්ෂණය සඳහා වාර්ෂික ප්‍රතිපාදන රු. මි. 50 ක් වන අතර ඉන් රු. මි. 48.7(97%) ක් 2016 වර්ෂය තුළදී භාවිතා කර ඇත. මෙම කාල පරිච්ඡේදය තුළදී ස්වාභාවික සම්පත් සංරක්ෂණය කිරීම යටතේ සන මීටර් 230 ක් හා මීටර් 15,423 තුල පාංශු සංරක්ෂණ කටයුතු සිදුකර ඇත. අලි මිනිස් ගැටුම වැලැක්වීම සඳහා කි. මී. 21 ක් දිග ජීව වැටක් හා කි.මී 6 ක් දිග විදුලි වැටක් ඉදි කිරීම ද කි.මී. 75 ක් දක්වා පවත්නා අලි වැට නඩත්තු කිරීමද මෙම කාලය තුළ සිදු කර ඇත.

මහවැලි ප්‍රදේශයන්හි ජලයේ ගුණාත්මක බව සහතික කිරීම සඳහා ජලතත්ව අධීක්ෂණ වැඩසටහන යටතේ ජලතත්ව වාර්තා 88 ක් මෙම කාලය තුළදී ලබා දී ඇත. පැළ තවාන් කළමනාකරණය හා පැළ නිෂ්පාදන වැඩසටහන යටතේ පැළ 279,369 ක් නිෂ්පාදනය කර ඇති අතර ළමුන්ගේ සහභාගිත්වයද ඇතුළුව පරිසර අධ්‍යාපන හා දැනුවත් කිරීම වැඩසටහන් 133 ක් ද මෙම කාල පරිච්ඡේකය තුළ පවත්වා ඇත. තවද ආක්‍රමණශීලී ශාක විශේෂ පාලනය කිරීම යටතේ බී,එච් සහ සී කලාපයේ ජලාශ 15 ක් පිරිසිදු කර ඇත.





**පුනර්ජනනීය බල ශක්ති නිෂ්පාදනය වැඩි කිරීම (කුඩා ජල විදුලිබල ව්‍යාපෘති)**

මහවැලි ප්‍රදේශයන්හි කුඩා පරිමාණ ජල විදුලි ව්‍යාපෘති 20 ක් ඉදි කිරීම තුළින් මෙ.වො. 57.3 ක් සමස්ථ ජල විදුලි ඒකක ප්‍රමාණයක් නිෂ්පාදන කිරීමට අපේක්ෂිත කෙරේ.මෙයින් ව්‍යාපෘතීන් 16 ක් සඳහා පාරිසරික තක්සේරු වාර්තා අනුමැතිය ලබාදී ඇති අතර 2016 දෙසැම්බර් අවසාන වන විට ඉන් ව්‍යාපෘති 10 ක් වාණිජ ක්‍රියාකාරකම් ආරම්භ කර ඇති අතර ඒවායේ ධාරිතාවය මෙ.වො. 30.1 කි.

### 1.3.6 ව්‍යාපාර සංවර්ධනය

සංචාරක බංගලා 07 ක නවීකරණ කටයුතු දැනටමත් අවසන් කර ඇති අතර 2016 වර්ෂය තුළදී දැව සංස්ථාවෙන් මිලට ගත් නව ගෘහ භාණ්ඩ එම සංචාරක බංගලා 07 ට ලබා දී අවසන් කර ඇත. පිඹුරත්තෑව සංචාරක බංගලාවේ නවීකරණ කටයුතු 2017 ජූනි අග වන විට අවසන් කිරීමට අපේක්ෂා කෙරේ.




*කලාවැව*



*දෙහිඅත්තකණ්ඩිය*

**මහවැලි කලාපයන්හි පෞද්ගලික අංශයේ ආයෝජන සඳහා අවස්ථා**

2016 වර්ෂය තුළදී මහවැලි කලපයේ නව වාණිජ කෘෂිකර්මාන්ත සහ අනෙකුත් සංවර්ධන ව්‍යාපෘතීන් සඳහා අනුමැතිය ලබාදී ඇත.

| ව්‍යාපෘතිය | අනුමත සංඛ්‍යාව |
|---|---|
| කෘෂි කර්මාන්තය හා පශු සම්පත් | 07 |
| සේවා(ඉන්ධන පිරවුම් හල්, අනෙකුත්) | 04 |
| සූර්ය බල ශක්ති පිරියත | 02 |
| කර්මාන්ත(සහල්,ගල් කොරි,ඇඟළුම්,ලුණු) | 06 |
| පාරිසරික ව්‍යාපෘති (බෝට්ටු , ඉඩම් ) | 06 |

**සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර ප්‍රවර්ධනය**

2016 වර්ෂය තුළදී ප්‍රාදේශීය සංවර්ධන බැංකුවේ සහයෝගය ඇතිව "මහවැලි සවිය" වැඩසටහන යටතේ කුඩා හා මධ්‍ය පරිමාණයේ ව්‍යවසායකයන් 78 ක් සඳහා රු. මි. 13.82 ක් ලබාදී ඇති අතර "මහවැලි දිරිය" විශේෂ ණය යෝජනා ක්‍රමය යටතේ ගොවි සංවිධාන 8 කට ඔවුන්ගේ ව්‍යාපාර කටයුතු වැඩි දියුණු කර ගැනීම සඳහා රු. මි. 10.7 ක් ලබාදී ඇත.

### 1.3.7 සුදුසු රාජකාරි පරිසරයක් සඳහා පහසුකම් සැලසීම

**I. මානව සම්පත් සංවර්ධනය/නව බඳවා ගැනීම්/කාර්ය මණ්ඩල උසස් වීම්**

කාර්යක්ෂම මෙන්ම ඵලදායි සේවාවක් සැපයීම සඳහා සංශෝධනය කරන ලද බඳවා ගැනීම් පරිපාටිවලට අනුව නව බඳවා ගැනීම් බොහෝමයක් ඉටු කර ගැනීමට අධිකාරියට හැකියාව ලැබී ඇත.

| පුරවන ලද පුරප්පාඩු සංඛ්‍යාව | | උසස්වීම් | |
|---|---|---|---|
| ජ්‍යෙෂ්ඨ කළමනාකරණය (ජ්‍යෙ.ක) | 01 | ජ්‍යෙෂ්ඨ කළමනාකරණය (ජ්යෙ.ක) | 01 |
| මධ්‍යම කළමනාකරණය (ම.ක) | 56 | මධ්‍යම කළමනාකරණය (ම.ක) | 45 |
| කණිෂ්ඨ කළමනාකරණය (ක.ක) | 12 | කණිෂ්ඨ කළමනාකරණය (ක.ක) | 68 |
| කළමනාකරණ කාර්ය මණ්ඩලය (MA-3 , MA 2-2, MA 1-2) | 262 | කළමනාකරණ කාර්ය මණ්ඩලය (ක.ස. 3, ක.ස. 2-2, ක.ස. 1-2) | 62 |
| **එකතුව** | **331** | **එකතුව** | **176** |

**ii. ප්‍රසම්පාදන සැලැස්ම**

2016 වර්ෂය තුළදී රාජකාරි කටයුතු වල කාර්යක්ෂමතාවය ඉහළ නැංවීම පිණිස පහත සඳහන් උපකරණ මිලට ගන්නා ලදී.

| කාර්යාලීය උපකරණ | ඒකක සංඛ්‍යාව |
|---|---|
| පරිගණක | 261 |
| ලැප්ටොප් පරිගණක | 68 |
| මුද්‍රණ යන්ත්‍රය | 106 |
| ඡායා පිටපත් යන්ත්‍රය | 74 |

| කාර්යාලීය උපකරණ | ඒකක සංඛ්‍යාව |
|---|---|
| UPS | 252 |
| මීඩියා ප්‍රෝජෙකටර් හා තිර | 28 |
| ෆැක්ස් යන්ත්‍ර | 8 |
| ඩොට් මුද්‍රණ යන්ත්‍ර | 10 |

**iii. පුහුණු වැඩසටහන්**

සේවකයන්ගේ හැකියාවන් හා දැනුම් මට්ටම ඉහළ තලයකට ගෙන එමින් ශක්තීන් වැඩි දියුණු කිරීම සඳහා අධිකාරියේ පුහුණු අංශය මගින් විවිධ විෂයයන් යටතේ පුහුණු වැඩ සටහන් පවත්වන ලදී.

| පවත්වන ලද පුහුණු වැඩ සටහන් | | |
|---|---|---|
| | වැඩ සටහන | සහභාගී වූවන් |
| ජ්‍යෙෂ්ඨ කළමනාකරණය (ජ්‍යෙ.ක) | 1 | 35 |
| මධ්‍යම කළමනාකරණය (ම.ක) | 4 | 128 |
| කණිෂ්ඨ කළමනාකරණය (ක.ක) | 11 | 237 |
| කළමනාකරණ කාර්ය මණ්ඩලය | 16 | 827 |
| **එකතුව** | **32** | **1227** |

### 1.3.8 නෛතික බලාත්මක කිරීම

2016 වර්ෂය තුළදී නීතිපති දෙපාර්තමේන්තුවේ උපදෙස් යටතේ නිති අංශය මගින් නඩු 116 ක් සම්බන්ධ කටයුතුවල නිරත වූ අතර ප්‍රධාන කාර්යාලයේ නිති නිළධාරීන් නඩු වාර 11 ක් සඳහා සහභාගි විය. ශ්‍රී ලංකා මහවැලි අධිකාරියේ පවත්නා ඇතැම් නඩු විසඳීම සඳහා නීති සාකච්ඡා වට 04 ක් පවත්වා ඇත.

### 1.3.9 ජල කළමනාකරණය

ලං.වි.ම, ජල සම්පාදන මණ්ඩලය, වාරිමාර්ග දෙපාර්තමේන්තුව හා කාලගුණික දෙපාර්තමේන්තුව සමග අවශය සම්බන්ධීකරණය කටයුතු කරමින් කෘෂි කර්මාන්තය, ජල විදුලිය හා පානීය මෙන්ම අනෙකුත් ජල අවශ්‍යතා සඳහා මහවැලි ජලාශවල ජලය කාර්යක්ෂම අයුරින් යොදා ගැනීම සම්බන්ධයෙන් ජල කළමනාකරණ ලේකම් කාර්යාලය සහතික වේ. එමෙන්ම ජල කලමනාකරණ මණ්ඩලයේ මෙහෙයුම් ප්‍රතිපත්ති තීරණ ගැනීමේදී ජල කළමනාකරණ ලේකම් කාර්යාලය ඒ සඳහා තොරතුරු හා නිර්දේශ ලබා දේ.

**මහවැලි ජලාශවල ජලය ගබඩා කර තැබීමේ ධාරිතාව**

| ජලාශ | උපරිම ධාරිතා මට්ටම (ස.මී.මි)<br>**2016** |
|---|---|
| කොත්මලේ | 172.9 |
| පෝල්ගොල්ල | 4.1 |
| වික්ටෝරියා | 721.2 |
| රන්දෙනිගල | 861.4 |
| රන්ටැඹේ | 7.0 |
| බෝවතැන්න | 23.5 |
| උඩවලව | 278.2 |
| දඹුලු ඔය | 11.7 |
| කණ්ඩලම | 33.8 |
| කලා වැව | 123.7 |
| උල්හිටිය/රත්කිඳ | 145.3 |
| මාදුරු ඔය | 596.6 |
| **එකතුව** | **2979.4** |

### 1.3.10 අභ්‍යන්තර විගනණය

අධිකාරියේ කාර්යයන් සම්බන්ධයෙන් කාර්යක්ෂමතාව තහවුරු කරනු වස් අභ්‍යන්තර විගනණ අංශය කෙෂ්ත්‍ර චාරිකා 11 ක් සිදු කරන ලදී. මීට අමතරව 2016 වර්ෂය තුළදී විගනණ වාර්තා 14 ක් හා විගනණ විමසුම් 24 ක් නිකුත් කර ඇත.

2. මහවැලි ජලාශවල බල ශක්ති උත්පාදන ධාරිතාව

| *ජලාශය* | මුලු ධාරිතාව (දල වශයෙන්) (ඝ.මී.මි) | උපරිම බල ශක්ති ධාරිතාව (මෙ.වො) | බල ශක්ති උත්පාදන - 2015 (ගි.වො.පැ) | බල ශක්ති උත්පාදන 2016 ජන. සිට නොවැ. දක්වා (ගි.වො.පැ) |
|---|---|---|---|---|
| කොත්මලේ | 174 | 201 | 480.44 | 257.69 |
| පෝල්ගොල්ල | 4 | - | | - |
| වික්ටෝරියා | 722 | 210 | 795.28 | 563.12 |
| රන්දෙනිගල | 860 | 126 | 434.56 | 304.94 |
| රන්ටැඹේ | 7 | 49 | 213.05 | 134.79 |
| උල්හිටිය/රත්කිඳ | 146 | - | | - |
| මාදුරුඔය | 596 | - | | - |
| බෝවතැන්න | 23 | 40 | 64.42 | 39.25 |
| උඩවලව | 268 | 6 | 21.42 | 15.54 |
| උකුවෙල (බලාගාරය පමණි) | | 40 | 157.51 | 146.62 |
| එකතුව | **2,800** | **672** | **2,166.68** | **1,461.94** |

3. **2016 වර්ෂයේදී ඉදිරිපත් කරන ලද අමාත්‍ය මණ්ඩල සංදේශ**

| අමාත්‍ය මණ්ඩල සංදේශ අංකය හා ඉදිරිපත් කරන ලද දිනය | | ශීර්ෂය | අමාත්‍ය මණ්ඩල තීරණය |
|---|---|---|---|
| අංකය | දිනය | | |
| 16/0063/704/003 | 2016.01.20 | මහවැලි පශු සම්පත් හා සී/ස ඇග්‍රි බිස්නස් (පුද්) සමාගම ප්‍රති සංවිධානය කිරීම සඳහා පුද්ගලික ආයෝජකයෙකු හා සම්බන්ධ වීම | යෝජනාව සඳහා අනුමැතිය ලබා දී ඇත. |
| 16/0621/704/015 | 2016.04.19 | මහවැලි L කලාපයේ ඉඩම් පැවරීම සම්බන්ධයෙන් ප්‍රතිපත්තිමය තීරණයක් ගැනීම. | (i)යෝජිත පරිදි ඉඩම් පැවරීම සඳහා අනුමැතිය ලබා දී ඇත.<br>(ii)අදාළ ප්‍රදේශයන්හි පවත්නා අලි මං තීරුවලට අවහිරයක් නොවන අයුරින් ඉහත සඳහන් පරිදි ඉඩම් පවරන ලෙස අදාළ බලධාරීනට උපදෙස් ලබා දීම |
| 16/0629/704/016 | 2016.04.19 | ගව අනාථාගාරයක් ඉදි කිරීම සඳහා අක්කර 100 ක ඉඩමක් සඳහා වූ ඉල්ලීම - ශ්‍රී බෝධිරාජ පදනම, බෝධිරාජ ධර්මායතනය, ඇඹිලිපිටිය | (i) යෝජනාව සඳහා අනුමැතිය ලබා දී ඇත.<br>(ii) යෝජිත ගව අනාථාගාරය ඇඹිලිපිටියේ සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුව යටතේ ලියා පදිංචි කරන ලෙස බෝධිරාජ ධර්මායතනයේ නිලධාරීන්හට උපදෙස් ලබා දීම |
| 16/1274/704/034 | 2016.07.26 | 1947 අංක 08 දරන රජයේ ඉඩම් ආඥා පනත යටතේ බදු පදනම මත බැහැර කරන ලද ඉඩම් සඳහා බදු සහන සැලසීම | (i) යෝජනාව සඳහා අනුමැතිය ලබා දී ඇත.<br>(ii)වාණිජ අරමුණු සම්බන්ධයෙන් බදු දෙන ඉඩම්වල වාර්ෂික බදු කුලියට අදාළ 1947 අංක 08 දරන රජයේ ඉඩම් ආඥා පනතේ රෙගුලාසි 2017 (02) ඡේදය නැවත සලකා බලන ලෙස ඉඩම් අමාත්‍යාංශයෙන් ඉල්ලා සිටි අතර සුදුසු යෝජනා අමාත්‍ය මණ්ඩලය වෙත නිර්දේශ කරන ලදී. |

| | | | |
|---|---|---|---|
| 16/1883/704/053/TBR | 2016.09.27 | මුලතිවු දිස්ත්‍රික්කයේ වැලිඔය ගජබාපුර ප්‍රදේශයේ සිට නැදුන්කර්නි නගරය දක්වා දිවෙන ප්‍රධාන මාර්ගය වැඩි දියුණු කර මතුපිට ආස්ථරණය කිරීමට මාර්ග සංවර්ධන අධිකාරියට ලබා දීම | යෝජනාව සඳහා අනුමැතිය ලබා දීමට තීරණය කර ඇත. |
| 16/2013/704/055 | 2016.10.11 | ශ්‍රී ලංකා මහවැලි අධිකාරියේ වාර්ෂික වාර්තාව - 2013 | (i) ශ්‍රී ලංකා මහවැලි අධිකාරියේ වාර්ෂික වාර්තාව - 2013 ඉදිරිපත් කිරීම සඳහා අනුමැතිය ලබා දීම<br>(ii) ශ්‍රී ලංකා මහවැලි අධිකාරියේ වාර්ෂික වාර්තාව-2013 හි මූල්‍ය ප්‍රකාශයේ කරුණු සම්බන්ධයෙන් විගණකාධිපතිවරයා විසින් ඉදිරිපත් කරන ලද අඩු පාඩු හා විෂමතාවන් නිවැරදි කිරීම<br>(iii) ශ්‍රී ලංකා මහවැලි අධිකාරියේ වාර්ෂික වාර්තාව - 2014 හා 2015 අමාත්‍ය මණ්ඩලය වෙත ඉදිරිපත් කිරීම. |
| 16/2343/704/011-II | 2016.11.15 | මහවැලි ආර්ථික කලාපයන්හි පුනර්ජනනීය බල ශක්ති නිෂ්පාදනය සඳහා යෝජනා කැඳවීම | (i)නිර්දේශ සඳහා ප්‍රතිපත්තිමය වශයෙන් අනුමැතිය ලබා දීම<br>(ii)සංදේශයේ සඳහන් වූ නිර්දෙශ ක්‍රියාත්මක කිරීම හා ඒකාබද්ධ යෝජනාවක් ලෙස අමාත්‍ය මණ්ඩලය වෙත ඉදිරිපත් කිරීම |